


මෙම කෘතියෙහි සම්පූර්ණ අයිතිය මල්ෂා දිසානායක සතුවේ.
කරුණාකර කතෘ අයිතිය සුරකින්න.
කියවීම පහසුව උදෙසා PDF ගොනුවක් ලෙස සකසන ලද්දේ - sinhalaebooks.com.

sinhalaebooks.com

" මූසලී.. උඹ හින්ද තමා අපි හැමදම මෙහෙම හිඟන්නෝ වුනේ.. ඉපදුන ද ඉඳන් අවාසනාව.. අප්පෙක් නැතුව අරකිගේ බඩට ඇවිත් ඒකිවත් මරාගෙන ඉපදුනා.. මේ මිනිහා පව් කියලා මැරෙන්න නොදී හද ගත්ත හින්ද වෙන්දෑ අපට මෙහෙම කරන්නේ..

" අනේ මාමේ මාව විකුණන්න එපා.. මාමට බරක්නම් මන් යන්නම්.. ඒත් මාව ඒ මිනිස්සුන්ට
දෙන්න එපා..

" උඹට නරක වෙන් නෑ කෙල්ලේ.. දැන් ඒ මිනිස්සු එයි හොද කෙල්ල වගේ නඩා ගිහින් ඇදුමක් ද ගනිම්.. උඹ ගොඩ ගියා කියන්නේ අපිත් ගොඩනේ..

" අනේ මාමේ මට බෑ.. බෑ.. පහන් අයියට මොකක්ද කියන්නේ මන්.. මට සල්ලි කාරයෝ එපා
මන් පහන් අයියා ගාවට යන්නම්..

" උඹට ඒ හිඟන්නමයි ඕනේ.. නෑ කීයටවත් ඌ ගාවට යන්න දෙන්න නෑ.. උඹ මේ ගමනඹ නොගියොත් මාමගේ මළකඳ තමා හෙට මුහුදෙන් ගොඩගහන්නේ.. අන්න ඒක මතක තියාගනින්..සදී

කෙල්ල ලඟින් අඩිය හප්පන් යන මාමා දිහා බොඳ වුන ඇස් වලින් බලන් හිටියේ ජීවිතේ ගලවගන්න තිබ්බ අවසන් උත්සහයත් නැතිවෙලා යද්දි..

වැල්ලෙම ඉපදිලා වැල්ලෙම මුහුදත් එක්ක ලොකු මහත් වුනේ අම්මෙක් අප්පෙක් ලගපාතකවත් නැතිව.. ඒත් සදී කිව්වම වැල්ලෙන හැමෝම හුගක් ආදරේයි කෙල්ලට..

මාමා කෙල්ලව විකුණන්න හදන්නේ පෝසත් පවුලක වැඩකාර කමට.. ඒකත් කසාද බඳින්න න ඕනේ ඒ මනුස්සයව.. කෙල්ල ආදරේ කලේ බෝට්ටුවේ රස්සාව කරපු පහන්ට.. කෙල්ලට ඒ ආදරේ දලා වැල්ලෙන් යන්න හිත තිබ්බෙම නෑ..

ඒත් මාමා ජීවිතේ උකසට තිබ්බේ කෙල්ලගේ හැගීම් ඉස්සරහා.. මාමා ජීවිතේ නැති කරගනී කියලා කෙල්ලට බයයි.. එහෙම දෙයක් වුනොත් නංගිලා මල්ලිලා නන්දලා අනාත වෙනවා..

කෙල්ල දිව්වේ ගේ පිටිපස්සේ තිබ්බ බෝට්ටු දිරනවට දන බේත් කුප්පිය ගාවට..

මට වෙන කරන්න දෙයක් නෑ පහන් අයියේ..
හැමෝම බේරලා මන් යන්නම් යනවා ඔව් මන් යනවා..

කෙල්ල වහ බෝතලේ අරන් බොන්න හදද්දිම කුසුමා ආවේ සැකේට ..

"අතාරින්න නැන්දේ අතාරින්න.. මට මැරෙන්න දෙන්න .. මට මේ හැම්දේකින්ම නිදහස් වෙලා යන්න ඕනේ.. මට් යන්න දෙන්න නැන්දේ අම්මා ලගට..

sinhalaebooks.com

" අනේ කව්රුත් නැද්ද.. වීරේ අනේ එන්න මෙන් මේකි වහ බෝතලයක් අරන් ඔට්ටුවෙනවා..

" කෙල්ලේ උඹට යකෙක් වැහිලද.. දපන් ඕක පැත්තකට..

" මාමේ නොදන්න මිනිහෙක්ට මාව විකුණලා ජීවිතේ විනාස වෙනවට වඩා මන්ම මැරිලා යනවා

" එහෙමද උඹ ඉදපන් එහෙනම් මන් ඕක බීලා මැරෙන්නම් ඉවරනේ. නැත්න ඒ මිනිස්සුන්ගෙන් මන් ගත්ත් සල්ලි ආපහු කොහෙන් දෙන්නද..

කෙල්ලගේ ඇස් ලොකු වුනා..

" මාමා සල්ලිත් ගත්තද ..

" ඔව් ඔව්.. මෙච්චර දවස් උඹලා කෑවේ ඒ සල්ලි වලින් තමා .. නැතුව උඹ හම්බකරලා තිබ්බ ඒවා නෙමෙයි..

කෙල්ල එහෙම්ම බිම ඉදගත්තේ ඔලුවට අත් දෙකත් ගහන්..

" අනේ වීරේ එපා .. ලමයි ගැන හිතන්න වීරේ.. අපි අසරණ වෙනවනේ..ඔයා නැති වුනොත්..

සදී දැන්වත් හා කියපන්කෝ.. උඹට ඕනේ මාමවත් මරාගන්නද..

කෙල්ල ගේ උරහිස්වලින් අල්ලලා කුසුමා හෙලෙව්වේ කෙල්ල මළකදක් ගානට ඔහේ වැනෙද්දි..

" මන් යන්නම් මාමේ..

එහෙම කියද්දි කුසුමයි වීරෙයි දෙන්නා ලොකු හුස්මක් අරන් හිනාවුනේ යුද්ධයක් අවසාන කරලා වගේ..

" හොද එකී උඹ .. දැන් පලයන් ඇදුමක් දගනින්..

වීරේ කෙල්ලගේ ඔලුව අතාගාද්දි කෙල්ල පරඩැලක් වගේ ගේ ඇතුලට ගියේ කිසිම දෙයක් නොතේරෙද්දි..

" අම්මෝ ඇති යන්තන්.. මේකි අකමැති වුනානම් මන් ඉවරයි ඒ මිනිස්සුන්ට මොකක් ද කියන්නේ..
සල්ලිත් මහ ගානක් ගත්තා විඩෙන් විඩේට..

sinhalaebooks.com

වීරේ ලී බංකුවට බර වුනේ එහෙම කියාතමයි..

" මේකි අවාසනාවන්තී.. අපටත් වගතුවක් නෑ මේකි ඉන්නකම්..යන එකටනම් මන් කැමිතී
අපේ ලමයෙක්වත් හඳුගන්න බෑ මගුල් විසේට නටනවා අර පහනා එක්ක ..

" දැන් කෑනුගහා හිටපන්.. ඒකී යන්න කැමති වුනානේ..
ගිහින් ඇඳුමක් හදලා දියන්.. හවස එනවා කිව්වා එක්කන් ය්න්න මැඩම්ලා..

කෙල්ල කාමරේට වෙලා කරේ අඬපු එක..

" අනේ පහන් අයියේ.. ඔයා අද එද්දි මන් නෑ..

කෙල්ල හයියෙන් ඉකි ගැහුවා.. ඇස් පියාගත්තම කෙල්ලට මැව්ලා පෙනුනේ මූහුදු යන්නේ
හෙට කියලා කෙල්ලව බලන්න් පහන් වැල්ලට ආවේ
පර්ප්ස මලකුත් අරන් .. හැමදම එහෙමයි
මූහුදු ගියාම එන්නෙ දවස් ගානකින් හින්ද කෙල්ලව බලලා යන්නේ..

" සදී ..

" ම්ම්..

" මන් මූහුදු ගිහින් හදිසියේ හරි නාවොත්

" අනේහ්.. පහන් අයියේ මොනාද කියන්නේ

පහන්ගේ තුරුලේ ඉදලා කෙල්ල අතින් පහන්ගේ තොල් තද කලේ ඒ වචන ඇහෙද්දිත් පපුව
කඩන් යනවා වගේ දැනුන හින්ද..

" එහෙම වෙන්නත් පුළුවන් මැනික.. හැමදේම දරාගන්න ඕනේ.. එහෙම වුනොත්..

කෙල්ල තුරුල් වුනේ පහන්ගේ පපුවට ඒ කවචන වලට උත්තර බදිනවට වඩා කෙල්ලට
ඕනේ ඒ උණුහුමේ ඉන්න..

".. එහෙම වුනොත් මාත් පනිනවා මූහුදට..

" ආ පිස්සි.. එහෙම වුනොත් ඔයා බදින්න ඕනී හොද මහත්තයෙක්ව .. මෝඩියක් නොවී

" මට බෑ..

කෙල්ල පහන් අස්සේ හැංගුනේ නොරිස්සුමට

" හරි හරි එහෙනම් පහනෝ උඹට පීනලා හරි ගොඩට එන්න වෙනවනේ..

sinhalaebooks.com

මයේ මැණික මන් එනකම්.පරිස්සමට එන්න ඕනේ..හොදේ..

" හ්ම්.. මන් මුහුද දිහා බලන් ඉන්නම් ඔයා එනකම්..

කෙල්ලගේ ඇස් වලින් කඳුලු ගලාගෙන ගියේ පහන් එක්ක කතා කල වචන ඒ ටික වෙද්දි..
පහන්ටපොරොදු වුනා එනකම් ඉන්නවා කියලා
ඒත් හැම්දේම දලා කෙල්ලට නොදන්න ලෝකේක අතරමං වෙන්න වෙලා

පහන් හිටියනම් කෙල්ලට මෙහෙම වෙන්න දෙන්නෑ කියලා දන්නවා..

" දැන් ඔය මදෑ ඇඩුවා.. නාගෙන ලෑස්ති වෙයන්

හවස් වුනා දැනුනෙවත් නැතුව කෙල්ල ඇදේ ඉදන්
හිටියේ ඇගම පන නැති වෙද්දි..

" මන් කොහොමද දෙයියනේ මේ ගමන යන්නේ
මන් වෙන කෙනෙක් බඳින්නේ කොහොමද.. මන් පහන් අයියගේ වෙලා ඉවරයි.. මගේ
හැම්දේම මන් පහන් අයියට දුන්නේ කවදවත් වෙන කෙනෙක් ගාවට් යන් න හිතන් නෙවෙයි
මන් කොහොමද මේ වට මූණ දෙන්නේ..

නැන්දලා දැනගත්තොත් මාව මරයි.. අනේ මාව බේරගන්න කව්රුත්ම නැද්ද දෙවියනේ..

කෙල්ල ඒ වෙද්දි පහන් අතින් විනාස වෙලා හිටියේ
ඒක වීරෙලා දැනන් හිටියේ නෑ.. කෙල්ලට බයයි වෙන කෙනෙක් බඳින්න..

" සදී උඹ තව ඇඳේ ඉදන් මක් කොරනවද අර මිනිස්සු මග එනවත් ඇති

" හරි නැන්දේ..

කෙල්ල නැගිටලා නා ගත්තේ ඇගේ තිබ්බ තෙහෙට්ටුව හෝන්දුමාන්දු ගතිය මගඇරගන්න
ඒත් ඒ ලග ට ජිවිතේ මුහුණ දෙන්න තියන අවස්ථා කෙල්ලට මතක් වෙද්දි ඇගම පනනැති
වේගෙන ආවා..

" අම්මේ අක්කා එක්කන් යන කට්ටිය ආවෝ

ගේ පිලිකන්නේ ඉදන් මාමගේ පොඩි එකා කෑ ගහන් කුස්සියට දුවන් යනවා කෙල්ල දැක්කේ
කාමරේ ජනේලෙන්..

" අනේ පහන් අයියේ දැන්වත් එන්නකෝ.. මාව බේරගෙන යන්න මට බෑ මේ මිනිස්සු එක්ක
යන්න..

කෙල්ල බිම දනගහන් පපුව ට ගහ ගත්තේ දරාගන්න බැරුවම..

sinhalaebooks.com

" සදී..

කුසුමා කාමරේට ආවේ කෙල්ලව එක්කන් එළියට යන්න.

" උඹ මක් කොරනවද මේ බිම පතබෑවිලා..නැගිටලා ඔය මීන පිදන් වරෙන් එළියට තවත් වක්කරනවා කඳුලු..

බලෙන්ම වගේ කෙල්ලව ඇදන් එළියට ආවේ කුසුමා බොරු දුක් මූනක් දගෙන කෙල්ලව තුරුල් කරන්..

" තෝනා මේ මගේ ඇස් දෙක වගේ.. අම්මා නෑ කියලා නෑ මගේ කුසෙන් වදපු ගානට මන් ආදරේයි
මේකි නැත්ත ත් බත් කටක් බඩෙන් පල්ලට යන් නෑ

කුසුමා හඬා වැටෙමින් කියද්දි කෙල්ලට මතක් වුනේ කී වේලක්නම් නොකා ඉන්න ඇද්ද. නංගිලාට බත් බෙදලා දීලා කෙල්ල කන්න එද්දි වලං වලට වතුර දලා ඇති දවස් කොච්චර තිබ්බද.. මෙහෙම රගපාන්න කුසුමට තිබ්බ හැකියාව ඉස්තරම් කියලා.

" සීදේවි දරුවා.. එන්න බලන්න

පිලිවෙලට ඇදන් හිටිය ඔසරියට කොණ්ඩේ ගෙඩියක් බැදන් හිටිය ගෑනු කෙනා නැගිටලා ඇවිත් සදීගේ අත් අල්ලගත්තේ කෙල්ල ඒ මූන දිහාවත් බැලුවේ නෑ.. බිම බලන් හිටියේ ඇස්වල උනන කඳුලු හංගගන්න උත්සහා කරමින්

" මොකක්ද නම දුවේ ඔයාගේ

" සදී

කෙල්ල තොල් හෙලෙව්වේ ඔලුව පහත් කරගෙනම

" එච්චරමද ..

" කියපන් කෙල්ලේ තෝනට සම්පූණර් නම
ලැජ්ජා නොවී

වීරේ අගමුල ඇල්ලුවේ වෙනසක් නොපෙන්වා
කෙල්ලගේ අකමැත්ත නොපෙන්වා

" සදීනා මනුදි වාසල ආරච්චි

" ම්ම්ම් හොද නමක්නේ තියෙන්නේ

sinhalaebooks.com

" ඔකිගෙ තාත්තා වැදගත් පවුලක නෝනා
ඒත් .. ඒවා දැන් කතා කරලා වැඩක් නෑ

මාමා කියන්න ගිහින් නවත්ත ගත්ත කතාව කෙල්ල හැම්දම කුසුමගෙන් කුණු බැනුම් වලින් අහගන්නවා..

" හරි එහෙනම් මේ ළමයා එක්කත් යන්නම් අපි..
පරක්කුත් වෙනවා.. කොළඹ වම යන්නත් ඕනිනේ

කෝට් එකක් දන් හිටිය මනුස්සයා නැගිටලා වැඩි හිනාවක් නැතිව කියද්දි කෙල්ලගේ කඳුලු අලුත් වුනා..

අවසාන වතාවට කෙල්ල කුසුමා දිහා බැලුවේ ඒ ඇස්වල තෙතක් බලාපොරොත්තු වෙන් ඒත් ඒ මූනේ තිබ්බේ ලොකු සතුටක්..

මාමත් සතුටින් ඇති.. හැමෝම සතුටින්
කමක් නෑ.. මාමලවත් දුකක් නැතුව ජීවත් වෙයිනේ

කෙල්ල කුසුමා ලගට නැගිටලා ඇවිත් කකුල් අල්ලලා වැන්දේ අවසන් වතාවට..

" අනේ පරිස්සමින් ඉදපන් මයේ මැණික උඹට වරදින් නෑ..

කුසුමා කෙල්ලව් බදගත්තේ මූනිච්චාවට කෙල්ල ඒක දන්නවා. මොකද කුසුමා ඒ ටිංගඩ කෙල්ලගේ කනට කෙදිරුවා.

" උඹ පැනලා එහෙම ඇවිත් තිබ්බොත් බලාගෙනයි.. දන්නවනේ මාමා ජීවත් වෙන එකක් නෑ උඹ එහෙම දෙයක් කරොත්..ගිය තනක ඉදපන් හොදින්..

ඒ වචන කෙල්ලගේ කනට විතරක් ඇහෙන්න කුසුමා මැතිරුවේ.

" යන්නම් මාමේ..

කෙල්ල දනගහලා වදිද්දි වීරේගේ ඇස්වල කඳුලු මතු වුනා මොනා වුනත් එක කුස උපන් සහෝදරීගේ දරුවනේ.. උණුවුනා කෙල්ල ගැන

" මට සමාවෙලා හිත හදන් ඉදපන් පුතේ

ඒ ටික වීරේ කිව්වේ හදවතින්මයි කියලා කෙල්ල දන්නවා.. හැමදේම කුසුමගේ පෙරත්තට සිද්දවෙන දේවල් කියලත් කෙල්ල දන්නවා..

sinhalaebooks.com

ගෙයි එවස්ස ලග බලන් ඉන්න නංගී මල්ලී දිහා කෙල්ල බැලුවේ උන්ගේ අනාගතේ වත් සාථ්ක වේවා කියලා ප්‍රාථ්නා කරමින්..

" අපි යමු දූව.

කෙල්ලව එක්කන් වාහනේට ගොඩවෙන්න යද්දි
වීරේ දූවන් ගිහින් රෙදි මල්ල ඩිකියට දලා බලන් හිටියේ ඇස් බොද කරගෙන

" එහෙනම් අපි ගිහින් එන්නම් වීරේ..
උවමනාවක් වුනොත් කතා කරන්න.. එහෙ නාවට කමක් නෑ දරුවා බලන්න අපි බලාගන්නවනේ.. ලමයා එක්ක ගනුදෙනු නවත්තන්න ඕනේ මෙතනින් පස්සේ.. මන් සල්ලී දෙන්නම් ඒවට..

වීරේ ඔලුව වැනුවේ කියන දේකට එකග වෙලා.. සල්ලී නැතුව විදින දුක වීරෙට එපා වෙලා තිබ්බේ ලමයි තුන්දෙනෙක් උස්මහත් කරන්න සොච්චමක් මදි.. මේක ඉල්ලමක් පෑදුනා වගේ..

" හොදයි මහත්තයා.. මගේ කෙල්ල බලාගන්න හොදට

කෙල්ල වාහනේ ඉදගෙන ජනේලෙන් ඇත මුහුද දිහා බලන් හිටියේ පහන්ගේ චායාව හිතේ ඇදගෙන.. ඒ ආදරේ මුහුදු පතුලේ හංගලා.. හිත වැල්ලේ තියලා මළ කඳක් ගානට ශරීරය පමණක් ඔහේ අරන් යද්දි..
ගාලු වෙරළ නොපෙනී යනකම් කෙල්ල ජනේලේ එල්ලිලා බලාන හිටියේ අවුරුදු 23ක ජීවිත පුවතත් ආත්මය වන් ප්‍රේමයත් තබා යන මුහුදුකරය අවසන් වතාවට නෙත් පුරා බලාගන්න..

වචන තුන හතරක් ඇරෙන්න කෙල්ල කොළඹට එනකම් ඔවුන් කිසිවෙක් එක්ක කතා නොකලා
කඳුලු හංගන් හදවතින් කෑ ගහලා ඇඩුවේ බේරගන්න පිහිටක් අයදිමින්.

" උඹ කොච්චර් බලන් හිටියත් පහනා ආය එන් නෑ
මේ පාර ඌ ගියේ මත්තාරම් .. එහෙත් ඌට පවුලක් තියනවලු කියන්නේ..

" අනේ නැන්දේ පච්කාර කතා නොකියා ඉන්නවද
පහන් අයියා එහෙම නෑ..

" උඹට තේරෙයි ඕකා බඩක් දීලා ගියපු දට.. අපේ මිනිහා දන්නවා ඕකගේ රගේ හැමතැනම ගෑනු
උඹ පරිස්සම් වෙයන් කෙල්ලේ.. අපිටනම් අමාරුවක් නෑ ඒත් උඹලෑ අම්මන්ඩිට වෙච්ච දේ උඹට වෙනවා දකින්න අපි කැමති නෑ..

sinhalaebooks.com

කෙල්ලට මතක් වුනේ දවස් දෙක තුනකට කලින් හැන්දෑවේ මුහුද ලගට වෙලා බලන් ඉද්දි දෑල් අදින ගමන් සයිමා නැන්ද කියපු කතාව..

ඒ වෙද්දි පහන් මුහුදු ගිහින් සති 2 ක් හරිනම් එන්න කල් ඒත් කෙල්ලගේ හිත පිලිගන්න කැමති වුන් නෑ පහන් ගැන නරකක්.. සැක කරන්න ඕන හැම තැනම කෙල්ල පහ්න්ට ආදරේ කලා ..

" පහන් අයියේ ඔයා එනවා නේද සඳී හොයාන
ඔයා එහෙම නෑ.. සඳී ඔයා එනකම් බලන් ඉන්නවා.

කෙල්ල වාහනේ වේගෙට පහුවෙන ගස් කොලන් දිහා බලන් මිමිනුවා..

" සමදරා ඔය ළමයට බඩගිනිද අහන්න

රණබාහු වාහනෙ ඩ්‍රයිවින් කරන ගමන් පිටිපස්ස බලලා එහා පැත්තේ හිටිය නෝනට කිව්වේ කෙල්ලගේ හෝන්දු මාන්දු ගතිය මූනෙන් පෙනුන නිසා..

"දුව කන්න මොකුත් අරන් දෙන්නද..

ඒ හඬ කෙල්ලට ඇහුනේ හරී ආදරණීය ව.. මාලාට තිබ්බ හිත් නිවන පෙනුම වගේම තිවුන කටහඬට කෙල්ල ට ආස හිතුනා..එතරම් ආදරෙන් කතා කල කෙනෙක් වැල්ලෙ නොහිටිය එකත් ඒකට හේතුවක් වෙන්න ඇති

" දැන් එපා නෝනා

ඒ වචන ඉස්සරහා නිහඬව ඉන්න හිත් දුන්නේ නැති හින්දම කෙල්ල අමාරුවෙන් වචන දෙකක් පිටකලා.
ඉන් එහා කතාවකට රණබාහු යුවල නොආවෙන් කෙල්ල ඇස් පියාගත්තේ බඩගින්නක් තියා වතුර පිපාසයක්වත් නොදැනෙන තරමට හිත ඇතුලේ ඇවිලෙන ගින්නෙන් දැවෙද්දි.

" බහින්න දුව..

කෙල්ල ට ඇහැ පියවුන ටිකට ඇවිත් තිබ්බේ රණබාහු නිවසට

වාහනෙන් බිමට බැහැලැ වට පිට බැලුවේ කවදාවත් දැකලා නැතිතරම් විශාල ගෙයක් හරියට මාලිගාවක් වගේ. ඒත් සතුට අහලකවත් නෑ මහ මූසල කමක් දැනුනේ..

" අද ඉදන් මේ තමා ඔයාගේ ගෙදර.

රණබාහු නෝනා කෙල්ලව අල්ලගෙන හිනාවෙලා කිව්වේ කෙල්ලගේ මූනේ තිබ්බ නොසන්සුන් ගතිය දැකලා.

sinhalaebooks.com

" අම්මා ඇයි මෙච්චර පරක්කු වුනේ"

ගේ ඇතුලේ ඉදන් මිදුලට දුවන් ආවේ පුංචි කොට කලිසම් කැල්ලට පටිදපු සිහින් බැනියමකින් සරසුන කෙල්ල රණබාහු නෝනට ආම්මා කියා කතා කලායින් කෙල්ල හිතුවේ ඒ රණබාහු පවුලේ දියණිය ක් කියලා.

" අපි මේ අක්කාව එක්කන් එන්න ගියා"

රණබාහු නෝනා කෙල්ලව පෙන්නලා කියද්දි ඇයත් කෙල්ල දිහා බැලුවේ නුපුරුදු බැල්මක් එක්ක..

" කව්ද අම්මා මේ ..

" යන්කෝ ඇතුලට මේ ලමයටත් තෙහෙට්ටු ඇති

රණබාහු නෝනා කෙල්ලවත් ඇදන් ඇතුලට යන්න ගියේ ලොකු කතාව මගඇරලා.

" නීලා මේ දරුවට කාමරයක් ලෑස්ති කරලා දෙන්න

" හා නෝනා

දුවන් ආව මැදි වයසෙ ගෑනු කෙනා අත දෙක පිහදන ගමන් කෙල්ල දිහා බලන් හිටියේ කටපුරා
හිනාවක් හිනාවක් තියාගෙන

" යන්න දුව ටිකක් මහන්සි අරින්න කාමරේට ගිහින්

කෙල්ල ඔලුව වනලා නීලා පස්සේ අඩි තිබ්බේ මහ විශාල ගේ ඇතුලේ සිනිදුවට කකුල් වලට පෑගෙන ටයිල් උඩිල් පරිස්සමට ..

" අම්මේ මොකක්ද ඔයාලා මේ කරන්න යන්නේ

" කෑ ගහන්න එපා දසුනි.. අර ලමයට ඇහෙයි

රණබාහු නෝනා සෝෆාවට වැටිලා ඉදගත්තේ දසුනිට රවලා.

" කව්ද අම්මේ ඒ.. ඇයි මෙහෙ ගෙනාවේ..

" අයියට බන්දලාවත් දෙන්න.. මේ ප්‍රශ්නෙට විසදුමක් එපැයි..

" මොකක්.. අම්මලාට පිස්සුද.. තමන්ගේ ලමයවත් තමන්ගේ කියලා පිළිගන්න අකමැති අයියට මේ අහිංසක කෙල්ලක් බන්දන්න හදන්නේ.. සිංහ කුඩුවට හාවෙක් දැම්මා වගේ

sinhalaebooks.com

තියෙයි.. මේ කෙල්ලව මරලා දයි .. අනේ අම්මේ ප්ලීස් මේ ළමයා ගෙනාව තැනකට ගිහින් දන්න..

දසුනු බයවෙලා වගේ කියාන ගියේ සමදරාගේ හිත යන්තන් ගැස්සිලා යද්දි..

දසුනි කියන කතාවේ ඇත්තක් තියනවා කියන්න
සමදරා දන්නවා..

" දසුනි එහෙමයි කියලා මොකුත්ම නොකර බලන් ඉන්නද.. අර ළමයා බලාගන්න කෙනෙක් එපැයි.

" ඒත්.. අයියා පිළිගත් නෑ ඒ අයියගේ දරුවා කියලා
දැක්කනේ එද හොස්පිටල් එකේ යකා නටපු හැටි

" ඒ අර හැතිරිගේ වැඩ හින්ද.. ඔයාගේ අයියා ඔච්චර දරුණු වුනේ.. ඕකි ගියේ කොල්ලගේ ජීවිතේම කාලා හොදක් වෙන්න එපා සාපවෙන්න ඕනෙ..

සමදරා පපුවට අත තියන් හඩා වැටුනේ තමන්ගේ ලේලිට සාප කරමින්.. ඒ දරුවෙක් එක්ක තමන්ගේ එකම පුතා තනිකරලා ගිය එකට..

" දැන් අම්මලා මේ ළමයට මොකද කරන්න හිතන් ඉන්නේ..අයියනම් කීයටවත් ආයි ගෑනියක් ලංකරගනී කියලා හිතන්න බෑ එයාට අපිව දැක්කත් මාරාවේශ වෙනවා දැන්..

" මේ ළමයා පොඩි දරුවව බලාගනී.. ඒකත් මේ වෙලාවේ සහනයක්..ඩැඩී කිව්වෙත් දරුව ටිකක් ඈත් කරලා තියමු කියලා අයියගෙන්..ඔය තරහා නිවෙනකම්..

" අනේ මන්ද අම්මේ මටනම් ඇතිවෙලා දැන්..

දසුනී නැගිටලා කාමරේට යන්න හැදුවේ එකින් එක වැඩිවෙන ප්‍රශ්න එක්ක විසඳුම් හොයන්න බැරිව

" කෝ දැන් අයියා..දසුනි

" මිම් අන්න රෝහිත්ලා එක්ක හොදටම බොනවලු අද ඔෆිස් ගිහිනුත් නෑ..

ඉහලට ගත්ත ලොකු හුස්මක් පහතට හෙලමින් සමදරා පුටුවට හිස තියාගත්තේ වේදනාවෙන්

දවසක් ඇතුලේ ජීවිතේ කනපිට පෙරලොලා සඳී තාමත් ඉන්නේ ගල් පිළිමයක් ගානට..නිලා කාමරේ ඇඳට සුදු බෙඩ් ශීට් එලලා හදන දිහා කෙල්ල බලන් ඉන්නේ බෑග් එකත් තුරුල් කරන්

sinhalaebooks.com

" හරි මිස්

කෙල්ලට නීලගේ හඬ නෑසෙන තරමට හිටියේ කලපනාබරව

" මිස්.. මිස්..

" ආ ..

කෙල්ල ගැස්සිලා නීලා දිහා බලද්දි නීලා හිනාවුනා

" මිස් බයවෙලා.. මේ නෝනලා හරි හොදයි මිස්
බයනැතුව ඉන්න..

කෙල්ලට නුහුරුයි මිස් කියන එක.. ඒකට කෙල්ලට ලැජ්ජා හිතුනා..

" නැන්දේ මට මිස් කියන්න එපා..

" අනේ නැතුව මට නෝනා බනී.. නෑදකම් කියන්න යනවා කියලා..

කෙල්ල හිනාවුනේ යන්තමට..

" මිම් හරි හරි බෑග් එක තියලා ඇදුම් මාරු කරගන්න.. මත්‍යනවා කෑම ලෑස්ති කරන්න
පස්සේ කතා කරමුකෝ..

නීලා පිටවෙලා යද්දි කෙල්ලට පාලුවක් තනිකමක් දැනුනා.. නීලා තමන්ගේ කෙනෙක් වාගේ
කුලුපගයිකියලා හිතුනා.

හිතට සැනසීමක් නැතත් සනීපෙට දැනෙන සැප මෙට්ටේ උඩ කෙල්ලට ඇස් පියවුනේ
පැඳුරක් එලත් නිදගත්ත ජීවිත කාලේ පුරාවට සනීපයක් දැනුන එකම දවස නිසා

කෙල්ලට ඇහැරුනේ හෝරා කීපයක් පහුවෙලා මහත්සියටත් එක්ක නින්ද ගියා.

කෙල්ල ඇහැරිලා බලද්දි කිසිම සද්දයක් නැති හින්ද වහලා තිබ්බ දොර ඇරත් ඔලුව දලා
බැලුවේ ජේන මානේ කවුරුහරි ඉන්නවද බලන්න..

ඇඟ ටිකක් හෝදගන්න කෙල්ලට ඕනේ.. උදේ ඉදන් ඇදගෙන ඉන්න ඇඳුමෙන්මයි තාමත් .

ඇතින් දැක්කේ නීලා මේසෙට කෑම අරිනවා..
හෙමීට දොර ඇරත් කෙල්ල ගියේ නීලා ලඟට

" නැන්දේ මට නා ගන්න තැනක් පෙන්නවද

sinhalaebooks.com

" ආතේ මිස්.. මන් දෙතුන්පාරක් බැලුවා මිස්ට හොදටෝම නින්ද ගිහින් කුද්දන්න ලෝබකමට ආවා.. ලොකු නෝනා කිව්වා මිස් ඇහැරුනාම කෑම දෙන්න කියලා..

කෙල්ල හිනාවුනේ එච්චර සැරට ගිය නින්ද ගැන ලැජ්ජා හිතුන නිසා..

" ඇඟට මහන්සී මැන්දේ ඒකයි ඇහැ පියවුනේ

" ඒකට කමක් නෑ මිස්.. යන්කෝ මන් බාතෲම් එක පෙන්නම්..

කෙල්ලව එක්කන් ගියේ නවීන පන්නේ නානකාමරේකට.. කාමරේට දෙවෙනි නෑ ඒ තරම් ලස්සනයි කියලා කෙල්ලට හිතුනා..
නීලා කෙල්ලට හැමදේම පෙන්නලා කියලා දුන්නේ
පිළිවෙලට කෙල්ලත් හැම්දේම දිහා බලන් ඉදලා හිස වැනුවේ ඒ වා යම්තරමින් මතක තියන්..

" එහෙනම් මිස් නා ගන්න මන් යන්නම්
මොනාහරි ඕන වුනොත් කතා කරන්න මට

නීලා පිට වෙලා ගියාම කෙල්ල යාන්තමට මතක තියාගත්ත ෂවර් එක ඇරලා හිතේ හැටියට වතුර මල යටට වෙලා හිටියේ ගතේ විඩාවට් එහා හිතේ බර සැහැල්ලු වෙනකම්..

" පහන් අයියේ ඔයා ආවද මන් හොයාන..
මාමා බැනලා පන්නන්න ඇති.. අනේ මට ඉගිළිලා ගාලු එන්න ඇත්තන් දැන්.. මේ හැම්දේම මට නුහුරුයි. මේ ජීවිතේ මට අමාරුයි..

පැයක් විතර කෙල්ල වතුර යටට වෙලා ඇඩුවේ
හිතේ හැටියට.

" මිස් කෑම කන්න එන්න

තෙත කොණ්ඩේ වතුර මාත්තු කර කර කාමරේට යන කෙල්ල දැකලා නීලා මේසෙට අඩගැහුවේ කෑම කන්න..

කෙල්ල මේසෙන් වාඩි වුනේ ටවල් එක ඔලුවේ බැදන්..

" මිස් මේ රෑ වෙලා කොණ්ඩේ තෙමුවද..
හෙම්බිරිස්සාවක් හැදෙයි වතුරත් අලුත්නේ.
හොදට වේල ගන්න ඕනේ නිදගන්න කලින්..

නීලා ගැන කෙල්ලට දැනෙන්නේම හිතවත්කමක්
නීලාගේ වචන වලට කෙල්ලට ආසයි..

sinhalaebooks.com

" නැන්දේ කෝ නෝනලා

" එයාලා කාමරවල ඇති..මේ ගෙදර වෙනදට හිනා සද්දේ ඇහෙන්නේ මේ වෙලාවට..ඒත් අද

නීලා හුස්ම හෙලුවේ වේදනාවෙන් කියලා කෙල්ලට තේරුනා.. මොකක් දෝ ලොකු ප්‍රශ්නයක් තියන බව කෙල්ලට සම්දරාගේ මූණෙන් ආව වෙලේ ඉදන් තේරුනා..

" ඒ ඇයි නැන්දේ..

කෙල්ල ඉදියාප්ප දෙකක් පිගානට ද ගත්තේ කන්න ඕනැවට නෙවෙයි නීලගෙන් විස්තර අහගන්න තිබ්බ උවමනාවට

" ලොකු බේබිට කරදයක් වුනානේ එකෙත් හැමෝටම ප්‍රශ්න ගොඩක් ආවා මිස්..

ලොකු බේබි කියන්නේ තමන් ව බන්දන්න එක්කන් ආව කෙනාද කියලා කෙල්ලට් සැකයි

" ලොකු බේබි කියන්නේ කව්ද නැන්දේ

කෙල්ල ඇහුවේ නීලව කතාවට අල්ලගෙනම

" මෙහේ එකම පිරිමි දරුවා. බැඳලා හිටියේ.. ඒ මිස් හරි සැරයි.. අපේ ආක්ෂා මිසුත් හරියට මිස් වගේ.. මට දැක්ක ගමන් එහෙම හිතුනා එත් කිව්වේ නෑ.. ලොකු නෝනලට තරහා යයි කියලා

" කෝ නැන්දේ එයා ඉතින්.

කෙල්ල ඇහුවේ නීලට කිට්ටු වෙලා

" ලොකු බේබිවයි දරුවයි දලා යන්න ගියා අලුත් මහත්තයෙක් එක්ක.. එදා ඉදන් අපේ ලොකු බේබි යකා තමා.. කිසි කෙනෙක් එක්ක කතාවක් නෑ බැලුවත් ඇති මරන්න එනවා..

කෙල්ල කටට ගත්ත ඉදියාප්ප කෑල්ල කැස්සට ආවේ යකෙක්ට බන්දල දෙන්නද මේ මිනිස්සු තමන්ව උස්සන් ආවේ කියලා හිතෙද්දි.

" අනේ මිස් හිර කරගත්තා නේද.. ආ වතුර බොන්න..මාත් කියවනවා ඔහේ.. කෑම කද්දි සමාවෙන්න මිස්

" ඒකට කමක් නෑ නීලා .. මට කැස්සක් ආවා

කෙල්ල වතුර ටිකක් බීලා නැඟිටලා කාමරේට ආවේ හිත ඇතුලේ ප්‍රශ්න එක පිට එක උත්තර අහද්දි.

sinhalaebooks.com

දෙයියනේ මත් මේ වැටුනේ මොන අපයකටද
කවුද ඒ යක්ෂයා.. මාව ඒ මිනිහට දෙන්නද හදන්නේ .. එතකොට කෝ ඒ දරුවා..

අනේ මට මේ මොකුත් තේරෙන් නෑ මාව පිච්චෙනවා වගේ.. මට බයයි

ඇඳට වෙලා අහට මෙහෙට ඇඹරි ඇඹරි කෙල්ල කල්පනා කලේම පැනලා යන්න විදියක්..
දන්නෙම නැතුව නින්ද අහලකටවත් ආවේ නැති නිසා පැය කීපයක් ගිහින් .. බිත්තියේ
ඔරලෝසුවේ මධ්‍යම රාත්‍රියත් ඉක්මවලා තියනවා කෙල්ල දැක්කේ කාමරේ ලා එළියෙන්..

" මට වතුර තිබහයි.. දිව ගිලෙන්න තරම්

කෙල්ල ඇදෙන් බැස්සේ වතුර ටිකක් බොන්න කුස්සියට යන්න .

දොර ඇරලා එළියට ආවත් විශාල ගෙයි හැමතැනම අඳුරෙන් වැහිලා කෙල්ල දන්නෙත් නෑ
ලයිට් එකක් දගන්නත්.. බිත්තිය අල්ලන් හිට්ජේ අනුමානෙට කෑම කාමරේ ලඟ තිබ්බ
කරාමේ හොයන් කෙල්ල ගියේ හෙමින් හෙමින්..

" ම ම පි_ස්_සෙ ක්.. ඇයි උ ඹ ම ට මෙ හෙ ම
ක රේ..

කෙල්ල ගැස්සුනා කෙඳිරි හඬකින් කව්ද කියවනවා.. කෙල්ලට මොකුත් පේන්නෑ ඒත්
කරුවලේ කෑම කාමරේ මේසේ ලග බිම වැතිරිලා ඉන්නවා කියලා කෙල්ල දැක්කා..

" දෙයියනේ.. ක ව් ද..

බය වුන පාරට ලග තිබ්බ පුටුවක හැප්පිලා විසිවෙලා ගිහින් වැටුනේ බිම හිටිය මනුස්සයා
ගාවට
කෙල්ල බිම බඩගාන් නැගිටගන්න හැදුවත් බෙල්ල ලගින් දැනුනේ දැඩි ග්‍රහනයක්..

" මරනවා.. ඔක්කොම මරනවා මන්
ලඟට එන්න එපා..

" අනේ මාව බේරගන්න අනේ ලොකු නෝනා.. යකෙක් යකෙක්.. අනේ නැත්දේ මාව
බේරගන්නකෝ ..

" අහ් බෙල්ල මගේ .. අනේ මට හුස් ම ගන්න බෑ

කෙල්ලගේ බෙල්ල හිරවුනේ ගොරෝසු අත් දෙකකට. කෙල්ල හිතුවෙම යකෙක් කියලා බයට
වෙව්ලන්න ගත්තේ කෑ ගහ්ගන්න බැරිවෙද්දි

එකපාරම මුලු ගේම ලයිට් ඔන් වෙද්දි කෙල්ල දැක්කේ ලොකු රැවුලක් වාවගත්ත ඇස් රතුම
රතු මිනිහෙක් කෙල්ලගේ බෙල්ල අල්ලන් ඉන්නවා

sinhalaebooks.com

" අනේ අම්මේ... මාව මරනවා..

බෙරිහන් දීගෙනම කෑ ගැහුවේ ඇස් දෙක පියාගෙනම

" දවාන් අත ඇරපන් මිනිහෝ ඔය ළමයව..

කෙල්ල ඇස් අරිද්දි හිටියේ රණබාහු නෝනා ලඟ

" අනේ නොනා.. මාව බේරගන්න..

" හරි හරි.. දැන් බය නැතුව ඉන්න.. නීලා මේ ළමයව ඇතුලට එක්කන් යන්න..

කෙල්ලව වත්තත් කරන් නීලා කාමරේට එක්කන් ගියේ කෙල්ලගේ බෙල්ල තාමත් ඇදුම් කද්දි..
උදේම සදීනා ඇහැරුනේ රණබාහු නිවසේ ගෙවීන පළවෙනි රාත්‍රී යම හිතුවට වඩා බිහිසුනු අත්දැකීමක් එක්ක .

අම්මේ මොකක් ද ඒ වුනේ දෙයියනේ.. කව්ද ඒ මිනිහා.. මන් හිතුවෙම බෙල්ල කඩයි කියලා

කෙල්ල ආපහු මතක් කරලා බැලුවේ ඒ මූනේ දැකපු චායාව ..

ඇඳෙන් බැහැලා ඇවිත් මේසේ ලඟ තිබ්බ කණ්ණාඩි මේසෙන් කෙල්ල බැලුවේ දැවිල්ලක් එන බෙල්ල දිහා.

" අනේ හොදටම සීරිලා.. තුවාල වෙන්නම
මේ ගෙදර ඉන්නේ යක්කුද කොහෙද..

කෙල්ල එහෙමම දොර ඇරන් නීලා හොයාන කුස්සිය පැත්තට ගියේ බයෙන් බයෙන්
කෙල්ල කුස්සියට යනකම්ම සාලෙට කවෘත් නාවේන් හිතට සැහැල්ලුයි..

" නැන්දේ..

" ආනේ මිස් නැගිට්ටද.. ඉන්න මන් තේ එකක් හදන්නම්

කෙල්ල නීලාට එහා පැත්තෙන් ගිහින් කරාමෙන් විදුරකට වතුර එකක් අරන් බීගෙන ගියේ රෑ පුරාම පිපාසෙන් හිටිය නිසා..

" නැන්දේ කව්ද ඊයේ මාව මරන්න හදපු මනුස්සයා

sinhalaebooks.com

කෙල්ල විදුර තියන ගමන් නීලා ගෙන් ඇහුවේ ඒ අර කිව්ව මේ ගෙදර ලොකු බේබි ද කියලා හිතේ තිබ්බ සැකේටත් එක්ක..

" ඒ අපේ දවාන් බේබි.. මේ ගෙදර එකම පුතා..රණබාහු නෝනගේ පන තමා ඒ..

නීලා කිව්වේ පිගානක් අරන් පිහදන ගමන්. නීලාගේ මූනේ තිබ්බ දුක්මුසු බැල්ම කෙල්ල දැක්කා

" ඒ මනුස්සයෙක් නෙවෙයි යක්ෂයෙක්නේ
මගේ බෙල්ල තුවාල වෙනකම් අල්ලන් හිටියා
නැන්දේ ..

කෙල්ල නීලාට පෙන්නුවේ බෙල්ලේ තුවාල

" අනේ හීරිලා නේද..මන් මොනාහරි ගාන්නම් දවල් වෙලා..

නීලා කෙල්ලගේ බෙල්ල පිරිමැදලා කිව්වේ අහක බලන්..

" ඇයි නැන්දේ ඒ එක්කෙනා එහෙම වෙලා තියෙන්නේ

" දවාන් බේබි බැඳපු නෝනා නිසා තමා .. නැත්තන් මේ ගෙදර හිටිය හොඳම කෙනා ලොකු බේබි..කවදවත් හිත රිදෙන වචනයක් කියන්නෑ අපිටවත්.. අර නපුරු මිස් ඇවිත් අපේ බේබිව යකෙක් කරා..

කෙල්ලට ඉන් එහා මුකුත්ම නීලගෙන් අහන්න ගියේ නෑ..යන්තමට රණබාහු ගෙදර ප්‍රශ්න ටික කෙල්ල තේරුම් ගත්තා නීලා හින්ද..

එතකොට මේ මිනිස්සු ඒ පිස්සු යක්ෂ පුතාට මාව් බන්දන්න හදන්නේ නම්බුව බේරගන්න ද නැත්තන් වෙන මොකටහරිද

අනේ මට මේ මුකුත් තේරෙන් නෑ..

" දවා න්.. ඔහොම නැවතියන්..

රණබාහු මහත්තයගේ කට දෝංකාර දීලා සද්දෙට ඇහෙද්දි නීලා කඩන් බිදන් සාලෙට දිව්වා.. කෙල්ලත් ඒ පස්සෙන් ගියේ සාලේ පැත්තට

" ඇයි

" කොහෙවත් යන්නෑ උඹ අද. ලෑස්ති වෙයන් හොස්පිටල් යන්න

sinhalaebooks.com

රණබාහු මහත්තයා නීලා ලෑස්ති කරලා තිබ්බ තේ මේසෙන් ඉදගන්න ගමන් සැරට කිව්වේ දවාත්ට

කෙල්ල බැලුවේ ඒ මූන දිහා.. රෑ කලුවර හින්ද හරියට මනුස්සයාවත් පෙනුන් නෑ..

" මෙයා ද මේ යක්ෂයා.. මූන පුරා රවුල ත් වවන්.. පිස්සෙක් වගේ.. රණබාහු මහත්තයගේ පුතෙක් කියන්නත් බෑ..

කෙල්ල බිත්තිය මුවා වෙලා මුමුනගත්තේ තමන්ටමයි.

" මන් කොහෙවත් යන් නෑ..

" අයියා මේ තිකත් සතෙක් වෙන්න එපා.. ඒ ළමයා ඔයාගේ .. ඔයා යන්න ඕනේ හොස්පිටල් එකට දරුවා ගන්න..

" මගේ ළමයි නෑ.. ඒකි වටේ ගිහින් හදගත්ත එව්න් මට එපා..

" ඕක උඹ කලින් කියන්න එපැයි ඒකිට ළමයා බඩට ආව ගමන්.. එතකොට උඹ ළමයා උඹේ කියලානේ කිව්වේ..

රණබාහු ඒ ටික කිව්වේ දවාත්ගේ ඇස් රතු වෙද්දි

" මට ඕන්නැති ළමයෙක් නෑ.. තොපි ගිහින් ඔය ළමයව මරලා දපියව්..මට කියන්න එන්ඩ එපා

" බල්ලෝ..කට වහපන්

රණබාහු පැනපු ගමන් දවාත්ගේ කත හරහා ගැහුවේ දසුනි ඇස් වහගත්තේ අහක බලන්

දවාත් කේත්තිය පිට කරේ මුලු තේ මේසෙම අත්දෙකෙන් බිමට තල්ලු කරලා දලා.. තේපෝච්චි පිගන් මහ සද්දෙට බිම වැටෙද්දි සදීනා බිත්ති පිටිපස්සට වුනේ ගැහි ගැහී

" තිරිසනා .. කොහෙදෝ යන සක්කරවට්ටම් කරේ එල්ලන් උඹ අපේ නම්බුව කෑවා අවලන් බල්ලා.. ඒ ඔක්කොම හා කියලා මූගේ ළමයා හදගෙන මූට ජීවිතයක් දෙන්න ගියාම මේකා කතා කරන්නේ තිරිසනෙකුටත් අන්ත විදියට..

" අනේ මහත්තයා ඕක නවත්තන්න දැන්..

" නෑ සමදරා දැන් මට සැකයි මූ මගේ ළමයෙක්ද කියලා..

දවාත් අත් මිට මොළවන් හිටගෙන වෙව්ලුව්වේ කේත්තිය දරාගන්න බැරුව..

sinhalaebooks.com

" මහත්තයා ඔයා මොනවද මේ කියන්නේ

ඇයි පුතේ ඔයා මේ අම්මට මෙහෙම දුක් දෙන්නේ..
කවදාවත් තාත්තා මට ඔහොම කියලා නෑ.. උඹ හින්ද අද මත් අහගන්න ඕන කැතම වචනෙත් අහගත්තා..

රණබාහු නෝනා අඬන් ගිහින් කොල්ලගේ අතේ එල්ලෙද්දි සදීනගේ ඇස්වලට කඳුලු ආවේ නිකම්ම..

මොනදේ වුනත් රණබාහු නෝනා කෙල්ලට කරුණාවන්තයි.. හිත රිදෙන වචනයක්වත් කිව්වේ නෑ. ඒ හෙම හොඳ කෙනෙක්ට මෙහෙම දුක් වෙද්දි කෙල්ලට දුක හිතුනා..

ලොකු මිනිස්සු න්ට සල්ලි තිබ්බට සතුටක් නෑ.. අපිට සල්ලි නැති වුනත් වේලක් ඇර වේලක් කාලහරි වැල්ලේ මිනිස්සු එක්ක සතුටින් හිටියා..

බලන් ගියාම ලොකු සල්ලි කාරයෙක් වෙනවා කියලා හිතන් අපි හීන දැක්කෙ අපරාදේ කියලා හිතෙනවා..

කෙල්ල හිතුවේ අඬා වැටෙන රණබාහු පවුලේ අය දිහා බලාගෙනම.

" නීලා මේ ටික අස් කරන්නකෝ

දසුනි ඇවිත් නීලට කිව්වේ හැමෝම කාර වලට යන්න ඇරලා..

දවාන් අතට අහුවෙන හැම්දේම පොලවේ ගහගෙනම කාමරේට ගිහින් සද්දෙට දොර වහගන්න දිහා සදීනා බලන් හිටියේ හොරාට

" බඩුමුට්ටු පලිද.. අපරාදේ එවා..

කෙල්ල හොරාට මිමුනුවා

" මිස් බයවුනාද.. මේ ගෙදර හැමදම ඔහොම තමා ලොකු බේබිගේ ප්‍රශ්නේ වුන ද ඉඳන් පිඟන් බඩු ගෙනාව හතර පාරක්.. එක පාකර් ටීවි එකත් පොලවේ ගැහුවා.. දවාන් බේබිට තරහා පාලනේ කරගන්න බෑ..

නීලා කුස්සියට ගිහින් කොස්සත් අරන් ආවේ සදීනට කියන ගමන්..

" මාත් උදව් කරන්නම් නැන්දේ

sinhalaebooks.com

කෙල්ලත් සාලෙට ඇවිත් වැටිලා තිබ්බ පිඟන් කෑලි එකතු කලේ දලක පැටලුන මාලුවෙක් ගානට තමනුත් අරන් ඇවිත් දපු ප්‍රශ්න ගොඩ ගැන හිතන ගමන් .

ඇත්තටම මේ මිනිස්සු දහක් ප්‍රශ්න තියන් පැත්තක හිටිය මාව ගෙනත් දන් කරන්න හදන්නේ මොකක්ද . මේ ගොල්ල හොදටම දන්නවා එයාලගේ පුතා කසාද බදිනවා තියා තමන්ගේ දරුවත් එපා කියනවා කියලා එහෙම එකේ මාව ගෙනාවේ මොන එහෙකට ද

වෙලාවකට හිතෙනවා කෙලින්ම අහන්නත්
එතකොට මට යන්න දෙයිනේ.. මන් කියනවා මට ඉන්න බෑ කියලා .. යන්න දුන් නැත්තන් හොරෙන් හරි පැනලා යනව..

යක්ෂයෙක් වගේ මිනිහෙක් ලග මනුස්සයො කොහොමද ඉන්නේ.. එයාලටවත් ඉන්න බැරිකොට මන් කොහොම ඉන්නද.. ඕනම මෝඩයෙක්ට ඒක තේරෙනවා

මන් යනවා පහන් අයියා ලගට කෝහොමහරි එයා මන් එනකම් බලාන ඇති.. මාව හොයනවා ඇති
පව්.. මේ යක්ෂ බංගලාවේ මට තවත් ඉන්න බෑ

" සදීනා ..."

කෙල්ල ගැස්සුනේ රණබාහු තෝනගේ හඩට
කෙල්ල ලගට එනකම් දැක්කේ නෑ රණබාහු තෝනා..හිතින් බැන බැන කෙල්ල හිටියේ ඔක්කොටම..

" තෝනා "

" හොද ඇදුමක් දන් ලෑහැස්ති වෙන්න අපි දැන් ගමනක් යන්න ඕනේ "

කෙල්ලට හිතුනේ ආපහු ගාලු එක්කන් යන්න කියලා..

" තෝනා මාව ගෙදර එක්කන් යන්නද.

කෙල්ල ඇහුවේ හිනාවෙලා..ඒත් රණබාහු තෝනාගේ මූනේ වෙනසක් නෑ අඳුරු පෙනුමක් තිබ්බේ කෙල්ලගේ හිනාව නැතිවුනා ඒක දැකලා

" නැහැ සදීනා අපි හොස්පිටල් යන්න ඕනේ

කෙල්ල ගේ බලාපොරොත්තු එහෙමම නැතිවෙලා ගියා .. ඉන් එහා මොකුත් නොකියා කාමරේට ගියේ ඇස්වල කඳුලු එකතු වෙද්දි..

sinhalaebooks.com

කෙල්ලවත් දගෙන වාහනේන් ප්‍රයිවට් හොස්පිටල් එකකට රණබාහු නෝනා ගියේ වැඩි කතාවක් නැතුව. සදීනත් කිසිම දෙයක් ගැන කතා නොකලේ උදේ සිද්දියත් එක්ක රණබාහු නෝනා ඉන්නේ හිත් රිද්දගෙන කියලා දන්න නිසා.. ඒත් ඇය මෙහෙම තනියම තකහනියක් ආවේ ඇයි කියලා කෙල්ලට හිතාගන්න බෑ

නෝනට අසනීපයක්වත් ද.. මට අහන්නත් හිතෙනවා ඒත් බයයි..කමක් නෑ ඕන එකක් බලමුකෝ

කෙල්ල පාඩුවේ හිටියා සද්ද නොකරම .කොළඹ වටේ කැරකෙනවා වගේ කෙල්කට හිතුනේ වාහනේ පාරවල් වලින් හරව හරව යද්දි..
පැය භාගෙක විතර ගමනකින් පස්සේ ලොකු බිල්ඩින්ග් එකක් ලග වාහනේ නතර කරලා රණබාහු නෝනා බහිද්දි කෙල්ලත් වාහනෙන් බැහැගත්තේ ඒ පිටිපස්සෙන්ම

" බණ්ඩාර වාහනේ පාක් එකෙන් දලා ඉන්න අපි කෝල් එකක් දෙන්නම්

රණබාහු නෝනා වාහනේ ඩ්‍රයිවර් ට කියනකම් කෙල්ල බලන් ඉදියේ පස්සට් වෙලා

" අපි යමු සදීනා..

කෙල්ල සමදරා පස්සෙන් වැටුනා.. ලොකු බිල්ඩින්ග් එකේ කොරිඩෝ දිගේ ගිහින් වීදුරු දොරක් ඇරන් සමදරා ඇතුල් වුනේ කෙල්ලත් ඒ පස්සෙන්ම එද්දි

" මේ දැන් කොච්චර දුවන් ආවද අප්පා ..නවතින් නැද්ද කකුලත් රිදෙනවා..

කෙල්ල කකුල් දෙක අල්ල අල්ල සමදරා පස්සේන් ගියා..

" සදීනා මෙතනින් වාඩිවෙලා ඉන්න . මන් කතා කරන්නම්

සමදරා කෙල්ලට පෙන්නුවේ සෝෆා සෙට් එකක් ඒක සදීනට ඉගේ මලක් පිපුනා වගේ එක දිගට සෑහෙන දුර ආවා පඩි නැගලාම කකුල් රිදෙනවා..

කෙල්ල වාඩි වුනේ වට පිට බල බලම.. එහාට මෙහාට දුවන මිනිස්සු අස්සේ සුදු පාට කෝට් දගත්ත ඩොක්ටස්ලා වගේම නසර්ලා දිහා කෙල්ල බලන් හිටියේ ආසාවෙන්..

සමදරා ගිහින් කවුන්ටරේ හිටිය කෙනාගෙන් මොනාද අහලා වේගෙන් ගිහින් ලගම තිබ්බ ලොකු කාමරේට ඇතුල් වෙන දිහා කෙල්ල බලන් හිටියේ..

පැයකට විතර පස්සේ සමදරා එළියට ආවේ අත් දේකේ තිල්පාට පැතල් එකක ඔතපු පුංචි බබෙක් එක්ක..

sinhalaebooks.com

ඇතින් එන සමදරා දැකලා කෙල්ල පුටුවෙන් නැගිට්ටේ අතේ හිටියේ නොනැවතී අඩන දරුවා දිහා බලාගෙනම..

" දෙයියනේ මේ එතකොට අර යක්ෂයගේ ළමයද
හදිසියේ නෝනා ආවේ එයාව ගන්න ද.. කෝ එයාගේ අම්මා..

කෙල්ලගේ හිතේ ප්‍රශ්න ගොඩයි..

" සදීනා ගන්න මෙයාව.. අඩනවා එයා.. හුරු නැතුවද කොහෙද මාවා..

කෙල්ල ලඟට ඇවිත් සමදරා ළමය කෙල්ලගේ අතින් තියද්දි කෙල්ල ගැස්සිලා ගියා..

කිරි සුවඳ එක්ක ආව පුංචි කෙඳිරිය කෙල්ල බැලුවේ පැනල් එක අස්සේ හැංගුන පුංචි මූන දිහා..
ආදරේ හිතුනා ඒ මූනට..කෙල්ල බලන් හිටියේ ඒ මූන දිහා හුඟක් වෙලා..

" චූටි මැණික .. අඩන්න එපා ඉතින්.. මගේ පන

කෙල්ල එහෙමම පපුවට තුරුල් කරත්තේ පුරුදුකාරියක් වගේ.. සමදරාට හිතා ගන්න බෑ මෙච්චර වෙලා අඩ අඩ හිටපු කොල්ලා පූස් පැටියෙක් වගේ සදීනා ලඟ..

කොල්ලා සදීනට එකතු වෙයි කියලා සමදරාගේ හිතට සහනයක් දැනුනා.

" සදීනා ඔය ඉන්නේ මගෙ පුතාගේ දරුවා.. මෙයාගේ අම්මා මෙයාව දාලා ගියා.. ඉපදිලා දවස් තුනයි හිටියේ..එයා වෙන කෙනෙක් එක්ක ගියා.

මාසයක් විතර මැෂින් වලින් හිටියේ කොල්ලා.. කහ වුනා කිරි නැතුව.. බේරගත්තේ අමාරුවෙන් ඩොක්ටස්ලා..

" අනේ නෝනා..

කෙල්ල පුංචි මූන දිහා බලන් හීල්ලුවා..

" මගේ පුතත් නැතිවුනා මට අන්තිමේ එකෙන්..
එයා කැමති නෑ සදීනා දරුවා බාරගන්න..
ඒත් එහෙමයි කියලා මේ කිරි සප්පයා දුක්විදිනවා බලන්න තරම් අපි අමුනුස්සයෝ නෙමෙයි ..

සමදරා කඳුලු පිහිත ගමන් කියාන යද්දි කෙල්ල බලන් හිටියේ අහිංසක මූන දිහා..

" නෝනා මොකක්ද දැන් කරන්න යන්නේ

sinhalaebooks.com

කෙල්ල ඇහුවේ සම්දරාගෙන් දරුවා ගැන..

" සදීනා පින් සිද්ධවෙයි.. මේ දරුවව බලාගන්න
ටික කාලෙකටහරි.. ටිකක් ලොකු වුනාම මොනාහරි කරනවා.. ඔයාට කරදරක් වෙන් නෑ
මේ දරුවා ලොකු වුනාම ඔයාට ගමට යන්න දෙන්නම්..

කෙල්ල ඔලුව උස්සලා බැලුවේ සමදරා දිහා..

" නෝනා.. මාව කසාද බන්දන් නෑ නේද අර නපුරු සටර්..

කෙල්ල ඇහුවේ සමදරාගෙන් මොකද කෙල්ලව එක්කන් ආවේ බන්දලා දෙන්වා කියලා.. මාමා කිව්වෙත් කෙල්ලට රණබාහු පවුලේ ලේලි වෙලා සල්ලි කාරියක් වෙන්න පුලුවන් කියලා කෙල්ල කැමතිම නෑ දවාත් වගේ යක්ෂයෙක් ලගවත් ඉන්න..

සම්දරාකිව්ව විදියට දරුවව බලාගෙන ඉදලා ගමට යන්න කෙල්ල කැමතී එක පයින්..ඒ හින්දමයි සම්දරාගෙන කෙලින්ම ඇහුවේ.

" නැහැ සදීනා නෑ.. ඔයාව ඒ යක් පැටියට දෙන් නෑ බය වෙන්න එපා.. මන් විස්වාස කරනවා ඔයාව ..
මේ අපේ පවුලේ නම්බුව වගේම අනාගතේ මොනදේ වුනත් මේ දරුවා රැකගන්න ඕනේ ඔයාට තේරෙනවනේ සදීනා මම කියන දේ.. දරුවව බලාගන්න හොදට..සදීනා මෙයා ඔයාට බාරයි දැන්

කෙල්ලට තේරුනා සමදරා කියපු දේ.. දරුවා මාගෙර්න් රණබාහු දේපල සල්ලි වලට මිනිස්සු කපටිකම් කරයි කියලා සමදරා බයෙන් ඉන්නවා කියලා .

" නෝනා බයවෙන්න එපා.. මන් බලාගන්නම් දරුවව.. මන් නෝනගේ විස්වාසේ රකින්නම් .

" මන් දන්නවා සදීනා.. එද දැක්ක දවසෙම මට හිතුනා ඒක.. අපේ පවුලට සදීනා වැරැද්දක් කරන් නෑ කියලා..

කෙල්ල ආසාවෙන් බාරගත්තේ.. අත් දෙක උඩ දැනෙන බර හිතට දැනුනා ඒක අමුතු හැඟීමක්

මන් ඔයාව බලාගන්නම් පැටියෝ.. මන් ඔයාව ලොකු කරන්නම්.. මන් එක්ක ඉමු හොදද සෝස මැනික..

කෙල්ල සමදරා ඉස්සර වෙන්න ඇරලා චූටි පැටියගේ කනට කරලා කෙදිරුවා.. කොල්ලා ඇඹරිලා අත් දෙක ගැස්සුවේ සදීනට හිනා යද්දි..

sinhalaebooks.com

ආ ඔයාට තේරුනා නේද මන් කියපු දේ.. අපි දැන් ගෙදේ යන් හොදද පුංචි මහත්තයා..
එහේ ඉන්නවා ඔයාගේ තාත්තා යක්ෂයා..

කෙල්ල ඒක කිව්වේ සමදරාට නැහෙන්න රහසින් වගේ..

කෙල්ල පුංචි කොලු පැටියව පපුවට තුරුල් කරන් ඇවිදන් ගියේ ආසාවෙන්..
කෙල්ලට රණබාහු ගෙදර හම්බුන රාජකාරිය බාරගත්තේ සතුටින්..
ළමයට ඕනකරන හැමදේම සමදරා මගින් අරගත්තේ අමතක වෙන දෙයක් සදීනගෙනුත් අහලා..

ගෙදර එනකම්ම්ම කොල්ලා සැපටනිදගෙන හිටියේ සදීනට තුරුල් වෙලා හරියට ආත්ම ගාතක පුරුදු කාරයෙක් වගේ...

" සදීනා දරුවා මට දීලා පිටිපස්සේ බඩු ටික අරන් එන්නකෝ..

රණබාහු මිදුලෙන් වාහනේ නවතිද්දි සමදරා කෙල්ලගෙන් ළමයා අරගත්තේ ගෙනාපු බඩු ටික අරන් එන්න සදීනට කියන ගමන්..

" අනේ අම්මී.. මට දෙන්නකෝ..
අනේ සෝයි අප්පා.. බෝලගෙඩියක් වගේ..
උම්මා.. ඉතින්.. මැනික් කැටේ.. අපේ

කෝ නැන්දී අතට එන්න කෝ..

දසුනි සමදරා ගෙන් කොල්ලව උදුරන්නේ ආසාවෙන් උඩ පැන පැන ..

මේ හැමෝම දරුවට මෙච්චර ආදරේ කරද්දි ඇයි එයාගෙම තාත්තා එයාට වෛර කරන්නේ
.
කොහොමද දරුවෙක්ට එච්චර ද්‍රෝහිකමක් කරන්නේ මනුස්සයෙක්..මට තේරෙන් නෑ දවාන් මහත්තයා මේ හැමෝගෙන්ම පලිගන්නේ ඇයි කියලා..

කෙල්ල බඩු ටිකත් අරන් ඇතුලට ආවේ තනියම හිතමින්. සමදරා එක්ක දසුනී කොල්ලව බදාගෙන හුරතල් කරන දිහා බලාගෙනම කෙල්ල කුස්සියට ගියේ නීලා හොයාගෙන..

" නැන්දේ අන්න ඔයාලගේ යක් මහත්තයගේ පැටියා අරන් ආවා..

කෙල්ල එලවලු කපා කපා හිටිය නීලට කිව්වේ හිනාවක් දලා .. කෙල්ල පස්සෙයි දැක්කේ කුස්සියේ තිබ්බ කෑම මේසේ ඉදන් බීම එකක් බිබී හිටිය දවාන්ව..

මලා උඹ ඉවරයි සදීයෝ. යකාගේ කට ලගටම ඇවිත්නේ ඒ ගොන් කතාව කිව්වේ..

sinhalaebooks.com

කෙල්ල වෙව්ලලා ගියේ දවාන් ඇස් රතු කරන් කෙල්ල දිහා කන්න වගේ බලන් ඉද්දි

" මොකක්ද උඹ කිව්වේ..

දවාන් පැනපු ගමන් කෙල්ලගේ කට එක අතකින් තදකරලා අල්ල ගත්තේ සදීනට හෙලවෙන්නවත් බැරිවෙන්න..

" අනේ ලොකු බේබි අත අරින්නකෝ.. ඔය ලමයා මැරෙයි.. විහිලුවටනේ කිව්වේ.. අනික ඒක කිව්වේ මට.. මහත්තයට නෙවෙයි.. අනේ අත අරින්න මහත්තයා..

නීලා දවාන්ගේ අත් දෙකේ එල්ලුනේ කෙල්ලව බේරගන්න..

" නීලාම්මා පැත්තකට වෙන්න.. මේකී කව්ද මගේ ගැන කියන්න..

උඹ කිව්ව යකා මත් පෙන්නන්නම්..

කෙල්ල අත් දෙකෙන් පොරබැදුවේ දවාන්ගේ යකඩ අත් බුරුල් කරගෙන පැනලා දුවගන්න.. හැබැයි කෙල්ල ඔට්ටුවෙන්න වෙන්න දවාන් කෙල්ලව තවත් තදට අල්ලගත්තා..

" අනේ ලොකු නෝනා අන්න අර ලමයා අල්ලන් ලොකු බේබි

" සදීනව.. දෙයියනේ මේ කොල්ලට මොන යකෙක් වැහිලද .

සමදරා දුවන් ආවේ කුස්සිය පැත්තට.. දසුනිත් ඒ එක්කම පොඩි දරුවත් වඩාගෙනම කුස්සියට ආවේ සමදරා පස්සෙන්..

" පුතා.. මොකද මේ..

" අම්මේ මේකි කව්ද.. මන් මේකිව ඉතුරු කරන් නෑ මගේ ප්‍රශ්න වලට අතදාන්න මුන් කව්රු කියලද හිතාන් ඉන්නේ.. හිඟන හැත්ත..ගේ අස්සේ දන්..

සදීනගේ ඇස්වලින් කඳුලු ආවා ඒ ටික කියද්දි..

ඇත්තටම මේ අපායට බලෙන් ආවේ නැකෙල්ලව එක්කන් ආවේ රණබාහුලා .. ඒකත් කෙල්ලගේ අකමැත්තෙන්..එහෙම වෙලත් මේ වගේ කුණු කතා ඇහෙද්දි කෙල්ලට හිතුනෙම දමලා ගහලා පැනලා යන්න..

"මෙන්න මේ දරුවා බලාගන්න හිඟන්නෙක් ගෙනාවේ අම්මලා.. මොකද මේ ලමයා ගේ තාත්තා කියන මනුස්සයා හිඟන්නෙක්ටත් අන්න සතෙක්නේ.. ඒ හින්ද..

sinhalaebooks.com

දසුනි දරුවව පෙන්නලා කියද්දි දවාන්ගේ අත් බුරුල් වුනා..කෙල්ල ඒ තත්පරෙන් පැනගත්තේ සමදරා ලඟට..

" අනේ ලොකු නෝනා..

කෙල්ල සමදරාගේ පිටිපස්සේ හැංගුනා.. දවාන් දසුනි දිහයි අතේ හිටිය දරුව දිහයි බලන් හිටියේ ඇස්වලින් ගිනි පිටවෙද්දි..

" උඹලා මොකටද මේ අවජාතකයෝ මෙහෙ අරන් ආවේ.. ආ කතාකරපල්ලා..

දවාන් කෑ ගැහුවේ මේසේ උඩ තිබ්බ වීදුරුව පොලවේ ගහලා..

" පුතා.. දෙයියනේ මොන යකෙක් වැහිලද දරුවෝ.

සමදරා දවාන් ලඟට කිට්ටු වෙද්දි සදීනා බැලුවේ දසුනි අතේ හිටිය දරුවා දිහා.. කෙල්ලට බය හිතුනා දරුවට කරදරයක් වෙයි කියලා..

" චූටි නෝනා දරුවා දෙන්න .. මන් කාමරේට අරන් යන්නම්..

" ආ සදීනා ගන්න.. ඒක හොඳයි.. ඔයා දොර වහගන්න..

කෙල්ල දරුවව අත් දෙකෙන් පපුවට තුරුල් කරන් දුවන් ගියේ කාමරේට.. කෙල්ල දන්නවා යක්ෂයගේ තරම..

" නෑ නෑ.. මට මොකෙක්වත් වැහිලා නෑ.. මේ ගෙදර ඉන්න උඹලටයි පිස්සු..
අනුන්ගේ ලමයි අරන් ඇවිත් මෙතන නාඩගම් නටන්නේ..

" එක පාරක් බලන්න ඒ මූන දිහා.. පුතේ ඒ ඔයාමයි
මේ අම්මට ඒක විස්වාසයි.. ඔයා පුංචි කාලේ වගේමයි.. ඒ ඔයාගේ දරුවා.. ඒ අහිංසකයගෙන් පලිගන්න එපා.. සාප වෙයි පුතේ අපට..

සමදරා අඬ අඬ කියද්දි දවාන් ඒ වචන ඇහෙන් නැතිගානට හිටියේ.. හිතක් පපුවක් නැති එකෙක් වගේ..

" අනේ අයියා.. තේරුම් ගන්නකෝ ටිකක්..
ඔයා මේ අපි හැමෝගෙන්ම ගන්නේ කාගේ පලියක්ද..
මේ හැම්දේම දමලා ගහලා මාත් යනවා යන්ඩ මේ ගෙදරින්.. මට එපා වෙලා දැන්..

දසුනි අඬාගෙන පඩිපෙල නැගලා කාමරේට දිව්වේ සාලේ අන්තිමට සමදරයි දවානුයි ඉතුරු වෙද්දි..

sinhalaebooks.com

" පලයව් ඔක්කොම පලයව්.. මගුල.. මට පේන්ඩවත් එන්ඩ එපා එකෙක්වත්..

"පුතා..

" අම්මත් යන්ඩ.. මන් අවජාතක පුතානේ ඔයාගේ
උදේ තාත්තා කිව්වනේ..
මන් අවජාතකයෙක්.. ඔයත් යන්න පින් සිද්දවෙයි යන්ඩ..

අත් දෙක එකතු කරන් සමදරා ඉස්සරහා වැඳන් ඉන්න දවාත් වෙව්ලනවා කේන්තියෙන්..
සමදරාට පපුව පැලෙන්නතරම් වේදනයි ඒක දැක්කම..
දවාත්ගේ වචන පිහියකින් අනින තරම්..

මේ දුක් විඳින්නේ කාලෙක කලින් තමන්ට හිටපු එකම පුතා. දවාත්ගේ හිතාව පවුලෙම හිත් නිවපු එකම බේහෙත.. ඒ හැම්දේමත් විනාස කරලා අක්ෂා දවාත්වත් නැතිකරලා ගියපු එකට සමදරා හදවතින් සාප කරා..

දවාත් කෑ ගහන සද්දේ ගෙදරටම ඇහෙනවා .. කාමරේ ඉදන් සදීනා අහගෙන හිටියේ..
දවාත්ගේ රූපේ අඹලා වගේ ඉන්න කොල්ලා දැක දැකත් මෙච්චර දරුණු විදියට නොදරුවෙක්ගෙන් පලිගන්න තරම් පහත් කෙනෙක් වුන දවාත් ගැන කෙල්ලට තිබ්බේ කලකිරීමක්..

" ඔයා මෙච්චර පව් කරේ ඇයි පුතේ.. මේ තරම් පහත් මිනිහෙක් ගේ ලේ වලින් ඉපදෙන්න තරම්..

මේ කිසිම දෙයක් නොදන්න ඔයා හොදට දොයි..
ඔයාගේ තාත්තා ඔයා එපා කියලා හැමෝටම බනිනවා.. දන්නවද මේ මටත් ගැහුවා ..

ඇයි පුතේ ඔයාගේ තාත්තා එච්චරටම නපුරු
ඔයානම් එහෙම වෙන්න එපා.. ලොකු වුනාම

කෙල්ලගේ පපුවට තුරුල් වෙලා හුස්ම ගත්තේ සද්දෙට.. හරියට කෙල්ල කියපුවා තේරුන ගානට..

" සදීනා.. දරුවෝ ඔයා නිදිද..

නීලා මහ රෑ කෙල්ලගේ කාමරේට තට්ටු කලේ කෙල්ල රෑට නොකාම නින්ද ගිහින්වත්ද කියලා..

" නැන්දේ..

sinhalaebooks.com

සදීනා දොර ඇරන් ආවේ නීලාලගට. මහ සද්දෙට තිබ්බ ගෙදරම දැන් කිසිම සද්දයක් නෑ.. අඩුම තරමේ ලයිට් එකක්වත් දලා නෑ.. කවුරුත් පේන්නත් නෑ..

" මොනාහරි කාලා නිදගන්න.. කෝ චූටි බේබි නිදිද .

නීලා කොල්ලා ගැන අහද්දි සදීනා ආපහු හැරිලා බැලුවේ නිදන් ඉන්න දරුවා දිහා.

" ම්ම්ම්.. දැන් නින්ද ගිහින් මන් නැගිට්ටම එයා ඇහැරෙනවා.. ඇගේ රස්සෙනට ගුලි වෙලා නිදගන්නවා.. කපටියෙක් මහ..

කෙල්ල ඒ ටික කිව්වේ බොරු තරහක් මවාගෙන.. කෙල්ල ආසයි එහෙම ඉන්න..දවාන්ගෙන් ගුටිකාලත් ගානක් නැති වුනේ දරුවා හින්ද.. ඒ හැම්දේම අමතක වුනා ඒ හිනාවට..

" මන් කිරි හැදලා තිවෙන්න තිබ්බා පැය හතරෙන් හතරට දරුවට දෙන්න ..

" හා නැන්දේ.. කෝ නෝනලා..

සදීනා ඇහුවේ සද්දයක්වත් නැති හින්ද..දවාන්ගේ වලියත් එක්ක කෙල්ලටත් ඇහැ පියවුනේ න් පස්සේ වුන කිසිම දෙයක් ඇහුනේ නෑ..

" ලොකු බේබි කෑ ගහලා කෑ ගහලා ගියා ඔන්න කොහෙද .
නෝනලා කාමරවල ඇති.. ලොකු මහත්තයා දැන් නෑ මොකුත්.. දන්නවනම් ලොකු බේබිව පන්නවා ගෙදරිනුත්..

නීලා රහසින් වගේ කිව්වේ කව්රුත් එනවද කියලා බල බලම..

" අනේ ඇයි නැන්දේ අර කිරි සප්පයගෙන් මේ මිනිස්සු මෙහෙම පලිගන්නේ.. මට තේරෙන් නෑ.. වෙලාවකට මට හිතෙනවා ගිහින් අර යක්ෂයගේ හොම්බට අනින්න දෙකක්.. ඇත්තමයි..

" හොම්බට ඇනිල්ල කෙසේවෙතත් අද අනූනවයෙන් බේරුනේ.. තව පොඩ්ඩෙන් බෙල්ලත් නැතිවෙනවා මිස්ගේ..

" අම්මෝ හා.. මන් නැන්ද ඉන්නවා කියලා එහෙම කියාන ආවේ පස්සෙනේ දැක්කේ එතන ඉන්නවා..
මගේ කට තාමත් රිදෙනවා අල්ලපු ඇල්ලීල්ලට..

කෙල්ල කිව්වේ දවාන් ගේ ඇඟිලි වලට තැලුන කම්මුලක් අතගාන ගමන්..

" ආයෙ කතා කරද්දි පරිස්සමින්.. ඔය ලොකු බේබි දැන් ගෙදර කාටවත් මෙල්ල කරන්න බෑ..

sinhalaebooks.com

නීලා ඒ ටික කිව්වේ කෙල්ල කට ඇරන් බලන් ඉද්දි..

" මෙල්ල කරන්න තමා වෙන්නේ.. මඳ කිපිලා වගේ දඟලන්නේ දැන්..

පුදුම වදයක් දෙන්නේ මිනිස්සුන්ට. ඔහොම දරුවෝ ඉපදෙන්නෙම හොඳ අම්මලා තාත්තලා ලඟනේ.. රණබාහු මහත්තයයි නෝනයි කොච්චර හොඳද.. ඒකටත් එක්ක පුතා.. අනේ මන්ද.. මේ මනුස්සයා ගැනනම් හිතාගන්න බෑ..

කෙල්ල නීලට නැහෙන්න බැන බැන හිටියේ දවාන්ට..

" අද ලොකු මහත්තයා රවට්ටන්න නෝනයි චූටි නෝනයි කෑම අතගෑවා විතරයි..

නීලා කෙල්ලට බිත්තරයක් ඔම්ලට් දන ගමන් කිව්වේ ඉතුරු වෙලා තියෙන කෑම වලන් ඇරලා කෙල්ල බලද්දි..

" පව්.. නැන්දේ එයාල..

සම්දරයි දසුනි දවාන් නිසා විඳවනවා කියලා කෙල්ලට ආව දවස් දෙක තේරුනා.. දැන් ඒකටම මොකුත් නොදන්න කිරි දරුවෙකුත් එකතු වුනා..

" ප්ලීස් සමදරා.. ඔය මිනිහා මොනවා කරගත්තත් මට කමක් නෑ.. ආයේ මන් ඇහැක් ඇරලා බලන් නෑ..

" අනේ මහත්තයා මොනාහරි කරන්න.. පොලිසියේ මුලු රෑම හිටියොත් අපටනේ ලැජ්ජාව..

කෙල්ල ට ලාවට ඇහුන සද්දෙ රණබාහුගෙයි ලොකු නෝනගෙයි.. නීලත් කෙල්ල දිහා බැලුවේ කලබලෙන්..

" නැන්දේ මොකක් හරි වෙලා වගේ

" ඒකතමා.. යන්කෝ බලන්න..

නීලයි කෙල්ලයි දෙන්නම් සාලෙට දුවන් යද්දි රණබාහු ෆෝන් එකක් අරන් කෝල් ගන්නවා කලබලෙන්.. සමදරා ඒ පස්සේන් හිටියේ බයවෙලා වගේ..

" ඇයි නොනා..

" අනේ නීලා ලොකු බේබිව පොලිසියෙන් ඇරස්ට් කරලලු..

සමදරා ඒ ටික කියලා පුටුවකට බර වුනේ ඔලුවට අතක් තියන්..

sinhalaebooks.com

" මගෙනම් බල්ලෙක්වත් යන් නෑ සමදරා ඕකා ගෙන්න.. මන් කෝල් කලා ජගත්ට ඇප දීලලු අන්න..
එන වෙලාවක එයි..

"අනේ මහත්තයා..

" මගේ නම්බුව කෑවා ඔය බල්ලා.. දරුවෝ වෙලා ආව හතුරෝ..

සමදරා... එක්කන් එන්න මෙහෙන් යන්නෑ එකෙක්වත් ඕකව..

රණබාහු එහෙම කියලා උඩට ගියේ ඉන් එහා මොකුත්ම කියන්න ඉඩක් නොදී..

" ඇයි අම්මා මේ..

දසුනි එද්දි සමදරා නැගිට්ටේ කලබලෙන්..

" අනේ චූටි අයියා පොලිසියෙලු.. කොහෙද නයිට් ක්ලබ් එකක හොදටම බීලා ඉදලා..

" ඉතින්..මොකද වෙලා තියෙන්නේ

" හරියට විස්තරයක් දන්නෑ.. ඇප දීලා තාත්තා කාටද කෝල් කරාට පස්සේ අයියා දැන් පොලිසියෙලු.. ඇවිත් එක්කන් යන්න කිව්වා..

" ඉතින් තාත්තී යයි..

" ඒ මනුස්සයා යන් නෑ චූටි.. මන් විතරයි දරුවෝ හැදුවේ. මේ ඔක්කොටම පලි මන්.. උඹලා කරන ඔක්කොම වැරදි මගේ.. මගේ දරුවෝනේ මන්ම බාරගන්න ඕනේ..

මන් ඇස් පියාගත්තනම් ඉවරයි.. මෙහෙම වද විදින්න බෑ තවත්..

සමදරා පපුවට ගහගත්තේ දතින්ම..ඈත ඉදන් බලන් හිටිය සදීනට දුකයි සමදරා ගැන..

" චූටි නෝනා අපි ගිහින් එක්කරගෙන එමුද දවාන් මහත්තයව

බලන් ඉන්න බැරිම තැන කෙල්ල දසුනිගෙන් ඇහුවේ දවාන් එක්කන් එන්න යන්න..

" අපි.. දෙන්නා.. ඔයාට පිස්සුද සදීනා.. ගුටි ත් කාලා තව ඒ මනුස්සයට උදව් කරන්නත යන්නේ..
මට බෑ.. එයා නිසා තමා මේ ඔක්කොම..

sinhalaebooks.com

මගේ අයියෙක් නෙමේ කියලා මන් හිතහදන් ඉන්නේ.. ඔහොම සහෝදරයෝ ඕන් නෑ.. ලැජ්ජා කරනවා අපි හැමෝටම

දසුනි කැමති වෙන්නෑ කියලා දැන දැනත් කෙල්ල ඇහුවේ සමදරා හින්ද..

" අනේ චූටි මේ දරුවා එක්ක යන්නකෝ
තාත්තා ට හොරෙන්.. මන් ගියොත් අහුවෙනවා..
මන් ශේප් කරන්නම් තාත්තිව..
අයියව එක්කන් එන්න පුතේ..

" හරි හරි..යන්නම්..
මේකා පුදුම වදකාරයෙක්.. ඇත්තමයි..

යමු සදීනා..

දසුනි මේසේ උඩ තිබ්බ වාහනේ යතුරත් අරන් කෙල්ලට අඬගැහුවේ රෑම දවාන් එක්කන් එන්න පොලිසියට යන්න..

කෙල්ලත් එහෙමම කොණ්ඩේ අතින් හද හද ගිහින් වාහනේ නැග්ගේ දවාන්ට හිතින් බැන බැන..

ගෙදර මිනිස්සු අපායකට දලා යම රජ්ජුරුවෝ වගේ වද දෙන වා

කෙල්ල හිතින් බැන්නේ දවාන්ට.

" සදීනා.. බයෙත් නෑ කෙල්ලේ.. තනියම ගිහිනුත් නෑ මන් රෑට.. මේ යකා හින්ද මේ ඔක්කොම..

දසුනි ඩ්‍රයිවින් කරන ගමන් සද්දයක්වත් නැතුව යන කෙල්ලට කිව්වේ දසුනිට හිතට බයක් දැනුන හින්ද..

" බය වෙන්න එපා චූටි නෝනා මාත් ඉන්නවනේ..

කෙල්ල දසුනිගේ හිත හැදුවේ ඇත්තටන කෙල්ලො දෙන්නෙක් මෙහෙම තනියම මහ රෑ පාරක වාහනයක් අරන් යන එකේ අවදනමකුත් ය්හිබ්බ හින්ද.. ඒත් ලොකු නෝනා වේදනාවෙම් ඉන්නවා බලන්න බැරි නිසාමයි කෙල්ල බලෙන්ම දවාන් එක්කන් එන්න යන්න ඇහුවේ..

කෙල්ලො දෙන්නා පොලිසියට යද්දි රණබාහු අඳුරන පොලිස් නිලදරියෙක් දසුනිට කතා කරායින් හොදට ගියා..

sinhalaebooks.com

" අංකල් අයියා..

" අහ් යමු දුව.. දවාන්ව එක්කත් යන්නනම් පුලුවන් තත්වෙක නෑ.. හොදටම බීලා..

තාත්තා අඳුරන නිසා ඇප දුන්නේ නැත්තම් නඩු දාන්න ත් තිබ්බා..

ක්ලබ් එකේ හිටියේ ඔක්කොම බාල වයස්කාර ගෑනු ළමයි.. මිස්ටර් දවානුත් එතන කස්ටමර් කෙනෙක්..

අර ඉන්නෙ දුර ඒ ළමයි.. මෙයාලා ගණිකා වෝ විදියට තියන් ඉදලා තියෙන්නේ. අපි ප්ලෑන් කරලා වැටලීම කරේ.. හිටපු ඔක්කොම අහුවුනා..ඒ අතරේ මිස්ටර් දවාන් හිටියේ.. මේක පබ්ලික් යන්න නොදී ශේප් කරා කොමහරි..

දැන්ම අරන් යන්න එයාව.. මීඩියා එන්න කලින්..

" බොහොම ස්තුති අංකල්..

පොලිස් කාරයා අරහෙම කියද්දි දසුනි සදීනයි මූනෙන් මූන බලාගත්තේ කියන්න උත්තර නැතුව..

ශික්.දරුවෙක් ඉන්න තාත්තෙක් කරන වැඩද මේ.. මේ මනුස්සයා තිරිසනෙකුටත් අන්තයි.. පව් චූටි නෝනා මේ මිනිස්සු ඉස්සරහා ලැජ්ජා වුනා තමන්ගේ අයියා නිසා.. වෙන අයියලා නංගිලාට ආදශර්යක් වෙනවා ඒකට මේ යකා..

දන්නම් ඉන්න තැනකට ගිහින් කන පැලෙන්ඩ දෙකක් දෙන්ඩ හිතෙනවා මට..

"සදීනා අපේ අයියා ඇයි අපෙත් මෙහෙම පලිගන්නේ..මීට වඩා හොදයි රෙදි නැතුව පාරේ ගියානම්.. ශිට්..

" චූටි නෝනා කලබල නොවී ඉන්නකෝ.. දැන් අපි දවාන් මහත්තයා ඉන්න තැනින් අරන් ගෙදර් යමු ඔක්කොටම කලින්..

දසුනිගේ හිතේ තිබ්බ වේදනාව කෙල්ලට තේරුනා ඒත් මේ වෙලාවේ ඔවා කතා කරකර ඉන්න බැරි නිසා කෙල්ල දසුනිවත් ඇඳන් දවාන් හොයාගෙන ගියා..

බිත්ති කනුවක් බදගෙන බිම වාඩිවෙලා බල්ලත් කඩන් ඉන්න දවාන් ව දැක්කා කෙල්ල ඇනදිම..

" චූටි නෝනා අර..

කෙල්ල අත දික් කරලා පෙන්නුවේ දවාන්ව..

sinhalaebooks.com

" මෝඩයා.. ශික්

දසුනි බනිද්දි කෙල්ල දුවන් ගිහින් දවාන්ව වත්ත කරලා උස්සන්න දඟලුවේ අර කිව්ව විදියට මීඩියා කාරයෝ ආවොත් දසුනිලාගේ පවුලට වෙන ලැජ්ජාව සුලු පටු නැති හින්ද..

" අනේ චූටි නෝනා දෙන්නම අල්ලමුද.. ඉක්මනට වාහනේට දගත්තොත් හරිනේ..

දසුනි දවාන්ගේ අතක් කරවටේ දන් වත්තත් කරගත්තා..කෙල්ල අනිත් පැත්තෙන් අල්ලගත්තා

" ඕ ඩාලින්.. අපි එන්ජෝයි කරමු.. රූම් එකට යන් අපි.. මයි ප්‍රින්සස්..

දවාන් මගක් එද්දි කියවන්න ගත්තේ ක්ලබ් එකේ කෙල්ලො එක්ක ඉන්නවා කියලා හිතාගෙන..

" ශික්. සදීනා... මට බෑ මූ එක්කන් යන්න..

දසුනි දවාන් අත ඇරලා දලා අයින් වුන පාරට කොල්ල සදීනගේ ඇග උඩ.

" අනේ අනේ චූටි නෝනා අල්ලන්නකො.. බරයි මට මේ අලියෙක් වගේ.. මන් එක්කම වැටෙයි අල්ලගන්නකෝ..

කෙල්ල කෑ ගැහුවේ දවාන්ව අල්ලගන්න බැරුව ..

" සදීනා මූ කියන එව්වා අහන්න පුලුවන්ද.. දැන් සල්ලාලයෙක් වෙලා ඉන්නේ..

" හරි හරි ගෙදර ගිහින් බනිමු. දැන් වාහනේට දගමුකෝ. මට බරයි.. අල්ලගන්නකෝ

දසවද දීලා කොල්ලව වාහනේට දගත්දී කෙල්ලගේ හොද පන ගියා..

" මන් කුරුල්ලෙක් වගේ.. පියාඹනවා.. සැපේ ඉන්නේ සැපේ.. කෙල්ලෝ නම් සැප තමා..

වාහනේ පිටිපස්සේ ඉදන් දවාන් කියවන වචන අහන් ඉන්නත් බැරිතරම්..

දසුනි හිටියෙ නැත්තම් හොදවගෙන් දෙකක් ඇනලා අගලකට දලා යන්න තරම් තරහා කෙල්ලට..
පුතා.. ලා ආවා නීලා..

දසුනි වාහනේ නතර කරද්දිම සමදරා දුවන් ගියේ වාහනේ ලගට..

sinhalaebooks.com

" ලැජ්ජයි මට.. මේ මගේ අයියා කියන්නත්
ශික්..

දසුනි වාහනේ දොර සද්දෙන් වහන් සමදරාට ගස්සගෙන ගේ ඇතුලට ගියා..

" අනේ මොකද දරුවො වුනේ..

සමදරා කෙල්ලගෙන් අහද්දි උත්තර නැති වුනා.. ඇත්තටම දවාන් පොලිසියට අරන් ගිය කාරණාව සමදරාට කියන්න කෙල්ලට හිත දුන් නෑ..

හැමෝම දවාම්ට විරුද්ධ ව බනිද්දි සම්දරාගේ මව් සෙනෙහස දවාන් වෙනුවෙන් හැම මොහොතක තියනවා කෙල්ල දැක්කා.. එච්චර දරුවන්ට ආදරේ කරන අම්මෙක්ට වචනෙකින්වත් දුකක් දෙන්න කෙල්ලට බෑ..

අම්මෙක් අප්පෙක් නැතුව ආදරයක් නැතුව අව්වට වැස්සට ලොකු මහත් වුන කෙල්ල වගේ කෙනෙක්ටමයි ඒ ආදරේ අගේ දැනෙන්නේ.. ඒ හින්දම සම්දරාට මොකුත් නොකියා ඉන්නවා කියලා කෙල්ල හිතුවා

" මොකුත් වුනේ නෑ ලොකු නෝනා.. දවාන් මහත්තයා ගොඩක් බීලා නිසා ඔය..

" අනේ මන්ද දරුවෝ.. මේ කොල්ලා අපෙන් පලිගන්නවා වගේ මෙහෙම ඒවා කරන්නේ..

සමදරා ඒ ටික කිව්වේ වාහනේ ඇතුලේ ගොරව ගොරව නිදන් ඉන්න දවාන් දිහා බලාගෙන..

" ලොකු නෝනා අපි මහත්තයව කාමරේට අරන් යමුද..වාහනේ තියන්නත් බෑනේ..

" අනේ ඔව් සදීනා.. මූ ඕකේ ඉන්නවා උදේට මහත්තයා දැක්කොත් එක ඇති හෙට යුද්ධෙකට

කෙල්ලයි සමදරයි සෑහෙන්න ඔට්ටු වෙලා දවාන්ව කාමරේ ඇඳට දගත්තේ .. ඒ ඇඳුම් පිටින්ම ඉන්න අරින්න කියලා සමදරා කාමරෙන් එලියට ගියේ ඔලුවට අතක් ගහන්..

කෙල්ලට දුකයි සමදරා ගැන.. හැම අතින්ම තැලිලා පොඩිවෙලා දුක් විදින එකට..

" ගෙදරම ඉන්න මිනිස්සුන්ට වද දීලා නිදගෙන ඉන්න ලස්සන ... තමන්ගේ දරුවව වත් අඳුරගන්න බැරි..මෝඩයා..

සදීනා දවාන්ට බැන බැන කාමරේ බිම තැනින් තැන වැටිලා තිබ්බ ඇඳුම් අහුලල බකට් එකකට දැම්මා..
දවාන් කොහොමත් සිහියෙන් හිටපු වෙලාවක් නෑනේ .. ඒ හින්දා කාමරේ තිබ්බේ යකා නටලා..

sinhalaebooks.com

ඒ කාමරේ කොහොමත් වැඩිය බඩු නෑ කණ්ණාඩි මේසෙයි කබඩ් එකයි ඇඳයි විතරයි..එකෙත් ග්ලාස් එකේ පැත්තක් නෑ..ඒකත් දවාන්ගේ කේන්තියේ අග්‍ර ප්‍රතිඵල කියලා කෙල්ල හිතුවා.

" මේකේ ගඳ.. කරෝර වාඩි හොදයි තව..මනුස්සයෙක් හිටිය පාටක් නෑ සතෙක් ලැගලා වගේ..

අතින් නහය වහන් කෙල්ල කොස්ස දලා ඇඳ යට තිබ්බ හිස් බෝතල් ටික අරන් ඩස්පින් දලා කාමරේ පිලිවෙලට අස්කරලා අතුගාලා දැම්මේ සැරින් සැරේ කෙඳිරි ගාන දවාන්ට බැන බැන..

තාමත් සපත්තු එල්ලෙන කකුල් දෙක ඇඳ පල්ලේ එල්ලි එල්ලි තියනවා කෙල්ල දැක්ක.. අල්ලන්න අපුලක් තිබ්බත් කමක් නෑ කියලා කොල්ලගේ සපත්තු දෙක ගලවලා පැත්තකින් තියලා ඇඳේ මැද්දට කරලා ශීට් එකක් පොරවලා හරිගැස්සුවා..

" මේ කොට්ටා මොකද මෙච්චර තෙත..

කෙල්ල දවාන්ගේ ඔලුව අරන් කොට්ටෙන් තියද්දි කෙල්කට දැනුනා අතට කොට්ටේ සීතලයි කියලා..

" දෙයියනේ මේ මනුස්සයා අඩනවා නේද.. නින්දෙන් අඩන්නේ.. ඉකි ත් ගහනවා..

දවාන් ගේ කැඩී කැඩී පිටවෙන හුස්ම එක්ක ඇස්වලින් ගලාගෙන එන කඳුලු කෙල්ල දැක්කා..

සදීනා අද මේ දේවල් දැක්කෙ.. කාටත් නොපෙනෙන්න දවාන් ගෙනව හැම රැයක්ම මෙහෙමයි..

" විස්වාස කරන්නත් අමාරු යි මේක.. මෙයා ඉන්නේ දුකෙන් ද එතකොට..
ඇයි එහෙනම් අනිත් අයට දුක් දෙන්නේ.. එයා තනියම විඳව විඳව..
මාව කීපාරක් මරන්න ගියාද.. හැමෝම ඉස්සරහා යකෙක් ගහලා වගේ මාරාවේස වෙලා හොරෙන් අඩනවා..

දවාන් දිහා බලාගෙන කෙල්ල හිතන්නේ.. දවාන්ගේ ජීවිතේ සිද්ද වුන හැම්දේම කෙල්ල දන් නෑ ..ඒත් ආපු දවස් ටිකට හැම දවසකම දවාන්ගෙන් දැක්කේ එක එක චරිත.. ඒත් අද දැක්ක මේ කඳුලු ගැන කෙල්ල තිබ්බේ පෙහෙලිකාවක්.. හිතාගන්න බැරි මනුස්සයෙක් තේරුම් ගන්න බැරි මායාවක් වගේ දවාන්ගේ ජීවිතේ..

sinhalaebooks.com

කෙල්ල පුංචි කොල කෑල්ලක් අහුලන් වචන ටිකක් ලියලා කොල්ලගේ කණ්ණාඩි මේසේ කැඩුන ග්ලාස් එකේ අලවලා කාමරේ දොරත් වහන් ආවේ..හෙටනම දසුනි එක්ක කතා කරනවා කියලා..හිතාගෙන

දවාත්ගේ ජීවිතේ හැමදෙයක්ම නොදන්න දරුවව දවාත්ට ලන් කරන්න බෑ. එත් සදීනා තමන්ට පොරොන්දුවක් වෙලා ඉවරයි පුංචි පැටියට එයාගේ අයිතිය කොහොම හරි අරන් දෙන්වා දෙනවා කියලා..

රෑ පුරාම පුංචි පැටියා තුරුල් කරන් කල්පනා කලේ දවාත් ගැන.. කෙල්ලගේ ඇස් අහලකටවත් නින්දක් ආවේ නෑ.. පාන්දර වෙනකම් ඉදලා දන්නෙම නැතුව නින්ද ගිහින් තිබ්බා..

ඔලුවේ කලුගලක් බැදලා වගේ බරයි..දවාත් අමාරුවෙන් ඇස් ඇරලා ඔලුව උස්සගන්න දැගලුවේ ඇදේ ඉදන්..මයි

" මගුලයි යකෝ.. ඔලුව රිදෙනවා පැලෙන්ඩ වගේ..
අම්මෝහ්.. ඊයේ ඇදුම් පිටින්මයි
ආවේ කොහොමද..මන්..
රෙද්ද මතක නෑ මෙලෝ මලදනයක්..
.....ඊඊඊඊඊඊ...ඊඊඊ

අමාරුවෙන් ඇද වියනට වත්තන් වෙලා ඉදගත්තේ අත් දෙකන්ම ඔලුව බදාගෙන..

මෙ ගෙදර එකෙක්වත් නැද්ද තේ එකක් ගේන්ඩවත්..
ඇවිදගන්නවත් පන නෑ..දවාත් උඹ ඊයේ බිව්වද පැලුනද..අම්මේහ් කොන්දත් එක්ක රිදෙනව..
ශිට්..

කොල්ලා නැගිටලා අත් දෙක උස්සලා ඇගමැලි කැඩුවේ දහයක් දොළහකගෙන් ගුටි කාපු සයිස් එකට ඇඟ රිදෙන හින්දා..
කණ්ණාඩි යෙන් මූන බලලා රවුල අතින් හදනකොට දැක්කේ අලවලා තිබ්බ පුංචි කොල කෑල්ල..

" අසිහියෙන් කඳුලු රවට්ටන්න බෑ.."

මොකක් ඒ මොන කුනුහපර්යද යකෝ..
කව්ද කාමරේ ට ආවෙ.. නීලා ද නෑ වෙන්න බෑ

දවාත් කොල කෑල්ල අතේ තියාගෙනම කල්පනා කරේ..වෙනදාට වඩා කාමෙත් වෙනසක් දැනුනා..

sinhalaebooks.com

හැම්දම බීලා ඇඳ යටට විසිකරන බෝතල් ඔක්කොම ඩස්පින් එකේ තියනවා දැක්කා.. ඇඳපු කිලිටි ඇඳුම් ටිකත් බකට් එකේ දලා අතුගාආ පිලිවෙලයි..

දවාත් කලපනා කරේ ම කව්ද ආවේ කියලා..

අම්මද නෑ.. ඊයේ ගසපු ගැසිල්ලට අම්මා එන්න නෑ කීයටවත් මගේ මූනක් බලන්න..

දවාත් මතක් කරපත් බල්ලෝ ඊයේ මොකද වුනේ කියලා..
ගෑනියක්වත් අරන් ආවද මන්..
මල මගුලයි.. ඒත් කෝ ආවනම් ගෑනියක්..

කොල්ලා බාතෲම් එකට එබිලා බැලුවේ ඊයේ තත්වේ හැටියට එහෙම දෙකුත් කරන්න බැරි නැති හින්ද..

ආ.. ඔක්කොම සැලට් වෙලා.. කව් කොලයි ඒවයි මේවයි.. මත් පිස්සෙක් වෙලා ..

" ලොකු බේබි..තේ ගෙනාව..

නීලා කතා කරද්දි උඩින් පැනලා ඇවිත් දොර ඇරියේ ඊයේ රෑ මොකද වුනේ කියලා අහගන්නත් එක්ක..

" නීලාම්මා මේ මේ ඊයේ මන් කාව හරි එක්කන් ආවද..

ඔලුව කහ කහා ඇහුවේ නීලගේ න් දැනගන්න..
මූනක් අල්ලන්න බෑ ගෙදර මිනිස්සුන්ට.. කොහොමත රණබාහු කතා කරන්නෙම නැති හින්ද කොල්ලා රණබාහු ඉන්න පැත්ත පලාතෙ යන් නෑ මොකටවත් .

" දසුනි බේබි සදීනයි ලොකු බේබිව එක්කන් ආවේ..

"මොකා ක්.."

ඔලුවට අතක් ගහන් වටයක් කැරකුනේ වෙන්න ඕනේ ටික ලස්සනටම වෙලා කියලා හිතාගෙන..

" ඔව් ...බේබි .. පොලිසියේ ඉන්නවා කියලා කෝල් එක ආවම ලොකු මහත්තයා යන්න බෑ කිව්වා පස්සේ ලොකු නෝනගේ පොරේට බේබි සදීනයි ගියා..

" ගම කාලා..දවාත් උඹ. රෙදිත් නෑ යකෝ
පවම සීන් එකක් වුනේ..

" කාමරේ අස්කලේ නීලම්මද..

sinhalaebooks.com

" නෑ බේබි.. මන් ආවේ නෑ.. ඊයේ ලොකු නෝනයි සදීනයි තමා අවසානෙට බේබිව ඇදට ගෙනත් දැම්මේ..

නීලා ඒ ටික කියද්දි නම් දවාන්ට පොලවේ ඉන්න බැරි තරම්.. ගෙදර මිනිස්සු ඉස්සරහා මදිවට වැඩකාරියෝ ඉස්සරහත් පව වෙලා කියලා දැනෙන්ද්දි දූවන්න හිතුනා

" නෙදකින්.. මීට වඩා හොදයි එල්ලිලා මැරුනනම්

එතකොට ඒ කෙල්ලවත් ද කාමරේ අස් කරේ
චිට් එකක් තිබ්බේත් ඒකිද..
කඳුලු මගුලක් කියන්නේ මන් ඒකි බදගෙන ඇඩුව වත්ද..

අඩෝ නෝ දවාන් උඹ.. නෑ.. එහෙම දෙයක් වෙන්න එපා..

දවාන් කොන්ඩේ ඇදන් අඩි හප්පගද්දි නීලට හිනා යන්න ආවේ.. ඔය ටික ඉයලා ඔහොමනම් ආපු විදිය දැනගත්තොත් ගෙදරිනුත් යන තරම් හින්ද..

" තේ එක බේබි..

" ආ ආ දෙන්න නීලම්මා.. මේ මෙ මන් ඕවා ඇහුවා කියලා අම්මලාට කියන්න එපා..දැන් නීලම්මා යන්න..

නීලා ආපහු හැරිලා ආවේ හිනාවෙවී..

අද බේබිගේ මූන සිරියාවයි.. දඟකාර වෙලා වගෙ නිකම්.. කවදවත් නැතුව හිනා වුනා.. අනේ එහෙම ඉන්නවනම් හැමදම..

" අද හාල් මැස්සෝ කෙල්ලත් මාව එක්කන් එන්න ගියාද..
යකෝ ඒකිට මන් ගැහුවත් එක්කනේ..
කෙල්ලෝ පලිගන්නේ දවාන් හීන් තූලෙන්..
පරිස්සමින්..

පීරිසිය උඩ තිබ්බ තේ එක අතට ගත් දී කෝප්පෙට යට කරලා තිබ්බ තවත් පුංචි චිට් එකක් අහුවුනා

" තේ එක උණු වැඩි වුනොත්..
බොන්න බෑ පිච්චෙනවා
තේ එක නිවිල වැඩිවුනොත්
රහක් නැතිවෙනවා..
ජීවිතේටත් රහක් තියනවා

sinhalaebooks.com

අඩු වැඩි වෙන තරමට
දුක සතුට ලැබෙන්න....."

"කව්ද යකෝ මේ කවි එවන එකා.. මඟුල කියනවා
රහක් කොහෙද ජීවිතේ මගේ..
දවාත් කියන්නේ හිතක් නැති එකෙක්..

හොයාගන්නම් මන්... මොකාද කව්‍ය විශාරද කියලා මේ දවාත් ලගට එන්න තරම්..

නීලා යද්දි සදීනා මඟ රැකන් හිටියේ හොරාට බල බල..කෙල්ල දවාත්ව මෙල්ල කනර්න අලුත් ක්‍රමයක් හොයාගත්තා ... නීලට හොරෙන් චිට් එක ලියලා තේ එක අස්සේ තිබ්බෙ කෙල්ල..

දැන් විස්වාසයි දවාත් උඩින් පෙන්නන මනුස්සයා නෙමෙයි ඇත්තටම ඉන්නෙ කියලා ..

" නැත්දේ.. ඇහැරලාද දවාත් මහත්තයා

කෙල්ල නොදැනෙන්න ඇහුවේ නීලගෙන්..

" හ්ම්.. ඔය හිටියෙ.. ලැජ්ජාවෙ ඊයේ නාඩගමට..

" ආ.. මොකුත් ඇහුවේ නැද්ද ඉතින්..

" නෑ කව්ද කාමරේට ගෙනත් දැම්මේ ඇහුවා..

" නෑ ඉතින් නැත්දූ කිව්වද මම කියලා..

කෙල්ල බය වුනා වඩේ අතටම මාට්ටු කියලා. නීලා බොරුවක් කියන් නෑ දවාත්ට කියලත් කෙල්ල දන්නවා..

" මන් කිව්වා නෝනයි මිසීයි කියලා

" ආ ඒක හොඳයි..

නීලා කුස්සියට යනකම් කෙල්ල බලන් හිටියේ බය වෙලා..

දෙයියනේ චිට් තිබ්බේ මන් කියලා දැනගනීද.. දසුනි නෝනා කියලා හිතයි.. ඔව්..
දැනගත්තනම් මේ වෙද්දිත් බෙල්ලෙන් අල්ලගෙනනෙ ඇවිත්..
කෝ ඉතින් තාම නෑනේ..
තත්වය යහපත් සදීයෝ.. උඹ ගේම ඇදගෙන යමන්..

sinhalaebooks.com

සදීනා උඩ බැලුවේ දවාත් පිහියක්වත් අරන් දුවන් එනවද කියලා. අංගුලි මාල වගේ මාරාවේශ වෙලාද දන්නෙත් නෑනේ.. කෝකටත් කියලා පොඩි දරුවත් අරන් එලිය බැස්සේ තීලා තිවෙන්න තියපු කිරි බෝතලෙත් අරන්..

චුට්ටෝ ඔයා දන්නවද ඊයේ වුන දේ..
ඔයා ගේ තාත්තා මෝඩයා.. ඉන්නවා නේද..
මන් එයාගේ කාමරේට ගියා...

ආ ඔයාටත් යන්න ඕනේ.. ද
අම්මෝ අම්මෝ මෙයා තාත්තට එච්චර ආදරෙයිද...

කොල්ලා අත් උස්සන් උඩ පනින්න වගේ හදද්දි කෙල්ලඅ අහන්නේ මූන ඉඹලා..

ඒයා ට මුල ඉඳන් හැමදේම කියලා දෙන්න ඕනේ.. චුට්ටෝ...
එයා ලගට ඔයාට යන්න මන් කොහොමහරි එයාව හොද කෙනෙක් කරනවා..

සදී ගෙන් චූට්ටට ඒක පොරොන්දුවක්..
හාද.. කවදහරි ඔයා මේ වගේ අර නපුරගේ අතේ ඉදන් හිනාවෙන්න ඕනී..
හරිද මැණික..

කෙල්ල අත් දෙකෙන් උස්සන් කොල්ලව වටයක් කරකලා එලියේ බංකුවෙන් ඉඳගෙන කකුල් දෙක උඩ කොල්ලා තියාගත්තේ කිරි එක පොවන්න..

කෙල්ල දන්නෑ මෙච්චර වෙලා කෙල්ල ලග ඇස් දෙකක් තිබ්බා.. දවාත් බැල්කෙනියට වෙලාබලන් හිටියේ මේ සේරම..

දරුවා දකිද්දි කොල්ලගේ පපුව රිදෙනවා වගේ.. ඒක හංගලා තරහක් මවා ගන්න දවාත් දන් පුරුදු වෙලා.. දරුවා තමන්ගේ කියලා පිළිගන්නවත් කැමති නැති තරම් ඒ වේදනාව වෛරය පලිගැනීම මේ ඔක්කොම එකට වෙලා තිබ්බා..

" ඔ හෝ මේ ඉන්නේ අර කෙල්ල නේද...දෙන්නම් මන්..

දවාත් චිට් එක අරන් උඩ ට උස්සලා බල බල හිටියේ කෙල්ල උඩ බලනකම්..

සදීනා ගස් වලට ආව කුරුල්ලෝ පෙන්නන ගමන් අහම්බෙන් බැල්කෙනිය බලද්දි දවාත් කොල දෙක උස්සන් ඉබලන් ඉන්නවා දැක්ක..

චුට්ටෝ අන්න තාත්තා ඇවිත්.. හැබැයි චුට්ටෝ මන් නම් ඉවරයි දැන්..
මන් තියපු චිට් බලන්නේ එයා..

sinhalaebooks.com

කෙල්ල ආයේ එකපාරක්වත් ඒ පැත්ත බැලුවේ නෑ දරුවා දිහා බලන් කිරි එක පෙව්වා.. කෙල්ල ගේ යටි හිත ගැහි ගැහී තිබ්බේ දැන් කැගලා බනී දැන් බනී කියලා..ඒත් දවාන් ගෙන් එහෙම කිසිම වචනයක් ආවේ නෑ.. අඩුම තරමේ රවාගෙනවත් බැලුවේ නෑ..කෙල්ල ඒක දැක්කා ඒ මූන පැහැදිලී ව තිබ්බා ඒතරමට..

" ආ ආ මේකිතමා මේක එව්වේ..ශුවර් ඇන්ඩ් ශොට්.. මෙච්චිහ ෟවෙලා තිබ්බ සිරික්කි හිනාව එකපාරම නැවතුනා..

මන් මොනාහරි කිව්වද දන්නෑ ඒකී එක්ක..
මොන මගුලක්වත් මතක නෑනේ..

දවාන් අතේ තියන් ගුලිකරපු චිට් දෙක ආයි දිග ඇරලා බැලුවා..

ඒ වචන වල මොකක්දෝ දෙයක් තිබ්බා. විසිකරන්න ගුලි කරන් ආපහු අරන් ගිහින් කාමරේ කණ්ණාඩියේ කොල දෙකම ඇලෙව්වා..

"ජීවිතේට රහක් තියනවා..
හරියට නීලාම්මගේ කිරි තේ එක වගේ..

එකන් තරකම නෑ..

දවාන් බෙල්ලත් ඇද කරන් චිට් එක දිහා බලන් ඉදලා ටවල් එක අරන් බාතෲම් එකට රිංග ගත්තේ හිනාවෙවී..

..............

සදීනා.. කොල්ලා කිරි බොනවද හොදට..

දසුනි ලගට එනකම් කෙල්ල දැක්කේ නෑ . කෙල්ල හිටියේ දවාන් ගැන සිහියෙන්.. කාටත් රහසේ දවාන්ට කිට්ටු වෙන්න කෙල්ල ප්ලෑන් කලේ.. දරුවා හින්ද.. හිත හැමවෙලේම කලබලයි ඒ හින්දම..

"ආ චූටි නෝනා.. අම්මෝ කුක්කු පප්පා මේ.. රෑටත් බොනවා දෙතුන් පාරක්..

කෙල්ල හිනාවෙවී කියලා දසුනි අතින් කොල්ලා තිබ්බා..

" පුතු ඔයා කුක්කු වලට ඔච්චර ආසද අනේ..

"චූටි නෝනා අම්මෙක්ගේ කිරි තරම් හිත පිරෙන දෙයක් මේවගේ දරුවෙක්ට නෑ නේද.. කොච්චර අපි කිරි දුන්නත් ඒයාට බඩගිනී එනවා..

sinhalaebooks.com

කෙල්ල කිව්වේ ඇස්වල කඳුලු පුරවන්..

" මන් දන්නවා සදීනා..අපේ අයියලගේ පව් ගෙවනවා මේ අහිංසකයා..

" මෙයාගේ අම්මා කෝ චූටි නෝනා.. අපි එයාව ඉන්න තැනකින් එක්කන් එමුද.. දරුවට කිරි කටක් දෙන්න ...

නෝනා තමන්ගේ අම්මගේ තනපුඩුවකට කට තියන්නවත් නැතුව ලොකු වුනා කියලා කවදහරි දැනගත්තොත්.. කොච්චර දුක් වෙයිද අසරණ වෙයිද.. මේ පැටියා..

සදීනා කියද්දි දසුනි කොල්ලගේ හිස මතින් දෙතොල් තියන් හිටියේ දරාගන්න බැරුව..

" සදීනා.. මෙයාගේ අම්මා ආයි එන එකක් නෑ..

" එයා කොහෙද නෝනා.. ඇත්තටම මොකක්ද වුනේ දවාන් මහත්තයගේ පවුලට..

සදීනට දසුනි ගෙන් මේ හැමදේම දැනගන්න උවමාව හොඳටම තිබ්බා.. ආව අවස්තාව මග නොහැර කෙල්ල හෙමීට ප්‍රශ්නේ දැම්මා..

" අපේ අයියා ඉස්සර හරි අහිංසකයි.. එයා හරි ජෝක් .. මට මාර ආදරෙයි එයා.. ඒ වගේම එයාට ආක්ෂා අක්කි හම්බුනාම එයාට පන ඇරලා ආදරේ කලා.. අක්ෂා අක්කි මොඩ්ලින් කලේ ඒ හින්ද අම්මලා අකමැති වුනා එයාව අපේ පවුලට ගන්න ඒත් අයියා නිසාම එයාලා කැමති වුනා..

ඉතින් ඒ දෙන්නා මැරි කලා.. අක්ෂා අක්කිට රට යන්න ආවා..එතකොටම අක්කි ප්‍රෙග්නන්ට් වුනා.. අක්කි බෑම කිව්වා දරුවා හදන්න.. එයාට ආයි එහෙම අවස්ථාවක් හම්බෙන් නෑ කියලා.
අයියා එක්ක රණ්ඩු කලා හැමදම.. එයා දවසක් බලෙන් දරුවා නැති කරන්න ගියා.. එද අයියා යකෙක් වගේ.. අක්කිට හොඳටම ගැහුවා..

දරුවා නැට්ජ් වුනේ නෑ මෝරලා වැඩී කියලා තිබ්බා ඩොක්ටස්ලා ..
ඒත්..එදයින් පස්සේ අයියා අක්කිට සැලකුවේනෑ.
අක්කි ගැන බැලුවෙවත් නෑ..
අයියා පිස්සෙක් වගේ හිටියා..හොඳටම බොන්න පටන් අරන්..

පස්සේ අක්ෂා අක්කි දරුවව හම්බුනාම ගෙදරට පණිවිඩයක් එවලා තිබ්බා.. දරුවා ගන්න එයා අයියගෙන් අයින් වෙනවා කියලා.
එයා අයියවයි දරුවවයි දෙන්නම දාලා රට ගියා
ඊට පස්සේ දරුවා මාස 2 ක්ම හිටොයේ හොස්පිටල් එකේ.. එයා හරි දුවර්ලයි කිව්වා..
හුගක් අමාරු වුනා අපේ කොල්ලට සදීනා..
ඒත් එයා අමාරුවෙන් ජීවිතේ අල්ලන් හිටියා..

sinhalaebooks.com

ඒත් එයා පත අරන් එද්දි එයාගේ අම්මයි තාත්තයි දෙන්නම එයාට නැති වෙලා..
මගේ කොල්ලා පව් සදීනා..පව්.. අයියලා මේ කරන්නේ සුලුපටු පවක් නෙමේ..

දසුනි අඩ අඩම කියද්දි කෙල්ලටත් දරාගන්න ආමාරුයි.. මිනිස්සුන්ට මෙච්චර අමානුෂික වෙන්න පුලුවන්ද දරුවෙක්ට..ඔව් ඔය වෙලා තියෙන්නේ.. දවාන් අක්ෂා දෙන්නම බලෙන් ආව වගේ පලි අරන් තියෙන්නේ මේ කිරි සප්පයගෙන්..
සදීනා හිතුවා..
සමදරා උදේ ඉඳන් පේන්න නැති නිසා දවාන්ට ප්‍රශ්නේ.. කොල්ලා බීලා නෙවෙයි මිතියක් මරලා ආවත් පුතේ කියන් සමදරා දුවන් එනවා කියලා කොල්ලා දන්නවා..
ඒත් අද නිකමටවත් කාමරේට ඇවිත් බැලුවේ නැති නිසා අවුල් ටිකක්..

" ඔක්කොම වගේ අම්මත් මාව හැලුවද එතකොට.. නෑ කීයටවත් එහෙම වෙන් නෑ..

කැමා කොට කලිසමට අත් නැති සුදු ටී එකකුත් දන් කොන්ඩේ ටිකක් පස්සට හදන් දවාන් පහළට බැස්සේ වටේටම ඇස් දන්.. බැරිවෙලාවත් රණබාහු හිටියොත් ඔන්දස්පොට් කියලා කොල්ලා දන්නවා..

පේන මානේ කවුත් නෑ සාලේ තිබ්බ කටර්න් ටිඅක විතරක් සර බර ගලා හුළගට වැනෙනවා ඇරෙන්න කවුත් නෑ සද්දයක්..

" මොකෙක්වත් නැද්ද මේ ගෙදර..
ටිකකට කලින් හිටියනේ අර හාල්මැස්සෙක් වගේ ඉන්න කෙල්ල..

කලිසම් සාක්කුවට අත් දෙකත් දන් තාලෙට ඇවිද්දේ ගෙදර කිසි කේනෙක් නැති නිසා නිදහස විඳිනවා කියලා හිතන් ඒ සතුට ඩෝං පටෝන් ගෑවේ කොල්ලා ඉස්සරගින් ගාඩ්න් එක යන්න බහිද්දිම රණබාහුගේ ජීප් එක ඇවිත් නතර කරායිත්..

" මඟුලයි.. උසාවි දලා නඩුත් අහලා හිරෙත් දලා නවතින්නේ අද ..
දවාන් උඹ හිත හිත නොහිත ආපු වේගෙන් නොදැක්ක ගානට කාමරේට දුවපන්..

සමදරයි රණබාහුයි ජීප් එකෙන් බහිද්දි දවාන් නොදැක්ක ගානට මාරුවෙන්න හැරුනේ..

" පුතා ඉන්න..

" හරි .... ඔය කෙරුවේ..

සමදරා පැත්ත හැරෙන් නැතුව දවාන් මූන දෙක කරන් ඉඳලා බොරු හිනාවක් දලා හැරුනේ වැඩේ වැරදුන හින්ද..

" ආ අම්මා.. මන් දැක්කේ නෑ..

sinhalaebooks.com

කොහෙද ගියේ උදේම

" යමුකෝ ඇතුලට ඔයාට වැදගත් දෙයක් දෙන්න තියනවා..

වැදගත් දේකට තියෙන්නේ ඊයේ බීලා නටපු එක තමා ඒකට දෙහි මල්ලක් අරන් එනවා ඇති ඔය.
අම්මගෙත් නම් බේරුනහැකි.. ලොකු මහත්තයා දෙන ලොරි ටෝක් තමා දිරවන්නැත්තේ ලමක් නෑ දවාත් උඹ ඉවසලා මාරු වෙයන්..

දවාත් හිත හිතම ඇතුලට ඇවිත් සෝෆාවකට වැටුනේ සමදරත් ඇවිත් ඒ ලගින්ම වාඩි වෙද්දි..

සදීනා දරුවා නිදි කරවලා නීලට උදව් කර කර ඉදලා දුවත් ආවේ සමදරලා ආව සද්දෙට..
කෙල්ල දන්නවා සමදරා උදේමගියේ මොකටද කියලා..

රණබාහු පවුලේ එකම මුණුපුරාට නමක් අරන් එන්න..
කෙල්ල හිටියේ කොයි වෙලේද එන්නේ කියකා මග බල බලමයි..

" පුතා.. මේක අත්සන් කරලා දෙන්න..

සමදරා දවාත්ගේ අතේ තිබ්බේ බතර් සෙටිෆිකේට් හදන ඇප්ලිකේෂන් එක.

" මොකක්ද මේ .. තාත්තා කම්පැනිය මගෙන් ආපහු ගන්නවත්ද.. මන් අවජාතකයා හින්ද..

" මොනාද පුතා මේ කියන්නේ.. තාත්තට ඇහුනොත්..හොදට හිටී..

දවාත් ඇන්ලොප් එක ඇතුලේ තිබ්බ කොලේ දිගාරිද්දිම දැක්කේ..

" අයාන් පාරමිත් රණබාහු

මව __... අක්ෂා ධනුජ් වික්‍රමසිංහ
පියා____ දවාත් මේඝසිත් රණබාහු

ඒ ඔක්කොම ඉයවන්න ඕනේ වුත් නෑ අක්ෂාගේ නම දැක්කා විතරයි මෙච්චර වෙලා තිබ්බ සැහැල්ලු මූන සම්පූණර්යෙන්ම වෙනස් වුනා..
දවාත් අත් මිට මොලවත් වෙව්ලුවා.. ඇස් රතු කරගත්තා.. ඒ දත් එකට හප්පද්දි මූනේ මස් ඉලිප්පුනේ යකෙක් වගේ..

" නෑ.. මේකට මන් අත්සන් කරන්නෑ..
කොහෙවත් යන වුන්ට මගේ නම දෙන් නෑ..

sinhalaebooks.com

දවා ත් කොලේ පොඩි කරලා විසිකරපු පාරට ඒක ඇවිත් වැටුනේ සදීනගේ කකුල් දෙක ගාව..
කෙල්ල ඒක දැක්කත් අහුලන්න නැමෙන්න බය හිතුනා..එහෙමම ගල් පිළිමාක් වගේ බිත්තියට හේත්තුවෙකා අත් දෙක්වින්ම කට වහන් හිටියේ හුස්මක් වත් ගන්න බයෙන්..

" දවාත්.. උඹ සෙල්ලම් කරන්න ලැස්ති වෙන්න එපා.. මාව යකෙක් නොකර අත්සත් කරපන් බල්ලා ඕක..

කසාද බැඳපු ගෑනි ගේ බඩේ අනුන්ගේ ළමයි හැදෙනවා නම් ඒක උඹේ වැරැද්දක්..

රණබාහු දවාත්ට ඇඟිල්ල දික් කරලා කිව්වේ අන්තිම පාරට.. දවාත්ගේ මේ නාඩගම දැන් ඇතිවෙලා හැමෝටම..

" ඔච්චර අමාරුනම් තාත්තාගේ නම ද ගන්න..
බාර ගත්තෙ මම නෙවෙයිනේ..

" මොකක්ද බල්ලෝ උඹ ඒ කිව්ව පාහර කතාව..
අවලත් තිරිසනා.. උඹව මත් අද ඉතුරු කරන්නෑ..

රණබාහුට දවාත්ගේ ඒ කතාව දරාගන්න බැරිවුනා පැනපු ගමන් දවාත්ට කනේ පාරවක් තුන හතරක් දීගෙන ගියේ කේන්තිය උපරිමේට තියන්

" අනේ ඇති මහත්තයා..ඕක නවත්තන්න අනේ පුතේ යන්න කාමරේට..

දෙයියනේ නාමෙන් ඕක නවත්තන්න..
මහත්තයා.. අනේ..

සමදරා කෑ ගැහුවේ රණබාහුගේ ඇගේ එල්ලිලා
දසුනිත් නෑ අද ගෙදර යාලුවෙක්ගේ ගෙදර ගිහින් සදීනා ඈතට වෙලාම හිටියේ ළඟට යනවා තියා දවාත් දැක්කම ත් ඇගේ හිරිගඩු වදින්න තරම් බය හිතෙන හින්ද..
නිලත් ඈත තියා බලන් ඉන්නවා ඈරෙන්න ඒ මැද්දට යන්න තරම් ශක්තියක් තිබ්බේ නෑ..

" ඉතං.. ඇති තාත්තේ ඇති
ගහලා මරලා දාන්න මාව මරලා දාන්න..
එක පාරින් මරලා දාන්න ඉවරයක් එතකොට..

මන් ඔය ළමයා බාර ගත් නෑ නෑ නෑ මයි
මැරුවත් නෑ..
ආයේ ඕක ගැන කියලා මාව මිනී මරුවෙක් කරගන්න එපා.. එච්චරයි..

sinhalaebooks.com

ළඟ තිබ්බ වීදුරු මල්වාස් එකක් අතේ පොඩි කරගත්තේ ඒ කටු වලට අත කැපිලා ලේ වැක්කේරෙද්දි.. දවාත් පිස්සු වැටුන ගානට ආවේස වෙලා වගේ. අත කැපිලා කියලවත් ගානක් නෑ..
ලේ පිටින්ම කාමරෙට ගිහින් සද්දෙට දොර විහගත්තකම් සමිදරයි රණබාහුයි සාලේ හිටිය තැන්වලම ඉදන් බලන් හිටියා මිසක් වචනයක්වත් කිව්වේ නෑ..

" පේනවද අර තිරිසනාට වෙලා තියෙන දේ..
ඌ අපේ දරුවෙක් කියලා හිතන්නවත් පුලුවන්ද සමදරා.. ඌ මගේ එකෙක්ද..

රණබාහුගේ ඇස්වල කඳුලු තියනවා කෙල්ල දැක්කා ඈතට .. මේ කේන්ති තරහා ආවේග අස්සේ තියෙන්නේ ආදරේ නේද.. නැත්තන් කොහෙන්ද මේහෙම කඳුලු.. ඒකේ තේරුම දවාත්ගේ තරහා කේන්තිය අස්සෙත් දරුවා වෙනුවෙන් ආදරයක් තියනවා කියන එක.. සදීනා කලපනා කලේ රහසෙම..

" මේක පවුලේ ලෙඩක්.. ආදරේ හඟන් වෛර කරන එක..

දැනුයි මට තේරෙන්නේ.. රණබාහු මහත්තයා ආදරේ නිසාමයි දවාත් මහත්තයා මත්තේ ඔට්ටුවෙන්නේ..ඒ තාත්තගේ පුතත් කරන්නේ ඒ ටිකමයි..

හොදයි අපි බලාගමු මිස්ටර් දවාත් රණබාහු..
ඔයාද දිනන්නේ මේ සදීනද කියලා..

කෙල්ල හෙමින්ම දවාත් විසිකරපු කොලෙත් අහුලන් කාමරේට ගියේ කරන්න දෙයක් හිත හිත..

" චූට්ටෝ ඇහුනද අද යුද්ධෙ..

ඔයාට ආච්චි නමක් දන් ඇවිත්.. දන්නවද ඔයාගෙ නම..
මිම් ඉන්න මන් කියන්න..

" මිස්ටර් දවාත් රණබාහුගේ එකම පුතා අයාත් පාරමිත් රණබාහු..

ඒ කියන්නේ ඔයා අද ඉදන් මගේ ආයු...

ආයු කියන්නේ හුස්මට.. ඔයා තමා මේ ගෙදර් හුස්ම. කවදහරි ඔයාගේ තාත්තගේ හුස්ම වෙලා ඉදීවි ඔයා ..එදට මන් නැතිවුනත්..
මගේ ආයු මාව මතක් කරනවා නේද මිම්

කෙල්ල නිදන් ඉන්න කොල්ලගේ කොපුලක් මත සිපුමක් තිබ්බේ ආදරෙන්..
කොලා කෙඳිරි ගාලා ඇහැරුනේ සදීනගේ උණුහුම දැන් කොල්ලා හොදට අඳුරනවා.. කෙල්ල ලඟට ආවම හොදට ඉව..

sinhalaebooks.com

කොල්ලා ආසා සදීනා එක්ක ඇඳට වෙලා හුරතක් වෙන්න.. නිදගන්නෑ වරුවකටවත් කෙල්ල බලෙන් නිදිකරොත් ඇරෙන්න..

" මගේ ආයූ..
හොරගෙඩියා.. දැන් ඇහැරිලා ගුස්ටි අල්ලන්න නේද හදන්නේ..
බෑ බෑ මට වැඩ ගොඩයි..
හිතන්න ඕනේ මේක අර ඔයාගේ මෝඩ තත්තගෙන් අත්සන් ගන්න විදියක්.

කෙල්ල කොලේ කරකව කරකව කල්පනා කලේ ක්‍රමයක් .

" ආවා ආවා.. කෝ අත දෙන්න
පහක් දන්න.. හොද අයිඩියා එකක් ආවා..

කෙල්ල අයුගේ අත් දෙක අරන් එකට ගහද්දි කොල්ලා උඩ පැන පැන හිනාවෙනවා..
තේරෙනවා වගේ හරියට හැම්දේම..

" ආ..ම් ආ..ම්

කොල්ලා තොල් හදනවා.. පිටවෙන්නේ අකුරු දෙකයි..
ඒ දගලන්නේ අම්මා කියන්න..
කෙල්ලට ඒක තේරුනා..

" දෙයියනේ ආයූ.. මගේ කොල්ලා
අම්මා කියන්නද ඔය හදන්නෙ..මේ දුප්පත් මට
නෑ මැණික මන් ඔයාගේ ආයාම්මා..
එච්චර වටිනාකමක් මට හම්බෙන් නෑ කවදාවත්

කොල්ලව පපුවට අරන් සදීනා ඇඬුවා කඳුලු ඔහේ ගකාගෙන යනකම් ඇඬුවා.. පපුවට මොකක්දෝ වෙනවා. කෙල්ක දැන් ලෝබයි මේ ආදරේට..
දැන් අයාන් දලා තත්පරයක්වත් ඉන්න බැරි තරම් ඒ පුංචි හිත එක්ක බැදිලා ඉවරයි..

දවස ගෙවෙනවා තේරෙන් නෑ අයූඑක්ක ඉද්දි.. කිරිහදනවා නිවනවා ඒක පොවනවා. ඒ කරලා නිදි කරවලා රෙදි ඔක්කොම කෙල්ල අතින්ම හෝදලා දන්නේ හරි පරිස්සමට පිරිසිදුවට..

උදේ දවාන් ගේ වකිය නිසා දවසම කෑම මේසේට ආවේ නෑ එක්කෙනෙක්වත්.. කෙල්ලයි නීලයි ත් බත් කෑවේ නෑ තේ එකක් බීකා හිටියා හැමෝම බඩගින්නේ ඉද්දි කෑමක් කන්න හිත දුන් නෑ..
රණබාහු දවාන්ට කෑ ගහලා සමදරාටත් අවසානේ බැනලා ගිය පාර හවස් වෙමකම්ම ආවේ නෑ

sinhalaebooks.com

කෙල්ල දැක්කා සමදරා දෙතුන් පාරක් ගේට්ටුව දිහා බලන් ඉන්නවා රණබාහු කැමටවත් එයි කියලා
දවාත් නිසා හැමෝම දුක් විදිනවා නොකා නොබී..

කෙල්ල රෑ වෙනකම් හොර ගල් අහුල අහුල හිටියේ හිතේ තියන් ලොකු ප්ලෑන් එකක් ඒක අහු වුනොත් බෙල්ල නැතුව එන්න වෙනවා කියකා දන්නවා ඒත් එක කරන්න කෙල්ල හිතා ගත්තා..

ඉස්සර ධීවර සමිතියේ ඕනම රජකාරී වැඩකට වැල්ලේ අයගෙන් ගත්තේ ඇඟිලි අත්සන ඒ ගොඩක් අයට අකුරු බැරි නිසා..
ඒ අත්සන ඕනම දේකට වලංගු වුනා..

කෙල්ලට ඕක මතක් වුනේ උදේ.. දවාන්ගේ ඇඟිලි අත්සන කොලේට ගහගත්තොත් ඒ වැඩේ සම්පූණර්යි ..එතකොට අයාන් කියන්නේ නිතියෙන් දවාන්ගෙ පුතා ඒක අයි වෙනස් කරන්න බෑ..

එත් ප්‍රශ්නේ තිබ්බේ දවාන්ට නොදැනෙන්න ඒක කරගන්න විදියේ..
ඕනම දෙකට මූන දෙන්න හිතන් කෙල්ල රෑ දවාන්ගේ කාමරේට පනින්න හිතා ගත්තා..

" නැන්දේ කෑම කැවද කට්ටිය..

" මොන රෑ කෑම මේසෙත් ඔක්කොම අහක දන්න වෙනවා.. චූටි නෝනා විතරක් පොඩ්ඩක් කෑවේ..

දවාන් කැමට ආවද නැද්ද කාමරේ ඉන්නවද කියලා කෙල්ලට දැනගන්න ඕනේ වෙලා තිබ්බේ..
තිලගෙන් ඒ ගැන කෙලින්ම අහන් නැතුව සදීනා වටින් ගොඩින් ඉගියක් දැම්මා..

" ම්ම්.. දවාන් මහත්තයානම් කන්න ඇති එයාට ගානක් නැනේ ඕවා..

" මොන අද දවසටවත් කාමරෙන් ආවේ නෑ.. තේ එකක්වත් ඉල්ලුවේ නෑ..මෙලහට ඇතුලේ ඉදන් හොදට බොනවා ඇති..

කෙල්ලට හීන් දඩිය දැම්මා.. මොනා වුනත් බීපු මනුස්සයෙක් ඉන්න කාමරේක යන්න බයයි..අනික් දවාන් වගේ එක්කෙනෙක්ගේ කොහොමත් බයයි
ඒත් දැන් වෙන විසදුමක් නෑ මේක ඇරෙන්න..

" ආයු .. නෝට් වැඩ බෑ.. දොයියගන්න ඕනී
හොදද.. ඇඩන්න බෑ මන් එනකම්..
එහෙම වුනොත් මාව ඔයාට නැතිවෙයි අර යක්ෂ තාත්තා මාව මරලා දයි..
මන් ඔයාගේ අයිතිය අරන් එන්නම්..

sinhalaebooks.com

ඉක්මනටම ..හොඳද..

කෙල්ක තලලට හාදුවක් තියලා දොර බාගෙට ඇරලා එළියට ආවේ හැමෝම නිදගන්න ගියාට පස්සේ..

දවත් රණබාහු ගේ ඔෆිස් කාමරෙන් උස්සපු සීල් තින්ත එකයි කොලෙයි අරන් කෙල්ල හෙමින්හෙමින් පඩි නැගලා උඩ ගියේ දවාන්ගේ කාමරේ තිබ්බේ උඩත්තට්ටුවේ හින්ද..

" අකී... අකී..
ඔයා කෝහෙද අකී..
එන්නකෝ ආයෙම..
ම ....ට
ජීවත් වෙන්න ඕනේ..
ඔ යා එක්ක..
එ න් න..... ඔයාගේ දවාන් පිස්සෙක්
නොකර එන්න..

සික් ගන්දස්තාරේ බෑ.. බීලා බීලා කියෝනවා..
ආක්ෂට අඬගහනවා.. නේද..
එතකොට ඒ කෙල්ලට සැලකුවේ නැලුනේ මේ යකා..
දැන් මේ ඉල්ල ඉල්ල අඩන්නේ..

දවාන් ගේ අසීමිත ආදරය ම තමා එයාගෙ කේන්තියත්.. ඒක කිසිම කෙනෙක්ට දැනුන් නෑ.. අක්ෂා ට තිබ්බ ආදරේමයි වෛරයක් වෙලා පලිගත්තේ.. දවාන් ගේ හැටි ඒක.. ආදරේ වැඩි වෙන්න වැඩි වෙන්න දවාන්ටපුංචි දේටත් කේන්ති ගියා..

කෙල්ල දවාන් දිහා බලාගෙන හිටියේ ඇඳී මුනින් අතට වැටිලා ඔහේ දොඩවන දිහා..

උදේ තුවාල උන අත තාමත් එහෙමමයි.. ලේ වේලිලා අනේ .. ඒත් තිවාලේ ලොකුවට පේන්නම තිබ්බා..

" බෙහෙත්වත් දගෙන නෑ..
එයා එයාගෙන් මත් පකිගන්නවා

දවාන්ගේ කබඩ් එකෙන් බෙහෙත් දලා තිබ්බ පෙට්ටිය අරන් කෙල්ල ඇදෙන් වාඩි වුනේ පරිස්සමට.. දවාන්ට මෙලෝ සිහියක් නෑ ඔහේ දොඩෝනවා.. ඒ වචන අස්සේ නිතරම කියෙව්වේ අක්ෂගේ නම..

කෙල්ල බෙහෙත් දන්න කලින් දවාන්ගේ අත හෙමීට අරන් සීල් ගහන තින්ත එකේ ඔබලා කොලේ අත්සන ගහන තැනින් තියාගත්තේ මාරම ගේමක් දීලා..

sinhalaebooks.com

දවාන්ගේ තුවාලෙට බෙහෙත් දලා වෙලුම් පටියක් අරන් අත ගැටගැහුවේ රිදෙන් නැතිවෙන්න.. ඊටත් ඕක එලිවෙනකම් තිබ්බොත් පාර ගන්න නිසා..

" සදී ඔන්න හරි.. අයාන් දැන් දවාන්ගේ..
අයාන් දවාන්.. එකතුකලා..

" කව්ද.. එකතු වෙන් නෑ ආයි.. අපි වෙන්වුනා
ඒත් චුට්ටක් මන් ලගට ඇවිත් ඉදලා යන්න..අකී
අකී..

අකී............අකී........

දවාන්ගේ සද්දේ වැඩිවුනා.. මහහයියෙත් අකීෂට අඩ ගහන්න ගත්තයින් කෙල්ල බයවුනා..

අයාන්ගේ කොලේ පපුවට තුරුල්න්කරන් කෙල්ල නැඟිටින්න ගියේ ඔඩොක්කුවෙන් තියන් හිටිය දවාන්ගේ අත පැත්තකින් තියලා..

ඒත් සදීනට ඉස්සරහට අඩියක්වත් යන්න හම්බුනේ නෑ එහෙමම පස්සට ඇදිලා ගියේ දවාන්ගේ පපුව උඩට..

කෙල්ල ගැහෙනවා මාලුවෙක් වගේ .. උදව් ඉල්ලලා කෑ ගහන්නත් බෑ.. මූකුත් කරගන්නත් බෑ.. දවාන්ගේ අත් කෙල්කගේ ඉන වටේන්ගිහින් තිරුවත් පපුවට කෙල්ලව තද කර ගත්ත්දි සදීනට
මුකුත්ම කරගන්න බෑ.. බයයි ඊටත් එහා ලැජ්ජාව..

ඒහුස්ම වදින්නේ කෙල්කගේ මූනටමයි.. සැරම සැර ගඳක් එක්ක රස්නෙට දැනෙන දවාන්ගේ හුස්ම මගඅරින්න කෙල්කලට බැරිවුනා..

" මාව දලා යන්න ද හදන්නේ
එපා.. මට පාලුයි තනියි..
අකී.........
චුට්ටක් ඉන්න මෙ පපුව උඩ..
අහන් ඉන්න මගේ හුස්ම
ඔයාව ඉල්ලනවා..
ඔව් හැම තත්පරේම හැම විනාඩියේම
ඔයාවම ඉල්ලනවා..
දවාන් මේ ලෝකේ ආදරේ කරන්නේ උඹට විතරයි
ඔව් ඒ උඹට විතරයි
මැරෙනකම්ම..උඹ විතරයි ඉන්නේ මේ පපුවේ
අකී..
මගේ දරුවත් අරන් එන්න..

sinhalaebooks.com

ආපහු..

කෙල්ල දවාත්ගේ පපුව උඩට වෙලා හුස්මවත් නොගෙන බලන්හිටියේ දවාත්ගෙ ඇස් වලින් කඳුලු ගලාගෙන යන විදිය.. දවාත් ගේ කටින් පිටවෙන අක්ෂාගේ ආදරේ දිහා..

දවාත්ගේ පපුව රස්නෙයි. කෙල්ලට ඒක දැනෙනවා ... අසිහියෙන් වුනත් මේ ඉන්නෙ මනුස්සයෙක්.. හදවතින් පිච්චෙන..ඒ වේදනාව සදීනට දැනෙනවා...

බරට ගන්න හුස්ම එක්ක එ අත් කෙල්කගේ පිට දිගේ ඇදෙද්දි හිත නොසන්සුන්.. නුහුරු පහසක්..
කෙල්ලට ඕනේ ඉකමනට අයින් වෙන්න..
හිත ගැස්සෙනවා.. දවාත්ගේ ග්‍රහනය රලු වෙද්දි..

කෙල්ලට දවාත් සන්සුන් වෙනකම් එහෙම ඉන්න වුනා ටිකක්.. කියවන එක නවත්තලා ටිකක් ඉද්දි කෙල්ලහෙමීට දවාත්ගේ ඇඟ උඩින් අයින් වුනේ පරිසමට..

" දෙවියන්ට ස්තූති වෙන්න ..
යකාගේ කටේ නෙමෙ පපුව උඩ ඉදලා බේරුනේ..
අම්මෝ මන් බය වුනතරමක්..

පහන් අයියා ලග ඇරෙන්න මන් වෙන පිරිමියෙක් ගේ ලඟ මෙහෙම ඉදලා නෑ.. ඒත් අයු වෙනුවෙන් මට ඒක කරන්න වුනා..
සමාවෙන්න පහන් අයියේ..
මේ හැමදේම දරුවෙක් වෙනුවෙන්..

මගේ අයු වෙනුවෙන්.. මට හම්බුන දෙවෙනි ආදරේ ආයු.. පහන් අයියා ඇරුනම මේ ලෝකේ මන් වැඩියෙනම ආදරේ ආයුට.. ඒ ආදරේ හින්දමයි මේ හැම්දේම දරාගත්තේ..

කෙල්ල අයාන්ගේ බතර් සෙටිෆිකේට් කොලේ පපුවට තුරුල් කරන් දවාත් දිහා එක පාරක් බැලුවේ. අද පලවෙනි පාරට දවාත්ගේ ආදරේ දැකලා කෙල්ල පුදුම වුනා..

" තපුරු යක්ෂයා අද මන් දැක්කා ඔයාගේ ආදරේ ඒක හරි ශක්තිමත්..වගේම පිරිසිදුයි...
කවදහරි ආක්ෂා මිස් ඒවි..ඔය දෙන්නා ලඟට..
මන් විස්වාස කරනවා ඒක..එහෙම වෙයි කියලා
ප්‍රාථර්නා කරනවා.. දවාත් ආක්ෂා අයාත් පවුල කවදහරි එකතු වෙන්න කියලා..

කෙල්ල කාමරෙන් එලියට ආවේ දවාත්ගේ ආදරේ වෙනුවෙන් ප්‍රාථර්නා කරලා..
දවාත්ට සිහිය ආවේ පහුද දවල් වෙද්දි ඒකත් ඇඳෙන් නැගිටගන්න බැරි තරම් ඇඟට අමාරුයි..ඒත් කොල්ලා ඇස් දෙක ඇරන් හිටියා..
දවසම බීලා බීලා මැරෙනකම්ම බොනවා කියලා හිතන් දවාත් ජීවිතේ නැත්තටම නැති වෙනවනම් සතුටුයි කියලා හිත ත් මේ දේවල් කලේ..

sinhalaebooks.com

" අම්මෝහ් ඔලුව පැලෙන්න වගේ..
රෙද්ද ඊයේ ඇඳගත්ත ශෝට පිටින් තාමත් යකෝ
නාලත් නැද්ද මං.

ඔලුව අල්ලන් අමාරුවෙන් නැඟිටලා බලද්දී දැක්කේ මේසේ උඩ තිබ්බ කෑම පිඟාන් දෙක..

වහ ටිකක් තිබ්බනම් කාලා නිදගන්න..
රෙද්ද...
හැමදම බොනවට වඩා ඒක ලේසී..

දවාත් එහෙම කිය කියම ෆෝන් එක අරන් බැලුවේ ආපු කෝල් මැසේජ්..
කෝල් කීපයක් තිබ්බා දවාත්ගේ ක්ලබ් යන යාලුවන්ගෙනුයි..ඒවගේ ඇසුරු කරපු
කෙල්ලන්ගෙනුයි..
එහෙමම ෆෝන් එක ඇඳට විසිකරලා දැම්මේ
කොල්ලට දැන් එලියටවත් යන්න හිතෙන් නෑ..
කලුවරකට වෙලා හංගිලා ඉන්න හිතෙනවා වෙලාවකට.. හැමෝගෙන්ම ඈත් වෙලා..

දවාත් ගෙදර අයගෙන් බලාපොරොත්තු වුනේ තමන්ව තේරුම් ගන්න එක.. ඒත් හැමෝම
දවාත්ගේ කේන්තිය වෛරය එක්ක හැප්පුනා
කොල්ලා තවත් දරුණු වුනා ඒකෙන්..

අක්ෂගේ මතකය ඒ ජීවිතය දවාත්ට අමතක කරන්න බෑ.. ඒ ආදරේ නැතිවුනේ අයාන් නිසා
කියලා කොල්ලා හිතන්නේ..
අයාන් ව දකිද්දි පවා තරහා ආවේ ඒ නිසා

ලොකු බේබී...තේ ගෙනාවා..

" ඇතුලට එන්න නීලාඅම්මා

ඇඳේම ඉදන් කොල්ලා කිව්වේ නැඟිටලා ගිහින් දොර අරින්නවත් ඇඟට පත නැති හින්ද
නීලා තේ බන්දේසියත් අරන් ඇතුට එද්දි දවාත් බැලුවේ තේ පීරිසිය දිහා හොරාට
ඊයේ වගේ චිට් එකක් තියනවද කියලා

" ආ නීලාම්මා කෝ තේ එක දෙන්න මට

දවාත් ඇඳෙන් පැනලා නීලගෙන් උදුරලා වගේ තේ එක ගත්දී නීලා බලන් හිටියේ කටත්
ඇරන්..

දවාත් තේ කෝප්පේ කරකව කරකව මොනවද හොයනවා පීරිසිය අනිත් පැත්ත හරවලාත්
බැලුවා.. නීලා අතේ තිබ්බ බන්දේසිය උඩත් බැලුවා ඒත් කිසිම දෙයක් තිබ්බේ නෑ..

sinhalaebooks.com

" ඇයි මහත්තයා..

දවාත් මූණත් අකුලත් ඇඳෙන් ඉදගත්දි නීලා ඇහුවේ දවාත්ගෙ වෙනස දැකලා

" මුකුත් නෑ නීලම්මා.. මට තේ එපා අරන් යන්න..
ආ.... අර කෑම ඒවත් අරන් යන්න..

දවාත් ආපහු කොට්ටේ බදගෙන ඇඳට වැටුනේ හිස් වුන හිතෙන් .

" ඇයි බේබි මේ කෑම කාල නැත්තේ..
බලන්න. අල්ලලාවත් නෑ..

නීලා කෑමපිඟන් ටිකත් අරන් එලියට යනකම්ම දවාත් උත්තර දුන් නෑ නීලා අහපු කිසිම දේකට..

කණ්ණාඩියේ අලවලා තිබ්බ පුංචි කොල කැලි දෙක දිහා දවාත් බලාගෙන හිටියා..

" අසිහියෙන් කඳුළු හංගන්න බෑ ... දවාත් ඒක ආයෙම කියෙව්වේ සද්දෙන්..
හ්ම් ඇත්ත.. ඒත් හොර කවිකාරී දන්නව ද..

සිහියෙන් කඳුලු දරාගන්න බෑ....

දවාත් ගේ වේදනාව ඒ වචන වල තිබ්බේ..ඒක කිසිම කෙනෙක්ට පේන් නෑ කියලා කොල්ලා දන්නවා .. ඒත් සදීනගේ වචන වලට කොල්ලට ආස හිතුනා..

අයූ වෙනුවෙන් කෙල්ල පළවෙනි අභියෝගේ දිනුවා.. හොරෙන් වුනත් ආයුගේ අයිතිය අරන් දුන්න එකට සමරා කෙල්ලට හුඟක් ස්තුති කලේ දසුනිටවත් කරන්න බැරිවුන දෙයක් කෙල්ල කිසිම බයක් නැතුව කරපු නිසා..

" සදීනා.. ඔයා මට මගෙම දරුවෙක් වගේ..මෙච්චර කැපවීමක් අපි වෙනුවෙන් කළාට..
ඔයාට පින් දූවේ.. අයාන් ට එයාගේ අයිතිය අරන් දුන්නට..

සමදරා ඒ ටික කෙල්ලට කිව්වේ හදවතින්මයි
කෙල්ල මේ හැම්දේම කලේ අයාන් වෙනුවෙන්.
දවාත් කියන්නේ හිතන තරම් නරක කෙනෙක් නෙවෙයි කියලා කෙල්ල තේරුම් ගත්තා ඒ ද රැ සිද්ධියෙන් පස්සේ..
දවාත් හොයන්නෙත් නැතිවුණ ආදරේ
ආයාන් හොයන්නේ නොලැබුණ සෙනෙහස
මේ දෙන්නම අසරණයි කියලා කෙල්ලට හිතෙන්නේ..

sinhalaebooks.com

අයාන් වෙනුවෙන් හැමෝම ඉන්නවා ඒත් දවාන්ව තේරුම් ගන්න කෙනෙක් නෑ.ඒ හින්දමයි කොල්ලා මෙහෙම නපුරු වෙලා තියෙන්නේ කියලායි කෙල්ල තේරුම් ගත්තේ..

සදීනා එතනින් පස්සේ අයාන් එක්කම රුඳුනේ කොල්ලගේ වැඩ වලට දවස ගෙවමින්.. දවස් තුනක් විතරම කිසිම සද්දයක් නැතිවගෙවිලා ගියා.. ඒත් ඒ දවස් ගානටම සදීනා දවාන්ව දැක්කෙම නෑ.. ඒ ගැන ගාණක් තිබ්බෙත් නෑ.. දවාන් ගැන කව්රුත් ඇහුවෙවත් හෙව්වෙවත් නෑ

" ආයු ඔයාගේ නපුරු තාත්තා පේන්නවත් නැතේ
එයා ගෙදර නැද්ද..

කෙල්ල අයාන්ව නාවලා පිහදන ගමන් කොල්ලට කිව්වේ එදා අත්සනෙන් පස්සේ දවාන්ව නොදැක්ක නිසා ..

සදීනා අයුව වඩාගෙනම කුස්සියට ගියේ නාවපු ගමන් කොල්ලට බඩගිනි එන හින්ද කලින් හදලා තිවෙන්න තිබ්බ කිරි එක අරන් එන්න.. නීලා කුස්සියේ හිටිය නිසාම කෙල්ලට හිතුනා දවාන් ගැන අහන්න.. ගෙදරම අය කිසිම සද්දයක් නැතුව තමන්ගේ වැඩ කරන් ඉන්නවා දවාන් ගැන කතා කලේම නෑ.. ඒ හින්දම නීලගෙන් විස්තරයක් දැනගන්න බලන්න දවාන් ගැන ඇහුවා..

" නැන්ද දවාන් මහත්තයා පේන්න නැත්තේ ඇයි

සදීනා කිරි බෝතලේ ගන්න ගමන් ඇහුවේ සන්සුන්ව..

" ලොකු බේබිට හොදටෝම උණ හැදිලා.. නැඟිටින්නවත් බෑ..
මෝනා බෙහෙත් අරන් දීලා ඔය ඉන්නේ..
කන්නේ බොන්නෙත් නෑ..

පව් අහිංසක කොල්ලා ..අන්තිමට පිස්සෙක්ම වුනා මිසී..

නීලා බරට හුස්ම පිටකරලා කිව්වේ දවාන් ගැන වේදනාවෙන් කියලා කෙල්ලට තේරුනා..

" ඇයි නැන්දේ පිස්සෙක් වුනා කියන්නේ..

" ඇයි කියන්නේ..දරුවෝ..ඔය පේන් නැද්ද
අර මල ජරාව බොනවා උදේ ඉදන් රෑ වෙනකන්..
දවස් ගානක් බීලා බීලා අන්තිමට අසනීප වෙනවා..
ආයේ හොද වුනාම අයේ බොනවා..
ගෙදර මනුස්සයෝ එක්ක මරාගන්නවා..
කොම්පැනියට යන් නෑ.. ඒවා ගැන බලන් නෑ..
පිස්සෙක් ගානට දැන් ජීවත් වෙන්නේ ලොකු බේබි..

sinhalaebooks.com

නීලා දවාත්ගේ ජීවන රටාව කියන් ගියේ.. සදීනා බැලුවේ අයුගේ මූන දිහා..

" ඔයාගේ තාත්ති බේරගන්න ..
ඒක කරන්න පුලුවන් ඔයාට..

කෙල්ල රහසින් කිව්වේ ආයුට.. දවාත්ගේ ජීවිතේ එහෙම යන එක ගැන ඇත්ත කෙල්ල දැන් දන්නවා.. දවාත්ට ඕනේ නැතිවුන ජීවිතේ.. ඒ අක්ෂගේ ආදරේ එක්ක ආයුව.. ඒ දෙන්නම නැතිව එක්කෙනෙක් එක්ක දවාත්ට ජීවත් වෙන්න බෑ...
ඒ හින්දමයි දවාත් අයාත්ව එපා කියන්නේ..

අයාත් කියන්නේ අක්ෂගේ යි දවාත්ගෙයි ආදරේ සංකේතය. අක්ෂා නැතුව ඒ සංකේතය දවාත්ට ලන් කරගන්න බෑ.. ඒකට හිත හයිය නෑ.

සදීනා කොල්ලවත් අරන් එලියට ආවේ දවාත් ගැන හිත හිත.. අයාත් ට විතරමයි පුලුවන් දවාත්ට ලන් වෙන්න..
ඒක වෙන කිසිම කෙනෙක්ට බෑ..

" සදීනා...

කෙල්ල හිටිය කල්පනාවෙන් ගැස්සුනේ දසුනි ලගට ඇවිත් කතා කලාම..

" චූටි නෝනා..

" කෝ එන්න මගේ පැටියා.. ම්ම් කුක්කු බොනවා නේද බන්ඩි ෆුල් දැන්..

කෝ නැම්දිට උම්මා ගොඩාක් දෙන්න .. පුතු දලා නැම්දි හෙට යනවා දුර ගමනක්..

දසුනි සදීනගේ ඔඩොක්කුවේ හිටිය කොල්ලව අරන් උඩ දලා කම්මුල් සිප ගත්තේ එහෙම කිය කිය...

දසුනි ගෙදරින් කොහෙහරි යන්න හදන්නේ කියලා කෙල්ලට තේරුනා දසුනිගේ වචන වලින්..

" චූටි නෝනා කොහෙද යන්නේ..

" සදීනා..
මම හෙට කැම්පස් එකට යනවා..
නිවාඩු ඉවරයි මගේ..

දසුනි ගල් බංකුවෙන් වාඩි වෙන ගමන් කෙල්ලට කිව්වේ..

sinhalaebooks.com

" අනේ චූටි නෝනා ගියාම පාලුවට තියෙයි..
හුඟක්ම ආයුට තමා පාඩු නේද සුදු මහත්තයා..ආ
නැන්දිට යන්න අපා කියන්න ඔයාගේ..

දසුනි හිනාවුනේ කොල්ලා දිහා බලන්..

" සදීනා.. මන් යන්නේ මේ පාර හුඟක් දුකෙන්..
ඉස්සර මන් යන දවසට අම්මී තාත්ති අයියා එකතුවෙලා මට පාටියක් දෙනවා..
හැමදම මාව යවන්නේ අඬලා.. අයියා මන් යන්න කිට්ටු වුනාම ශොපින් එක්කන්
යනවා..ඇඳුම් ගොඩාක් අරන් දීලා..තව ලට්ට පට්ට ඔක්කොමත් අරන් දෙනවා..
පස්සේ අපි ඔක්කොමලා එලියට ගිහින් ඩිනර් අරන් පවුලෙම අය සතුටු වෙනවා..

ඒත් අද ...

හැමෝම ඉන්නේ අයියගේ ප්‍රශ්න එක්ක.. අම්මීගේ වැඩේ කල්පනා කරන එක..තාත්ති ඉන්නේ
නෑ ගෙදර..අයියට මාව මතකවත් නෑ..
අඩුම ගානේ එයාලා දන්නෙවත් නෑ මන් යනවා කියලවත්..
මට හරි දුකයි සදීනා..මට මගේ පවුලෙම අය නැතිවෙලා අද..

මේ හැමදේම අර ආක්ෂා නිසා.. ඒකි අපේ පවුල විනාස කලා..අපේ සතුට නැතිකලා..
දැන් මට ආදරේ නෑ මේ ගෙදර කව්රුත් මම තනිවෙලා..

දසුනි අඬ අඬ කියද්දි සදීනා දසුනිගෙ ලගින් ඉදගත්තේ අයාන්ව දසුනි අතින් ගන්න ගමන්..

" චූටි නෝනා නඬා ඉන්න..
හැමදම එක වගේ හිටින් නෑ
අපි හැමෝටම ප්‍රශ්න එනවා..අපි ආදරේ කරන අයට අපිව මගඇරෙන අවස්ථාත් එනවා..
එහෙමයි කියලා එයාලා අපට ආදරේ නොකර නෙවෙයි..
දවාන් මහත්තයගේ ප්‍රශ්නේ එක්ක ලොකු නෝනලා ඉන්නේ ලොකු පීඩනේට චූටි නෝනා..
අනික එයාලා දන්නවා චූටි නොනා කවදවත් දවාන් මහත්තයා වගේ දුකක් දෙන් නෑ කියලා
ඒහෙම ජීවිතේ වරද්දගන්නෙත් නෑ කියලා..

ඉතින් චූටි නොනා ගැන ලොකු නෝනයි මහත්තයි දෙන්නවා හිත ඇතුලෙන් ආඩම්බර
වෙනවා ඇති
එයාලට චූටි නෝනා තමා විස්වාසවන්තම දරුවා..ඒ හින්ද බයක් නෑ නෝනා ගැන ඒකයි
ඔහොම ඉන්නේ.. මොකද ඕනම අවස්ථාවක අම්මවයි තාත්තවයි තේරුම් ගන්න චූටි
නෝනට පුලුවන් කියලා එයලා හිතන් ඇති..

එහෙම වුනොත් චූටි නෝනා මෙහෙම හිතන එක වැරදීනේද..

" මට තේරෙනවා සදීනා.. ඒත් මට දුකයි..

sinhalaebooks.com

මත් තරහා නෑ අම්මිලා එක්ක..
සමහර වෙලාවට මට හිතෙනවා මම තනිවෙලා කියලා..
ඒක කමක් නෑ.. මේ මගේ පවුල සදීනා මත් ආදරෙයි හැමෝටම..

දසුනි කියපු හැමදේම සදීනට තේරුනා.. මේ වෙලවේ දසුනිට දැනෙන තනිකම සාදරණයි කියා කෙල්ල දන්නවා ඒත් රණබාහු පවුලම මේ වෙලාවේ ඉන්න තත්වේ එක්ක ඒක සාමාන්‍ය යි..
එහෙමයි කියලා කෙල්ලට බෑ දසුනිගේ හිත කඩන්න පවුලෙන්..ඒ හින්ද දසුනිව තිව්වේ හැමෝගෙම ආදරේ ගැන මතක් කරලා..

" චූටි නෝනා ඕවා හිතත් නැතුව හොදින් වැඩ ටික කරගන්න. මේ ප්‍රශ්න ඉක්මනට විසදිලා ඉස්සර වගේ හැමෝම සතුටින් ඉන්න දවසක් එයි..එතකත් ඉවසලා ඉන්න..

" සදීනා.. මත් ගියාම ගෙදර අයව බලාගන්න..
විශේෂයෙන් අපේ අම්මී.. එයා අයියගේ ප්‍රශ්න ඉස්සරහා හරි දුවර්ලයි.. එයාට හරි වැරැද්ද තේරෙන් නෑ එයා ගන්නේ අයියගේ පැත්ත..එතෝට තාත්ති තරහා ගන්නවා..ඔයා දැක්කනේ සදීනා පහුගිය දවස්වල ඒක..
අම්මිව බලාගන්න සදීනා එහෙම වෙලාවට
එයා අසනීපෙන් ඉන්නෙත්..

අයාන්වත් බලාගන්න.. අයියා ගැනත් අවදනෙන් ඉන්න.. මත් ඔයාව විස්වාස කරනවා සදීනා..
මත් එනකම් ආපහු අපේ පවුල බලාගන්න..

දසුනි කෙල්ලගේ අත් දෙක අල්ලන් කිව්වේ ඇස්වල කඳුලු පුරවන්.. සදීනා දසුනිගේ ත් දෙක තද කරලා අල්ලගත්තේ පොරොන්දු වෙලා මේ හැමෝටම කරදරයක් නෙවෙන්න බලාගන්නවා කියලා..

දසුනිට ගෙදර දලා යන්න සදීනා ඉන්න එක සැනසීමක් වුනා..

........................

දසුනි එක්ක කතා කරලා ඇවිත් කෙල්ල අයාන්ව නිදි කරන ගමන් හිතුවේ දසුනිව සතුටු කරලා හිත හදලා යනවන්න විදියක්..

" ආයූ ඔයාගේ නැන්දී දුකෙන් ඉන්නේ..
අපි කෝමද එයාව හිනස්සන්නේ..
කියන්නකෝ අනේ.. ඕම ඇස් නටව නටව ඉන්නේ නැතුව..

කෙල්ල අයාන්ව නලවන ගමන් හිතුවා.. දැනට කරන්න පුලුවන් එකම දේ දසුනිට හැමොම ආදරෙයි කියලා ඔප්පු කරන එක..

sinhalaebooks.com

ආදරේ දැනෙන්න මහ ලොකු ඒවා ඕන්නෑනේ..
ඉස්සර පහත් අයියා මට බෙල්ලෙකක් අහුලල දුන්නත් ආදරේ හිතෙනවා .. බෙල්ලෙක් කියන්නේ නිකන් මැරුනු කට්ටක්නේ ඒත් ආදරේ කරන කෙනෙක් අතින් දුන්නම ඒක දැනෙනවා..

ම්ම්ම්ම් චූටි නෝනට ආදරේ පෙන්නන්න නේ මෙසෙකුත් ඇති..සදීනා හොදම වැඩේ තේ මේසේට හවස ඔක්කොම එකතු කරගන්න එක..

කෙල්ල අවසානේ ආව හොදම අදහස ක්‍රියාත්මක කරා.. අයාත් නිදගත්ත අතරේ කෙල්ල නීලට කිව්වා කෑම ටිකක් වැඩියෙන් හදන්න කියලා..
දසුනි ආස කෑම වලින් කීපයක් හදන්න බඩු එකතු කරලා නීලට දීලා කෙල්ල ඊලගට කරේ මාරුම වැඩේ..

" රණබාහු මහත්තයා මගේ කෝල එක ආන්සර් කරොත් හොදයි..
අනේ ෆෝන් එක ගන්න..මහත්තා.. අනේ අනේ

කෙල්ල සාලේ තිබ්බ ෆෝන් එකෙන් රණබාහුට ගත්තේ කලින් ගෙදර එන්න කියන්න..

" හෙලෝ..

එහා පැත්තේ ඇහුන රලු කටහඩ රණබාහුගේ කියකා කෙලට ශුවර්.. බයෙන් බයෙන් කතා කරන්න කට හැදුවා..

" මේ මේ ලොකු මහත්තයා මන් සදීනා..

" ආ ඇයි දරුවෝ..

රණබාහු කලබල නැතුව දරුවෝ කියපු එක සදීනට ඊලග ටික කියන්න වචන ගැටගහගන්න ලේසි වුනා..

" ලොකු මහත්තයා අද ටිකක් කලින් ගෙදර එන්න පුලුවන්ද..

" ඇයි ප්‍රශ්නයක් ද ගෙදර. හදිසියක්ද දරුවෝ..
මට කියන්න.. අර මනුස්සයා ආයි ජල්ලියක් ඇල්ලුවද..

" ආ න් නේ නෑ නෑ මහත්තයා.. මේ හෙට චූටි නෝනා කැම්පස් එකට යනවා.. මහත්තයලා දන්නෑ කියලා දුකෙන්.ඉන්නේ.. පුලුවන්නම් චූටි නෝනට තෑග්ගක් අරන් ටිකක් වේලාසන එන්න ලොකු මහත්තයා..

රණබාහුට වචන නැතිවුනේ දසුනි යන හාන්කවිස්සියක්වත් මතකේ තිබ්බ නැති එකට..

sinhalaebooks.com

" හරි හරි දරුවෝ.. මන් එන්නම් කලින්..

රණබාහු ෆෝන් එක ටිජියකා දුක් වුනේ දසුනිව අමතක වුන එකට..

සදීනට සතුටුයි රණබාහු කැමති වුන එකට

" චූටි නෝනා බොරුවට කලබල වෙලානේ.. මෙයාලා හරි ආදරෙයි ඔයාට..ඒකනේ කිව්ව ගමන් හා එන්නම් කිව්වේ..

කෙල්ල උඩ පැන පැන ගියේ ප්ලෑන් කරපු වැඩේ බාගයක් සාථර්ක විදියට කරගත්ත හින්ද..ඊලගට තියෙන්නේ යක්ෂාආරාධනාව..ඒකට කෙල්ලට යන්න බෑනේ..
දවාත් ලගට යන්න පුලුවන් රෑකට වගේ හොරාට තමා නැත්තන් විමානෙට එන වුන්ව කාලා දනවා යක්ෂයෙක්නේ..කිසිම සමාවක් නෑ..

කෙල්ක හිත හිත ගියේ කරන්න දෙයක්..නීලා සුප් එකක් හදලා ජ්ලාස් එකකට දාලා මේසේ උඩ තියකා තියනවා දැක්කා..

" කාටද නැන්දේ සුප්

" ලොකු බේබිට..බත් කන්න බෑ කියනවනේ..

කෙල්ලට හිනාවක් ගියේ ඒ වැඩේටත් ක්‍රමයක් ආව හින්ද..දුවලා කාමරේට ගිහින් කොලේක පොඩියට වචන ටිකක් ලියලා සුප් එක තියකා තිබ්බ ට්‍රේ එක යටින් තියලා මාරු වුනා..

නීලා ඒ වෙද්දි වැලි තලපයි දසුනි ආසම හැලප ටිකකුයි හදලා ඉවරත් කරලා තිබ්බා..
කෙල්ලට තිබ්බෙ සැන්විච් ටිකයි .. කේක් එකයි ලෑස්ති කරන්න හවසට..

කෙල්ල කුස්සියට වෙලා හිටියේ නීලා සුප් එක අරන් දවාත්ගේ කාමරේට ගිහින් එනකම්..

නීලා සුඹ එක දවාත් ට පොවන්නහැදුවත් කොල්ලා එක එපා කිව්වේ නිදගෙනමයි.. සුප් දීසිය යට ඇලවිලා තියන කොල කෑල්ල කොල්ලා දැක්කා නීලා සුප් එක අරන් ඇඳෙන් වාඩිවෙලා ඉද්දි..

" නීලම්මා තියලා යන්න මන් බොන්නම් ..ටිකක නිවිනම..

දවාත්ට ඕනේ නීලව යවාගන්න ඉක්මනට..

" මන් ගියාම හොරාට තියයි හීතල වෙනකම්
ලොකු නෝනා උදේ වත්තට ගියේ බේබිට දවල්ට සුප් එකක් කොහොමහරි පොවන්න කියලා..

sinhalaebooks.com

"අනේ නීලම්මේ මන් බබෙක් නෙමේ..
ඔන්න ඕක තියලා යන්න..අනේ වද නොදී..

දවාත් ට ඊට වඩා පෙරැත්ත කරලා වැඩක් නෑ කියලා නීලා දන්න නිසාම සූප් එක මේසෙත් තියලා වහලා ආවා..

සදීනගේ කොල සෙල්ලම නීලට අහුවුනේම නෑ.. පීරිසි ය්ම්ට කොල තිබ්බට නීලට ඕවා එහෙමට පේන් නෑ වයස හින්ද.. දවාත් කනාවට වගේ හැමදම දැක්කා ඒක..

නීලා දොර වහන් එලියට යන්න ඇරලා නැගිටලා ඇලවිලා තිබ්බ කොලේ ගත්තේ දවාත් දවස් ගානකට පස්සේ ආවේ මොකක්ද බලන්න..

" පුලුවන්නම් හවස තේ මේසෙට නොවරදවාම එන්න..
හෙටින් පස්සේ ඒ ඇස් මේ ගෙදර නෑ..
සුබ පතලා යන්න එන්න..

ඇස් නෑ කියන්නේ.. මේ කෙල්ල හෙට ගෙදර යනවද.. එ කියන්නේ අම්මලා දරුවව අරන් ගිහින්ද..

දවාත්ට ප්‍රශ්න ගොඩයි.. සදීනා යන්න යනවා කියලමයි කොල්ලට හිතුනේ..

" මන් යන්නෑ..

දවාත් කොලේ ගුලිකරලා දලා ඇඳේ දිගාවුනේ වහලේ දිහා බලන්..

හවස් වෙද්දි කෙල්ලට වැඩ කෝටියයි..ඒ අස්සේ ආයුත් නැගිටලා සෙල්ලම.. කෙල්ල ආයු උකුලේ තියන් අහට මෙහෙට දුවද්දි කොල්ල ට ජොලිය .. දත් නැති චූටි කට ඇරන් බක ගාලා හිනා කොල්ලට..

" ආයු.. දෙනවා ගුටි ඔයාට මන්..
බිම ඉන්නෑ.අඬනවා..වඩාගත්තම බොරුවට හිනාවෙනවා.
මට වැඩ ගොඩයි..

සමදරා වත්තට ගිහින් එලවලුත් අරන් ආවේ සදීනලා කුස්සියේ කෑම ලෑස්ති කර කර ඉන්දද්දිමයි..

" සදීනා.. අද මොකද කලබලේත් මෙච්චර

සමදරා ආයාන්ව වඩාගන්න ගමන්මයි ඇහුවේ..

sinhalaebooks.com

ම්ම්..ඒක ස්ප්‍රයිස් එකක්.. ලොකු නෝනා දැන් ගිහින් නාගෙන එහෙම එන්නකෝ පහලට .. ය්හේ බොන්න.. ආවම කියන්නම්..

සමදරාට හිනාවක් ගියේ සදීන ඇස් නටවලා කියද්දි..

" සුදු පුතා.. මොකක්ද මේ හොරේ.. ආච්චිට කියන් නෑ..

සම්දරා කොල්ලගේ කොපුලක් සිපගෙන ඇහුවේ හිනාවෙවී..

රණබාහු වෙනදට කලින් ගෙදර ආවේ දසුනිට ලොකු ටෙඩියෙකුත් අරන්..කෑම ජාති ටිකකුත් අරන්..

රණබාහු එද්දි සදීනා තේ මේසේ ලස්සනටහදලා තිබ්බා..

" මහත් තයා අද කලින්.. පුදුමයි..

සම්දරා රණබාහු පිලිගන්න ඉස්සරහට ගියේ එහෙම කියානමයි..

" කෝ චූටි..

" උඩ හිටියා..ඉන්න මන් තේ බොන්න එන්න කියන්නම්..

රණබාහු සදීනට හිනාවක් දලා පෙන්නුවේ වාහනේ .

සදීනා දන්නවා මොනාහරි ගෙනත් කියලා..රමබාහුට හිනාවෙලා කෙල්ල ගියේ වාහ්නේ තිබ්බ දසුනිගේ තෑග්ග අරන් එන්න..

"අනේ ලොකු මෙයාගේ.. ආයුටත් තිබ්බනම් එකක්..මන්වත් මහලා දෙන්න ඔක්නේ..

ආ මේ තව චූටි එකකුත් තියනවා. සීයා පප්පට මුනුබුරා අමතක වෙලා නෑ එහෙනම්..

කෙල්ක බඩු ටික අරන් ඇවිත් තිබ්බේ දසුනිට පස්සේ දෙන්න හිත්ද..

දවාන් නා ගෙන ඔලුව ශෝට් එකකට බැතියමක් දන් කොන්ඩේ පීරපීරකල්පනා කලේ යනවද නැද්ද කියලා .

ඔන්න ඔහේ යනවා..ඒ කෙල්ලට මගේ අතින් හිරිහැර වුනානේ.. සොරි කියලා කියනවා.. ගිහින්.. මොනාවුනත් ගෙදර වැඩ කරන් හිටියනේ..

දවාන් සදීන ය්න්න යනවා කියලා හිතාගෙන ම අවසාන ඉල්ලීම පව් කියලා කෙල්ල කිව්ව විදියට තේ මේසේට එන්න හිතුවා

sinhalaebooks.com

දවාත් පඩිපෙල බහිද්දි සමදරා බලන්හිටියේ පුදුම වෙලා..

සමදරාට කට ඇරන් බලන් හිටියේ දවස් ගානකින් එලියට එන දවාත් දිහා..ඒකත් තේ මේසෙට.. ඒක පුදුමයක්..

සදීනා තීලා අතට අයාත්ව දීලා කෑම ටික මේසේ ලස්සනට තියලා අඩුපාඩු බැලුවේ මේසේ වටේම ගිහින්.. කෙල්ල විඩෙන් විඩේ පඩි ඔළුල දිහා ඇස් ගහන් හිටියේ දවාත් එන් නැතිවෙයි කියලා ඒත් දවාත් එනවා දැක්කම කෙල්කට සතුට දරාගන්න බෑ..

" දවාත් මහත්තයා..එන්න වාඩිවෙන්න..

කෙල්ක දවාත්ට පුටුවක් අරන් දුන්නා..දවාත් කෙල්ල දිහා හොරාට බලල වාඩි වුනේ බිම් බලාගෙනම..

" සදිනා මොකද ලමයෝ මේ..කෑම ගොඩක් හදන් ඔක්කොම ටික ඉන්දගෙන කරන්නේ..

සමදරා ඇහුවේ හිනාවෙවී..

රණබාහු මොකුත් නොදන්න ගානට ෆෝන් එක දිහා බලන් හිටියේ කෙල්ලගේ වැඩේ දන්න නිසා කලින්ම..

" චුට්ටක් ඉන්න ලොකු නෝනා..

සදීනා දිව්වේ දසුනිගේ කාමරේට..

" අනේ මේ දොර අරිවා සදීනා.. දැන් කීයේ ඉදන්ද මාව මේකේ හිරකරලා..

සදීනා හ්ම්ගිහින් දසුනිගේ කාමරේ ලොක් කරපු දොර අරිද්දි දසුනි කෑ ගැහුවා..

" හරි හරි.. කෝ මේකෙන් ඇස් දෙක බැදගන්න ..කෝ ඉක්මනට පරක්කු වෙනවා..

කෙල්ල දසුනිව ඉන්දලා පටියක් අරන් ඇස් බැන්දේ දසුනි දගලද්දි..

" මොකද හලෝ මේ..පිස්සු හැදිලද අර අයියට වගේ..

" හරි දැන් යන්..

කෙල්ල දසුනිව එක්කන් ආවේ සාලේට.. සමදරා එක්ක දවානුත් බකන් හිටියේ ඇස් දෙක වහලා එක්කන් එන දසුනි දිහා..

sinhalaebooks.com

" අනේ මේක ලිහනවා සදීනා..මත් හැපෙයි..

ආ..ඉන්න ඔන්න දැන් හරි..

දසුනි ඇස් අරිද්දි හැමෝම හිටියා තේ මේසේ..

" හෙට අපේ චූටි නෝනා කැම්පස් එකට යන නිසා හැමෝගෙන්ම ටී පාටර්"එකක්..

අනේ සදීනා..

දසුනි සදීනව බදගෙන අඩුවේ සදීනගේ ඇස්වලත් කඳුලු පිරෙද්දි..දසුනි මේ අඬන්නේ සතුටට කෙල්ල දන්නවා..

" නැන්දි අඬවා දැක්කොත් අයාන් බබත් හිනාවෙයි කෝ කෝ දැන් ගිහි වාඩි වෙලා තේ බොන්න..ඔන්න හැමෝම ඉන්නවා චූටි නෝනගේ..

සමදරාට දෙලෝ රත් වුනේ සදීනා කියද්දි..

" අනේ මගේ චූටියෝ...සමාවෙන්න අම්මට අමතකම වුනා මගේ කෙල්ල හෙට යනවා කියලා..

"තාත්තිටනම් අමතක නෑ ඔන්න..චූටි යනවා කියලා..

රණබාහු හිනාවෙලා ආවේ සදීනා ගෙනත් සැටියේ තියලා තිබ්බ ටෙඩියව කෙල්ලට දීලා සිප ගත්දී දසුනි ඇඩුවා හොදටම..

" තාත්තී...අනේ..

දවාත් හිටියේ ඉදගෙනමයි.. කොල්ලට දුකයි දසුනි ගැන ..ඉස්සර දසුනිගේ කෝලම්.මතක් වුනා.. රණ්ඩු වෙවී හරි දසුනි ඉන්න එක සැනසීමක්..ඇස් වලින් ඈතට යනවා කියලා දැනෙද්දි දුකයි..

තවත් මේසෙට වෙලා ඉදන් ඉන්න බැරි වුනා කොල්ලට..

" i miss you චූටී..

අයියා...

දවාත් කෙල්ලට කියද්දි දසුනි පැනපු ගමන් දවාත් බදගෙන ඇඩුවේ.. මෙච්චිහර දවස් අයියා ලගටබ්‍යන්න නැතිව හිතේ තිබ්බ වේදනව ඔක්කොම දිය කරලා යවද්දි..

sinhalaebooks.com

මේ ඔක්කොම දිහා බලන් සදීනා හිටොයේ සතුටින්.. කාලෙකට පස්සේ හැමෝම හිනාවෙලා තේ මේසේ ඉදන් දසුනිගේ මූනේ හිනාව පිරිලා..

" සදීනා..පුතේ එන්න තේ බොන්න..ඇයි හිටගෙන..

"ලොකු නෝනලා බොන්න මන් පස්සේ බොන්නම්..

සමදරාට කෙල්ල ගැන ආදරේ හිතුනා..තනියම මෙච්චර හරියක් කරපු එකට..

" සදිනා මිසී උදේ ඉදන් ලොකු නෝනා කාලවත් නෑ ..තව ඔය..හිස් බඩෙන් ඉන්නේ... මට සැර දැම්මා කෑම හදන්න කියලා චූටි බේබි ආස ඒවා..
එයා තමා මේ ඔක්කොම ලෑස්ති කලේ..

" අනේ.. මෙගේ කෙල්ල.. පින් හුගක් මේ හැමදේටම..

සමදරා කියද්දි දසුනි කේක් කෑල්ලක් අරන් ගිහින් සදීනට කවලා බදගත්තේ කෙල්ල හිනාවෙද්දි

Thank you සදීනා..මේ හැමදේටම..

" මට හොරාට කෝල් එකක් ගත්තා උදේ.. නැත්තන් චූටිට තෑගි තියා මන් දන්නෙත් නෑ..
Thank you..දරුවෝ..අද ඔයා හින්ද අපි අතින් වෙන්න ගිය ලොකු අඩුපාඩුවක් පිරවුනේ..නැත්තන් චූටි දුකෙන් යයි අපි දන්නෙත් නැතිව..

දවාන් හොර පූසා වගේ හිටියේ මේ ඔක්කොම අහගෙන..

"අයියා දන්නේ කොමද මේක..

දසුනි දවාම්ගෙන් අහද්දි දවාන් කකා හිටිය කේක් කෑල්ල හිර කරගත්තේ කැස්සක් එක්ක..

"පුතා..ආ..මේ වතුර එක බොන්න..

සදීනත් ගැස්සුනා..කොල කැලි වැඩේ දවාන් කියයි කියලා..

දවාන් වතුර එක බොන ගමන් සදීනා දිහා බැලුවා..
කෙල්ල ඇස් වලින් කිව්වේ ඒපා කියලා කියන්න..

දවාන්ට ඒක තේරුනා..

දවාන් තපුරු මූනක් දගත්දිනම් කෙල්ලට බය හිතුනා..

sinhalaebooks.com

මේ මෝඩයා කියයිද..ඒක කිව්වොත් නෝනලා මොනා හිතයිද..අපෝ ශිට්..

"ආ අයියා ඔයා කොමද දන්නේ..

" ම ම.. නිකන් ආවේ..

දවාන් ඒක කිව්වේ හෙමින්..සදීනට හුස්ම වැටුනේ දැන්..

සදිනා. පපුව අල්ලලා හුස්මක් ගන්නවා දැක්කම කොල්ලට කට කොනට හිනාවක් ආවා..
සවස් වරුම ගෙව්නේ හැමෝගෙම හිනාවෙන්
දසුනි වෙනුවෙන් වුනත් ගෙදර හැමෝම එකතු වුනේ කාලෙකින්..

" අද පුතා හිනාවුනා නේද මහත්තයා..
කාලෙකින් කොල්ලගේ මූනේ හිනාවක් දැක්කේ

සමදරා කිව්වේ නිදගන්න ඇඳට ඇවිත් පත්තරේ බලන රණබාහුට..

" අද කාලෙකට පස්සේ මම පවුලක් දැක්කා සමදරා මේ ගෙදර..

රණබාහු පත්තරේ තියලා කිව්වේ සතුටෙන්..

" මේ හැම්දේම අර දරුවා හින්ද.. මට හරි ලෝබ හිතුනා අද කෙල්ලට..

" සීදේවි කෙල්ල.. උදේට දැක්කත් ඇති දවසම සුබයි..සමදරා..
ඒ ළමයට අපි උදව් කරන්න ඕනේ..

රණබාහු කිව්වේ කෙල්ලගේ අනාගතේ ගැන.. ඒත් සදීනා මේ හැමදේම කලේ කිසිම දෙයක් බලාපොරොත්තුවෙන් නෙවෙයි.. කෙල්ලට ඕනේ අයාන්ට හැම්දේම දීනලා දෙන්න.. හැම්දේම කලේ ඒ වෙනුවෙන්..

"අද හැමෝම සතුටින් නිදගන්න ඇති..
චූටි නෝනා හෙට සතුටින් යයි.. ඒකම ඇති නැත්තන් ඒ අහිංසකී දුක් විදිනවා මේ ප්‍රශ්න හින්ද..

දවාන් මහත්තයා නිවිලා අද ..
එයා එහෙම හිටිය එකමත් අද විශේෂයි..

කෙල්ල හිත හිතම නාගෙන ආවේ ඔක්කොම වැඩ ඉවර කරලා නීලට කුස්සිය අස් කරන්නත් උදව් කරලා..

sinhalaebooks.com

දවාත් රෑ ඇඳට ඇවිත් කරේ නිදාගන්නවා වෙනුවට ඇඳපුරා පෙරලි පෙරලි හිටිය එක..
නින්ද අහලකටවත් ආවේ නෑ කොල්ලට..

කොට්ටයක් අරන් හේත්තුවෙලා සිගරට් එකක් පත්තු කරන් කල්පනා කලේ හවස වුන දේවල් ගැන..

කොල්ලට මතක් වෙන්නම සදිනා දපු හොර කෝලම.. චිට් එකක් එවපු වගක් කියන්න එඹආ කියකා ඇස් වලින් කියපු විදිය දවාත්ගේ හිතේ ඇඳිලා වගේ .. ඒකම මතක් වුනා..

" පිස්සු කෙල්ලෙක් ..

දවාත් එහෙමම නැගිටලා පහලට ආවේ නින්ද යන් නැති හින්ද ..

සදීනගෙයි අයාන්ගෙයි කාමරේ තිබ්බේ උඩට නගින පඩිපෙල ලග හින්ද දවාත් එතනින් යන ගමන් නැවතුනේ ඇතුලෙන් ඇහෙන හිනා සද්දෙත් එක්ක තොරතෝංචියක් නැතුව ඇහෙන කතාවට..

" අනේ ආයු ඇති අනේ.. ඔහොම මගේ මූන හැපුවම.. මට රිදෙනවා.. ඔයාටනම් ජොලී..
මේ කෙල ලොරියයි..

අයාන් දවල් ඉදන් කෙල්ල හිටියේ නැති හින්ද එයාගේ ජොලි වැඩවලට අල්ලගෙන හිටියේ හිතාවෙවී..කෙල්ල එක්ක නටන්න තියනවනම් කොල්ලට නිදාගන්න ගාන්ක්වත් නෑ

කෙල්ල සැර දපුවම.අයාන් අඬනවා

" ඔන්න ඉතිම්.. තාත්තයි පුතයි දෙන්නම එකයි.. තාත්තා ගොරවලා පුප්පලා රවලා මාව බය කරනවා..
පුතා අඬලා බය කරනවා..

දෙන්නම එකම අච්චුවේ
කට ඇරියොත් මිනිස්සු බය කරනවා..
මත් ගහනවා දෙන්නටම උන හැදෙන්න වෙලාවක..

දවාත් අහගෙන කෙල්ලගේ කතාව.. හිනත් ගියා කොල්ලට.. ඊට වඩා අමුත්තක් දැනුනා..
ආස හිතුනා.. අයිති නැති ලන් වෙන්න බැරි හිමිත් නැති ඒ සතුටට ආස හිතුනා..

දොර ලගට වෙලා කොල්ලා අහන් හිටියා..ඒහුරතල් වචන..

" කෝ කෝ බන්ඩි සූට්ටක් උම්මා එකක් දෙන්න
හොරගෙඩියට..

sinhalaebooks.com

ආයූ.. බන්ඩි ඔකු වෙලා වැඩී වගේ..
තාත්තා වගේ බඩ මුදලි කෙනෙක් වෙන්න එපා හොදේ..
එයා කැතේ බෑ.. බංඩි මුදලාලි වගේ නිකම් ඔයා ලස්සනට ඉන්න ඕනේ හරිද..

දවන්ට දෙලෝ රත් වුනා සදීනා කියපු එකට.. කොල්ලා බැලුවේ බඩ දිහා..

"මේකිගේ ආච්චිට යකෝ ..
මගේ කොහෙද එච්චර බඩක්..
අහුවෙද්දෙන්කෝ..මන් දෙන්නම් වැඩක්..

දවාන් කාමරේට ගියේ සදීනට බැන බැනමයි..

...............................................

කෙල්ල පාන්දරම නැගිට්ටා.. ආයානුත් කෙල්ක නැගිටිද්දි නැගිටිනවා කෙල්ල කිරි හදලා කොල්ලට පොවලා ආයේ නිදි කරලා නීලා එක්ක එකතු වෙලා කිරි බත් ටිකක් හැදුවේ දසුනිට කාලා යන්න..

" නැත්දේ මන් මේසෙට ඇරියා කිරිබත් එක..

කෙල්ල කෑම මේසේලෑස්ති කරලා ආවේ කුස්සියට..

" අනේ දරුවෝ.. මේ ලොකු බේබිගේ කිරි එක උඩට ගිහින් දෙන්න.. මන් ලෑස්ති වෙන්න යනවා..

නීලා දවාන්ගේ කිරි එක සදීනා අතටදීලා ගියේ දසුනි එක්ක නීලත් යන හින්ද ලෑස්ති වෙන්න..

කෙල්ල කිරි එක අරන් උඩටගියේ දවාන් ගේ කාමරේට..

" මේ දොරත් හායි ගාලා ඇරලා දලා ද නිදි..

කෙල්ල එබුනේ ඇරකා තිබ්බ දොරෙන්..කාමරේ පේන්න කවෘත්ම හිටියේ නෑ..කෙල්ල බාතෲම් එකෙත් බැලුවා දවාන් පේන්නවත් හිටියේ නෑ..

" මේ මනුස්සයා උදේ පාන්දර කොහෙද ගියේ..

දවාන් වැඩි හරියක් කාමරේ නැත්තත් ඉන්නේ බැල්කනියේ..කෙල්ල බැල්කනියට ගියේ ඉන්නවද බලන්න..

බැල්කනියෙත් නැති හින්ද කෙල්ල නිකමට මිදුල බලද්දි දැක්කෙ..

sinhalaebooks.com

දවාත් හතිදත් එක්සයිස් කරනවා..

" මෙන්න මෙයා..
උදේ පාන්දර සකර්ස් එකක රිලවෙක් වගේ තිකන් ඇඹරෙන්නේ..
පුදුමයි.. කවදවත් නැතුව අද එලියට බහින්න හිතිලා .

දවාත් අත් දෙකත් කරකව කරකව.. බෙල්ල හරවද්දි දැක්කේ කෙල්ල උඩ ඉදන් බලන් ඉන්නව..

" ආ.. මැඩම්..
ඉන්නවකෝ පෙන්නන්න
බඩ මුදලාලිගේ සික්ස් පැක් බොඩි එක

දවාත් ඇදන්හිටිය ටී ශටර් එක ගලවලා කැරකුනේ සදීනා නොදැක්ක ගානට..

" සික්..මේ මොන නැහැදිච්චකමක් ද.. මාව දැකලා නේද ඒ ඇදුම් ගැලෙව්වේ.. ඊයා..

කෙල්ල මූනත් වහන් යද්දි. දවාත් හිතාවුනේ වතුර බොතලේ උඩ දලා අල්ලන ගමන්..

" බය වුනා..
පව්..ඒයි..
ආවා මෙතන බඩ මුදලාලි කියන්ඩ..

කොලා සදීන්ට බැන බැන එක්සයිස් කලා.. උදේම එක්සයිස් පටන් ගත්තෙත් සදීනා කියපු එකට බය වෙලා.. දවාත් කොහොමත් ඇග ගැන වැඩියෙන් හිතුවා. හැම්දම..

සමදරා සදීනව හෙව්වේ කෙල්ලට කියලා යන්න. නීලවත් එක්කන් සමදරයි රණබාහුයි දෙන්නම යන්න හිතුවේ ..දසුනි පේරාදෙණිය කැම්පස් එකට දලා නුවර මහ ගෙදර වලව්වට ගිහින් සුද්ද කරලා දලා එන්න..

"සදීනා පුතේ පරිස්සමට ඉන්න දරුවත් එක්ක..
මොනාහරි තිබ්බොත් කෝල් කරන්න
නීලත් නැතේ..
අපි එද්දි රෑ වෙයි..

අනික දවාත් ලගට යන්න එපා.. දන්නවනේ හැටි එයා කෑම ඉල්ලුවොත් දෙන්න.. නැත්තන් ඔයාලා දොරවහන් ඉන්න..

සමදරා මගින් මගට කියලා ගියේ දවාත්ගෙන් ඈත්වෙලා ඉන්න කියලා. ගියාට බයයි දවාත් යකෙක් කියලා දන්නවනේ ..

sinhalaebooks.com

කෙල්ල හැමෝම ගියාට පස්සේ ගෙදර අස්පස් කරලා අතුගාන්න ගත්තේ අයාන් නිදි හින්ද.. කොල්ලා ඇහැරුනාම නාවන්න වතුර එකක් ලිපෙන් තියකා කෙල්ල වැඩ ටික කරා..

" නීලම්මා කන්න මොනාද තියෙන්නේ..

දවාන් සද්දෙට අහන් පඩිපෙල බහිද්දී කෙල්ල හිටියේ සාලේ..

" නැත්ද නෑ..මහත්තයා

දවාන් කෙල්ල ලගට ගියේ නිකන් මොඩ්ල් කෙනෙක් යනවා වගේ.. කොල්ලට ඕනේ ලස්සන ඇඟක් තියනවා කියලා පෙන්නන..

" මේ මොකද.. බයිසිකල් හැන්ඩ්ල් එකක් ගිලලා වගේ නිකන්.. කැරකෙන්නේ..

කෙල්ල තනියම හිතුවා.. දවාන් කෙල්ල ලග අහාට මේහාට ය්ද්දී..

" නීලාම්මා නැත්තන් තමුන් මට කෑම හදලා දෙනවා..

" හරි මහත්තයා ..

කෙල්ල කොස්ස තියලා යන්න ගියේ කුස්සියට්..

" තමුන් දන්නවද මම කෑම ගන්න පිලිවෙල..

දවාන් අහද්දී කෙල්ල ආපහුහැරුනේ..ඒ පාර මොකක්ද කියන්නේ කියලා..

" මන් කිව්වේ තනුන් දන්නවද මගේ කෑම එක හදන්න..
මොකද නීලම්මා තමා මට කෑම රෙඩි කරන්නේ හැමදම..

නීලා එහෙම විශේෂයෙන් කෑම හදන් නෑ කියලා කෙල්ල දන්නවා.. දවාන්ටත් සාමාන්‍ය විදියට කෑම දෙන්නේ එහෙම එකේ මේ කියන ඒවා කෙල්ලට් හිතා ගන්න බෑ..

" මම දන් නෑ මහත්තයා කිව්වොත් මට පුලුවන් හදලා දෙන්න..

"මට බ්‍රේක්වස්ට් එකට
කරවිල ජූස් එකයි..කැරට් ටිකක් තම්බලයි දෙන්න..

කෙල්ලකට ඇරන්හිටියේ දවාන් දිහා..

" ඉක්මනට හදලා ගන්නවා..පරක්කු නොකර.. මන් වෙලාවට කෑම ගන්නවා..

sinhalaebooks.com

සදීනා කුස්සියට ගියේ දවාන්ට රවලා..

ගන්නවා වෙලාවට..මත් කියත් නෑ.. දවස් ගනත් බත් කුනු වෙනවා කාමරේ.. වෙලාවට කනවලු..

උදේ ට කරවිල ජූස් එක්ක කැරට්.. පිස්සුද මන්ද..
කැරට් කන්න හාවෙක්ද එයා..

පුදුම කෑම මෙව්වා..

කෙල්ල දවාන් කිව්ව විදියටම කෑම එක හැදුවා පැය භාගෙකින් විතර..

දවාන් හොරාට කුස්සිය දිහා බල බල හිටියේ..
ශෝ එකට පෝෂදයි කෑම ගන්නවා කියල පෙන්නන්න හදන්න කිව්වට දවාන්ට කරවිල ජූස් මතක් වෙද්දිත් වමනේ යන්න වගේ ආවා..

" එන්න මහත්තයා කෑම එක හරි..

" අ ආ. හරි මත් එන්නම්..

දවාන්.. උඹ හදන්න කිව්වේ කරවිල ජූස්..
මෝඩයා..වෙන එකක් කියන්න තිබ්බේ නැද්ද..
දැන් බීපන්කෝ..

දවාන් කෑම මේසෙත් ඉදගත්තේ මූන බෙරිකරන්..
කරවිල ජූස් එකට හැන්දක් දන් කරකවන දිහ් සදීනා බලන් හිටියේ හිනා යන්න ආවත් හිනා නොවී..

" මහත්තය..ඕක බීලා බලන්න හොදද කියලා..
මොකද මම මීට කලින් හදලා නෑ ඕවා..

කෙල්ල කිව්වේ දවාන් අත ගගා ඉද්දි බොන්න ගානක් නැති හින්ද..

" ආ මේ ඔව්.. මේවා එහෙම හැමෝම බොන් නැනේ..
ඇඟ ලස්සන ට තියාගන්න අය තමා වැඩියෙන් බොන්නේ..

දවාන් ඒක කියද්දිනම් සදිනට හිනායන්න ආවා..
අමාරුවෙන් හංගගෙන හිටියා..

" මේකි අලේ තිබ්බා වගේ ඉන්නවනේ මෙතනම..මෙ තිත්ත ගොඩ බොන්නේ කොහොමද..
ඇක්.. ඇඟත් එක්ක හිරිවැටෙනවා මතක් වෙද්දි..

sinhalaebooks.com

කොල්ලා අමාරුවෙන් හැන්දට ටිකක් අරන් කටෙන් තියද්දි වෙනස්වුන දවාන්ගේ මූන දැක්කම සදීනට මැරෙන්න හිනා යන්න ආවා.. ඔක්කොටම එහා දවාන්ගේ ඇදවෙලා තිබ්බ කට..දැක්කම හිනා..

මේ චූට්ටට බීලා මෙහෙමනම්.. මේ වීදුරුව ම බිව්වොත් මට වමනේ ගිහි මැරෙයි..අනේ මට වෙච්ච දෙයක්..

අයාන් නැගිටලා අඬන සද්දේ ඇහුන නිසා කෙල්ල කාමරේට දිව්වා.. දවාන්ට හොඳ අවස්ථාව ආවෙන් කොල්ලා සින්ක් එකට බාගයක්ම හලලා ඉදගත්තා..

" ආයූ..මගේ සත් කොටේ නැගිට්ටද.. කෝ එන්න
අම්මෝ ඉතිම් සූ ගහලා සූ ගහලා ගන්දස්තාරේ බෑ..

කෝ අපි නන්.. අන්න අරහේ ඔයාගේ අර පිස්සු තාත්තා කරවිල ජූස් බොනවා..යමුකො බලන්න..

කෙල්ල යද්දි දවාන් ගැරුපොඋවෙන් කැරට් කෑල්ල අල්ලන් හොඳට කනවා.. කරවිල ජූස් එකේ බාගයක්ම හිස් කරලා.. කෙල්ලට සැකයි.. බිව්වේ නෑ කියලා

" මේ මනුස්සයා බීලද මේක මේ.. වෙන්න බෑ..

අයාන්ගේ වතුර එක තිවෙමින දන්න කෙල්ල කොල්ලත් වඩාගෙනම සින්ක් එක ලගට් ගියාම දැක්කේ සින්ක් එක හොදලා තිබ්බ එකේ කොල පාටට තියනවා..

කෙල්ලට ශුවර් හලලා කියලා. දවාන් ගානක් නැතුව කැරට් කකා හිටියේ සදිනව ගනන් නොගෙන..

"ආයූ.. බෝ නාන්න ඔනේ හොදද.. කුක්කු බොන්නේ පස්සේ..

කොල්ලගේ කෙඳිරිය වැඩි වෙන හින්ද කෙල්ල සැරට කිව්වේ..
අයාන් වතුර බේසමටදනවා දකිද්දි අඬන්න තියාගත්තේ නාන්න හොරට..

" ඔන්න ඉතිම් ..
තාත්තයි පුතයි දෙන්නම එකයි..
දෙන්නම ලෝක අන්ඩපාල හොරු ..

තාත්තා කරවිල ජූස් බොනවා කියලා සින්ක් එකට හලලා රගපානවා..
පුතා නාන්ඩ හොරට අඬලා රගපානවා..

දවාන්ට කකා හිටිය කැරට් කෑල්ලත් හිරවුනා සදීනා කියපුඑකට..

sinhalaebooks.com

" මොකක්ද ඒ වුනේ යකො..
රෙදි නැතුව පාරේ ගියා වගේ සීන් එකක් වුනේ..
ඒක මීට වඩා නම්බුයි..

මේකී දැක්කද ඒක..
අපොයි දවාත් උඹ කරගත්ත දේ..

කෙල්ල අයාත් උකුලේ ගහත් බැන බැන යද්දි අයාත් බැලුවේ කොල්ලා දිහා..

තාත්තා වැඩේ කැවා කියන්න වගේ..

දවාත්ට ඒ ඇස් දකිද්දි මොකක්ද වුනා.. ලේ මස් ඇට නහර කිඳබහින වේදනාවක් ආවා..

අයාත් කියන්නේ කොල්ලගේ ලේ..ඒක දන්නවා. ආක්ෂා ගේ මතකේ එක්ක අයාත් දකිද්දි එන තරහා සදීනා එක්ක කොල්ලා ඉද්දි දැනෙන් නෑ..
කොල්ලවයි සදීනයි දවාත්ට පේන්නේ හරි ලස්සනට..දවාත් ආස වෙලා ඒ දිහා බලන් ඉන්න..

කෙල්ල අයාත් හෝදන්න බාතෲම් එකට ගියා.. දවාත්ට ආපහු කොල්ලගේ මූන බලන්න ආස හිතුනා.. ඒ කෝලම් දෙක දිහා බලන් ඉද්දි හරි සැනසීමයි..ඒ හින්දම සාලේ ඇවිද ඇවිද බාතෲම් එකදිහා බලන් හිටියේ කෙල්ල එනකම්..

සදිනා කොල්ලව පිහදන ගමන් සාලෙට එද්දි දවාත් පත්තරයක් අරන් පුටුවට පැන්නේ නොදැනෙන්න..

" ආයු.. කෝ සොයි සූට් දන්න කලින් සුවද ගාන්න ඕනේ.. කෝ.. ඉන්න..

කෙල්ල ක්‍රීම් එකක් අරන්න අයාත්ගේ ඇගේ ගාද්දි කොල්ලා කෙල්ලගේ අත අයින් කරන්න හදනවා දවාත් පත්තරේට යටින් බලාගෙන..

" ගුටි දෙනවා මන් දැන්..
ඔයත් තාත්තා වගේ හඩු ගඳට ඉන්නද හදන්නේ..
ඕම ඉන්න ඔනේ දඟලන් නැතුව..

දවාත් ගැස්සුනා.. සදීනා ඒක කිව්වේ තමන්ට කියල කොල්ලා දන්නව..

" යකෝ මටද ඒ හඩු ගඳයි කිව්වේ..
පත්තරෙන් දමලා අරින්න හිතෙනවා මට දැන්..

කොල්ලා කෝකටත් කොලර් එක ගාවට නහය තියලා බැලුවේ ඇත්තටම ගඳක් එනවද කියලා..

sinhalaebooks.com

සදීනා දවාත් දිහා බැලුවත් පත්තරේ හින්ද මූන පෙනුන් නෑ.. ඒත් කොල්ලට ඇහෙනවා කියකා දන්නවා. අවුස්සන්නමයි කෙල්ල ඒවා කිව්වේ..

තාත්තයි පුතයි එකයි කියලා තේරුනොත් ලොකු දෙයක්..
මේ කොස් ඇටෙත් ඒ වගේම තමා..
උස්සලා තියන්න හිතෙනවා ඔඩොක්කුවෙන් මට..

කෙල්ල තනියම හිතුවේ සද්දයක් වත් නැතුව ඉන්න දවාත් දිහා බලලා..

අයාන්ට කලිසම දන්න එක කකුලක් දද්දි කොල්ල අනික ගලවනවා..සදීනා කලිසම අරන් ඔට්ටු වෙන දිහා බලන් හිටියේ දවාත් හිනාවෙවී..

" හොද වැඩේ. ඔහොම තමා කරන්න ඕනේ..
කට තිබ්බට පොඩි එකෙක් මෙල්ල කරගන්න බෑ..

" ආයු.. ඔයා කාසම් දන්නේ නැද්ද දැන්.. ඔහොම කකුල් පද්දන්නේ..
අන්න අර තාත්තා බලන් ඉන්නවා.. හූ කියයි ඔහොම ඉදලා.
නැත්තන්
ඔයාත් තාත්තා වගේ කෙල්ලො ඉස්සරහා ඇඳුම්ගලවන්නද ආස..

දවාන්ට නැගිට්ටුනා.. කෙල්ල ඒකකිව්වේ උදේ එක්සයිස් කරද්දි කරපු වැඩේට කියන්න කොල්ලා දන්නවා..

දවාත් පත්තරේ විසිකරලා යත්ඩගියේ රවාගෙන

දක්කතේ තාත්තා පන්න ගත්ත විදිය. පුතාටත් දෙනෝ දැන් දුවන්න එකක්.. ඇදුම් ඇදගත්තේ නැත්තන්..කෙල්ල පොඩි එකා එක්ක එළියේ තිබ්බ බංකුව උඩ ට වෙලා කුරුල්ලෝ බල බල හිටියේ
දවාත් ඒ කිට්ටුවට ගිහින් උඩ බිම බල බල ඇවිද්දේ සදීනලව නොදක්ක ගානට..

" මට දවල්ට කන්න දෙන්න ගානක්වත් නෑ මේකිට..
දැන් කීයද වෙලාව.. උදේ කරවිල මඟුලක් බීලා බඩත් රිදෙනවා..

දවාත් හිත හිත සදීනට පේන්න ඇවිද්දා.. කෙල්ල ගානකටවත් ගත්තේ නෑ..අයාන්ට රහස් කියකිය හිනාවුනා ..

" ආයු.. ඔයාගේ තාත්තා මොකද අර හොරගල් අහුලන්නේ..
බඩගිනි ඇති දැන්..ඒත් ඉතින් ඕක ඇවිත් කිව්වනම් පැත්තක් යනවද..
ලොකුකමනේ..

sinhalaebooks.com

කෙල්ල දවාත් ට ටිකක් එහෙම ඉන්න ඇරියේ දවාත්ගේ ලොකුම හිත්ද..

ගේට් එකෙන් ඇතුලට දපු වාහනේ සද්දෙට දවාත් එක්කම සදීනත් බැලුවේ කව්ද කියලා..
සදීනා මීට කලින් දැකලා නෑ එහෙම වාහනයක් එනවා දවාත් ඉස්සරහට ගිය නිසා කෙල්ල අයාන්ව වඩාගෙන බලාගෙන හිටියා..

" දවාත්... ඩාලින්
ඔයා ඇයි මගේ කෝල්ස් මිස් කරන්නේ..ආ..
ඔයා මට ප්‍රොමිස් වුනා ...මාව කැන්ඩි එක්කන් යනවා කියලා..එන්ජෝයි කරන්න..
ඒත් එදයින් පස්සේ ඔයා දකින්නවත් නෑ..
බොරුකාරයෙක් ඔයා..

දවාත්ට හිතාගන්න බැරිවුනා.. කාර් එකෙන් බැහැලා ආවේ නිකී.
දවාත්ගේ ක්ලබ් එකේ කෑල්ල..බීවම කියන එව්වා කාටද මතක නිකී වගේ වුන් කීයක්නම් ඇසුරු කරලා අත ඇරලා ඇද්ද..කොල්ලා ආතල් ගත්තා විතරයි නිකීගෙන් මෙහෙම ගෙදර හොයන් එයි කියලා හිතුවෙම නෑ..

" ආයු.. ඔයාගේ තාත්තගේ නරක ජීවිතේ.
ලස්සන කරපු අය ඔය එන්නේ...

සදීනා කොල්ලා එක්ක අහක බලා ගත්තේ දවාත්ගේ සමාජ ශාලා ජීවිතේ එද කෙල්ල දැක්ක හිත්ද..ඒවගේ කෙල්ලෙක් කියලා ඇඳුමෙන්ම හිතාගෙන..
නිකී ඇදන් හිටියේ කොට ශෝට් එකකට බඩ පේන්න කෙටි බ්ලව්ස් එකක්..
සදීනා කොල්ලා එක්ක දවාත්ලට පිටුපාලා ඉදගත්තේ ඒ ගැන අවදනය නොදී..

" ආ නිකී..
මේ මේ මට අසනීප වුනා..ඒකයි එන්න බැරිවුනේ..
මම හෙට එන්නම්කෝ...

කොල්ලා සදීනා දිහා හොරාට බලලා නිකීට කිව්වේ කොහොමහරි නිකීව පන්නගන්න..
නැත්තන් ලෝක ලෙඩක් වැටෙන හිත්ද..

" බොරු කියන්න එපා දවාත්..
ඔයා මාව මඟාරිනවා දැන්.. ඒකනමා ඇත්ත..

"එහෙම දෙයක් නෑ නිකී..

දවාත් ගානකට නොගෙන කිව්වේ..

" ඇයි දවාත් ඔයා මෙහෙම...
මට ඇතුලටවත් එන්න කිව්වේ නෑ.. එලියෙම තියන් කතාව..

sinhalaebooks.com

ඔයා මෙහෙමද සලකන්නේ මට..
ම්ම්ම්..

දවාන්ගේ රතු කට්ට පනින්න ඔන්න මෙන්න දැන්..
සදීනාට තිකීගේ කටේ සද්දේ ඇහෙනවා කියලා ශුවර් කොල්ලට ඕනේ ඉක්මනට තිකී යවාගන්න..එහෙම එකේ තිකීඑල්ලීඑල්ලී එන එකට කොල්ලට කේන්ති

" ගෙදර එන්න තරම් අපි අතර සම්බන්ධයක් තිබ්බේ නැතේ තිකී..
ක්ලබ් ගියාම එතන ඉන්න ඕනම කෙල්ලෙක් එක්ක එන්ජෝයි කරනවා එහෙමයි කියලා ඒ ඔක්කොම ගෙදර අස්සේ දගන්නේ නැතේ..

දවාන් කිව්වේ සැරට.. තිකී කියන්නේ ලේසියකින් ගැලවිලා යන එකක් නෙමේ කියලා දවාන්ට තේරුනේ තිකී එක්ක හිටිය දවසෙන් පස්සේ කොල්ලට තිකීගෙන් කෝල් 100ට වඩා ආව නිසා.. ඒ එකක්වත් ගත්තේ නෑ.. දවාන් ට ඔය එකෙක්වත් එක්ක ජීවිතේ බෙදගන්න තරම් ආසාවක් තිබ්බේ නෑ..

" ද වා න්... තමුසේ බොරුකාරයෙක්
වංචාකාරයෙක්.. සල්ලාලයෙක්..
ශිට්.. මන් රැවටුනා..
තමුසේ කිව්වේ මොනාද එද මට.. හීන ලෝකයක් මවලා පෙන්නුවා..

" කට වහන් පලයන් මෙතනින්.. මගේ යකා අවුස්සන් නැතුව..

" නොගියොත්...

තිකී කියවන් යද්දි දවාන්ට ඉවසන්න බැරිවුනා.. මේ දවස් කීපෙට කොල්ලට තරහා ආවේ නෑ..
ඒ ඔක්කොම හරියන්න අද තිකී හින්ද මාරාවේස වේගන ආවේ..

සදීනා දැක්කා සද්දෙ වැඩි වෙද්දි දවාන් දත් මිටි කාගෙන අත් මිටි කරන් ඉන්නවා..
කෙල්ල දන්නවා ඊලගට වෙන්නේ ඉන්න ගෑනු ලමයගේ දත් දෙකක් නැති වෙන එක කියලා..
කෙල්ල අයාන්වත් වඩාගෙන දවාන්ලා ඉන්න තැනට ආවේ තිකීව යවන්න බලන්න..

" මැඩම්.. දැන් යන්න..
දවාන් මහත්තයට තරහා ගියොත් මැඩම්ට ගහයි..
ඒ හින්ද දැන් ගිහින් පස්සේ එන්න..

සදීනා ඒ ටික කිව්වේ තිකීට.. තිකී කෙල්ල දිහා බැලුවේ කට ඇද කරලා තිකන් කින්ඩියට වගේ..

" තමුන් කව්ද මට යන්න කියන්න..

sinhalaebooks.com

ආ.. මෙයා අනාත කරපු එකියක්ද උඹත්
ළමයත් මෙයාගෙද

නිකී සදීනට කියද්දි දවාන් පැන්නේ නිකීව අල්ලගන්න හැබැයි ඊටකලින් සදීනා නිකීව තල්ලු කලා ඈතට.. මොකද දවාන්ගේ අතට අහුවුනොත් නිකී ඉතුරු වෙන් නැති හින්ද.. ඒත් නිකී හිතුවේ කෙල්ල නිකීට ගැහුවා කියලා..

"බැල්ලී.. මගේ ඇගට අත තියන්න උඹ කව්ද..

නිකීගේ අතුල් පාර සදීනගේ කන හරහා යද්දි කෙල්ල විසිවෙලා ගිහින් අයාන් එක්කම බිම වැටුනා..

" අනේ මගේ දරුවා..

සදීනා වැටුන පාරට අයාන් විසිවුනා..කෙල්ල පැනලා අයාන්ව වඩාගෙන බැලුවේ කොල්ලට තුවාලද කියලා දෙවියන්ට පින් සිද්ද වෙන්න කොල්ලා ට සීරීමක්වත් නෑ..එත් බය වුන් පාරට අඬනවා කොල්ලා හෝ ගාලා

මේ ඔක්කොම වෙන්න ඇස් පිය ගහන තත්පරේ ඇති වුනා දවාන්ට හිතාගන්න බෑ.. නිකික්ව මරලා අලු කරන්න තරම් ආව කේන්තිය..

" නිකී.. උඹව මන් මරනවා..
මගේම ගෙදර ඇවිත් මගේම ඒවට අත තියන්න
උඹ කරගත්තේ ලොකුම මෝඩ වැඩක්.

කෙල්ල අයාන් අඬද්දි කොල්ලව තුරුල් කරන් නැගිටගත්තා අමාරුවෙන්..
දවාන් නිකීගේ බෙල්ලෙන් අල්ලන් ඉන්නවා දැක්කම කෙල්ලට දෙලෝ රත් වුනා..

" ආව්... ද වාන්... මට රිදෙනවා..
බෙල්ල මගේ...අනේ බේරගන්න..

" අනේ දවාන් මහත්තයා..අතාරින්නකෝ අනේ
මෙයාට මොනාහරි වෙයි..
අනේ.. කවෘත් නෑ ගෙදර..ත්
අනේ මහත්තයා..

සදීනා හිටියේ කොල්ලගේ අතේ එල්ලිලා.. අයාන් මහ හඬින් අඬනවා කෙල්ල ගේ පපුව අස්සේ මූන හංගන්..

දවාන් දැක්කා සදීනගේ නලලෙන් ලේ ගලනවා..

sinhalaebooks.com

කොල්ලට ඉබේම තිකීව අත ඇරුනා.. කෙල්ල තාමත් අයාන් තුරුල් කරන් දවාන්ගේ අතේ එල්ලිලා..

තිකී ගැලවුන තත්පරෙන් වාහනේ නැගගත්තේ දවාන්ගෙන් බේරිලා..

" ඒයි ඒයි... තමුසෙගේ ඔලුව පැලිලා ඔන්න..
ලේ එනවා..

දවාන් එහෙම කියනකොටයි කෙල්ල නලල අතගාලා බැලුවේ.. දැවිල්ලක් එක්ක කැක්කුමක් ආවේ නලල තුවාල වෙලා..

" ඒක කමක් නෑ.. දවාන් මහත්තයා.. දරුවා ට මොකද බලන්න.. මාව වෙව්ලනවා..මගේ අත් දෙකත් පන නෑ..

කෙල්ල අයාන්ව දවාන් අතට දුන්නා.. ඔක්කොම අස්සේ අයාන්ව වඩාගත්ත පලවෙනි පාර කොල්ලා මේ.. දවාන්ට ඒක ගානක් නෑ.. කොල්ලා අයාන්ගේ අත් කකුල් බලලා. වැලි පිහලා..කෙල්ලගේ ඔලුව බැලුවේ..ඒක බෙහෙත් දන්න තරම් ලොකුවටම තුවාලේ හිත්ද..

" යමු මන් බෙහෙත් දගෙන එන්න..
මම වාහනේ අරන් එන්නම්..

දවාන් කොල්ලව සදීනට දීලා වාහනේ යතුර අරන් එන්න දිව්වේ..දවාන් කලබල වෙලා හොඳටම..
සදීනට පුදුමයි..

" ආයු.. තාත්තා ඔයාව වඩා ගත්තා..
ඔයා අඩන එක නතර කලා එයා ලගට වෙලා..
මට සතුටුයි.. මගේ ඔලුව නැත්තටම නැතිවුනත් කමක් නෑ.. මෙහෙම වුන එක.මට සතුටුයි..
බේත් ඕනෙත් නෑ මට..දැන්..

කෙල්ල අයාන්ව සිප ගත්තේ..කවදවත් හිතුවේ නැති විදියට අයාන්ට ලැබුන මේ අවස්ථාව හිතාගන්න බැරිතරම් හිත්ද..

දවාන් ට සිහියක් නෑ කොල්ලා බයවෙලා සදීනගේ ඔලුව හිත්ද.. කොල්ලට දුකයි.. තමන් හිත්ද කෙල්ලට වුන දේට..
කාමරේට දුවලා පසර් එකයි යතුරයි අරන් දුවන් ආවේ කෙල්ලව අරන් යන්න..

"නගිනවා. ඉක්මනට..

දවාන් එහෙම කියානම වාහනේට ගොඩවෙමින ගියේ..

sinhalaebooks.com

" ඕන් නෑ මහත්තයා ..
මේකට ගෙදරින් මොනාහරි දගමු..

" තමුසෙත් මගේ යකා අවුස්සගන්න තමා දැන් හදන්නෙ..කනපලා ගන් නැතුව නගිනවා..

කෙල්ල සද්ද නැතිව ගිහින් වාහනේට නගින්න හැදුවේ

" ඒයි.. ඔය කෙහෙද නගින්නේ...

කෙල්ල ජීප් එකේ පිටිපස්සේ ශීට් එකට ගොඩවෙන්න ගියේ.. දොර අරින්න හදනකොටම දවාන් බෙරිහන් දුන්නේ..

"ඇයි..

" මම ඩ්‍රයිවර් නෙවෙයිනේ මැඩම්ගේ..
ඉස්සරහින් නගිනවා .

කෙල්ල එහෙමම ඉස්සරහට ගොඩ වුනේ දවාන්ට තරහා ගිහින් ඉන්නේ කියලා දන්න නිසා කිසිම දෙයක් නොකියා..

කෙල්ලව අරන් ගියේ ප්‍රයිවට් හොස්පිටල් එකකට..කෙල්ලව ඩොක්ටර් ගාවට දාලා දවාන් අයාන්ව අරන් එලියට් ආවේ කෙල්ලට බෙහෙත් දනකම්..

මේ අතේ ඉන්නේ තමන් එපා කියපු දකින්නවත් අකමැති වුන තමන්ගෙම දරුවා කියලා දවාන්ට ගානක් නෑ.. කොල්ලා ඉන්නේ සදීනට වුන දේ එක්ක තිකී ගැන තරහෙන්.. තරහා ආවම දවාන් කොහොමත් මේ ලෝකේ නෑනේ..

කෙල්ල බෙහෙත් දන් එලියට් එද්දි දවාන් අතේ කොල්ලට නින්ද ගිහින්.. දවාන්ගේ පෞවට ඔලුව තියන් අයාන් ඉන්නවා දැක්කම කෙල්ලට දුකයි සතුටයි දෙකම එකට වෙලා දැනුනා..

" ඔහ්.. කොහොමද සමුසෙට..
රිදෙනවද ගොඩක්.. ආ..
ගොඩක් තුවාලද..

දවාන් කලබලෙන් අහද්දි කෙල්ල නෑ කියන්න ඔලුව වැනුවා..

" ආ.. මෙන්න.. ලමයා ගන්නවා..
මන් වාහනේ දැම්මේ මග.. අරන් එන්නම් මන්..

කෙල්ල අතට කොල්ලා දෙන්න හැදුවේ දවාන්..

sinhalaebooks.com

"ආහ් ආහ්.. අම්මෝ ඔලුව රිදෙනවා.. ආව්..

" ඇයි ඇයි.. මොකද..
රිදෙනවද..අමාරුද.. මන් ඩොක්ටර් කතා කරන්නද..

කෙල්ල ඔලුව අල්ලන් කෑ ගැහුවේ අයාන්ව දවාන් අතේම තව ටිකක් වෙලා තියන්න ඕනැවට.. කෙල්ල්ල රිදුන් නෑ නැතනම්

" මට කලන්තේ වගේ.. ගෙදර ගිහින් බේත් බිව්වම හරි යයි අපි ඉක්මනට යමු මහත්තයා..

"ආ.. හරි හරි.. මන් වාහනේ අරන් ඒන්නම්..
නෑ .. එක්කො හෙමීට යමු ඇවිදින්න අමාරු නැතේ
ලග තියෙන්නේ වාහනේ..

දවාන් කෙල්ලට හෙමින් යමු කීවේ වාහනේ අරන් එන්න අයාඅන්ව වඩන් යන්නත් බෑ කෙල්ලට වඩාගෙන ඉන්නත් බැරි නිසා..

දවාන් කොල්ලව බඩාගෙන ඉස්සල්ලා යනවා කෙල්ල පිටිපස්සෙන් යනවා..

" සදීනා.. මේ හීනයක්ද දකින්නේ ඔයා..
ඕඔ යකා මහත්තයා ආයුව වඩන් යනවා..අනේ
මට මේක හීනයක්මද කියලා හිතෙනවා..

නෑ මේක ඇත්තක්..
එයාලා එහෙම යද්දූ ලස්සනයි.. තාත්තයි පුතයි..
ලොකු නෝනා දැක්කනම් සතුටට පැලෙයි..

මට සතුටට පාරෙන නටන්න හිතෙනවා..

සදීනගේ සද්දයක් නැති හින්ද කොලා බැලුවේ පිටිපස්සෙන් එනවද කියලා..

"ආව් ..අම්මෝ රිදෙනවා.. අම්මෝ

කෙල්ල දවාන් බලද්දි බොරුවට ඔලුව අල්ලන් අමාරුවෙන් ආවා.. කොල්ල ඉස්සර බලාගද්දි කෙල්ල සතුටට අත් විහිද ලා පැද්දි පැද්දි ගියේ වාහනේ ලග්ට යනකම්ම..

"ආයු.. අන්න අන්න.. අර
ලොකු බස් එකක්..

ආ අර තව ඒක ටිපර් එකක්.. අපෝ ඒක ජස්ටම් බෝඩ් ලොරියක්.. ඔයා ආසද මන් ආස නෑ..

sinhalaebooks.com

දවාත් පාඩුවේ වහනේ අරන් යන්වා..සදීනයි අයානුයි කට පියන් නෑ වාහන දිහා බල බල කියෝනවා

කොල්ලා දෙපාරක් තුන් පාරක් බැලුවා.. කෙල්ලගේ කකුල් දෙක උඩට වෙලා උඩ පැන පැන ග්ලාස් එකෙන් එබීගෙන වාහන බලන කොල්ලා දිහා..

"ආම් ආම් ආ මි..

අයාන් එක පාරම වචන කියවෙන් නැති වුනාට දපු සද්දෙට සදීනට වගේම දවාන්ටත් හිනා ගියා..

" ආම්.. බූම් තමා..හොරගෙඩියා..
පැහිලා ඉන්නේ..

කෙල්ල අයාන්ව සිපගත්තේ පපුවටතුරුල් කරන්..

"ආ ආ..අර..
තව ලොකු බස් එකක්..

සදීනා විනාඩි පහකට සැරයක් ආ ර කියලා කෑ ගහ්ද්දි දවාන් ගැස්සෙනවා..සද්දෙට.. දවාන් දෙතුන් පාරක්ම බයවෙලා බැලුවා..

" මෙකී මෙහම ගියොත් මාව මොකකහරි අන්නලා තමා නවතින්නේ..

"ආයූ ආන්..

"ඒයි.. තමුසේ අගහරු ඉදන්ද ආවේ..
වාහන දැකලා නෑ වගේ.. ආන් ආන් ගාලා කෑ ගහන්න.. දෙන්නම දනවා එලියට වාහන බලබල ඉන්න..
කෑ ගහනවා..මේක ඇතුලේ..

දවාන් ඉස්සරහා බලානම බැන බැන ගියේ කෙල්ල දිහා බකන් නැතුව..

" ෂ්..ෂ්..

ආයාන්ට කෙල්ල කටට ඇගිල්ල තියලා පෙන්නුවේ සද්ද නොකර ඉන්න කියලා..

" මෝඩයෙක්.. ලමයි එහෙම තමා..පොඩි දරුවෙක් එක්ක ඉන්නවත් දන් නෑ..
එයාගේ වාහනේ යන නිසානේ.. මේ ඔක්කොම බඩකඩින්නුවෙන් බැස්සම බලාගමු..

sinhalaebooks.com

දවාත් තිකීට ගේමක් දෙනවා කියලා ප්ලෑන් කර කර ඩ්‍රයිව්න් කලා.. කෙල්ලයි අයානුයි සද්දයක් නැති හින්ද ටිකක් දුර ඇවිත් කොල්ලා බැලුවේ..

සදීනා ශීට් එකට ඔලුව තියන් නිදි කොල්ලත් කෙල්ලගේ පපුවට හේත්තුවෙලා නිදි..

" වැහැලා පායලා වගේ.. පුදුම නැටිල්ලක් තියෙන්නේ දෙන්නම එකයි..

දවාත් විඩෙන් විඩේ බැලුවා.. බැන්නට පාලුයි දෙන්නගේ කෝලම් නැතුව..
කෙල්ලගේ පපුව උඩ තිබ්බ අයාන්ගේ චූටි ඔලුව වැටෙන්න එනවා නින්ද ගිහින් ..

දවාත් ඩ්‍රයිව්න් කරන ගමන්ම කොල්ලගෙ ඔලුව කෙල්ලගේ පපුව මැද්දට කරලා තිබ්බා ඇහැරෙන් නැතිවෙන්න..

ඔතලා තියෙන බැන්ඩේජ් එකෙ ලේ පුරලා.. දවාත්ට ඒක දැක්කම කෙල්ල ගැන දුක හිතුනා..
එච්චර අමාරුවෙනුත් පොඩි එකා එක්ක හිනාවෙම ලස්සන කියලා හිතුනා..

ඉස්සර මෙහෙම අක්ෂා එක්ක යන්නහීන දැක්කා..
අක්ෂා දරුවා එක්ක මෙහෙම පාරවල් ගානේ ඇවිදින්න.. ලෝකේ වටේ යන්න.. අනන්ත වාරයක් හීන දකින්න ඇති

ඒ සුන්දර ජීවිතේ නැත්තටම නැතිකලා..අක්ෂා යන්නම ගියත් ..කොහෙන්දෝ ආව කෙල්ලෙක් ඒ හීන පාට කරලා පෙන්නවා වගේ හිතුනා දවාත්ට..

දවාත් ඔහේ හිත හිත ගෙදර යනවා වෙනුවට කොළඹ වටේ වාහනේ අරන් ගියා..
ගෙදරබ්‍යන්න හිතුන් නෑ.. සදීනයි කොල්ලයි දිහා බල බල දවාත් ඩ්‍රයිව්න් කලා.. දෙන්නා පැයක් විතර් හොදට නිදගත්තා..

" යකෝ දැන් එකම පාරේ මන් කී පාරක් ගියාද..
මුන් දෙන්නා නිදි පෙති ගහලද..
ඇහැරෙන් නැද්ද..
ටිකක් අවුස්ස ලා ගෙදර එක්කත් යනවා..
ඇහැරෙනකම් මන් මන් වාහනේ වටේ අරන් යනවා..

ඊටත් ටික වෙලාවකට පස්සේ කෙල්ලට ඇහැරුනා..
කෙල්කළුලිය බලද්දි දැක්කේ කලුවර වැටිලා..

"ආ.. අපි තාම යනවද.. මෙච්චර වෙලා..

දවාත්ට කට කොනට හිනාවක් අරන් නැහුන ගානට පාර දිහා බලන්ඩ්‍රයිව්න් කලා..

" ආයු..

sinhalaebooks.com

මේ හොඳටම දොයි..

දවාත් මහත්තයා අපි ගෙදර ආවේ නැද තාම..

කෙල්ක දවාත් දිහා බලන් ඇහුවේ..

"ම්ම්ම් නෑ..

"ඇයි.. මෙච්චර වෙලා..

" දන් නෑ.. දැන් ලග ඇති..

සදීනා කට ඇරන් හිටියේ දවාත් ගාත්කට් නෙගෙන දෙන උත්තර වලට..

මේ මනුස්සයට පිස්සුද ඒම නැත්තන් ඔලුව වදුන පාර මට පිස්සුද.. හරිනම් අපිට ගෙදර දහපාරක් ගිහින් එන්න වෙලා..

මෙයා අපිව මේ කේ දලා ක්ලබ් එකට ගියාද දන් නෑ..

බීලද ඉන්නේ.. කෝ බලමු මූන..

දවාත් දැක්කා කෙල්ල මූනට එබී එබී බලනවා..
කොල්ලට හිනා. සදීනා බයවෙලා ඉන්නේ කියකා දන්නව..

" බීලත් නෑ වගේ.. අනේ මේ මොන විකාරයක්ද..
පස්සත් රිදෙනවා දැන්..

...........

දවාත් ගෙදර එද්දි සමදරාලා ගෙදර ඇවිත් තිබ්බා..
හොඳටම කලබල වෙලා හිටියේ සදීනයිඅයානුයි නැටිජ් හින්ද..දන්න හැම කෙනාටම කෝල් දීලා ඒ වෙද්දිත්.. දවාත් ෆෝන් එකත් ගෙදර දලා ගිහින් තිබ්බ නිසා කිසිම තොරතුරක් නෑ..

කෙල්ල අයාන් එක්ක වාහනෙන් බහිද්දි සමදරා දුවන් ආවේ..

"දෙයියනේ මේ මොකක්ද.. වුනේ දරුවෝ..
ඔලුව තුවාල කරගත්තේ කොහොමද..

දවාත් සමදරා එක්කබ්කතා නොකර වාහනේ යතුර අරන් යන්න ගියේ..

sinhalaebooks.com

"දවාත්.. ඔහොම නැවතියන්.. උඹ ගැහුවද මේ ලමයට.. මොකද කරේ..අපි නැති අතරේ.. මත් හිතුවා දලා යද්දි..

ණර්බාහු දවාත්ට කඩන් පැන්න..

"අනේ නෑ මෑ ලොකු මහත්තයා .. දවාත් මහත්තයා නෙවෙයි. අම ලිස්සලා වැටුනා බාතෲම් එකේ.. මහත්තයා තමා බේත් අරන් දුන්නේ..

කෙල්ල දවාත් බේරගන්න කිව්වා.. ඒත් රණබාහු විස්වාස කලේ නෑ..

" ඔය ලමයා මේකට බයේ බොරු කියන්න ඕන් නෑ.. මන් දන්නවා..මූ තමා මොනාහරි කරන්න ඇත්තේ.. බය කරන්න ඇති කියන්න එප කියලා..

"අනේ මහත්තයා .. සදීනා නෑ කිව්වනේ.. පුතා එහෙම කරන් නෑ..

සමදරා දවාත්ගේ පැත්ත ගත්තා.. යතුර අතේ තියන් කතා නොකර හිටියේ දවාත්ට එන කේන්තිය දරාගන්න බැරුව.. ඒත් කොල්ලට තරහා ආවේ රණබාහුටත් එහා තිකී ගැන..

කතා නොකරම් ආපහු වාහනේට නැගලා ඉගිකුනේ සදීනා යි සමදරයි බකන් ඉන්දිම.. කෙල්ලගේ හිතට හරි නෑ.. අද මොනදේ කොහොම සිද්ද වුනත් දවානුයි අයාන්වයි අංශු මාත්‍රයක් හරි ලන් වුනා.. ඒත් රණබාහුගේ කේන්තිය හින්ද අද ගිහින් බීලා ආවොත් ආපහු දවස්ගානක් දවාත් ඒ පලිය ගන්නවා..ඒක මේ ගෙදර හැමෝගෙනම පිරිමහ ගන්නවා..

" .සදීනා

කෙල්ල හිටියේ අයානුත් නිදි හින්ද එලියේ බංකුවට වෙලා ඉදගෙන.. දවාත් එනවද කියලා මග බලන ගමන්..
සමදරා කෙල්ල ලගට ආවේ.. නිදගන්න කියලා ඇඳට ගියත් දවාත් නැති හින්ද සමදරාගේ ඇස් පියවුනේම නෑ..
බැරිම තැන නැගිටලා එලියට ආවා..

"ලොකු නෝනා..
මම මේ දවාත් මහත්තයා නැති හින්ද බැලුවේ ටිකක්..

"හ්ම්.. මටත් නින්ද යන් නෑ කෙල්ලේ..

සමදරා බර හුස්මක් හෙලල කෙල්ල ලගින් වාඩිවුනේ..

" දවාත් මහත්තයා මේ දවස් ටිකේම හොදට හිටියා.. බිව්වෙත් නෑ නෝනා..
අද ලොකු මහත්තයා කතා කරපු විදියට දවාත් මහත්තයට කේන්ති ගියා..
මට බය ආයෙත් බීලා එයිද කියලා

sinhalaebooks.com

කෙල්ල කියපු දේ ඇත්ත කියලා සමදරා දන්නවා.. දවාත් ට පොඩි කාලේ ඉදන් තරහින් දෙයක් කියලා පහදන්න බෑ කියලා දැන දැනත් රණබාහු කේන්තියෙන් පුපුරන එක දවාත්ගේ මුරණ්ඩුකම වැඩි වෙන්න හේතුවක්..

" මන් දන්නවා දරුවෝ.. අපේ මහත්තයා කලබලයි..තාත්තයි පුතයි දෙන්නම කේන්ති කාරයොනේ.. දෙන්නම එකයි.. ඔක්කොගෙන්ම තැලෙන්නේ මම..

සමදරා කියන්නේ ඇත්ත. දවාත්ගේ මුරණ්ඩුකම එක්ක වෙනස් වුන දවාත්ගේ ජීවිතේ අස්සේ හැමදම දුක් වින්දේ සමදරා..
රණබාහු කලේ කේන්තියෙන් කෑ ගහලා පීඩනේ නිදහස් කල එක.. ඒ දේවල් වලින් දවාත් තවත් මුරණ්ඩු වුනා..

" ලොකු නෝනා.. මන් දෙයක් කියන්නද..

කෙල්ල සමදරා කල්පනා කර කර ඉන්නවා දැකක්කා..ඒ මූනට හිනාවක් සැනසීමක් දැනෙන දෙයක් අද සිද්ද වුනා..තාමත් කෙල්ල විතරක් ඒ ගැන හිත හිත සතුටු වුනා.. ඒත් දැන් ඒක සමදරාට කියන්න හොදම වෙලාව කියලා හිතුවා..

" මොකක්ද දරුවෝ..

" අද දවාත් මහත්තයා ආයූ බබාව වඩාගත්තා..

කෙල්ල ඒ ටික කියද්දි සමදරාගේ ඇස්වල කඳුලු හෝ ගාලා කඩගෙන වැටෙනවා. ඒක දරාගන්න අමාරු සතුටක්..

" අනේ දෙවියනේ.. සදීනා
ඒක ඇත්තක් ද.. මට අදහගන්නත් බෑ..

" ඇත්ත නෝනා.. මට බෙහෙත් දනකම් බබාව වඩාගෙන එලියෙන් හිටියා මහත්තයා..

මට බයත් හිතුනා නෝනා..ඒත් මම එලියට එද්දි
දවාත් මහත්තයා බබාට එක එක ඒවා පෙන්නවා..
බබත් ශෝක් එකට හිටියා..

කෙල්ල කියන් ගියේ සදමදරාගේ සතුට දෙගුණ තෙගුන කරමින්..
කවදවත් බලාපොරොත්තු වුන් නෑ මෙච්චර ඉක්මනට දවාත්ගේ වෙනසක්..
මේ හැමදේම සදීනා හින්ද කියලමයි සමදරාගේ හිත කියන්නේ
ඇත්තටම කෙල්ල ගෙදරට වාසනාව අරන් ආවා දේව දූතියක් වගේ..

" අනේ දරුවෝ.. මට පුදුම සැහැල්ලුවක් දැනෙන්නේ ..

sinhalaebooks.com

මත් දැනත් හිටියා දුව මේක කරනවා කියලා ඒත් මෙච්චර ඉක්මනට කරයි කියලා හිතුවේ නෑ..

" මත් මුකුත් කලේ නෑ නෝනා..
අයාත් බබා වාසනාවන්තයි
එයා කොහොමහරි එයාගේ තාත්තා ළඟට යයි..
අපි බලත් ඉමු..නෝනා..

කෙල්ල කිව්වේ සමදරාට .. ඇත්තටම අයාන් දවාන්ගේ ජිවිතේ කොටසක්.. ලේ වල කොටසක් ඒක වෙනස් කරන්න බෑ දවානුත් ඒක දන්නවා. ඒ බැදීම කවදා කොහොම කොතැනකදි හරි එකතු වෙනවා කියලා කෙල්ලට විස්වාසයි..

සමදරා එක්ක දවසෙම වුන දේවල් කෙල්ල කිව්වේ හිනාවෙවී.. දවාන් අද කරපුවා සම්දරා කෙල්ලගෙන් දැනගත්තදි පුදුමයි..ඉස්සර දවාන් ඔහොම දේවල් කලා කිව්වොත් විස්වාස කරන්න පුලුවන් ඒත් අද ඉන්න දවාන් කියන්නෙ හුගක් වෙනස් කෙනෙක්.. සමදරාට හිතුනා කොල්ලා දැන් වෙනස් වීගෙන එනවා කියලා..

" අන්න නෝනා දවාන් මහත්තයගේ වාහනේ ආවා..

කොල්ලා වාහනේ නවත්තදී දැක්කා සදීනයි සමදරයි බංකුව ලඟ බලාගෙන ඉන්නවා..

" අර මෝඩ් මොකද.. තුවාලෙත් තියන් පිනි බාන්න එලියට වෙලා ඉන්නේ

ශුවර් ඇන්ඩ් ශොට් දෙන්නම බලන් ඇත්තේ අද මන් බීලා ඇති කියලා ඔය..
දෙන්නම්කෝ..ඇක්ටින් පාරක් .

දවාන් බීලා නෙවෙයි ආවේ ඒත් සමදරායි සදීනයි බය කරන්නත් එක්කම බොරු වෙරියක් අරන් වාහනේ අල්ල අල්ල ආවේ කකුල් පටල පටල ඇවිදගෙන..

" කිව්වත් වගේම අන්න සදීනා..
ගන්න දෙයක් නෑ හොදටම බීලා..

" ඔව්මයි නෝනා.. ඇවිදගන්නවත් බෑ..

දවාන් අමාරුවෙන් දොර ලඟට ගිහින් බිම වැටුනේ හොරාට බලලා..

" බඩගාගෙන හරි යයි කාමරේට..
අපි ගිහින් නිදගමු..
සදීනාත් යන්න.. මම යනවා මට බෑ ඔය ජ්වුසන් බලන්න..

sinhalaebooks.com

සමදරා කොල්ලා ගාවින් ම ඇතුලට ගියේ තරහෙන්.. ඔතන දවාන්ට මොනාහරි කියවුනොත් ඒකටත් කේන්ති අරන් කැගලා යුද්ධයක් කරන හිත්ද ඕන දෙයක් කරගන්න ඇරලා ගේ ඇතුලට ගියේ..

" දවාන් මහත්තයා නැගිට්ටින්න.. ඔය බිමනේ ඉන්නේ..

දවාන් පඩිය ගාව ඇස් පියාන නිදගෙන වගේ ඉද්දි කෙල්ල අතකින් අල්ලලා උස්සන්න හැදුවේ කොල්ලා බීලා කියලා හිතලා..

" කඳ බඩ තිබ්බට වැඩක් නෑ මොලේ නැතේ..
බීලා ප්‍රශ්න විසදන්න පුලුවන් ඇති කියලා හිතන් ඇති..
උදේ ඉදන් හොදට හිටියා..
අං දෙකක් මෝදු වෙනවද දන් නෑ
ඔය හැටි කියන දෙය නොතේරෙන්න තරම්..

දවාන්ට ඇහෙනවා කෙල්ල කියන ඒවා.. තවත් ඒ විදියටම හිටියේ මොනවද කියන්නේ බලන්න..
දැන් බැනපු ටික හොදටම ඇති කෙල්ලගේ කන පලන්න..ඒත් දවාන්ට බෑ දැන් කෙල්ල ඉස්සරහා නපුරු වෙන්න..

සදීනා සලකන විදිය ට ඒ කටකාරකමට දවාන් ආසයි.. වෙනස් විදියේ කෙල්ලක් දැක්කා දවාන් සදීනගෙන්.

" මම කියන්නේ මේ යකාට ඉන්න තිබ්බේ අයියෙක් තව..
මෙහෙම බීලා ආවම ඇදුම් ටික ගලවලා දොරකඩ නිදගන්න දීලා තිබ්බම
උදේට හෙලුවෙන් ඉද්දි ලැජ්ජාවටවත් හැදෙයිනේ..

බීලා ගෑනු එක්ක නටලා නටලා ඇවිත්..අර අහිංසක ලොකු නෝනලට රෙස්පට් දනවා..

සදීනා දවාන්ව නගිටන්න උත්සහ කරන ගමන් කියෙව්වේ..

"එහාට වෙනවා..
මම බීලා නෑ..

දඩබඩ ගාලා නැගිටලා යද්දි කෙල්ල අත් දෙකෙන් කට වහගත්තා..

" දෙවියනේ.. බොරුවටද ඉදලා තියෙන්නේ..
මන් කියපුවා ඇහෙන්න ඇති..
ඉවරයි බෙල්ල ගලවන් තමා අද නවතින්නේ සදීනා උඹ..

sinhalaebooks.com

පව් අනේ ලොකු නෝනා හිත තරක් කරන් නිදාගන්න ගියේ.. මේ මෝඩයා අර මිනිස්සු අවුලලා මොන සතුටක් හොයනවද මන්ද..

" ඔතන ගල් ගිලලා වගේ ඉන්නේ.. මට බඩගිනී කෑම ලෑස්ති කරලා දෙනවා..

කෙල්ල දොරලග හිටගෙන ඉද්දි දවාන් සාලෙට ගිහින් කෑ ගැහුවේ .. කෙල්ලව ගෙන්න ගන්නත් එක්ක.. දවාන් අලුත් සෙල්ලමක් පටන් අරන් තිබ්බෙ සදීනව බය කරලා අවුස්සන එක

" හරි මහත්තයා..

මේකි දැන් මහත්තයලු.. මට කියන්න ඕන කුනු කතා ඔක්කොම කියලා බැනලා.. කටක් නෙවෙයි ඒක.. කොහෙන් එක්කත් ආවද දන්නෑ මේ ගල් කටස් එක තාත්තා..

කෑම මේසේට ඇරලා කෙල්ල වතුර එකත් මේසේ ත් තියලා කාමරේට යන්න ගියේ දවාන්ට කෑම කන්න කියලා..

කෙල්ලට දවාන් ඉස්සරහා ඉන්න මොකක්ද වගේ බැන්න ඒවටයි කියපුවටයි ලැජ්ජයි.. ඊටත් බීලා නාව එකත් පුදුමයි..

දවාන් මහත්තයා අර කෙල්ලට බනින්නවත් ද ගිහින් ආවෙ..
නැත්තන් කල්බ් එකට ගියා වෙන්නත් බෑ.. එහෙනම් බොනවනේ හොදටම..
කොහේ ගිහින්ද ආවේ..
හිතන්න අමාරුයි..

ඕන එකක් මන් යනවා නිදාගන්න.

" ඊයි.. වතුර එකක් ඕනේ..

එක හුස්මට මේසේන් තිබ්බ වතුර එක බීලා දවාන් කෙල්ලට වීදුරුව දික් කරන් හිටියේ තව එකක් ඉල්ලලා..

කෙල්ල කතා නොකරම ගිහින් තව එකක් ගෙනත් තිබ්බා..
කෙල්ල කාමරේට ආයි යන්න හදද්දි ආයෙම දවාන් වතුර එක බීලා ග්ලාස් එක දෙනවා ගේන්න කියලා..

කීප වතාවක්ම සදී සද්ද නොකර වතුර අරන් ඇවිත් දුන්න..

"මොකක්ද මහත්තයා වෙලා තියෙන්නේ..
බවුසරයක් ද බඩ.. කීපාරක් වතුර ගෙනාවද..
ආයේ මට බෑ..කෑම එක කන්න..දැන්..ඔයහැටි වතුර නොබී..

sinhalaebooks.com

කෙල්ල බැරිම තැන කිව්වේ දවාත් ට අන්තිම වතුර ග්ලාස් එක ගෙනත් තියලා..

"මේකී ට තේරෙන් නෑ කියන දෙයක්.. මන් කනකන් හිටියම නරක් වෙනවද..
මැටි මොළේට ඒක තේරෙද්දි වතුර බීලා බඩ පැලෙනව මගේ...

" එහෙනම් තමුසේ ඉන්නවා මන් කනකම්..
දූවන් නැතුව ඔතනින් වාඩි වෙලා..

සදීනා බැලුවේ බීලා නෑ නෑ කිව්වට ඇත්තටම බීලද කියලා.. නැත්තන් ඔහොම කතාවක් ජීවිතේට කියන් නෑ දවාත්..

" හරි.. වතුර අදිනවට වඩා ඒක ලේසී..
මන් ඉන්නම් දැන් කන්න..

සදී දවාත් ඉස්සරාහින්ම වාඩිවෙලා මූන දිහා බලන් හිටියේ හිනාවෙලා දත් ටිකත් පෙන්නම

" ඔහොම ඉන්න එපා.. තමුසේ දැක්කම බය හිතෙනවා.. මට..
හොල්මන වගේ විරිත්තන් ඉන්නේ නිකන්..

"නෑ නෑ මහත්තයා ට තනියම කන්න බෑනේ කියන්නේ.හොල්මන හරි මෝහිනිහරි මොකී වුනත් කමක් නෑ තනියට ඉන්නනේ ඕනේ..
ඒ හින්ද සද්ද නොකර කන්න..

දවාත් බිම් බලන් කන්න ගත්තත් කලේ කෑම එකට ඇඟිල්ලෙන් ඇන ඇන හිටිය එක..
සදීනා දිහා හොරාට බැලුවත් කෙල්ල හිටියේ අහක බලන්..

" ම ට ඇති

දවාත් ඒක කිව්වේ රහසෙන් වගේ.. සදීනා බැලුවේ කෑම එක දිහා ඇති කියන්න දවාත් කෑම එකට අතවත් තියලා නෑ..

" ඔය කාලා තියා අල්ලලවත් නෑනේ කෑම එක මහත්තයා..

කාගෙන්ද මහත්තයා ඔය පලිගන්නේ ඔයාගෙන්ද
නැත්තන් මේ ගෙදර අයගෙන්ද ආ.. කියන්නකෝ

කෑම පලි නෑනේ.. අනික විසිකරන්න කෑම හදන් නෑ මේ ගෙදර.. දවාත් මහත්තයා බීලා බීලා නිදගත්තට ලොකු මහත්තයා අමාරුවෙන් සල්ලි හොයන්නේ..ඒවගෙන් තමා මහත්තයා ත් කන්නේ බොන්නේ.. එහෙම එකේ පව් සිද්ද වෙනවා කෑම නාස්ති කරොත්..

sinhalaebooks.com

දවාන්ට හිනාව නවත්තගන්න බැරි තරම් .. සදීනා කතුර වගේ බතින්නේ පොඩි ළමයෙක් ගානට දලා දවාන්ව..

" රණබාහු බංගලාවේ ලොකු මැඩම්..
මේ දවාන් ගේ අත තුවාල වුනා ඒකයි කන්න අමාරු.. ලොකු මැඩම් කියනවනම් මම කෑම වලට ගෙවන්න.ම්..

ඒක කිව්වේ කින්ඩියට් වගේ.. කෙල්ල හිතලා තියෙන දුර.. දවාන් කියන්නේ ලංකාවේ ලොකුම බිස්නස් වලින් එකක අයිති කාරයෙක්.. දවාන්ට වෙනමම බිස්නස් තිබ්බා ලංකාව වටේම..එහෙම එකේ ගෙදර පිනට කනවා කියලා කියද්දි දවාන්ට කේන්ති යන්න තිබ්බා ඒත් සදීනා කියන්නේ දැන් දවාන් ආසම කෙනෙක් .. කෙල්ල ගැන තරහක් ආවේ නෑ.. අවුස්සලා සතුටු වෙන්නමයි හිතුනේ..

දවාන් අත පෙන්නලා කියද්දි සදීනා බැලුවේ අත දිහා.. ලොකු මැඩම් කියපු එකටනම් කෙල්ලටලැජ්ජා හිතුනා..ඕන්නැති දෙයක් කිව්වද කියලා..

" මේ මොකද ...
තකහතියක් ඉගිලුනේ කාට හරි චණ්ඩිකමක් දලා එන්නද මහත්තයා ..

හදන්නත් බෑ හැදෙන්නෙත් නෑ.. මහත්තයා ඉන්න තිබ්බේ අපේ වැල්ලේ.. මාලු පිහියක් අරන් කපාගෙන කොටාගෙන ඉන්න තිබ්බා..

කෙල්ල දවාන්ට එහෙම කියලා ගියේ හැන්දක් අරන් එන්න.. මොනාවුනත් කෑම එක කන්න බෑනිතුවාල අතින්..

" ඔහ් වැල්ලේ කියන්නේ මෙයා එතකොට මාලු කැල්ලක්ද.. වැල්ලේ හිටිය.. ඒකතමා මෙච්චර කට සැර...

දවාන් ට හැන්ද අල්ලන්න හුරු නෑ වම් අතින් කොල්ලා ඔට්ටු වුනේ කාගන්න.. සදීනා බලන් හිටියේ දවාන් බත් කටක් කන්න විදින කට්ට දිහා..

" මම කවන්න ද..

දවාන් බැලුවේ සදී දිහා.. හිතුවෙම නෑ ඒ වගේ එකක් කියයි කියලා..ගත් කටටම හා කියන්න හිතුනත්.බෑනේ එතකොට තිකන් ඒකටම හිටියා වගේ..

" ඕන් නෑ... මන් කන්නම්..

සදීනත් ඔලුව වනලා වාඩිවෙලා හිටියේ දවාන් කනකම්..දවාන්ට කොච්චර ඔට්ටු වුනත් බත් කටක් අනලා හැන්දෙන් කා ගන්න බැරිවුනා..

sinhalaebooks.com

" ශිට්..මට එපා..මඟුල..

බත් එක තල්ලු කරලා නැගිටලා යන්න හදද්දි සඳී බත් එක අරන් දවාව අල්ලලා ඉන්දුවේ පුටුවෙන්..

කෙල්ල පුංචියට බත් කටක් අනලා දවාන්ගේ කට ළඟට කලේ ඔලුවෙන් කන්න කියලා බත් කට පෙන්නන ගමන්
දවාන් බලන් හිටියේ ඒ ඇස් දිහා..
අහිංසක කමයි නපුරුකමයි දෙකම එකම මූනේ තිබ්බා හොඳටම..
අක්ෂා එක්ක අවුරුදු හතරක් ආදරේ කලා හැමතැනම ඇවිද්ද ඒත් කවදාවත් දවාන්ට බත් කටක් කවලා නෑ..
ආදරෙන් කිසිම දවසක කතා කරලා නෑ
හිත හැදෙන වචනයක් කියලා නෑ..

ඒත් මේ කොහෙන්ද ආව පුංචි කෙල්ලෙක් දවාන්ට බත් කවනවා බනිනවා සැර දනවා..
කොල්ලට පුදුමයි.. මේක හීනයක් වගේ රූ දකින..
ගෙදර අයවත් මෙච්චර හිතත් නෑ කියල හිතෙනවා..

" එපා ද දවාන් මහත්තයා ..
අහ්.. මට සමාවෙන්න.. අපි වගේ වැඩකාර අයගෙ අත්වලින් කන එක එච්චර හරි නෑ නේද..

දවාන් කල්පනා කරන හින්ද කෙල්ල අත ගත්තේ දවාන් අකමැති ඇති කියලා..
සඳී කියන්නේ ගෙදර වැඩ ඉන්න කෙනෙක්..එහෙම කෙනෙක්ගෙන් බත් කවාගන්න තරම් දවාන්ලා
කැමති නෑ කියලා කෙල්ලට හිතුනා..

"මඟුල..කෝ මෙහාට..

සඳීගේ අතඇදලා අරන් කොල්ලා බත් කට ද ගත්තේ බලෙන්ම..වගේ

කෙල්ලගෙන් බත් කටවල් දෙක තුනක්ම කෑවේ නිහඬවම.. ඒ බත් කට දවාන්ට රහයි කියලා හිතුනා.. ඒත් ඒක කියන්න තරම් දවාන්ට වචන තිබ්බේ නෑ..

" දවාන් මහත්තයා ..

" ම්ම්ම්..

" අතට මොකද වුනේ කියන්නකෝ..
රණ්ඩු වුනාද..

sinhalaebooks.com

" මොකා එක්ක රණ්ඩු වෙන්නද ඕයි.. ඕක කවනවකෝ බයිලා අහන් නැතුව

දවාත් ඇත්තටම ගිහින් තිකීට බැනලා ක්ලබ් එකේ ඔක්කොටම ගහලා ආවේ.. තිකීගෙත් ඔලුව තුවාල වෙන්න ගැහුවා කොල්ලා.. සදීනට තුවාල කරපු එකට පලිය ගන්න..

" බයිලා නෙවෙයි.. ඒ තෝනා ආව එක හොදයි..
මගේ ඔලුව පැලුන එකත් හොදයි.. මටනම් සතුටුයි ඒකට. ඒ හින්ද ඒ තෝනා එක්ක තරහා ගන්න එපා..

කෙල්ල කිව්වේ කෑම එක දිහා බලන්.දවාත්ට හිතාගන්න බෑ ඔලුව තුවාල වෙලා කොහෙවත් යන එකියක්ගෙන් ගුටිත් කාලා සතුටු වෙන්න තරම් සදීනාට ඒකේ තිබ්බ හොදේ මොකක්ද කියලා..

" ආ තමුසේ ට මගේ සුඛෝපභෝගී ජීප් එකේ රවුමක් යන්න හම්බුනානේ.. නේහ්..
ඔච්චර සතුටු ඒකයි..

" අප්පෝ ඔව්.. ඒ තරම් ත්‍රාසජනක ගමනක් මන් ඔය ගියාමයි..
කොච්චර සුන්දරද කියනවනම් එකම පාරේ හතර පාරක් ගියා..

දවාත්ට කැස්සක් එක්ක බත් කටත් එලියට පැන්නා..සදීනා නිදගෙන වගේ ඉදලා තියෙන්නේ හොරට කියලා කොල්ලට මීටර් වුනේ දැනුයි..

"මට ඇති අරන් යනවා ඕක..

කාපු ටිකත් දිරවත් ගියා.. මේකට පුදුම හැකියාවක් තියෙන්නේ මාව කපලා අරින්න..

දවාත් කියන්නේ කෙල්ල යන්න ඇරලා..තවත් කෙල්ල ලග තෝන්ඩි වෙනවට වඩා හොදයි කාමරේට ගිහින් පාඩුවේ නිදගන්න එක.. ඒ හින්දම දවාත් නැඟිට්ටේ වතුර එක බීලා කාමරේට යන්න..

" ඔහොම ඉන්න..දවාත් මහත්තයා අතට බෙහෙත් දන් යන්න..

සදී නා දුවන් ආවේ බෙහෙත් එකත් අරගෙනම .දවාත් යන්න හැරිලත් ආයි ඉදගත්තේ කෙල්ල පන්නලාහරි බෙහෙත් දලා නවතින්නේ කියලා දන්න නිසා..

අතේ තිබ්බ ලේ ටික පිහලා කෙල්ල සීරුවට බෙහෙත් දන දිහා දවාත් බලාගෙන හිටියා.. ඒ මූන දිහා දවසක් වුනත් බලන්න ඉන්න පුලුවන් කියලා හිතෙනවා කොල්ලට.
අහිංසක කමට තපුරුකමත් එකතුවෙලා අමුතුම ලුක් එකක්. දවාත්ගේ හිත මොනවද කියනවා

"දවාත් මහත්තයා..

sinhalaebooks.com

" ම්ම්ම්.....

" ඇහුවේ නෑතේ අර නෝනා ආව එකෙන් සතුටු වුනේ ඇයි කියලා..

" හ්ම්.. මොකක්ද නිකී ආව එකේ තමුසෙට ඔච්චර නටන්න වුන දේ..

" අද දවාන් මහත්තයා..අපේ ආයුව වඩාගත්තා..
ඒ නෝනා ඇවිත් මාව වට්ටලා තුවාල කරපු නිසයි ආයාන් බබාට එයාගේ තාත්තා ගේ අතට යන්න පුලුවන් වුනේ..

දවාන්ගේ පපුවට මොකක්ද වුනා.. කෙල්ල ඔය කියනකම් ඒක හිතුවෙ නෑ.අයාන් වඩාගත්ත බවක් මතක තිබ්බෙත් නෑ..
හැමදේම අස්සේ තුවාලත් වෙලා මහ හුගක්සතුටු වෙන්නේ අයාන් නිසා කියලා කොල්ලට හිතෙද්දි සදීනා ගැන පැහැදුනා ඒ හිත..

" ඒ වුනාට ඒ මගේ ළමයා නෙමේ..

" ඒ වුනාට වඩාගත්තනේ..

" ආයි ඕක කියන්න එපා

සදීනා බෙත් දලා වෙලපු අත උඳුරන් නැගිට්ටේ එතනින් යන්න.. දවාන්ට තවත් එතන ඉන්න අමාරුයි..
සමහර වේදනාවල් තියනවා වතුරයට දාපු රබර් බෝල වගේ.. හැමවෙලේම උඩට මතුවෙලා ඇවිලෙන..
අයාන් කියන්නේ දවාන්ගේ ජිවිතේ එක වේදනාවක්..ඒකෙන් පිච්චෙන්නේ දවාන්ගේ හිත..
ආයි ආයි මතක් කර කර ඒ ගින්නෙන් අලු වෙන්න දවාන්ට අමාරුයි දැන්..

" හැමදම තාත්තලා ආදරේ දුන්නේ හංගලා..
ඔය පපුව ටත් දරාගන්න බැරි දවසක් එයි..
එදට... පුතාව හොයන් එන්න දවාන් මහත්තයා..

පඩිපෙල නගින දවාන්ට ඇහෙන්න කෙල්ල කිව්වෙ
දවාන් ඒක නැහුන ගානට ගියත් දරාගන්න අමාරුයි ඒ වචන..

සදීනා එදා රෑ දවාන්ගේ නින්ද නැතිකලා.. ඇඳට ආවට නිදගන්න දවාන් කලේ හිතින් දහක් ප්‍රශ්න අහපු එක.
සදීනා එක්ක අය්න්ගේ ජිවිත දවාන් වටේ පාරා වලල්ලක් වෙලා කැරකෙනවා වගේ දැනුනා..
බැනලා කෑගහලා අයින් වෙලා යන්න බැරිතැනට දවාන් ගොලු වෙලා..

sinhalaebooks.com

.....................................................

සමදරා උදේ සදීනගෙන් අහලා දැනගත්තේ කොල්ලා බීලා නෑ කියලා..රෑ සමදරාලා අවුස්සන්න රඟපාලා කියලා... සමදරාට ගිහින් ගහලා එන්න තරම් තරහා දවාන් එක්ක

" අනේ මේ කොල්ලා තියන්න වටින් නෑ සදීනා..
මගේ ලේ ටික රත් කරලා තියලා..ඔය වගේ වැඩ කරනවද දරුවො..

සමදරා බනින්නේ දවාන්ගේ වැඩ වලට..ඊට වඩා කෙල්ල දවාන් එක්ක හුගක් දේවල් රෑ කතා කලා.. ඒ හැමදේම කිව්වේ නෑ.. බත් කවපු කතාව කිව්වෙත් නෑ.. මොනාවුනත් ඒක කියන්න බය හිතුනා..
තමන් මේ ගෙදර වැඩකාරියක්..කියන දේ අමතක වෙලා කියලා හිතයි කියලා කෙල්ලට බය හිතුනා..

"ආන්ටී ගුඩ් මෝනින්.. හබ් ආ යූ...

සන්ග්ලාස් දෙකක් ගලව ගලව ආව කොල්ලෙක් සමදර ලග ට ඇවිත් බදාගන්නවා සදීනා බලන් හිටියේ අයාන්වත් වඩාන් කුස්සියේ ඉදන් එනගමන්..

" අපේ අප්පෝ මේ ආදී කොල්ලනේ..
කවද්ද දෙයියෝ ලංකාවට ආවේ..

"ඊයේ ආන්ටි. ආව ගමන් කොල්ලා මෙහේ..ආයේ යන් නෑ දුම් ගහලවත්.. ඕ යැස්..

හලෝ කොහොමද ඉතින්....කව්ද අපේ මේ නීලා ගලර්.. යං ලුකින්..ආ..සෝ බියුටි කුයීන් ..
කැම එහෙම වැඩිපුර හදලා ඇතිනේ..
සෝ හන්ග්‍රි ආ..

නීලා දැකලා බාගෙට සිංහලෙන් කියවන් යද්දි සදීනට හිනා ගියේ නීලා තේරෙන් නැති හින්ද අපහසුවෙන් ඔලුව වනනවා දැක්ක පාර..

" යං පුතා ඉදගන්න..ඉතින් මොකද හදිසියේ ගොඩ බහින්න හිතුවේ..

"ආව ආන්ටී මෙහෙ බිස්නස් ටික බලන්නත් එපැයි..
මේ ඒක නෙමේ කෝ අපේ ලොකු බොස්..

"කව්ද අපෙ දවාන්ද..
එ ගැන කොහෙත් පටන් ගන්නද.. ඉස්සර ඔයාලා එක්ක හිටපු දවාන් නෑ දැන්.. එයා වෙනස් වෙලා..
බිස්නස් කනර් නෑ දැන් ඒවා කාඩාක්ප්පල් කරගෙන ඔහේ බිබී ඉන්නවා..

sinhalaebooks.com

" මට ආරංචි වුනා සීන් එක.. ඇත්තමයි ආන්ටී මන් විස්වාස කලේ නෑ..සිරාවට අකී ඔහොම කරා කියලා..
ඉස්සර දවාත් අකී අපේ බෙස්ට් කපල් එකනේ..

ආදී කියන්නේ දවාත්ගේ අතීතේ ගැන.. දවාත් ගේ හොදම යාලුවා ආදී.. අක්ෂගෙයි දවාත්ගෙයි හැමදේම දන්නේ ආදී.. ආදී රට ගියේ දවාත් මැරි කලාට පස්සේ ඊට පස්සේ වුන හැමදේම ආදි දැනගත්තා මිසක් දවාත් ලගට එන්න කොල්ලටත් බැරිවුනා .. විස්වාස නොකරන විදියට දවාත්ගේ ජීවිතෙන් ආක්ෂා ඈතටම ගියා..කියකා විතරක් කොල්ලා දැනන් හිටියා

" අවසානේ දවාන්ට ඉතුරු වුනේ අන්න අර කිරි සප්පයා විතරයි.. ඒකත් ආක්ෂා ඉපදුන ගමන් දාලා ගියේ කොල්ලව.. දවාත් දරුවව එපා කියනවා දැන් පුතා..
අපි ඉන්නේ ගිනි ගොඩක පිච්චි පිච්චි

" ආන්ටී ආන්ටී.. දැන් ආදී ආවනේ.. නෝ වොරී..i can handle this stuation..

ඕ ඕ ඕ.. මේ බටු ඇටේද අපේ ලොකු බොස්ගේ පොඩි බොස්..

දවාත්ස් ඩුප්ලිකේට් ආ ... සේම් ලුකින්..

සදීනාගේ අතින් අයාන්ව අරන් උඩ දආ කරකවන ගමන් ආදී කිව්වේ..ඔව් දකින ඕනම කෙනෙක්ට කියන්න පුලුවන්..අයාන් කියන්නේ දවාත්මයි කියලා ඒ තරම් ඒ ඇස් ඒ මූන ඒ හිනාව ඔක්කොම අයාන් ලග තිබ්බා..

" එතකොට මේ කියුට් කව්ද..
විලේජ් ලුකින්.. ම්ම්ම්.. අහිංසක රෝස මලක් වගේ..
කව්ද ආන්ටී මෙ.. කියුට්ම කියුට් කැල්ල..

" ඔය දවාත්ගේ දරුවා බලාගන්න ඉන්න ගලර් පුතා..

"ඕ රියලි.. ඒ වැඩේට ගැලපෙන් නෑ.. මෙයා බියුටි වැඩි
මොඩ්ලින් දමු.. නම්බර් වන් එයි ආ එකෙන්ම

ආදී කියන කිසිම දෙයක් කෙල්ලට තේරුන් නෑ.. බාගෙට සිංහලෙන්.. ඉංග්‍රීසි කෑලි දාලා රූකඩේ වැගේ නැටවෙන කොල්ලා දිහා සදීනා බලන් හිටියේ පුදුම වෙලා..

"කොහෙන් ආව ජෝකර් කෙනෙක්ද අනේ ඒ..
බටකොල ආච්චිගේ සීයා වගේකියවනවා කියවනවා ඉවරයක් නෑ..

"සදීනා..තේ මේසේ ලෑස්ති කරන්නකො ..මේ දවාත් ගේ හොදම යාලුවෙක්.. ටිකක් හොදට ලෑස්ති කරන්නකො

sinhalaebooks.com

සැන්ච්විච් ටිකක් හදන්න කොල්ලා ආස ඒවට්..

අයාන් අරන් ආදී හුරතල් කරන අතරේ සමදරා සදීනට කිට්ටු කරලා කිව්වේ ආදිට් තේ ලෑස්ති කරන්න කියලා..

" තේ බීලා කෑමත් කනවා..
කව්ද මේ රෝස් ප්ලවර් කියුට් ඔයාගේ අතින්ම ඕනේ ආ රස තේ එකක්..

කෙල්ල යන්න ඇරලා හයියෙන් ආදී කෑගැහුවේ.. සමදරා හිනා වුනා.. ආදි ගේ හැටි දන්න නිසා.. අඳුරන් නැති කෙනෙක්ට හරි ආදී කියන්න හිතුන දේ කියල දනවා..
විහිලුවෙන්ම හැමදේම කියනවාබ්කියන්න සමදරා දන්නවා..

" කව්ද නීලා නැත්දේ ඒ..අම්මො වැස්සක් ආවා වගේ..
සාලේ එකටම සද්දේ..

" ආදී මහත්තයා ..පොඩි කාලේ ඉදන් මෙහෙ තමා වැඩි හරියක් හිටියේ.. අපේ ලොකු බේබිගෙ යාලුවා ඔය.
" අඩෝ පුම්බකරණයා.. නැගිටපාආආආආන්..

දවාන් උඩ ගියා ආදී කෑ ගහන් ඇගට පැන්න පාරට..

" මොන රෙද්දක් කරනවද..යකෝ මන් බය වුනා..
උඹ කොහෙද මෙහේ..

දවාන් කොට්ටෙ තියලා ඇඳ වියනට හේත්තු වුනේ ආදී ඇඟෙන් ඉදගද්දි..

" ඇයි බොෂ් අපි එන්න හොද නැද්ද.. මට හිතුනා
ෂූස් ගාලා ප්ලයිට් කරා ගොඩ බැස්සා..මන් ආවා..

ආදී කාර් එකේ යතුර කරකව කරකව කිව්වේ දවාන් මූන ඇඳකරන් ඉද්දි.. ආදි යනකොට ලන්කාවෙන් දවාන් ආක්ෂා මැරි කලා විතරයි..එද හිටිය දවාන් අද නෑ ඒත් ආදී ඒ විදියමයි ඒ කටමයි වෙනස් වෙලා නෑ..දවාන්ට කොල්ලා දැක්කම සතුටු හිතුනා.. මේ ආදීව දවාන්ට ඕනෙම කාලයක්..කොච්චර යාලුවෝ හිටියත් සමහර වෙලාවට අපට ඕනේ එක යාලුවෙක් විතරයි ඒ අපිව තේරුම් ගන්න පුලුවන් වගේම වචයක් පාසා හිත තිවෙන කෙනෙක්.. සමහර යාලුකම් තිබ්බෙම මරාගත්ත තැනවල.. අම්බානට නෝන්ඩි කරලා දපු තැන්වල.. ආදි කියන්නෙත් දවාන්ගේ ජීවිතේ වෙනස් නොවෙන යාලුකමක සංකේතයක්..

" උඹ බැන්ද කියලා ආරංචි වුනා.. ඇමරිකන් සුද්දියක්ව .

" රෙද්ද තමා..
බදින්නෑ නෑ නෑ මයි කියලා හිතා ගත්තා මන්

sinhalaebooks.com

" ඇයි.. උඹට මොකද වුනේ..

"..Fb එකේ අර ලන්ඩන් එක බත් මත් ටෝක් කරේ ඒ දවස් වල
සිරා කරන්න කියලා හිතලා එහෙ ගිහින් හම්බෙන්න ගියා..
පටම සීන් එක උනේ ඕයි මට..
නාකි මගුලක් ඒක අද මැරෙයි හෙට මැරෙයි සීන් එකේ..

දවාත්ට හිනාව නවත්තගන්න බෑ..අදී ඉස්සර ලන්ඩන් බියුටි කියලා ශෝ දන් හිටිය විදිය මතක් වුනා කොල්ලට..

" ලන්ඩන් බියුටි..උඹව දරුකම්ට හදගන්න ඉල්ලුවද..

" පලයන් යන්ඩ.. මේ ඒක නෙමේ..
මට අකී මීට් වුනා දවසක්..

දවාත්ගේ හිනාව එහෙමම නැතිවෙලා ගියා..හුස්මක් අරන් අහක බලාගත්තේ ඒ නමත් දැන් අප්පිරියම වෙන තරම්..

" හ්ම්..

" හරි හරි මන් දන්නවා උඹට අවුල් කියලා..ඒත් අකී අමාරුවේ වැටිලා බන් දැන්.. කරපුවා පඩිසන් දීලා ඉන්නේ.. ඒකී ඉන්නේ බන් ෆොටෝ කාරයෙක් එක්ක දැන්..ඌ මේකිව විකුනලා සල්ලි හොයනවා.. ගොන් ගහ රැවටිලා ඉන්නේ ඌට

"මට මොකද..මට වැඩක් නෑ ඒවා දැන්.

දවාත් නැගිටලා ටවල් එක අරන් බාතෲම් එකට රිංග ගත්තේ අකීෂා ගැන අහන්න තරම් හිත හයිය නැති හින්ද.. වලලලා දපු මලකඳක් ආඹඅහු ගොඩ අදිනවා වගේ අකීෂගේ මතකය උඩට එන්න එන්න දවාත්ගේ යක්ෂාවේසය මතුවෙනවා.. දරාගන්න අමාරුම තැන්වලා කොල්ල දරුණු වෙන්නේ ඒ හින්දයි..

" අකීගෙන් මග ඇරලා පලයන් හැබැයි දවාත් උඹට ලමයාගෙන් මග අරින්න බෑ හරිද..

මන් දන්නවා ඔක්කොම උඹ කරපුවා..මී හරකා..
උඹ රඟපාගෙන ගෙදර අල්ලපු නාඩගම් මන් ඔක්කොම දැනන් තමා ආවේ..
සෙල්ලම් කරපන්කොක් ආයේ බලන්න.. ලමයගේ ජීවිතේ එක්ක..

දවාත් බ්‍රශ් එක අරන් කණ්නාඩියෙන් බලන් දත් මැද්දේ ආදී කාමරේ ඉඳන් හයියෙන් දවාත්ට බනින ඒවා අහගෙනම..

sinhalaebooks.com

ආදී නිකන් ආව ගමනක් නෙවෙයි කියන්න දවාන් දන්නවා.. දසුනි ආදිට හැමදේම කියනවා..
දවාන් ට පස්සේ දසුනිට ලඟම කෙනා ආදී අනිවායර්යෙන්ම දසුනිගෙන් අකුරක් නැර
අහගෙන ආදී මේ ආවේ..

"ආ බන්
කව්ද අර කියුට් රෝස් ෆ්ලවර් එක..

ආදී ඇදේ පෙරලිලා කකුලක් උඩදන් ඇහුවේ නාලා කොන්ඩේ පිහදදා ආව දවාන්ගෙන්..

" මොන..

"අර උඹේ ළමයාගේ සවන්ට් කෙල්ල බන්.

" සදීනා ............... ඉතින්

" ඕ මයි ගෝඩ්.. බියුටිෆුල් නේම්..
ස දී නා............ ස දී නා............. සදීනා..
බියුටින් කුවීන්...

දවාන් රවාගෙන හිටියේ ආදී සදීනගේ නම අල්ලන්
කරපු විකාරෙට..

" වරෙන් යන්න තේ බොන්න.. විකාර නොකර

උඹ දන්නෑ රෝස මලේ තරම තව.. බලන් හිටපන්කෝ
ටික දවසක් උඹට අහගන්න පුලුවන් රස කතා...

දවාන් හිතුවේ සදීනා ගැන දන්න හින්ද තනියම.

කොල්ලො දෙන්නම පහලට එද්දි තේ මේසේ ලස්සනට හදලා තිබ්බා..
සමදරා අතේ අයාන් තියාගෙන හිටියේ කෙල්ල කෑම ලෑස්ති කර කරහිටිය හින්ද..
දවාන්ට මතක් වුනේ කෙල්ල දකිද්දි රෑ ළඟට වෙලා කියව කියව හිටිය විදිය..
අතට බේත් දාපු විදිය.. කොල්ලා වුවමනාවෙන් බැලුවත් සදීනා දවාන් දිහා බැලුවෙවත් නැතුව
වැඩ කරපු එකට කේන්ති ආව...

" පුතාලාතේ බොන්න වාඩිවෙලා...
සදීනා පොඩ්ඩක් බලන්න මේසේ ලග...

සමදරා කොල්ලව අරන් එළියට ගියේ කිරි එක අරන් අයාන්ට පොවන්නත් එක්කම..

"හරි ආන්ටී...

sinhalaebooks.com

පින්වත්තියේ මාගේ ප්‍රේම කතාවේ
ඇයිදෝ මට පෑවේ මල් මද හාසේ...
දෑස සලා සිත යට කෝල කතා...
ආදරේ පතා ඔබෙන් සිතා සිතාම ආවේ සොයන්

තා න තාන තා නනතෝ තා තා නෝ...
ටන්ට ටන්ට ටා තාතෝ.............

සදීනා කුස්සියේ ඉදන් මේසේ ලගට තේ බන්දේසිය අරන් එන තාලෙට ආදී මිම්නුවේ පද පේලියක්..

දවාත් හිටියේ හිතහොදින් නෙවෙයි. ආදී සදීනා දිහා බලන බැල්මක් ගානේ දවාන්ට කේන්ති ආව.. ඒත් ඒක නොපෙන්වා ඉන්න දවාත් උත්සහා කලා.. එ හින්දම කොල්ලා කෑම මේසෙන් වාඩි වෙලා අහක බලන් හිටියා

" කියුට් රසම රස තේ එකක් ඔයා ගානේ ඕනේ අද...

" වාඩි වෙන්න ආදි මහත්තයා. තෙ හදලා තියෙන්නේ
මොනාහරි කාලා බොන්න..

කෙල්ල කුස්සියට ගියේ ආදිටයි දවාන්ටයි කන්න ඇරලා..

" රූප ශ්‍රියා මා සිත උමතු කලා....
කියුට්...සදී..

"කටපියන් උඹ ඕක කනවද.. මොන මගුලක්ද යකෝ ආව වෙලේ ඉදන් කියුටක් ගහනවා.. ඒකි ගේ..ඇති ලස්සනකුත් නෑ.. අනික ඒ මෙ ගෙදර වැඩට ඉන්න කෙල්ලෙක්.. උඹ මෙතන නටන්නෙ නිකන් මහ රැජින දැක්කා වගේනේ..

දවාත් බැරිම තැන අදිට බැන්නේ සදීනා දිහා බලන් ආදි කරන විහිලු සීමාව ඉක්මවා යන්න යන හින්දමයි..

" අන්න අන්න.. වැඩවසම් යුගයේ ධනපති මානසිකත්වයේ කුහකම ආවා උඹෙන්..
සැක්..වැඩකාරකම්කරත් මණික මැණිකමයි ආ..
කියුට්කියන්නේ මැනිකක් අන්න ඒ වගේ රූ රැජිනක් ..

ඒක අමුතු ලස්සනක් ඕයි.. මේක දියන්කෝ මොඩ්ලින් ශූට් එකකට දලා ගන්න.. පේමස් වෙයි ආ බිලියන ගන්න් හොයන්න පුලුවන් .

දවාත් කකා හිටිය සැන්විජ් එක පැත්තකින් තිබ්බේ ආදිගේ ඒ කතාවට මල පැනල..

sinhalaebooks.com

සදීනා ඒ වගේ දේකට කීයටවත් දෙන් නෑ දවාත්.. මණිකක් වෙන්න පුලුවන් ඒත් එක ඔප දත්ත විකුනත්ත දෙන්න තරම් උවමනාවක් දවාත්ට නෑ..

ඒ මැණික හැම්දම මේ විදියට රණබාහු ගෙදර තිබුනාවේ..
දවාත් හිතුවේ කෙල්ල ගැන එහෙම..

" දවා ත්.. උඹ හොදින් ද..
ඒ ඒ මන් ජෝක් එකක් කරේ යකෝ..
තියාගනින් උඹේ වැඩකාරී.. අපට එපා..

දවාත් කල්පනා කරපු හින්ද ආදි කිව්වේ එක..

" .. ආදි මහත්තයා කෝමද තේ එක..

කෙල්ල ආවෙස් ආදීගෙන් අහන ගමන්..දවාත්ට බැලුවේ සදීනා දිහා කන්න වගේ.. ආදිට තේ දීලා රහගුණ අහන්න තිබ්බ ආසාව ගැන කොල්ලට කේන්ති

" වාව් කියුටි.. වාව්.. මේක පට්ට..
හවසත් එනවා මේ වගේම එකක් ඕනේ හොදේ..

" රට ඉදන් ආව නිසා වෙන්න ඇති මහත්තයට ඔච්චර ම ලංකාවේ තේ රස එහෙනම්..

කෙල්ල කිව්වේ හිනාවෙලා..

" ඔයාට කියන්න කියුටි.. මන් ආස ගැමි විදියට ඉන්න.. අල බතල කාලා..තේ එකක් බීලා..
ගැමි කෙල්ලෙක් බැදලා ඈතක ගමක ජීවත් වෙන්න..

" මී හරක් ජෝඩුවක් අරන් ආදි මහත්තයා කුඹුරක් හාලා ආදයම් මාගෙර්කුත් හොයාගත්තනම් තවත් ෂෝක්..

සදීනා කිව්වේ ආදිට නෝන්ඩියට.. දවාත්ටත් හිනා යන්න ආවා..ඒත් දවාත්ට ඊට වඩා සදීනා අදි එක්ක කියවන එක බලන් ඉන්න බැරි වුනා..

" මල ජරාවක් හදලා.. මේකට සීනි නෑ.. මෙලෝ රහක් නෑ..මට වෙන එකක් ගේනවා..
නීලම්මට කියලා හදන් එනවා....

තේ එකක්වත් හදගන්න බෑ හරියට..
හිනාව දන් කියවන්න විතරයිදන්නේ..
වැඩකාරියෝ වැඩකාරියෝ විදියට ඕනේ..
කරේ නගින්න එනවා මෙතන..

sinhalaebooks.com

හදන් එනවා.ගිහින් තේ එකක් තව..පැලවෙලා වගේ ඉන් නැතුව මෙතෙන්ට වෙලා..

සදීනා ඉස්සරහම දවාත් තේ එක විසිකරේ බිමට කෙල්ල උඩ ගියා දවාත් එක පාරම කෑ ගහද්දි..

" දෙවියනේ .. දවාත් මහත්තයා ඇයි මේ..

".ඒ දවාන් පිස්සුද යකෝ.. ඒ ලමයට කෑ ගහන්නේ..
ආ මේක බීපම්.. මේක අවුලක් නෑ..
ඒ අහිංසක කෙල්ලට බනින්නේ..

ආදී දවාත්ට දුන්නේ තමන්ගේ තේ එක.. දවාත් තපුරු වෙකා කියලා ආදිටත් තේරුනා..

දවාත් හිටියේ පුපුරනගමන් ඇස් රතුකරන්.. ආදි කටඇරන් හිටියේ දවාත් ට එකපාර වැහුන යකා මොකාද කියලා..

" ඉන්න මන් තේ එකක් අරන් එන්නම් තව..

දවාත්ට ඕනේ වුනේ කෙල්ල ආදි වෙනුවෙන් හදපු තේ එක වගේ ඒකක් තමන්ටත් හදගන්න. ආදිට විශේෂයක් පෙන්නනකොට දවාත්ට බලන් ඉන්න බෑ..

" පිස්සෙක්ද බන්.. මේ හොදට තියෙනතේ එකට සීනි නෑ කියන්න.. උඹට බීලම රසදිවක් නැද්ද බන්..

" ඒ උඹේ එකටනේ.. මගේ එකට නෑ..

දවාත්කියන්නේ සැන්විජ් එකක් කටේ තියාගෙන.ම

" මොකද දරුවෝ ආයේ තේ හදන්නේ ඔය..

" අනේ මන්දන් නෑ නීලා නැත්දේ.. ඔයාගේ ලොකු බේබි වද දෙන එකනම් ඉවරයක් නෑ..

නීලා හිනා වෙලා නිහඬව හිටියේ දවාත් එක්ක සදීනා දගන්න වලි වලට අත නොද..

ඔක්කොටම එකට හදපු තේ එකේ.. ආදි මහත්තයට හොද වෙන්නත් එයාට සීනි මදි වෙන්නත් හේතුවක් නෑනේ.. කටේ දෝසයක් වෙන්න ඕනෙ..
වදකාරයා..

කෙල්ල දවාත්ට බෑම බෑනම ගිහින් මේසෙන් තිබ්බේ
අලුතින් හදපු තේ එක..

sinhalaebooks.com

තත්පරයක්වත් එතන රැදෙන් නැතුව කෙල්ල ඉස්සරහට ගියේ අයාන්ව හොයාගෙන සමදරාලගට..

කෙල්ලට දුකයි හැමදේම කරලා දීලත් උදේම දවාන් කෑ ගහපු එකට.ඒකත් කිසිම වරදක් නොකර..

" දුව.. ලොකුලා තේ බීලා ඉවරද..

" තාම බොනවා.. ආයුව දීලා ලොකු නෝනත් ගිහින් බොන්න..

කෙල්ල දරුවව අරන් වත්තේ ඈතට ගියේ සමදරාව දවාන්ලා ලගට යවලා

" ආයු. ඔයා දන්නවද..අද තාත්තා මට නිස්කාරනේ බැන්නා.. වැඩකාරී කිව්වා..
කවදවත් ලොකු නෝනවත් එහෙම කියලා නෑ..
මට දුකයි...
ඔයාගේ තාත්තා ඇයි ඔච්චරම නපුරු..
හරියට අහස වගේ මේ වෙනස් වෙනවා..

කෙල්ලට දවාන් කතා කරපු විදියට හිත රිදුනා.. ආදි ඉස්සරහා ඒකත් කෙල්ලව පහත්කලා වගේ හරියට..
ඊයේ හොදට කතා කරලා අද දුෂ්ටකම් කරලා පලිගන්න තරම් කෙල්ල කරපු වරද මොකක්ද කියලා හිතුනා..

......................................

දවාන් ආදී එක්ක එලියට ගියේ ආදීගේ පෙරුත්තට.. දවාන්ට හිතට හරිනෑ කෙල්ලට කතා කරපු විදියට..
ඒත් ආදිට විශේෂ සැලකිලි කරනකොට දවාන්ට බලන් ඉන්න බෑ.. ඒක මොනවගේ හැඟීමක්ද කියලා තේරෙන් නෑ.. සදීනා ආදි ලග ඉද්දි දවාන්ට මරන්න තරම් කේන්තියක් එනවා.. ඒත් ඒක ආදී පිටින් යවන්න බැරි නිසා කෙල්ලට බැනලා හිත නිවා ගත්තා..
දවාන්ට ඕනේ ආදි එක්ක කෙල්ල කතා කරන් එක නවත්තන්න ...

" දවා න්.. උඹ වෙනස් වෙලා බන්..
හොදටම..

ආදී ඩ්‍රයිවින් කරන ගමන් කිව්වේ නිහඩව ඈතක් බලන් ඔහේ යන දවාන් දිහා බලලා..

" ඔව්.. වෙනස් ඇති දැන්..
වෙන්න ඕන ඔක්කොම සිද්ද වුනාට පස්සේ උඹ කියන්නේ මට මාර ජොලියේ ඉන්න කියලද..

sinhalaebooks.com

ගෑනියක් හින්ද නැත්තටම නැතිවුනා රෙද්ද..
ඔක්කොම එකයි.. ගෑනු ජාතියම එකයි..
වුන්ට කවදාවත් බෑ පිරිමියෙක් ගැන හිතන්න තේරුම් ගන්න..උන් හිතන්නේ උන් ගැන විතරයි..
අවස්ථාවාදී ගෑනු...

"යකෝ එක ගෑනියක් හින්ද ගෑනු සංහතියටම බනින එක හරිද..

ආදි දවාන්ට විරුද්ධව කිවේ ඇත්තටම දවාන්තින්නේ ගෑනු ජාතියම වැරදි කාරයෝ කරන් නිසා..
දවාන් මේ කතා කරන්නේ සදීනවත් ගෑනු ගොඩටම දන්
ආදි එක්ක හිනාවෙලා කතා කරපු එක දවාන්ට දරාගන්න බෑ.. ඒක හින්දම හිත හදගන්න ඔක්කොටම වැරැද්ද දලා කතා කරන්නේ දවාන්..

" ඔක්කොම එකයි..

" හරි බොස් හරි.. අපි ඒ කතාව නවත්තමු.. මේ උඹේ ඔෆිස් රූම් එකේ ආන් වවුල්ලු පදිංචි වෙලාලු.. මකුලු දැල් බැදලාලු දැන්..
මන් හිතන්නේ ඒවා කඩලා සුද්ද කරොත් නරකද..

ආදී කිව්වේ හිනාවෙලා.. කොල්ලා මාස යක් විතරම දැන් ඔෆිස් ගිහින් නෑ කියන්න ආදී දන්නව.. කොල්ලව ආපහු ඔෆිස් ඇදන් හිහින් වැඩ කරවන්න ආදිට ඕනේ වුනේ..

" ඒ වා තාත්තා බලාගනී
මට ඕන් නෑ.. ඔය මගුලවල් එකක්වත්..

" එතකොට උඹ ළමයට දෙන්නේ උඹේ සරමද පිය උරුමය කියලා..ඈ මී හරකෝ..

දැන් ළමයා මගේ නේමේ.. ඕකි වටේ ගියා කියලා නිකන් කුනුහපර් කතා නම් කියන්න හදන්න එපා..
මම දන්නවා අකී උඹ එක්ක ඉද්දි වැරැද්දක් කරේ නෑ කියලා..
උඹලා ලව් කරපු විසේ හැටියට අකී බඩ වෙන්නේ බදින්න සෑහෙන්න කලින්..
බැන්දට පස්සේ වුන එකම ලොකු දෙයක්..

අකී ගියේ දරුවා හදන්න බෑ කියද්දි උඹ දරුවව ඉල්ලපු එකයි..ඒකිගේ රටයන හීනෙයි හින්ද මිසක්..ඒකිට මිනිස්සු හිටියේ නෑ එතකන්..

ඒ හින්ද..නිකන් දන්න ඇත්තට කුනුහපර් කතා හදන් නැතුව ළමයාට අනාගතයක් හදපන්..එච්චරයි කියන්නේ..

sinhalaebooks.com

ආදි දවාන්ට කියන ඇත්ත.. දවාන්ගේ හිත දන්න ඇත්තක්.. ඒත් වේදනාව හින්දම දවාන් කලේ අකීගෙන් පලිගන්නවා වෙනුවට අයාන්ගෙන් පලිගන්න එක..
ඒක කොල්ලා දන්නවා.. ඒ කොහොම වුනත් සමහර වෙලාවට හැමදේටම හේතුව අයාන් කියලා හිතෙද්දි
ඒ මූන බලන්නවත් හිතෙන් නැති තරම් තරහක් එනවා..
ඒක දවාන්ට කියන්න තේරෙන් නෑ..
හැමෝම කලේ අයාන්ගේ පැත්ත ගත්ත එක.. දවාන් ඒ ප්‍රශ්නේ එක කොණක නොසෑහෙන්න දුක් වින්ද..

" ක්ලබ් එකකට යමන් මට බොන්න ඕනේ අද..

දවාන් කිව්වේ ආදි එක්ක ඇවිදින්න යන් කියලා ආව ගමන වෙනුවට දැන් හිතට දැනෙන වේදනාව දගර්න්න බැරි හින්දම..

සදීනට බැන්න එකත් කොල්ලගේ හිතේ තිබ්බා.. ආදී එක්ක එන්න ගෙදරින් එලියට බහිද්දිවත් කෙල්ල පේන්න හිටියේ නෑ.. දවාන් එක්ක තරහා වෙලා කියලා ශුවර්.ඒකෝ අවුලත් හිතේතියන් දැන් කොල්ලටඕනේ වැටෙනකම් බොන්න..

දවාන් බැලුවේ ඊයේ රෑ සදීනා වෙලපු අත දිහා.. ඒ බැන්ඩේජ් එක තාමත් එහෙමමයි..
ඒ හිත අද උදේම බිඳලා දැම්ම එක ගැන පසුතැවුනා දවාන්
අයාන් ගේ නිත්ද කියන්නේ සදීනට පාලුවක් ගෙනාව එකම දේ.. කෙල්ල ආසම අයාන් තුරුල් කරන් ඉන්න..මුලු දවසම වුනත් ඒ හිනාව ඒ කෝලම් එක්ක ගෙවන්න..

කොල්ලා සැපට නිදගෙන හිටියේ ඇඟිල්ලකුත් කටේ දන් කොට්ටයක් බදගෙන..
සදීනා ඒ චූටි තලලට හාදුවක් තියලා කාමරෙන් එලියට ආවේ නීලගේ වැඩකට උදව්වක් දෙන්න හිතන්

" සදීනා..

"ලොකු නෝනා.. මන් හිතුවා නෝනා නිදි කියලා..

සමදරා සාලේ සෝෆාවේ ඉදන් ආවේ කෙල්ල ලගට

" නිදගන්නේ කොහෙද අර කොල්ලෝ දෙන්නා ආවේ නැතේ තාම..උදේ ගිය ගමන්.. කොහේ ගිහින්ද දන් නෑ..

සමදරා කියද්දි කෙල්ලට මතක් වුනේ දවාන් ආදි එක්ක ගිය ගමන ආවේ නෑ කියලා තාම..
හොයලා බලනවා තියා ඒ නමත් දැන් අප්පිරියයි.. කොච්චර හොඳ කරත් මනුස්සකමක් නෑ දවාන් ලග කියලා කෙල්ල හිතුවේ..
උදේ වචන කෙල්ලගේ හිත ඒ තරමට රිද්දලා තිබ්බා..

sinhalaebooks.com

" නෝනා නිදගන්න.. ආවොත් කෑම ඇරලා දෙන්නම් මන්.. ආයු බබාට රෑ කිරි එක දෙන්න මත් ඇහැරලා ඉන්නවනේ..

" අනේ දරුවෝ එහෙනම් පොඩ්ඩක් ආවොත් බලල කන්න දෙන්න.. මට හෙට ළමා නිවාසේ වැඩකට යන්න තියනවා ඒ හින්ද කලින් නිදගන්නවා..

" ළමා නිවාසෙට.. කොහෙද නෝනා ඒ..

කෙල්ල සමදරාගෙන් ඇහුවේ ළමා නිවාසේ ගැන.. වැල්ලේ ඉබාගාතේ ඉන්න ලමයින්ව ඉස්සර අරන් යනවා මතකයි ලමා නිවාස වලට දන්න..කාත් කවුරුත් නැති ළමයි ඒවාගේ කාලා ඇඳලා සතුටින් ඉන්නවා කියලා කෙල්ල අහලා තිබ්බා..

" අපේ මහත්තයා රත්තපුරේ බංගලාව අනාථ ළමයි වෙනුවෙන් හදලා දීලා තියෙන්නෙ.. ඒකේ පාලිකාවො කීපදෙනෙක් දලා දැන් ළමයි 50 ක් විතර බලාගන්නවා අපි අපේ වියදමෙන්..

මහත්තයට ඕවා බලන්න යන්න වෙලාවක් නෑනේ සදීනා මාසෙකට වතාවක් මන් යනවා ගිහින් අඩුපාඩු බලලා එන්න..

කෙල්ලට ආස හිතුනා සමදරා කියද්දි. දවාන්ට වඩා කරුණාවන්ත් හිතක් සමදරාටයි රණබාහුටයි තියනවා කියලා කෙල්ල හිතුවේ මේ විදියට හැමෝම කරන් නැති හින්ද..

" අනේ ලොකු නෝනා මාවත් එක්කන් යනවද දවසක
මට ආසයි බලන්න..

කෙල්ල කිව්වේ ඇත්තටම ළමා නිවාසයක් බලන්න කෙල්ලට ආස හිතුන හින්ද..

" අනේ දරුවෝ..
ඉතින් හෙට යමු මාත් එක්ක.. තනියම යන එකේ මයයි චූටි කොල්ලයිත් යන්..
පොඩි එකාත් ගෙදරින් එලියට ගියෙම නෑනේ..
අපි හෙට ගිහින් එමු..

සමදරා කියද්දි කෙල්ලට සතුටුයි..ආයු එක්ක ඇවිදින්න එලියට යන්න කෙල්ල ආසාවෙන් හිටියේ.. කොල්ලව ගේ ඇතුලේ බිත්තිවලට හිරවෙලා ඉද්දි කෙල්ලට දුකයි..
ඒත් සමදරා හෙට එක්කන් යන්න කැමති වුන එකට කෙල්ලට මල් හතයි..

ආදි දවාන්ව ගෙදරට ඇරලවලා ගියේ මහ රෑ.. දෙන්නම ක්ලබ් එකේ ඇති පදන් නටලා සින්දු කියලා බීලා ආවේ
ඒත් දවාන්ට වැටෙන්නතරම් වෙරියක් තිබ්බේ නෑ.. කොල්ල බිව්වේ ගානට..ආදී කොහොමත් දවාන්ව එච්චර බොන්න දුන් නෑ.. ගෙදර ඇවිත් පිස්සු නටයි කියලා..

sinhalaebooks.com

දවාත් ගෙට එද්දි කෙල්ලට සෝෆාවේ නින්ද ගිහින් හිටියේ ..
කෙල්ල දැක්කම දවාත්ට හිනාවක් ගියා.. උදේ ඉඳන් හිත අප්සට් කෙල්ලට බැනපු එකට.

" අරූ කියන්නා වගේ කියුට් රෝස මලක්ම තමා උඹනම්..

කෙල්ල ළඟ දන ගහන් බලන් හිටියේ ඇස් පියවෙලා තිබ්බ ඒ මූන දිහා..චුට්ටක් මූන අල්ලලා කෙස් රොදක් කන ළඟින් රඳවන්න ආස හිතුනත් උස්සපු අත ආයිම පාත් කලේ ඒ මූන දකිද්දි අකීෂගේ රූපේ මැවිලා පෙනුන නිසා..

කෙල්ලව එහෙම දාලා යන්න නැගිටලත් දවාත් ආයිම බැලුවේ ඒ මූන දිහා..

" ඔහොම දාලා යන්න ලෝබයි බන්..
ආයි මන් එද්දි පුටුවල ඉන්න බෑ.. දවාත්ගේ හිත මෙච්චා වෙනවා උඹව දැක්කම..
බැන්න එකට මන් දන්නවා තරහා වෙලා ඉන්නේ කියලා....
ආදී එක්ක එකතුවෙලා උඹ හිනාවෙද්දි මට රිදෙනවා..
ඒක ඇයි කියලා මහ්ප්‍රාණ කියන්න මන් දන්නෑ..
ආයේ එහෙම වෙන්න බෑ..එච්චරයි ..

දවාත් නින්ද ගිහින් ඉන්න කෙල්ලව උස්සලා ගත්තේ අත් දෙකට ..සදීනට උදේ ඉඳන් කොල්ලා එක්ක ඔට්ටුවෙලා මහන්සියට් හොඳටම නින්ද ගිහින් තිබ්බේ..දවාත්ගේ අත් දෙක උඩ ඉන්නේ කියලාවත් සිහියක් නෑ ඒතරම් නින්ද තදයි..

" මේකිගේ බර..කොස් ඇටේ වගේ හිටියට කොන්දත් කැඩෙන්න වගේ..

දවාත් කෙල්ලව උස්සන් ගිහින් තිබ්බේ අයාන් ළඟින් කෙල්ලව ඇඳ්න් තිබ්බා විතරයි හොඳට නිදන් හිටිය කොල්ලා පෙරලිලා ගිහින් සදීනගේ පපුව අස්සේ ඔලුව ගහන් හීනෙන් කියනොනවා දවාත් බලාගෙන..

" ආම් ආම් ආම්...ම්ම්

ඇඳේ කොනක එහෙම ඉඳගත්තේ ඒ කෝලම බලන්න
අයාන්ව කෙල්ල ඇස් පියාතම තුරුල් කරගත්දි කොල්ලා මීක් නෑ.. සදීනාගේ උණුහුමට දැන් හුරු වෙලා..

" උඹලා දෙන්නම දැන් මාව පිස්සෙක් කරනවා..
එච්චරයි වෙන්නේ..

දවාත් නැගිටලා ආවේ තවත් ටික වෙලාවක් එහෙමම බලාගෙන ඉඳලා..

...............................................

sinhalaebooks.com

"නැත්දේ ..
ඊයේ දවාත් මහත්තයලා රෑ කෑමට ආවද..

සදීනා උදේම තීලා හොයන් ආවේ.. දවාත්ලා එනකම් පුටුවෙ හිටියා විතරයි මතක..
ඇඳට ගිය විදියක් මත නැති හින්ද..

" නෑ නෝනා..ලොකු බේබි ආව වෙලාවක් මන් දන්නෑ.. කෑම කාලත් නෑ.."

එතකොට මන් ඇඳට ගියේ.. මන් හිටියේ සෝෆාවෙනෙ..
ආයුට කිරි එක දීලා ඇවිත් මන් ඉඳගත්තේ ඊට පස්සේ කාමරේට මන් ගියේ නෑ..
අසිහියෙන්ද මාත් අර යක්ෂයා වගේ ඉන්නේ.. බීලත් නැතුව වෙරි වෙලාද මන්..එතකොට..

කෙල්ල හිතුවේ ඇඳට ගිය විදිය මතකම නැති තැන.. දවාත් උස්සන් ගිය වගක් කෙල්ලට
දැනිලම නෑ..

දවාත්ට ෆිට් එකේ උදේම සින්දුවක් කියන් පහලට ආවේ එක්සයිස් කරන්න එළියට යන්න..
කුස්සිය පැත්තට ඔලුව දාලා බැලුවේ පේන්න ඉන්නවද කියලා

" කෝ මාලු කැල්ල.. නැනේ පේන්නවත්..
නින්ද ගිහින්ද දන්නෑ.. මගේ දූතේ උණුහුම වැඩිවෙලා..

දවාත් හිනා වෙවී එළියට බැස්සේ කෙල්ල ඉන්නවද කියලා වටේම ඇහැ දන ගමන්..

ආදී උදේම ආවේ දවාත් එක්ක ඔෆිස් එකට යන්න.. දවාත්ව ඊයේ කොල්ලා පොරොන්දු
කරගත්තා අද ඔෆිස් ගිහින් බලනවා කියලා වැඩ ටික..

ආදී වාහනේ හරවද්දි දැක්කේ සදීනා පාර ළග ඉන්නවා..

" හලෝ ගුඩ් මෝනින් කියුටි...මොකෝ පාරේ..

කව්ද පාර දිගේ එහේ මෙහේ ගියේ........
තුඹත් හැඩ වී වැට ළගම ඇයිද ලදේ......

සදීනට හිනා ගියේ ආදී වාහනෙන් ඔලුව එළියට දන් කෑ ගහද්දි..

" කිරි ගෙනකම් ආදී මහත්තයා..

කෙල්ල හිටියේ සමදරා ගේන්න කිව්ව එල කිරි බෝතල් වගයක් අරන් එනකම්..

" කියුටි අරන් එන්න එහෙනම් අපි ගියා .. බායි..

sinhalaebooks.com

කොල්ලා වාහනේ ඇතුළට දද්දි දවන් මිදුලේ ඇවිද ඇවිද ඉන්නවා දැක්කා..

" ලොකු බොස්.. අන්න උඹගේ වැඩකාරී පාරේ..

ආදී වාහනෙන් බැහැලා ආවේ දවාන් ළගට

" කව්ද..

" රෝස් කියුට් ආන්න කිරි ගන්න කියලා පාරේ ඉන්නවා..

දවාන් ගේට් එක පැත්ත බලද්දි දැක්කේ කෙල්ල පාරේ න් එබි එබී ඉන්නවා..

මේකී උදේම පාරට ගියේ මොන මගුලක් කරන්නද..
ආපුදෙන්කෝ.. පෝස්ටරේ වගේ ඇති.. පාරේ යන වුන්ට..

" මොනවද උඹ කුටු කුටු ගාන්නේ..

" ආ ආ.. මේ නෑ.. බන්
ඕකි ඉන්නේ බත් ඔය කිරි ගන්න තමා..
මට හැමදම ප්‍රෙශ් මිල්ක් එකක් ඕනේ එක්සයිස් කරලා ඉවර වුනාම..ඔය ඒක හදන්න ගන්න ඉන්නේ..
වෙලාවට දුන් නැත්තන් මගේ හැටි දන්නවනේ..

දවාන් වැඩ දලා කියද්දි ආදී යතුර කටේ ගහන් බලන් හිටියේ ..

" නෑ බන් සිරාවට... බියුටි උඹට බයයි නේද ..
පව් කෙල්ල..

" ඔව් මන් රැව්වත් ඇති.. ඒකි බයයි..

දවාන් එහෙම කියද්දි ආදී දැක්කා කෙල්ල කිරි බෝතල් දෙක අරන් එනවා ..

දවාන් දෙන්නම්කෝ උඹට මන්..වැඩක්..ඒකිද බය උඹද බය කියලා හොයාගන්න..

" ඒ ඒ.. රෝස් බියුටි.. කම් කම්..

" ඇයි ආදී මහත්තයා..

" දවාන්ට විතරද ඇඟ හදගන්න ප්‍රෙශ් මිල්ක් දෙන්නේ
අපිට දුන්නම නරක් වෙනවද . ....
අද ඉදන් මටත් ඕනේ...

sinhalaebooks.com

" තමුන් ගිහින් ඉක්මනට ඕක අපට බොන්න ලෑස්ති කරනවා..
පරක්කු වෙනවා..

සදීනා බැලුවේ දවාත් දිහා කොල්ලා ඇස් වලින් කිව්වේ කෙල්ලට යන්න කියලා..

ආ..මේ යකා මේක ආදී මහත්තයා අන්දන්න කියපු එකක් එහෙනම්..
බොරුකාරයා.. මට බැන්න එකට දෙන්නම් මාත්..
මෝඩ දවාත්..

දවාත් අහක බලන් හිටියේ සදීනා මොකක් කියයි ද කියලා බයේ..

" ඇඟ හදාගන්න.. කිරි...නෑ..
මේ ලොකු නෝනා රත්පුරේ යන හින්ද කොවිලට ගෙනියන්න ගත් තේ..
නැත්තන් මෙහෙ කවදාවත් එල කිරි ගත් නෑ මහත්තයා..

ඔය කරේ ගොන් නැම්බී.. නිකමට මගේ පැත්ත ගන්නෑ..
ඔච්චර කියලත්.. සෑහ්..
අහුවෙයිනේ හොම්බ සමතලා කරනවා මත් මේකිගේ..

දවාත් ශේප් එකේ ගෙට යන්න හැරුනේ ආඳ වගේ ලෙස්සලා..

" නෙදකින් මුසලයා.. උදේම කෙබ්බ ඇදබානවා..
අපි යන් කියුට්.. බකමූනා.. තෝ
ඇටි කුකුලා..

" කව්ද යකෝ ඇටි කුකුලා..

දවාත් බලන් ඉද්දි ආදී සදීනා පස්සෙන් ගියේ දවාන්ට රව රව..

" සදීනා පුතේ ඉක්මනට ලෑස්ති වෙන්න පරක්කු වෙනවා..කොල්ලව මත් බලාගන්නම් ඔයා ලෑස්ති වෙන්න..

කෙල්ල කිරි බෝතල් දෙක තියලා දිව්වේ ඇඳුමක් දන් එන්න..අයාන්ව කලින් නාවකා ඇඳුමක් දලා තිබ්බේ කෙල්ල ලේසියට..

" කොහෙද ආන්ටී යන්නෙ..

" මායි සදීනයි රත්නපුරේ යනවා..ළමා නිවාසෙට ගිහින් එන්න..කියල..
කෙල්ල ආසාවෙන් ඔය ඉන්නේ යන්න ආවත් හරි ගෙදරින් එලියට ගියේ නෑ..

sinhalaebooks.com

ආදී ට සමුදරා කියද්දී කොල්ලටත් යන්න හිතුනා..
සදීනත් යන හින්ද ජොලියක් දන්න පුලුවන්..කෙල්ල එක්ක ඉන්න ආදී කැමතී

" අනේ අන්ටි නියමයිනේ මාත් එනවා..ඈ..අපි යන් .. මගේ වෙහිකල් එකේ යන්..

දවාත් ටවල් එකත් කරේ දන් එද්දී ආදී කියනවා ඇහුනේ..

" කොහේ යන්නද.. උඹ..

" මන් යනවා කියුටි ආන්ටී එක්ක ළමා නිවාසෙට..
උඹ ඉදපන්.. පවයා..
බොරු කාරයා.. ඇඟ හදගන්න එල කිරි බොන හරකා..

ආදී බනින්නේ දවාන්ට.. කෙල්ල එක්ක ආදී යන්න හදන
එකට දවාන්ට ලෝබයි..

" මාත් එනවා..උඹ විතර යන්න..ඒක අපේ ළමා නිවසෙනේ..උඹේ නෙමේනේ..

" ඉතින් කව්ද නෑ කිව්වේ උඹේ තමා..ඈන්ටි උඹව ගත්තෙත් ඒකේන් තමා හදගන්න..පව් කියලා..
නේද ආන්ටී..

සමදරාට මේ වලි හුරුයි ඉස්සර ඉදන් ඔහොමමයි..දවාන් දාන් හිනාවෙලා විහිලුවක් කරනවා දැක්කම සමදරාට සතුටුයි..

" අනේ මන් දන්නෑ.. ඔය දෙන්නත් යනවනම් යමු..
රණ්ඩු වෙන්න බෑ එතන ගිහින්.. හැබැයි..

" ඒක තමා ඇන්ටී මූ තමා.. අර වැද්දොන්ගෙන් ආව එකෙක්නේ මූ..දඹානේ අඟලක ඉදලා මූව ළමා නිවාසෙට ගෙනත් තිබ්බේ දිමි කකා ඉදලා.. පව්..තාම කැලෑ ගතිය..

" තොට මන්... කියන්නෑ..

දවාන් ටවල් එක අරන් ආදිට පැන්නුවේ ගහන්න.. සමදරා බලන් හිටියේ හිනා වෙවී..

" මේ පිස්සො දෙන්නා එක්ක ගිහින් අනේ මන්ද..

සමදරා කුස්සියට ගියේ කොල්ලා දෙන්නා උඩට යන්න ඇරලා..
දවාන් බාතෲම් එකට වෙලා නාගත්තේ සදීනලා එක්ක යන්න .ආදි යන හින්ද කොල්ලා අකමැත්තෙන් වුනත් යන්න හිතුවා.. මාස ගානකින් සමදරා එක්ක තියා ඕනම වැඩකටවත් කොල්ලා රත්නපුරේ ගිහින් නෑ..

sinhalaebooks.com

"සදීනා පුතේ උඩ ඇති බඩු වගයක් අරන් ඇවිත් දෙන්න ආදි ට..කොල්ලා වාහනේට දුවි..

" හා නෝනා..

කෙල්ල පඩිපෙල දිගේ දිව්වේ ඉක්මනට බඩු ටික අරන් එන්න..කෙල්ල දවාන්ගේ කාමරේ ලගින් දුවන් යනවා කොල්ලා දැක්කේ බාතෲම් එකේ ඉදන් තෙත කොන්ඩේ ගස ගස ඇඳුමක් දගන්න එද්දි..

" නපුරි.. ඉන්නවකෝ කරන්න මන් වැඩක්..
තරහා පිරිමහනවට..

දවාන් වීදුරු වාස් එක අරන් බිම දැම්මේ සද්දෙට..

" ආහ්.. අම්මෝ අත ..
ආව් රිදෙනවා.... අම්මා ........

කෙල්ලට ඇහුනා වතුර බෝතල් ටික උස්සන් පඩිපෙල බහින්න හදද්දිම දවාන්ගේ කාමරෙන් ආව සද්දෙත් එක්ක කොල්ලා කෑ ගහනවා..සදීනා බොතල් ටික එහෙමම දලා පැන්නේ දවාන්ට කරදරයක් වෙලාද කියලා බයට..

" ද වාන් මහත්තයා .. මොකද කරගත්තේ..

කෙල්ල කාමරේට යද්දි දවාන් අත අල්ලන් කෑ ගහනවා..

" අනේ සදීනා අත කැපුනා. ආහ් රිදෙනවා..

" කෝ බලන්න මහත්තයා මෙහාට දෙන්න අත..
මොනාද කරගත්තේ බබෙක් වගේ..

කෝ දෙන්න හුගක් කැපිලද..

කෙල්ල දවාන්ගේ අත ඉල්ලුවේ බලන්න දවාන් අත හංගන් කෑ ගහන්නේ..

" රිදෙනවා..ආ..හ්

" මෙන්න මෙහාට දෙන්න බලන්න..

කෙල්ල බලෙන්ම අත ඇදලා ගත්දි දවාන්ගේ කෑ ගැහිල්ල නැවතුනා..හිනා වුනේ හොරාට කොල්ලා.. සදීනා අත හරව හරව බැලුවේ තුවාලයක් හොයාගන්න නැති හින්ද.. කොල්ලා ඒ අස්සේ සදීනගේ ලස්සන වින්ද ඇස් වලින්.. ඒ මූන වෙනස් වෙන දිහාම බලන් හිටියා..

sinhalaebooks.com

" කෝ.. නැතේ තුවාලයක්..

" ආ අහ්..නැද්ද තිබ්බා තිබ්බා මට රිදුනනතේ.. හොදට බලනවකෝ රෙද්ද. තමුසෙට ඇස් පේන්නෑ..

දවාත් කෙල්ලගේ මූන දිහා බලන් ඉන්න ඕනැවට අත බලෙන්ම කෙල්ලගේ අතෙන් තිබ්බා..

" මේ දවාත් මහත්තයා.. සෙල්ලම් කරන්න එපා..
බොරුවට.. ඇති තුවාලයක් නෑ..
මන් යනවා..

" ඒ යි.. කොහෙද යන්නේ..

සදීනා ඉස්සරහට තිබ්බ අඩියට වඩා වේගෙන් පස්සට ඇදිලා ආවේ දවාත්ගෙ පපුව උඩට..

" අත අරින්න දවාත් මහත්තයා.. පිස්සු හැදිලද..

"ඔව්.. පිස්සු තමා.. මේ අහනවා හොදට..
අද ගියාට කමක් නෑ.. ආදි එක්ක සිරික්කිය දාලා මගේ යාකා අවුස්සගන්න එපා හරිද..
පාඩුවේ ළමයා එක්ක ඉන්න ඕනේ තමුසේ..

කෙල්ලගේ කට මිරිකන් දවාත් කිව්වේ සැර දාලා.. දවාත්ට ඕනේ සදීනව ආදිගෙන් ඈත් කරලා තියාගන්න..

" කියුටී................කියුටියෝ
ඔයා පැල වෙලාද අනේ උඩ... එනවකෝ ඉක්මනට..ඕක අරන්.................

ආදි පාත ඉදන් කෙල්ලට කෑ ගැහුවේ බිඩු ටික ගෙනත් දෙනකම් කොල්ලා පාතට වෙලා බලන් ඉදලා බැරිම තැන..

" අන්න ආදී මහත්තය කතා කරනව..
මට යන්න දෙන්න දවා ත් මහත්තයා අනේ.

" නෑ යන් නෑ.. කොහෙවත්..

සදීනව තවත් ලගට අරන් අල්ලගත්තේ කෙල්ලට හෙලවෙන්නවත් නොදීම..

" අනේ පින් සිද්දවෙයි දවාත් මහත්තයා මාව අත අරින්න..ලොකු නෝනා දැක්කොත් මොනා හිතයිද..

sinhalaebooks.com

කෙල්ල දවාත්ගෙන් ඈත් වෙන්න දඟලන වාරයක් පාසා කෙල්ල පරඬැලක් වගේ දවාත්ගේ අත්වලට හිරවුනා..

" පොරොන්දු වෙනවා..
ආදී එක්ක කතාවට යන් නෑ කියලා
ආදී නෙමේ මොකා එක්කවත් ඕන් නෑ කතා කරන්න එච්චර යි..
මට පොරොන්දු වුනොත් යන්න දෙනව..

" බෑ.. මන් පොරොන්දු වෙන් නෑ..
එහෙම නීතී දන්න මහත්තයා මගේ කව්ද..
මන් කැමති නෑ ..

දවාත් කෙල්ලගේ අත කරකවලා පිටිපස්සට අරන් පපුවට තද කරගත්තේ රවාගෙන..

කොල්ලා ඉන්නේ තාමත් නාගෙන ආව ටවල් එක පිටින්..කොණ්ඩෙන් වැටෙන බතුර වලින් සදීනගේ ගෙල පාමුල තෙත් වෙලා තිබ්බා.. ඊට එහා කෙල්ලට දැනෙන නුහුර එක්ක ලැජ්ජාව හින්දම දවාත්ගේ මූන නොබලා ගැලවෙන්න ඔට්ටු වුනේ..

" දවාත් මහත්තයා මාව අතැරියේ නැත්තන් මන් හොඳ වැඩක් කරනවා..
ඒ හින්ද අතරින්න මාව..

" නෑ යන්න දෙන්නෙම නෑ..

කෙල්ල දවාත් ඇඳන් හිටිය ටවල් එකෙන් ඇද්ද පාරට ඒක ගැලවිලා වැටෙද්දි දවාත් කෙල්ලව අත ඇරලා ටවල් එක අල්ල ගත්තේ ලැජ්ජාවටම..

" මඟුල.. මේකි යකෝ.. පැන්නා නේද..

" හූ හූ... ඇද්ද ආව මෙතන මාව අල්ලන්න..
බායි දවාත් මහත්තයා ...

කෙල්ල කාමරෙන් එලියට් ගිහින් දවාත්ට නෝන්ඩියට් කිව්වේ.

" උඹට මන්.. වල් ඊරි..අල්ලගන්නම්කෝ..

සික්.. වෙච්ච දෙයක්.. නිවර්ස්ත්‍ර වුනානේ.. මේකි ඉස්සරහා.. දැක්කද දන්නෑ.. මූනක් අල්ලලා ඉවරනේ..දැන්..

" හෝ හෝව් කියුටි.. මැරතත් දුවනවා වගේ කොහෙද දුවන්නේ .. ඕක දෙනවා මෙහාට..

කෙල්ල හතිදන් වතුර බෝතක් දෙක අරන් ආව පර නැවතුනේ ආදි ලඟ හතිඇර ඇරම..

sinhalaebooks.com

දවාත් ලෑස්තිවෙලා එන්න ගිය පරක්කුවට කට්ටියම බලන් හිටියේ.. වාහනේ ළගට වෙලා..

" වරෙන්කෝ මූසලයෝ..
මනමාලියක් බලන්න නෙමේ යන්නේ..
ළමා නිවාසෙට...රෙද්ද..

" කැනුගාහ නැගපන් තෝ.. තාත්තා වගේ අම්මේ මේකත්.. එපා වෙනවා කෑ ගහද්දි..

සුදු අත් කොට ෂටර් එකට කොල්ලා ඇඳලා ආවේ කලු ට්‍රවුසර් එකක්.. දවාත් ඒකට හැඩයි.. ජෙල් ගාලා උඩට හදපු කුරු කොණ්ඩෙට මූනේ තිබ්බ තඩි රැවුල කොල්ලට අමුතු ලස්සනක් ගෙනාවා..

" ඒ.. මෙන්න මූ... ඇන්ටි මූ නිකන් හිටියේ රිලවා මැරුන අභිකුන්ඨකයා වගේනේ ඉස්සර.. දැන් එන්න එන්න හැඩ වෙනවා.. ආ ආ ආ.. මොකක්ද රහස..........

" පදේ අහගන් නැතුව යන්ද මිස්ටර් ආදිත්‍ය වංශනායක..

ආදී කැරකුනේ දවාන් වටේ..ට කොල්ලා බැලුවේ සදීනා කෝ කියලා. කෙල්ල අයාන් එක්ක හිටියේ සමදරා ළග හැංගිලා..

" තමුසෙත් යන්කෝ... දැන් රෙදි ඇන්දත් නෑ වගේනේ..
මාව හෙලුවෙන් තියලා.. ආතල් එකක් ගත්තා නේහ් සුදු නෝනා.. රිටත් දෙන්නම් මන්..
තොපි ඔක්කොටම..

දවාත් හිත හිත ගියේ වාහනේ ළගට..

" ලොකු.. සදීනවත් දන් ඔයාලා නිවාසෙට යන්න..
මම ඩ්‍රයිවර් එක්ක කෝවිලටත් ගිහින් එද්දි ලේට් වෙයි..
කලින් යන්න ඔයාලා.. පොඩි දරුවට අමාරු වෙයි පරක්කු වුනොත්

සදීනා පුතේ ආදිලා එක්ක ඔයා එන්න..

සදීනගේ කටේ කෙල ටිකත් හිඳිලා ගියා වගේ.. දවාන්ගේ ටවල් එක ගලවපු එකට පනිශ්මන්ට් හම්බෙනවා කියලා කෙල්ල දන්න නිසාම බය හිතුනා දවාත් එක්ක වාහනේ යන්න..

" අනේ ලොකු නෝනා එක්ක එන්නද මායි ආයු යි..

" අපෝ කියූටි මොනාද අනේ.. අපි එක්ක යන්කෝ කයියක් දගෙන..

sinhalaebooks.com

කෙල්ල අකමැති වුනත් අවසානේ වුනේ දවාන්ලගේ වාහනේ යන්න වුන එක..

සදීනා ආයාන්ව තුරු ල් කරගෙන ගියේ කිසිම සද්දයක් නැතිව.. කෙල්ල අයාන්ට පේන වාහන ගස් බිල්ඩින් පෙන්නු ඇරෙන්න ආදි ගෙයි දවාන්ගෙයි කතා වලට උත්තර දුන්නෙම නෑ..

සෑහෙන දුරක් යනකම් කෙල්ල හිටොයේ ග්ලාස් එකෙන් පාර දිහා බලාගෙන වැරදිලාවත් ඉස්සරහා තිබ්බ කණ්ණාඩිය දිහා බලයිද කියල දවාන් ඒක කෙල්ලගේ මූනටම තියන් හොරාට බල බල ඩ්‍රයිවින් කලේ..

" බකමූනී..

දවාන්ට කියවුනේ කෙල්ල පුම්බන් ඉන්නවා දැකලා එකපාරටම..

" ඈ.. මොකක්..

ආදි ට ඇහුන් නැති හින්ද දවාන්ගෙන් ඇහුවේ..

" නෑ නෑ මොකුත් නෑ..

" අඩ්ඩේ..අපේ කියුටි සද්දයක්වත් නෑ.. තරහා වෙලාද...

ආදී පිටි පස්ස බලද්දි කෙල්ල ග්ලාස් එකෙන් එලිය බලන් ඉදලා ආදි දිහා බලලා හිනාවුනා..

" ඔය ඉන්නේ රෝස යි බේබි රෝසයි දෙකම ..
කෝ අපේ පොඩි බොස් නිදිද කියුටි..

ඔව් ආදි මහත්තයා.. එයාට නින්ද ගියා..

සදීනට බෑ දවාන් දිහා බලන්නවත්.. කෙල්ලඋදේ කලෙ එච්චර හොද වැඩක් නෙවෙයි කියන්න දන්නවා.. දවාන්ගේ ඇඟ නොදැක්කේ කෙල්ල පිටිපස්ස නොබලා එලියට දුවන් ආව නිසාඒකත් වෙලාවට නැත්තන් මූන බලනවා තියා ගෙදර ඉදලත් ඉවරයි කියලා කෙල්ල දන්නවා..

ආදි ටිකක දුර ගිහින් දවාන්ගේ ඉස්සරහා තිබ්බ සදීනා පැත්තට හරව්පු කණ්ණාඩි ය ආදිට කෙල්ල පේන් විදියට හදගත්තා..
දවාන් ආදීට රවලා ආයෙන ඒක තමන්ගේ පැත්තට හරව ගත්තා..

දෙපාරක් තුන්පාරක්ම ඕක මාරුවට වුනා..දවාන් ආදිට දුන්නෙම නෑ කෙල්ලව කණ්ණාඩියේ ත් බලන්න..

sinhalaebooks.com

" අදී කන්ඩ හදන්නේ උඹ දැන් ඔය..ඕක ඔහොම තියලා උඹ පාඩුවෙ යමන්..දැන්..

." හා හා හා හා හරි හරි ...

සේපාලිකා මලයි.............
සුදුපාට මීදුමයි........
හරි ලස්සනයි සුදූයි.......
ඇත්තටම ඔබ වගේයි....

හ්ම් හ්ම්ම් හ්ම් හ්ම්ම්ම්ම්

ආදි සින්දුව කිව්වේ සදීනට ඇහෙන්න.. දවාන්ට මාරාවේස ආදීගේ සින්දුවට.. කොල්ලා කැමති නෑ ඒකට..

" ලව් සින්දු කියන්න එපා උඹ..
අහන් ඉන්න බෑ.. මෙකෙන් එලියට දානවා දැනගනින්..

දවාන් ඩ්‍රයිවින් කරන ගමන් කිව්වේ ආදිට..

" හා.. එහෙමද. මොකක්ද මහත්තයා කියන්න හොද සින්දුවක්.. ලව් නැති එකක්..

" කියපන්කෝ හොද ආගමික සින්දුවක්..

දවාන් කිව්වේ කටට ආවට.. කොල්ලට ඕනේ වෙලා තිබ්බේ සදීනට වදින්න ආදි කියන සින්දු නවත්තන්න..

" සංසාරේ ඒ ඒ ඒ ඒ ඒ ඒ
භවේ .............දූකා ආආආආ

"ආදි මහත්තයා මොකද ඔය.. ළමයත් බයවුනා..
බඩේ අමාරුවක් ද..

දවාන්ට හිනාව දරාගන්න බෑ.. ආදිගේ මූන ඇදවෙලා තියනවා දැකලා..

" සෝ එක්ට්‍රීම්ලී සොරි කියුට්.. පෝඩ්ඩක් හයි පිච් ගියා සෝන්ග් එක .
ඇමරිකන් ඉදන් ආව නිසා පොඩ්ඩක් තාලෙ අහුවෙන්නෑ..දැන්..

ආදී කිව්වේ කෙල්ලට ගස්සලා.. දවාන්ට මහ හයියෙන් හිනා ගියේ ආදිට සදීනා දපු කින්ඩියට්..

sinhalaebooks.com

" හා හා.. ඉස්සරහා බලන් ඩ්‍රයිව් කරපන්.. නැත්තන් ඇනගතින් විරිත්තලා මෙතන..
ආය එන් නැතේ තෝ වගේ හිවලෙක් එක්ක..
ගෙදර ඉන්නැතුව ආවට මටහොඳ වැඩේ..

ඇදී තනියම බැන බැම යද්දි කෙල්ලටත් හිනා ගියා..

දවල් වෙද්දි ළමා නිවාසෙට යන්න දවාත්ලට පුලුවන් වුනා..
කෙල්ලයි අයානුයි මීක් නෑ..දවාත් දන්නවා කෙල්ල කතාව වහලා ඉන්නේ උදේ සිද්දිය නිසා කියලා..

" දවාත් මහත්තයා..කාලෙකින් ඇවිත්..
එන්න එන්න..

මැදි වයසේ උස ගවුමක් ඇඳත් ආව ගෑනු කෙනෙක් දවාත්ව පිගත්තා ..දවාත් හිනාවෙලා මොනවදෝ කියනවා සදීනා බලන් හිටියේ ඈතට වෙලා..

" පුතු පැටියා.. මහන්සිද ඔයාට..
තාත්තා එක්ක සවුමක් ආවා නේද හොර කොල්ලා..
සතුටු ඇති නේද මේ පුංචි හිත් පොඩ්ඩ ආ..
සතුටුයිද..

කෙල්ල අයාන්ගේ කොපුලක් සිපත්ගත්තේ කොල්ලා හිනාවෙද්දි..

" සදීනා....මේ ආන්ටි සුබා එක්ක ඇතුලට යන්න ඔයා..
දැන් අම්මා එයි.. එතකන් ඇතුලෙන් ඉන්න..

දවාත් කෙල්ලව පිටත් කලේ පාලිකාව එක්ක..

" මේ නෝනා කව්ද... මන් දැකලා නෑ මීට කලින්..

" මම වැඩට ඉන්න කෙනෙක් රණබාහු මහත්තයලා ලඟ..

ඉන් එහා වැඩි කතාවක් නැතුවම කෙල්ල අයාන් එක්ක ඇතුලට ගියා

පුංචි පුංචි ළමයි ගොඩක් එළියේ සෙල්ලම් කරනවා
සදීනා අයාන්ව තියාන් බංකුවට වෙලා බලන් හිටියේ ළමයි දිහා..
එතන එක එක වයසේ අය හිටියා. පුංචිම අය ටිකක් ලොකු අය .. තරුණ වයසේ අයත් හිටියා..

සදීනට මතක් වුනේ වැල්ලේ ගෙවපු ඒ ජීවිතේ.. එක එක වයස් වල හැමෝම ළමයි හිනාවෙකා නටකා කෑ ගහලා වැල්ලේ එකට හිටියා හරියට මේ වගේම..

sinhalaebooks.com

හොයන්න බලන්න අම්මකා තාත්තකා නෑ හිටියත් ඒ කාටවත් ගානක් නෑ මාලු යි දෑලුයි එක්ක ඔට්ටුවෙනවා ඇරෙන්න ළමයි ගැන හොයන්න වෙලාවක් තිබ්බේ නෑ..

" අනේ පහන් අයියා. අපේ මාමා.. මොනා කරනවා ඇද්ද..
නැන්ද නංගි ටයි මල්ලිටයි සැරකරනවද දන් නෑ..

පහන් අයියට මාව දන් අමතක වෙලත් ඇති.. මම හිටියේ කොහෙද.මම දන් ඉන්නේ කොහෙද.. ජීවිතේ වෙනස්ම විදියට් මට සලකන්නේ..

අද මේ පුංචි කොල්ලෙක් නිසා හැමදේම අමතක කරන්න වෙලා.. අම්මෙක් නැති අහිංසකයෙක්ට අම්මෙක් වෙන්න වෙලා..
ඒ වෙනුවෙන් මට මගේ හැමදේම අමතක කරන්න වෙලා..

පුදුමයි වෙලාවකට ජීවිතේ.. අපි හිතන විදියට වඩා වෙමස් විදියට් හැම්දේම දෙන්නේ..

" සදීනා..

" ලොකු නෝනා දන්ද ආවේ..

" මත් ඇවිත් ටිකක් වෙලා ඔයා ළමයි දිහා බකන් හිටිය නිසා මත් කරදර කලේ නෑ..

" අනේ නෝනා මෙයාලා හරි අහිංසකයි.. පව් නේද..

" අනේ ඔව් දරුවෝ.. මේ මල් පරවෙලා යන්න නොදී රැකගන්න ඕන කොහොමහරි.. මේ තමා අපේ අනාගතේ..

සමදරා කිව්වේ ඒක හදවතින්මයි.. රණබාහු මහත්තයලා සල්ලි තියන ලොකු මිනිස්සු උනත් එයාලගෙත් සමාජෙට වෙන්න ඕන
හැමදේම වෙනවා කියලා කෙල්ල හිතුවේ..ඒ ගැන අඩම්බර සතුටක් ආවා.. එහෙම තැනක වැටිලා ඉන්න එකත්.. උදව් කරන එකත් වටිනවා කියලා..

කෙල්ල සමදරා එක්ක පාලිකාව ළගට යද්දි අයාන් අඩන්න ගත්තේ එකපාරම..

" ලොකු නෝනා අයාන් බබා අඩනවනේ..
පැම්පස් එක මාරු කරන්න ඕන ඇති..ම වාහනේට ගිහින් මාරු කරන් එන්නම්..

" ආ හරි පුතේ ගිහින් එන්න..

කෙල්ල අයාන්ව අරන් ආවේ වාහනේට.. කොල්ලගේ ඇඳුම් බෑග් තිබ්බේ වාහනේ හින්ද..

sinhalaebooks.com

ආදී දවානුයි කෙල්ල දැක්කෙම නෑ මොකද ආව වෙලේ ඉඳන් කොල්ලො දෙන්න බරටම වැඩ.. ළමයින්ට ගෙනාව දේවක් දුන්නා.. අඩුඔආඩු බලලා ඒවාට පිළියම් යෙදුවා.. කොහොමහරි දවාන්ටත් සදීනයි කොල්ලවයි දකින්න හම්බුන් නෑ..

කෙල්ල වාහනේ පැත්තට යනවා දවාන් දැක්ක.. හොර ගල් අහුල අහුල කොල්ලත් වාහනේට කිට්ටු කලේ සදීනා ව තනියම අල්ලගන්න..

" කෝ චූ නාලා.. සුදු මහත්තයා ඔයා.. අලුත් පැම්පස් එකක් දමු අපි.. පුතාට කෝ එන්න..

දවාන් ග්ලාස් එකෙන් එබුනේ ශීට් එක උඩ කියව කියව අයාන්ගේ ඇඳුම් අයින් කරන කෙල්ල ලඟින්ම..

" ඒයි.. මොකද කරන්නේ..

දවාන් ඇහුවේ රහසෙන් වගේ..

" අපි අලුත් සූට් දනවා කියන්න ආයු..

" ආ ඇත්තද.. උදේ මගේ ගැලෙව්වා දැන් මගේ කොල්ලගේ ගලවනවා.. සාහසිකයි බකමූනි තවුසේ..

දවාන් කිව්වේ ග්ලාස් එක උඩ මූන තියන් සදීනා දිහා බලාගෙන..
කෙල්ලට හිනා යන්න ආවත් අමාරුවෙන් ගිලගත්තා..

" ආයුනම් පැම්පස් දලා ඉන්නේ නේද . ඒකට තාත්තා .

දවාන්ට තේරුනා ඒ කියපු එක.. පොලව පලන් එතනම වැලලෙන්න හිතුනා..

" තමුසේට මන්.. ඉන්නවකො මන් එනකන්..

දවාන් දොර ඇරන් ගොඩවෙලා අල්ලගත්තේ කෙල්ලගේ කනෙන්...

" ආව් ආව්.. අනේ දවාන් මහත්තයා අතාරින්නකො මගේ කන රිදෙනවා..

" තමුසෙගේ තියන වල් කමට මගේ ටවල් එක ගලවලා දුවලා මෙතන කොල්ලට මගේ වැරැද්ද කියනවද.. ආ..

දවාන් කෙල්ලගේ කන අල්ලන් බැන්නේ හිනාවෙවී.. ඒක දවාන්ට ආව කේන්තියක් නෙවෙය්..කොල්ලා ආසයි සදීනා ළග ඉන්න රණ්ඩු වෙන්න.. ඒ වචන වලට දවාන් දැන් ඇබ්බැහි වෙලා..

sinhalaebooks.com

" නෑ නෑ.. මහත්තයා හොඳආ ආ ආ ආ යි..
ආයු ඔයාගේ තාත්තා හොඳයි..නේද..

" ආන් එහෙම එන්න

දවාත් කෙල්ලව අත ඇරලා ශීට් එකට හේත්තු වුනේ කොන්ඩෙ හද හද.. කොල්ලට සැහැල්කුවක් දැනුනා.. සදීනා අයාන්ව ඔඩොක්කුවේ තියන් කන අල්ලන් අත ගාගත්තේ දවාත් අල්ලපු පාරට රිදුන හින්ද..

" රිදුනා කන මගේ ..

ආයු කොල්ලා හොරාට සදීනගේ ලග ඉදන් දවාත්ගේ කකුලට පැන්නේ කෙල්ලට එහා පැත්තෙම දවාත් ඉඳන්හිටිය නිසා..

" චා චා...ආ ම්..

" දවාත් මහත්තයා ඔය.. පේන්නැද්ද.. ඔයාට කියන්නේ වඩගන්න කියලා..

කොල්ලා හිටියේ උඩ බලන්..

" ම්ම්ම්ම්ම්

" ඇයි ඔච්චර තපුරු වෙන්නේ කියන්නකෝ..
ආයු හොයන්නේ එයා ගේ තාත්තා ගේ උණුහුම..ආදරේ.. දවාත් මහත්තයටඒකවත් දෙන්න බැරිද මේ අහිංසකයා වෙනුවෙන්..

රටේම ඉන්න ළමයින්ට ආදරේ කරනවා ළමා නිවාස දලා.. තමන්ගේ ළමයට හතුරෙක්ට වගේ සලකනවා..

සදීනා බනිද්දි කොල්ලා සද්ද නෑ.. ඇස් අස්සෙ කඳුලක් දවාන්ගේ එලියට පනින්න ඔට්ටු වෙනවා..

" ෂ් ෂ් ෂ් ෂ්..

දවාත් ඇඟිල්ල තිබ්බෙ සදීනගේ තොල් උඩින්.. කෙල්ල ගේ ක්තාව නැවතුනා ඇස් ලොකුකරන් බලන් හිටියේ දවාත් අයාන්ව පපුව උඩින් තියාගන්නවා දැකලා..

" දැන් හරිද.. උඹ ආව ද ඉදන් නටන්නේ මේකටනේ.
දැන් සතුටුද...

අයාන් කියන්නේ දවාත්ගේ පන.. ඒක වෙනස් කරන්න මේ ලෝකේ කාටවත් බෑ.. ඒත්

sinhalaebooks.com

පිරිමියෙක් තේරුම් ගන්න උඹ තාම පොඩි වැඩි මැණික..

දවාත් කිව්වේ සදීනා දිහා බලලා.. කෙල්ල අඬනවා හෝ ගාලා..
අයාත් දවාත්ගේ ශටර් එකේ විවර වුන බොත්තම් කාස අතරින් ඔලුව තියන් ඒ පලුවට තොල් තද කරන් හිටියේ හරියට ලොකු කෙනෙක් වගේ ..

" පිරිමි ගැන මත් දත් නැතුව ඇති ඒත් මට ආදිව දැනෙන.වා..
ඔය බලත්න දවාත් මහත්තයා.ඔයාගේ පපුව අස්සේ ඒ හොයන්නේ ලේ සුවඳ... ඒ උණුහුම..
ඇයි අයාත්ගෙ ඒ අයිතිය ඔයාට දෙන්න බැරි..

දෙවියන්ට බුදුන්ට වඳින අත් දෙක එකතු කරලා කියන්නේ.ආයුට මෙහම කරන්න එපා..
අනේ..

ඇත්ත දවාත් බලද්දී කොල්ලා පපුව අස්සේ ඔලුව ගහත් කොල්ලට දරාගන්න අමාරුයි..
අද දැනෙන්නේ සුතැවීමක්.. මේ ආදරේ මේ ස්පශර්යන් ඒ තරම් සැනසීමක් ගේනවා කියලා කොල්ලට දැනුනේ අද..

කෙල්ලට එච්චර යි කියාගන්න පුලුවන් වුනේ ඇඩුනා හොදටම . දවාත් ඒ අත් දෙක අල්ලලා පහල දැම්මේ වඳින්න එපාකියන්න වගේ..

" අඬන්න එපා..දැන් යමු..
ආයුට ආයේ එහෙම වෙන් නෑ..ප්‍රොමිස්..
හරිද...දැන්..

පුතේ ඔයාගේ ආම්ට කියන්න හොටු එනවා කෑතේ බෑ කියලා..

දවාත් කොල්ලට කිව්වේ හිනාවෙලා..

"බොරු...

සදීනා වාහනෙත් බැස්සේ දවාත් කොල්ලව වඩාගෙන බැස්සට පස්සේ..දවාත් පස්සෙත් කෙල්ල ඇවිදන් ගියේ හදවතින් හිනාවෙවී.... අයාත්ට දවාත් ලගට යන්න චුට්ට චුට්ට හරි හදලා දෙන්න ගත්ත උත්සහයාද වෙද්දී සාථර්ක වෙලා කියලා දැනෙන්ද්දී හදවතින්ම සතුටු වෙමින්...

සමදරා දැක්කා ඈත තියා ආඅන්ව විඩන් එන දවාත්ව..
හිත අස්සේ මල් වෙඩි දැම්මා සමදරා.. මේ ඇස් මානේ පේන්නේ නින්දක් නැතුව දෙවියන්ට යැදපු එකම පැතුම..

" දෙවියන්ට ස්තුති වේවා.. කෝවිලේ පූජාව දීලා එද්දිම මෙහෙම දකින්න ලැබුන එක වාසනාවක්..

sinhalaebooks.com

සමදරා හිතුවේ දවාන්ගේ වෙනස දේව හාස්කමක් කිහලා අද....

" අඩෝ වරෙන්කෝ බන්.. මේ කිඩ්ස්ලා මාව ඊට් කරනවා සෝන්ග් එකක් කියන්න කියලා..

ආදී කෑ ගැහුවේ දවාන්ට ..කොල්ලාව ළමයි ටික වටකරන් සින්දු කියන්න කියලා පොරේ..

" ඉතින් උඹ කියපන්..අර එද්දි කිව්වේ ලස්සන ඒවා..

"අඩෝ මට සින්දු කියන්න බෑ ඕයි.. හෙන ගහන කතා නොකියා උඹ එකක් කියපන්කෝ.. ආ ගිටාර් එක..

දවාන් බැලුවේ සදීනා දිහා..

" කියන්නද..

" මගෙත් අහන්නේ.. මහත්තයා කැමතිනම් කියන්න ඉතින්..

අයාන්ව කෙල්ල අතට දීලා දවාන් ගිහින් ගිටාර් එක ගත්තේ හොරාට සදීනා දිහා බලලා..

" හරි මගේ පැටව් ටික සින්දුවක් අහමු නේද එහෙනම්..

"මගේ දූවේ නුඹ අවදියෙන්නම්
මෙ රැයේ මිහිරිම වෙලාවයි
දොර ඇරන් එළියට ආවොතින්
මෙ මිහිරි දේවල් නුඹටමයි

සේපාලිකා මල් බිමට බැහැලා
ඇවිදින්න යන වෙලාවයි

තිල් තාරකා බිම බලාගෙන
වැව් දියට පෙම් බැඳි වෙලාවයි
මේ පොළව කෙතරම් සුන්දරද
මගේ දූත් තනියම හිනාවෙයි

මගේ දූවේ නුඹ අවදියෙන්නම්
මේ රැයේ මිහිරිම වෙලාවයි
දොර ඇරන් එළියට ආවොතින්
මේ මිහිරි දේවල් නුඹටමයි

ගණ කලුවරට අපි පෙම් කලොත්

sinhalaebooks.com

ඉර හඳ තරු වලට ණය ගැති

ලොව දුන්නු දේවල් අද අපට
හෙට ලොවට පෙරකා දිය යුතුයි
ඔබ මේ ලොවට ආදරේ නම්
මුළු ලොවත ඔබටත් ආදරෙයි............

දවාත් අවසානේ බැලුවේ සදීනා දිහා.. කෙල්ලගේ ඇස්වල කඳුලු දිලිසෙනවා.. මේ දවාත් කෙල්ල දැක්කේ අද.. මෙච්චර ලස්සන හිත තිවෙන කට හඬක්.. පුංචි හිත් සතුටු කරපු විදිය.. සදීනට සතුටුයි..

" වාව්.. ස්පිරි ආ.. මූසල වුනාට පෙනුම හඬේ පොඩි එකක් තිබ්බා තරුණයා ඔබෙ..

ආදී කිව්වේ දවාත් ගිටාර් එක උස්සන් ගහන්න යද්දි..

" ආයු ඒ ඔයාගේ තාත්තා... ලස්සනයි නේද අහන්හිටියා නේද සුදු පුතා මගේ.. ම්ම්..

කෙල්ල අයාන්ගෙන් ඇහුවේ කනට කරලා..
ළමා නිවාසේ ගෙවෙන දවස සදීනට අයාන්ට වගේම සමදරාටත් සතුට අරන් ආපු දවසක් වුනා..දවාත් වෙනස් වෙනවා ඒක හැමෝටම පේනවා.. සමදරා ඈත ඉඳන් බලන් බලන් ඉන්නේ සදීනා අයාන් ආදී මේ හැමෝම දවාත්ගේ ජීවිතේ ලස්සනට පාට කරන විදිය.. ආක්ෂා විනාස කරපු ඒ ජීවිත දෙකට පන දෙන්න උත්සහ කරන සදීනයි ආදී ගැන සමදරාට තිබ්බේ කියාගන්න බැරි හැඟීමක්..

" ආදී...........
මගේ කොල්ලා වෙනස් වෙනවා ටික ටික..
මට සැනසීමක් ඒක.. බලන් හිටියා ඉස්සර හිටිය මගේ කොල්ලාව ආයේ දකින්න..

" ආන්ටි හිතන්න එපා.. මන් ආවනේ දැන් දවාත් ආයේ ඉස්සර හිටියා වගේම ඉදී.. අපි කෝමහරි ඒක කරමු..
හැබැයි මට වඩා කියුට් ආයු කොල්ලයි තමා මූව වෙනස් කරන්නේ දවසක..

" ඒක ඇත්ත පුතා.. මන් දන්නවා සදීනා අපේ ගෙදර සතුට ආයේ ගේනවා කියලා.. මට ඒ අහිංසකී ගැන විස්වාසයි..

සමදරා කියන්නේ සදීනා ගැන.. කෙල්ලව මහ හුගක් විස්වාස කරන් සමදරා හිටියේ..

" උඹ මොකද අම්මා අල්ලන් ඒ පාර..
ඇයි ළමා නිවාසේ ලියාගන්නවත්ද උඹේ නමට..

දවාත් ආවේ ආදිව අවුස්සන්න බලන් කියන්න දෙයක් හදගෙනමයි එතෙන්ට..

sinhalaebooks.com

ආදී අබුස්සලා ගන්න ජෝලිය කොල්ලා තැනක් නොතැනක් නෑ කරනවා ඉස්සර ඉඳන්ම කියලා සමඳරා දන්න නිසාම හිනා වුනේ කොල්ලෝ දෙන්නා දිහා බලල..

" ඇයි බැරිද... මන් තමා ආන්ටිගේ චූටි පුතා..
ඉල්ලුවොත් නොදී ඉදී කියලා තමා බය..
අනික උඹ හදගන්න ගත්ත එකානේ..

" ආ හරි හරි උඹ මලෙන් උපන් කුමාරයනේ..
මෙන්න මෙහේ වරෙන් ගඟ පැත්තේ යන්න..

" පුතේ පරිස්සමට හොදද.. ගඟ පැත්තේ පතල් කාරයෝ ඉන්නවා බීලා හවසට... කතාවට් යන්න එපා..

සමඳරා කොල්ලෝ දෙන්නටම ඇහෙන්න කිව්වේ.. දවාන්නුයි ආදී නැහුන ගානට ගියේ ගඟ පැත්තට..

ගඟ ළගට වෙලා කොල්ලො දෙන්නා සෑහෙන්න දේවල් කතා කලා.. අකීෂා ගැන වගේම සිද්ද වුන හැමදේම .. දවාන්ට හිරකරන් හිටිය ඒ වේදනාව ආදි ඉස්සරහා එලිකලේ කොල්ලට කිසිම රහසක් නැති එකම කෙනා ආදී නිසා.

" උඹ දැන් ඔය හැමදේම අතීතෙට දීලා අනාගතේ ජීවත් වෙන්න ඕනේ...
අනික දැන් උඹ කොල්ලෙක් නෙවෙයි.. තාත්තෙක් ඒක අමතක කරන්න එපා..
උඹ හින්ද මේ ලෝකේට ආව ඒ දරුවා වෙනුවෙන් උඹ ඉස්සරහට වැඩ කරන්න ඕනේ..

" මන් ඒක දන්නවා බන්...

" අනික බන් උඹ කැමති ඕනම තීරණයක් ගන්න උඹට නිදහස තියනවා..

ආදී කිව්ව දේ දවාන්ට තේරුන් නෑ කොල්ලා ආදි දිහා බැලුවේ ආදී එහෙම කියලා අදහස් කලේ මොකක්ද කියලා දැනගන්න..

" ඒ කියන්නේ

" ඒ කියන්නේ.. උඹ දැන් අයාන්ට අම්මෙක් හොයාගන්න ඕනේ.. ඒක උඹ කැමති කෙනෙක්.. මන් කියන්නේ උඹ ආයි මැරි කරන්න ඕනේ.. නැත්තන් කියුටිත් හැමදම ඉන්න ඇවිත් නෑනේ.. ආන්ටිලත් හැමදම ඉන් නෑ.. ඉතින් ඒ හැමෝම නැති කාලෙක උඹව වගේම කොල්ලා බලාගන්නත් කෙනෙක් ඕනේ..

ආදී කියන දේවල් වල ඇත්තක් තියනවා කියලා දවාන් දන්නවා .. ඒත් තාමත් අක්ෂා ගේ අතීතේ කොල්ලගේ හිත අස්සේ හොල්මන් කරන්නේ හැඟීම් මරලා දලා.. දවාන්ට සදීනා

sinhalaebooks.com

දකිද්දි දැනෙන හැඟීම් ආයේ ආයේ හිතද්දි අක්ෂාගේ මතක ඇවිත් කොල්ලව යක්ෂාවේස කරනවා..
අයාන් ලඟට වුනත් කොල්ලා යන්න බය ඒකයි..
ඒත් දැන් දැන් හිත කියන්නෙම සදීනාගේ ලග නවතින්න කියලා.. කොල්ලට ඕනේ අයාන් එක්ක සදීනව හැමදම තමන් ළග තියා ගන්න..
ඒක කෙලින් කියාගන්න තරම් දවාන්ට ශක්තියක් තිබ්බේ නෑ..

" සදීනා යයිද බන් මගේ කොල්ලව දාලා කවදහරි....

දවාන් එකපාර අහද්දි ආදීටහිනා ගියා...

" ඇයි උඹට දැන් ඕනේ කියුටිව උඹෙත් ආයා කරගන්නද..
ඒවා කැත වැඩ... කියුටි ට මීට වඩා ලස්සන අනාගතයක් තියනවා බන්..ඒකි තාම පොඩි කෙල්ලෙක්..අනික ඒකි උඹ ළග ඉන්න කැමති නෑ.. උඹ මහ සෝහොනා වගේ මරන් කන්න හදනවනේ එකිව..

ආදී කියද්දි කොල්ලට කේන්ති.. දවාන්ට හිතුනෙම කෙල්ල ආදී එක්ක එහෙම දෙයක් කියලා වෙන්න ඇති කියලා..

" හරි..උඹ කියන්නේ සදීනා මට කැමති නෑ කියලද..
ඔට්ටුවක් දාලා බලමුද ..

" හරි ඔට්ටුයි ... කියුටි උඹ එක්ක තරහයි..

" හරි උඹ ගිහින් කෙල්ලට කියපන් මන් ගඟට වැටුනා කියලා.. උඹ වාහනේ ගේන්න යනවා කියලා කියපන්...

" කියලා..

" කියලා බලපන්කෝ.. ඒකී දෙකක් නෑ මන් හොයාන එනවා මෙතෙන්ට..

දවාන්ටත් ඕනේ කෙල්ල තමන් ගැන චුට්ටක් හරි හිතනවද බලන්න..

" හරි ඔට්ටුයි.. මන් ගිහින් කියන්නම්..

ආදී ගියේ දවාන්ගේ ඔට්ටුවට කෙල්ලව හොයන්.. සදීනා ළමා නිවාසේ හිටිය ළමයි ලගට වෙලා කතා කර කර හිටියේ අයාන්වත් ලග තියාගෙනමයි..
ආදී හදිසියෙන් වගේ කෙල්ල ඉන්න පැත්තට එනවා දැක්කාත් වැඩිය ගනන් ගත්තේ නැතුව කෙල්ල හිටියා..

" කියුටී... කියුටී..

sinhalaebooks.com

අනේ කෝ අන්ටී...

ආදීගේ මූන හරි නැති හින්දයි කොල්ලා බෙරිහන් දෙන හින්දයි සදීනා නැගිට්ටේ

"ඇයි ආදී මහත්තයා කලබලෙන්...

" කියුට් දවාන් ගඟට වැටුනා.. කොල්ලට අමාරුයි වතුර පෙව්නා.. වෙලාවට මිනිස්සු හිටියා ළග නැත්තන් අද..මන් ගිහින් වාහනේ අරන් එන්නම් හොස්පිටල් යන්න.. ආන්ටි කෝ..

සදීනගේ කකුල් දෙකත් පන නැතිවේගන ආවේ.. කෙල්ලට පපුව ගැහෙමින ගත්තා..

" ආදී මහත්තයා දැන් කෝ දවාන් මහත්තයා..
අනේ කො හුගක් අමාරුද..

" ටිකක් අමාරුයි ගඟ ගාව ඉන්නවා මිනිස්සු වගයක් ..
එයාලා දවාන්ලග ඉන්නවා.. මන් ආවේ පණිවිඩේ කියකා වාහනේ අරන් යන්න..

සදීනට ඉන්න බැරිවුනා තවත් එහෙම..කෙල්ල අයාන්ව ආදීට දීලා දිව්වේ ගංග පැත්තට..

" ඕ ශිට්.... පොඩි බොස් මන් ෆේල් වුනා..
අන්න ඔයාගේ කියුට් දිව්වා.. තාත්තා හොයන්න..
කියුට් දවාන් ගැන හිතනවා ඒ කියන්නේ..
පොඩි බොස් ඔයා අම්මෙක් හොයාගෙන ඔක්කොටන හොරෙන්.....
හොර ගෙඩියා... දැන් ඉතින් අපි ඒ දෙන්නා ප්‍රේම ගඟට පැනලා නාලා එයි අපි යමු යන්න........

ආදී කොල්ලව අරන් නිවාසේ පැත්තට ආවේ සදීනයි දවානුයි කතා කරලා එයිනේ කියලා හිතලා..

සදීනා හදිසිය වැඩි කමට දුවන් ආවට කෙල්ල දන් නෑ ගංගට යන්න හරියටම පාර ..කැලේ වැවිලා තිබ්බ තේක්ක ගස් පිරුන වත්ත මැද්දෙන් කෙල්ල ඉස්සරහට ගියේබයෙන් බයෙන්..

" අනේ දවාන් මහත්තයා..
දෙයියනේ... මොකක්ද කරගත්තේ..
එයාට මුකුත් වෙන්න එපා.. ආරක්ෂා කරන්න එයාව..

සදීනා වැඳගෙන දිව්වේ ඔහේ ඉස්සරහට මිසක් හරියට පාර දැනන් නෙමෙයි.. දවාන්ලා ගිය පාර වෙනුවට කෙල්ල ගිහින් තිබ්බේ කැලේට යන පාරේ.. ඔස්සරහටබ්‍යන්න යන්න මහ කැලේ මිසක් ගඟක් හම්බුන් නෑ කෙල්ලට..

sinhalaebooks.com

" කෝ දෙයියනේ.. කව්රුත් නෑ මනුස්සයෙක්..
මට බයයි.. අනේ දවාන් මහත්තයා...

කෙල්ල පතල් හාරන වාඩි පැත්තට ඇවිත් තිබ්බේ
නොදැනම.. කවදාවත් මේ වගේ කෙල්ල ඇවිත් නෑ.. දන්නෙත් නෑ.. දවාන් ට කරදරයක් වෙලා ඇති කියලා බයටම කෙල්ල දුවන් ආවේ හිතේ හයියට..

" අන්න කෙල්ලෙක් බන්.. චූලා උඹ දැක්කද..

කෙල්ල වටපිට බල බල යනවා පතල් වාඩියේ කොල්ලො දැක්කා..
සදීනට ගඟක් තියා වතුරපොදක්වත් දකින්න හම්බුන් නෑ.. කෙල්ලට දැන් දැන් හිතට බයයි..
මේ යන්නේ පාර වැරදිලදෝ කියකමයි කෙල්ලට හිතුනේ.. දිව ගිලෙන්නතරම් වතුර තිබහයි

" දෙයියනේ.. මට පාර වැරදිලද...
ආදී මහත්තයගෙන් අහන්නෙත් නැතුව පිස්සි වගේ දුවන් ආවනේ..

ආහ්... අනේ කකුල ආව්.... කැඩුනද මන්ද.. ආයි රිදෙනවා...

කෙල්ල මුලක හැපොඉලා ඇඳගෙන වැටුනේ කකුල ඇඹරිලා යද්දි.. කකුල හොල්ලන්නවත් බෑ රිදෙනවා.. කෙල්ල එහෙමම බිම ඉදන් කකුල අතින් අත් ගෑවේ නැගිට ගන්න දඟලමින්..

" ආ නංගී.. කොහෙද මේ තනියම...

කෙල්ල උඩ බලද්දි දැක්කේ තමන් වටේම ඉන්න කලුම කලු මිනිස්සු ටික.. කෙල්ලගේ ඇඟ වෙව්ලලා ගියා.. මේ අවසාන මොහොත කියලා කෙල්ලට් හිතුනේ.. අයාන්ගේ මූන කෙල්ලට මැවිලා පෙනුනා..

"අනේ මාව බේරගන්න... මට පා ර.... වැ ර දු නා..
අ නේ... ම ම... ළ මා... නි වා සේ

ආව්.. එපා අනේ..එපා...........
ම්ම්ම්ම්ම් ම්ම්ම්ම්ම් ම්ම්ම්

කෙල්ලට එච්චරයි කියාගන්න පුලුවන් වුනේ.. ආපු පතල් කාරයෝ ටික කෙල්ලව අල්ලලා ගැට ගැහුවේ අත් දෙකයි කටයි බැඳලා.. කෙල්ල දඟලුවා මිසක් කිසිම දෙයක් කරගන්න බෑ..

අනේ දවාන් මහත්තයා ආදී මහත්තයා ඔයාලා කොහෙද.. මාව බේරගන්නකෝ.. අනේ කාටවත් මාව ඇහෙන් නැද්ද දෙයියනේ..
ලොකු නෝනා.. අනේ එන්නකෝ මම බයයි...
අනේ මාව බේරගන්නකෝ....

sinhalaebooks.com

කෙල්ල හිතින් විලාප තිබ්බා.. ඒත් කෙල්කව ඇහෙන්න කවෘත් හිටියේ නෑ.. දවාන්වත් ආදිවත් මේ කිසිම දෙයක් දන්නෑ..

" මේකි සී අයි ඩී ද දන් නෑ චූලා..
රඟපාලා එන්නෙ උන්..තමා..
කෝකටත් මේකිව බැඳලා දමු වාඩියේ..
රෑ වෙලා කතා කරගමු කරන දෙයක්...

එකෙක් කිව්වේ සදීනව කරේ තියන් යන එකාට..

" රෑ වෙකා සෙල්ලමක් දලා ගඟට දමු මේකිව. සැපක් අරන්..ගඟ පතුලට ගියාම කොහෙන් හොයන්නද.. කිඹුලෙක්ගේ බඩෙන් තමා ගන්න වෙන්නේ..
ඈ බත් මොකද කියන්නේ.

සදීනට ඇහෙනවා කියන ඒවා කෙල්ලට සිහියනැති වේගන ආවා ඒවා ඇහෙද්දි.. අඬන්න කඳුලු නෑ..මේ අන්තිම තත්පර ගාන කියලාමයි කෙල්ල හිතුවේ..

දවාන් පැයක් විතර බලන් ඉඳකා බැරිම තැන නිවාසෙට එන්න ආවේ.. ආදිට දිනුම හම්බුනා කියලා හිතින් කෙල්ලට් බැන බැන..

" ඔච්චරටම වෛර කරනවද සදීනා තමුසේ මට..
මැරුනා කිව්වත් එන් නැති තරමට..
මන් හිතුවේ නෑ එහෙම.. අත කැපුනම බත් කවද්දි
මන් එනකන් හැමදම රෑට මග බලද්දි මට හිතුනෙම උඹ මන් ගැනහිතනවා කියලා ඒත්..
ඒක බොරු රැවටීමක්... අද ඒක ඔප්පු කලා..
බොරුකාරී...

දවාන් හිත හිතම ගියේ කෙල්ල ගැන තරහෙන්..
දවාන්ට හිතුනෙම කෙල්ල ආදී එක්ක එකතු වෙලා කියලා.. ආදිට කියන්න ඇති කියලා ..

" අඩෝ.. කෝ කියුටි..

ආදී අයාන් එක්ක පඩි පෙල දිගේ ආවේ දවාන් ඔහේ ඇවිදගෙන එද්දි..
දවාන් උඩ බිම බැලුවේ සදීනව අහන හින්ද..

" සදීනා.. ආවේ නෑ..
උඹ දිනුවා..

" මොකක්... යකෝ .. කෙල්ල ගියා.. දැන්පැය දෙකකටත් වැඩී.. මන් හිතුවේ උඹව හම්බෙලා ඇති කියලා..

sinhalaebooks.com

දවාත්ගේ ඇස් දෙකැඩ ගියේ කෙල්ලට කරදරයක් වෙලා ඇති කියලා ආදී කියන විදියට කෙල්ල ගියානම් යන්න වෙලා ඒත් කෙල්ලට පාර වරදින්න ඇති කියලා දවාත්ට මතක් වුනා..

"දෙයියනේ.මගේ කෙල්ල..

දවාත් ආපහු හැරිලා දිව්වේ ගඟ පැත්තට..

" ආන්ටී ආන්ටී.. ආයුව ගන්න කෝ හදිසියක්..

"ඇයි පුතා..

" කියුටි පාර වරද්දන් කැලේට ගිහින්.. අපි හොයන් එන්නම්..

ආදි වැඩි විස්තරයක් සමදරාට නොකියා දිව්වේ දවාත් පස්සෙන්..

අනේ දෙයියනේ.. මගේ කෙල්ල..
මොකක්ද මේ කරගත්තේ.. මේ හිටියනේ පොඩි එකා එක්ක පාර වරද්දන් කැලේ ගියේ මොකටද..
මේ ළමයි මොකක්ද වුනේ කියන් නැනේ..

" මැඩම් පතල් පැත්තට ගියානම් තමා බය ..ඒවගේ ඉන්න එවුන් අණ ගුන නෑ.. මේ දරුවා නොදන්න තැන් වලට මොකට ගියාද...
ඉන්නකෝ මන් ගමේ දෙතුන් දෙනෙකුට කෝල් දෙන්නම් බලන්න කියලා..

සම්දරා ඔලුවට අත තියන් වාඩි වුනේ පාලිකාව ගමේ අයට කියන්න යන්න ඇරලා..
හිතාගන්න බෑ සදීනට වුන දෙයක්..

" සදීනා............ සදීනා..........................සදීනා..

දෙයියනේ කොහෙද මේ කෙල්ල ගියේ..
මමයි කලේ මෝඩ වැඩේ...අනේ මගේ කෙල්ලට මොකක් වුනාද...

දවාත් කැලේ අස්සෙන් රිංගලා තේක්ක ගස් මැද්දෙන් ගියේ සදීනට අඩ ගහ ගහ..

කෙල්ල ඇඳන් හිටිය දිග සායේ ඉරුන රෙදි කෑල්ලක් කෙල්ල වැටුන තැන කටු පඳුරේ පැටලිලා තිබ්බා..
ඒක දවාත් දැක්කේ අහම්බෙන් වගේ..

" මේ මේ ක... කෙල්ලගේ ඇඳුමේ කෑල්ලක්..ඔබ් ඒක තමා..

sinhalaebooks.com

දවාත් ඉස්සරහට වේගෙන් දිව්වේ ආදිට කෝක් එකක් ගන්න ගමන්..

"දවත් උඹ කොහෙද..

" හෙලෝ හෙලෝ.. ආදී උඹ පොලිසියට කියපන් කෙල්ල පතල් පැත්තට ගිහින් තියෙන්නේ.. මට ඇඳුමේ කෑල්ලක් හම්බුනා මත් දැන් එහාට යනවා..මට හිතෙනවා කෙල්ලව කව්රුහරි අරන් ගිහින් කියලා. උණ පොලිසිය එක්ක වරෙන්..

දවාත් ඒ ටික කියලා ෆෝන් එක ද ගත්තේ ආදිට කියන්න ඉඩක් නොදීම..

" මගේ මැණික බය වෙන්න එපා ...මත් එනවා..
මොන ලෝකෙත් හරි.මත් උඹව හොයාගන්නවා..

කෙල්ලව ලොකු ගහකට තියලා ගැට ගහලා පතල් කාරයෝ වාඩියට වෙලා කතා කරේ රෑවෙලා කෙල්ලට කරන දෙයක් ගැන..

කෙල්කගේ ඇඟ තුවාල වෙලා හැමතැනම..කටු අතු වැදිලා අරන් එද්දි..එහෙම් කඹ වලින් බැදලා ඒවට කැපෙද්දි කෙල්ලට රිදෙනවා..

යන්තමට අල්ලත් ඉන්න හුස්ම ටිකෙන් කෙල්ල ප්‍රාථර්තා කලේ බේරගන්න කව්රු හරි එන්න කියලා..
දවාත්ට කරදරයක් වෙලා ඇති කියලාත් කෙල්ලට මතක් වුනා…
විහිලුවක් අන්තිමට ඇස් රතු වෙන තැනටම සිද්ද වුනා.. දවාත්ට බයයි කෙල්ලට කරදරයක් වෙලා ඇති කියලා.. කොල්ලගෙ විහිලුව නිසයි මේ හැමදේම වුනේ.. සදීතා මෙහෙට අලුත් කෙල්ල පාරක් තොටක් කිසිම දෙයක් දන් නැති එකම දවාත්ගේ කකුල් පන නැති වෙන තරමටම බය කලා..

"අනේ මැණිකේ උඹ කොහෙද..
මාව බය නොකර ඇස් ඉස්සරහට වරෙන් ඉක්මනට..

දවාත් කැලේ ඇතුලටම ගියේ අරමුණක් නැතුව.. ඒත් කෙල්ල යන්න ඇත්තේ මේ කැලේ ඇතුලට කියලා තිබ්බ සැකේට. දවාත් පතල් වාඩි ළගට වැටුනෙ ගඟේ උඩ පැත්තෙන් ගිහින්..

ගඟට නැමුන ලොකු ගහක කෙල්ලව බැඳලා ඉන්නවා දවාත් දැක්කා ඈතට.. කොහෙන් කොහ්ම පැන්නදවත් මතක නෑ කොල්ලා දිව්වේ කෙල්ල ළඟට.

" මගේ මැණික..

sinhalaebooks.com

ඒ ඇස් අඩවන් වෙලා දවාන් දුවන් එනවා පේනවා ඒත් තද වෙලා තිබ්බ බැමි වලින් කෙල්ලට හෙලවෙන්න වත් බෑ.. කට බැඳලා තිබ්බ නිසා කෙල්ලගේ සද්දේ පිටට ආවේ නෑ..

ගගට වැටුනා කිව්ව දවාන් එනවා දැක්කම කෙල්ලට හිතාගන්න බෑ මුකුත්.. කෙල්ලට හිතෙන් නෑ මුකුත් පපුව ගැහෙනවා බයට.. ඔලුව රිදෙනවා පුපුරන්න වගේ..වැටෙද්දි ඇඹරුන කකුල ඇදුම් කනවා .. සිහිය අල්ලන් ඉන්න සදී පුලුවන් තරම් උත්සහා කලා..

" ඒයි ඒයි... අන්න මොකෙක්ද එකෙක් එනවා අර කෙල්ල ළගට..

පතල් කාරයෝ ටික කෙල්ල ළගට ආවේ ඉතේ ගහගෙන හිටිය කිනිසි ලග තිබ්බ පොලුයි අහුලගෙන..

දවාන් ලං වෙන්න කලින් කෙල්ලව වට කරගත්තේ මිනිස්සු ටික..

කොල්ලට ආව කේන්තියට ඔක්කොම මරාගෙන යන්න හිතුනා..ඒත් සදීනා හින්ද ඉවසුවා.. කලබල කලොත් කෙල්ල ට නරකක් වෙන්න ඉඩ වැඩී.. ඉවසීම උපරිමෙන් තියලා දවාන් කිට්ටු වුනේ සන්සුන්ව..
සදීනගේ ඇස් පියවිලා දැන්. ඒ මූන දැක්කම දවාන්ට දරාගන්න බෑ.. කෙල්ලව ළගට ගන්නකම් ඉවසීමක් නෑ.. ඒත් පරිස්සමට හැමදේම කරගන්න ඕනේ කියලා දන්නවා.

" ම ම.. රණබාහු බංගලාවේන්.. හෙක්ටර් රණබාහු මගේ සීයා පප්පා.. මේ වත්තේ අයිතිකාරයා..
තමුසෙලා ඔය බැඳලා දලා ඉන්නේ මගේ මගේ වයිෆ්ව..

කරුණාකරලා මට එයා අරන් යන්න දෙන්න..

දවාන් කිව්වේ ඒ ටික ඉවසලා..ඒත් දමලා අරින්න හිතුනේ බෙලිටික ගැලවිලා යන්න කොල්ලට මෙහෙම කතා කරලා පුරුදු නෑ.. ඒත් සදීනා වෙනුවෙන් එහෙම කරන්න වුනා..

" උඹ කව්රු වුනත අපට අදල නෑ.. කෙල්ල දෙන් නෑ..
උඹලා සී අයි ඩී එකේ වුන්ද ..

දවාන්ට දැන්නම් දත් ටික එකට තද වුනේ මුන් කියන මගුලක් නොතේරෙන හින්ද.. කියන සැරේ පිලිගත් නැත්තත් ඊලග උත්තරේ දවාන්ගේ අතින් පයින් තමා..

" මගේ ඉවසීමේ සීමා පන්නගන්නවා තොපි දැන්..

" එන්න එපා කපනවා මෙකිගේ බල්ල මුලින්..
අඩියක් තියන්න එපා...ඉස්සරහට..

sinhalaebooks.com

දවාත් හිටිය තැනම නැවතුනේ කෙල්ල හින්ද.. කිසිම දෙයක් කරගන්න බැරි තැන අසරණ වුනා..
දවාත් කෙල්ල බැඳලා හිටිය ගහ පිටිපස්සේ ආදී ඉන්නවා දැක්කා.. කොල්ලා ආදී නොදැක්ක ගානට හිටියේ ආදීව නොදැක්ක පතල් කාරයො කෙල්ලවයි දවාත්වයි අල්ලගන්න උත්සහ කලේ..

ආදී අතේ තිබ්බ පොල්ලෙන් සදීනගේ බෙල්ලට පිහිය තියන් හිටිය මනුස්සයගේ ඔලුවටම දමලා ඇරියේ සදීනට තියන් හිටිය පිහිය බිම වෙටෙද්දී ඒ මනුස්සයත් ඇඳන් වැටුනා..
දවාත් ඒ සැතින් පැනලා ඔක්කොටම ගහගෙන ගියේ ආදී එක්කම එකතුවෙලා..

සැහෙන වෙලාවක රණ්ඩුවෙන් පස්සෙ දවාත් කෙල්ල ලඟට ආවේ එතන හිටිය ඔක්කොටම වැටෙනකම් ගහලා..

" මගේ කෙල්ල.. පව්..
නරුම හැත්ත...

දවාත් කෙල්ලව ලිහලා කකුල් දෙක උඩින් තියාගත්දිත් කෙල්ලට සිහිය නෑ.. අත් දෙකයි කකුල් දෙකයි තුවාල වෙලා තිබ්බා හොඳටම..

" සදීනා... කතා කරන්නකෝ
බය නොකර ඇස් අරිනවා ඕයි..
මේ දවාත් බයයි උඹ ඔහොම ඉද්දි..
අනේ..මෙහෙ බලනවකෝ...

" ඒ දවාත් මේ වතුර ටිකක් ඉහපන්කෝ..කෙල්ලට සිහිය නැතිවෙලා ඇත්තේ බයටත් එක්ක..

ආදී ගෙනත්දීපු වතුර ටික සදීනගේ මූනට ඉහිද්දි කෙල්ල කෙඳිරි ගෑවා.. දවාත්ගේ මූනට හිනාවක් ආව කෙල්ල ඇස් අරිද්දි..

" ද් දවා ත් ම හ ත් ත යා ඔ යා ට මො ක ද වු නේ......

" මට මොකුත් වුනේ මෑ මැණිකේ..
සොරි ඔයාට විහිලුවක් කරන්න ගියේ.

දවාත් කෙල්ලගේ ඔලුව පිරිමැදලා ඒ ටික කිව්වේ සදීනගේ ඇස් දිහා බලන්

" කියුට් යෝ අනේ සොරි...

sinhalaebooks.com

ආදී කෙල්ලගේ මූනට එබිලා කිව්වේ. සදීනට ඔලුව උස්සන්නවත් බැරිතරම් බරයි.. කෙල්ලට දවානුයි ආදී කියන ඒවා ඇහුනා.. ඇස් වලින් කඳුලු හෝ ගාලා ආවේ ආදී දවානුයි දෙන්නා විහිලු කරලා කියලා කියද්දි..
කෙල්ලට දුකයි..

" කෝ නැඟිටින්න දැන්.. අපි යමු..
අම්මත් බයවෙලා අත්න හොඳටම..
අයාත් අඬනවා ඇති එයාගේ ආම් නැතුව..

දවාත් එහෙම කියලා කෙල්ලව අල්ලගෙන හිටගන්න උදව් කලා..ඒත් සදීනගේ ක්කුල ඉදිමිලා තිබ්බේ හොඳටම වැටුන පාරට කකුල ඇඹරුන නිසා..

" ආව්..ආයි. මගේ කකුල..

දවාත් බැලුවේ කෙල්ලගේ කකුල දිහා.. රතු වෙලා සුදුකකුල.. පිට්ටුවක් වගේ ඉදිමිලා..
දවාත්ට කෙල්ල ගැම දුකයි.. හැමදේම වුනේ තමන් හින්ද කියලා..

දවාත් කෙල්ලව උස්සලා අත් දෙකට ගත්තේ සදීනා ඇස් ලොකු කරන් ඉද්දි..

" ආදී මහත්තයා ... මාව බිමින් තියන්න කියන්න..
මට යන්න පුලුවන්..

දවාත් එක්ක කෙල් ල තරහා වෙලා.. මේ හැමදේම දවාත්ගේ බොරුව නිසා වුනේ කියලා කෙල්ල දැන් දන්නවා..

" ඇහ්.. ඒත් කියුටි ඔයාට ඇවිදින්න බෑනේ..
මේ මූ එක්කන් යයි ඔයාව..

" ම ට බෑ.. ආදී මහත්තයා එහෙනම් මාව එක්කන් යන්න..

දවාත් බැලුවේ පපුව ළග තියෙන කෙල්ලගේ මූන දිහා..
දවාත් දිහා වැරදිලාවත් බලන් නෑ සදීනා හිටියේ අහක බලන්..

" මගේ මාරයා අවුස්සගන්න එපා උඹ..
කටපියන් හිටු.. ඔහොම..

දවාත් දත් එකට තද කරන් සැරට කිව්වේ කෙල්ලගේ කනට කරලා.. ආදී එක්ක යන්න හදපු එකට දවාත්ට කේන්ති ගියා. කෙල්ලට ඕනේ වුනේ දවාත්ගෙන් ඈත් වෙලා යන්න..

" අරුන් ටික කෑවා හොඳ කෑමක් බන්.. එකෙක්ට සිහියක් නෑ .. දෙතුන් දෙනෙක් පැනලා දිව්වා.. නැත්තන් උන්ටත් නෙලනවා ඔන්දස්පොට් වෙන්ඩම..

sinhalaebooks.com

ආදී කිව්වේ දවාන්ට.. කොල්ලා සදීනව උස්සන් ඉස්සරහින් යද්දි ආදී කියව කියව පස්සෙන් ආවේ..

" ගහලා මදී තිරිසන්නු.. ඕවුන්ට දෙන්නම් සප් එක..
ආදී උඹ පොලිසියට කිව්වද..

" නෑ බන් මට කෝල් දෙන්න බැරිවුනා උඹ පස්සේ මාත් දුවන් ආවා.. උඹ මගක් ආවම නේ එ මගුල කිව්වේ මන් කෝකටත් කෝල් නොකර උඹ හොයාන් ආව..

ආදිට පොලිසියට කියන්න වෙලාවක් තිබ්බේ නෑ කොල්ලත් දවාන් පස්සේ ආව නිසා..

" ඒකත් හොදයි.. මන් දෙන්නම් ඕකුන්ට උන් හිටි තැන් නැතිවෙන්න ගේමක්..

දවාන්ලා කොළඹ එද්දි රෑ වුනා.. සදීනට මගදිම බෙහෙත් අරන් දෙන්න වුනේ කකුල හින්ද කෙල්ලට හොදටම උණ ගත්ත නිසා..කෙල්ලට අමාරුවටම වාහනේම නින්ද ගියා තුවාල වල අමාරුවයි උණයි ඔක්කොම එකතු වෙලා සදීනට ඇස් අරින්නවත් බැරිතරම් අමාරු වුනා..

" ඔයින් ගියා මදෑයි පුතා. මන් බයවුනා කෙල්ලට කරදරයක් වුනාද කියලා..

" මූ තමා රවට්ටන්න අරහෙම කතාවක් කිව්වේ ආන්ටී..
මන් ඉතින් ගිහින් කිව්වා ඊට පස්සේ...

කෙල්ලව ගෙදර ආව ගමන් ඇදෙන් තියලා දවාන්ලා කතා කලේ සිද්ද වුන දේ ගැන.. සමදරා හිටියෙ හොදටම බය වෙලා . සදීනගේ ජීවිතේ අද නොසැලකිලිමත්ව අවදානමට වැටුනේ.. සමදරාට් ඒක මතක් වෙද්දිත් ඇගේ ලේ වතුර වුනා.. කෙල්ලට දෙයක් වුනානම් මේ කතා කිසිදේකින් වැඩක් වෙන් නෑ කියලා දන්නවා..

" හරි හරි දැන් ඔක්කොම හරිනේ.. ආදී උඹටත් යමන් රෑ වෙලා දැන්.. මාත් නිදාගන්න යනව..
අහ් ආදි.. උඹ උදේ වරෙන් ඔෆිස් එකට ගිහින් එන්න ඕනේ හෙට..

දවාන් ඇදන් හිටිය ශටර් එකේ බොත්තම් බුරුල් කරන ගමන් ආදිට කිය කියම ගියේ කාමරේට යන්න..

" හරි බන්.. මන් උදේ එන්නම්..
එහෙනම් ආන්ටී මාත් කැපෙනව... අද මහන්සී පට්ටට..

" පරිස්සමින් යන්න පුතා...

sinhalaebooks.com

සමදරා ආදිට කියලා ආවේ නිදගන්න යන්න.. රණබාහු දවස් කීපෙකට එලියටගියායින් සම්දරා හිටියේ වැඩ ගොඩක් එක්ක ඒ අස්සෙත් අද සිද්දවුන දේත් එක්ක හිතට හරිනෑ කොහොමවත්.. සදීනා ගැන බලන්න බැරිවුන එකට හිතට දුකයි..

" අම්මා.. දරුවා මත් ගාව නිදිකරවගන්නම්..
සදීනට අද කරදර කරන්න එපා අමාරු ඇති ඇඟට..

දවාන් පඩිපෙලේ මග ඉදන් සමදරාට කියද්දි බැලුවේ දවාන් දිහා පුදුමෙන් වගේ.. කොල්ලගේ කටින් ජීවිතේ මෙහෙම දෙයක් බලාපොරොත්තු වුනා.. ඒත් මේ විදියට් මෙච්චර් ඉක්මනට නෑ.. විස්වාස කරන්නත් බෑ දවාන්ගේ වෙනස..

" ම්ම් හ්... හා පුතා.. නීලා ට කිරි එක දීලා එක්කන්
එන්න කියන්නම්..

දවාන් දන්නවා අම්මා ඉන්නේ හිත දෙගිඩියාවෙන් කියලා .. ඇත්ත මෙච්චර දවස් එපාම කියපු දරුවා අද
ලගට ඉල්ලද්දි පුදුම වෙන එක සාදරණයි .. ඒත් දැන් මේ හිත වෙනස් වෙනවටවඩා මොනවද දෙයක් ඉල්ලනවා.. ඒක මෙහෙමයි කියන්න දවාන්ට තේරෙන් නෑ.. සදීනා අයාන් මේ රූප දෙක අයාන්ගේ හිත වටේ ඇවිදින්නේ අමු සොහොනක් පන්සලක් කරන ගමන්.

..................................................................................

සදීනා දවස් දෙකක්ම එක දිගට නිදගත්තේ ඇඳෙන්වත් බහින් නැතුව.. කෙල්ලට උණ ටිකක් බහිනකන් සමදරා වගේම දවානුත් කෙල්ලට නිති දැම්මා ඇඳෙන් බහින්නවත් නොදී...

" අනේ නැන්දේ.. මට මෙහෙම ඉන්න බෑ...
ආයුව ඕනේ.. මට කොල්ලා බලන් නැතුව ඉන්න බෑ..
අඩනවද කොල්ලා මත් නෑ කියලා..

සදීනා නීලට කරදර කලේ අයාන්ව ඉල්ලලා.. පොඩි දරුවා සදීනා ලගට ගෙනාවේ නෑ කෙල්ලව දැක්කම කොල්ලා අඩන්න ගන්නවා කෙල්ලගේ අතට යන්න.. කකුලත් එක්ක සදීනට් අයාන්ව වඩාගන්නවත් බෑ ඒ හින්ද අයාන් හිටියේ දවාන් ලග දවස් දෙකේම..

" ආයු බබා ලොකු බෙබි ලඟ නිදගත්තේ මේ දවස් දෙකේම.. අප්පේ බලන්න එපැයි උදේට දෙන්නගේ කෝලම්.. ආයු බබා ලොකු බේබිගේ ඇඟ උඩ නිඳගත්තේ.. හරි ශෝක් සදීනා මිසී දක්කනම් ආස හිතෙයි..

සදීනාගේ ඇස්වල කඳුලු කෙල්ලට සතුටුයි දවාන්ට ආයු ලන් වුන එක.. එත් කොල්ලා තමන්ගේ ඇතට යයි කියලා සදීනට බය හිතුනා.. පපුව රිදෙන්න ගත්තා.. දවස් දෙකක් කොල්ලා තමන් නැතුව දවාන් ලග හිටියා කියන්නේ ආයුට කවදහරි දවාන් හොදටම ලං වුනාම කෙල්ලව අමතක වෙලා යයි කියලා හිතුනා..

sinhalaebooks.com

කෑ ගහලා අඩන්න හිතුනා..

මාස නවයක් කුසේ තියන් නොහැදුවත් දන් අයාන් කියන්නේ කෙල්ලගේ හුස්ම ටික.. රෑ මැද නින්දෙන් කෙල්ල අයාන්ව හෙව්වා දවස් දෙකේම..මතක් වුනා ඇඩුවා ඒත් අයාන් ට කෙල්ල නැති අඩුව දැනිලවත් නෑ කියලා හිතෙද්දි දරා ගන්න අමාරු වුනා..

" මගේ ආයු.. ඔයාට අම්මාව අමතක වුනාද තාත්තා ලගට ගියාම..
මගේ පුතු ... ඔයා.. මගේ විතරයි..
කාටවත් දෙන්න බෑ මට දන්.. අනේ මට ලෝබයි
මට බයයි...
එයාලා මගෙන් උදුර ගනීද ආයුව..
බෑ බෑ මට බෑ.. දවාන් මහත්තයා ට දෙන්න බෑ
මට ඕනි.ආයු මගේ..
එයාට මාව අමතක වෙයි.. මමයි අම්මා මම විතරයි..
ආයු.............අනේ.....මගේ පුතු පැටියා..

කෙල්ලගේ හිත කෑ ගහලා අඩනවා.. ඒක මව් සෙනෙහසමයි.. ඒ ආදරේ අව්‍යාජයි ඒත් ලොබයි.. දවාන්ට කොල්ලව ලන් කරන්න හැම්දේම කලේ ඒත් එක දවසක් කොල්ලා දවාන් ලගට ගියාම කෙල්ලට බයයි.. ඊෂ්‍යාර්යි ඔක්කොම එකතුවෙලා.. පිස්සු හැදෙන්න වගේ ..

දවාන් ඔෆිස් එකට ගියේ ඉස්සර හිටිය දවාන් වෙලා.. කොල්ලට හීන ගොඩක් හිතට ඇවිත්.. අඩියෙන් අඩිය වෙනස් වෙනවා ජීවිතේ කියලා දැනෙනවා..

දවාන්ගේ මූන හිනාවක් තිබ්බා උදේම ඔෆිස් එකේ හැමෝම වෙනුවෙන්.. දකිද්දිත් හිත පිරිලා යන්න..

" අම්මේහ් බලපන්කෝ හිනාව... මල් හතයි ආ..

දවාන් කැබින් එකට එද්දි ආදි ඇවිත් හිටියා උදේම..කොල්ලගේ හිනාවට ආදි කිව්වේ. කාලෙකින් දවාන්ගේ මූනේ හිනාවක් දැක්කේ..

" ඇයි අපි හිනාවුනාම මොකද වෙන්නේ..
ඒක නෙමේ උඹ උදේම ආවේ..මෙහේ..

දවාන් පුටුව පස්සට අරන් වාඩිවෙන ගමන් ඇහුවේ..ආදී උදේම ඔෆිස් එකට ආව නිසා..

" ඒක දෙවෙනියට කියන්නම්.. ඉස්සල්ලම කියපන් අපේ කියුටියා හොදින්ද.. කෙල්ලට කොහොමද දන්..

sinhalaebooks.com

දවාත් හිනාවුනා ලස්සට ආයෙම .. ආදිට හිතාගන්න පුලුවන් දවාත්ගේ හිත.. කොල්ලා සදීනා ගැන හිතනවා කියන්න ආදි දන්නවා.. කොල්ලව අවුස්සන්නේ ඒ හින්දමයි..

" දැන් අඩුයි.. හැබැයි මන් එක්ක තරහයි තාම..
උදේයි හවසයි හොරාට තමා බලාගන්නේ ඒකිව..
මහරජිණි මන් දැක්කමත් ගස්සනවා ගැස්සිල්ලක්
ආයේ මූණ පුම්බගෙන ඉන්නේ..

විහිලුවක් කරේ කියලා ඕකිට තේරෙන් නැනේ.. හරි වැරදී කියමුකෝ..මන් බේරගත්තනේ ඒකිව..

මගුල වෙලාවකට දෙන්න හිතෙනවා මට දත් ටික එලියට එන්න..රවාගෙන ඉද්දි.. රෙද්ද..

දවාත් කියාගෙන යන විදිය ආදි බෙල්ලත් ඇඳ කරන් බලන් හිටියේ දවාත් මේ කියන්නේ සදීනා ගැනට වඩා දවාත්ගේ ආදරෙව් ගැන කියලා හිත හිත.. ඒ හැම වචනෙකම තිබ්බේ සදීනා වෙනුවෙන් ආදරේ..

" උඹ කියුට්ට ආදරෙයි..

දවාත් ගැස්සුනා.. ආදී මේසේ උඩ තිබ්බ වීදුරු බෝලේ කරකව කරකව ඒක කිව්වේ දවාත්ට ඇහෙන්න..

" නෑ පිස්සු ද.. ඒ මගේ වැඩකාරී..
මන් මේ කියන්නේ මනුස්සකමට..

" ආ ආ ආ.. ඒක මරු මනුස්සකම..
අනේ නිකන් පලයන් යකෝ.. උඹ හිතුවද මන් තණකොල කනවා කියලා..බූරුවා..
අරකිට ලව් මූනෙන් පේනවා මනමාලකම
ඇහුව ම අපට පිස්සුද අහනවා..

පාතිය දන්ඩ එපා මෙ ආදිට.. මන් ලව් ඔස්තාර් ඕකේ මිස්ට දවාත් පාරමිත්..

දවාත්ට උත්තර නෑ.. ඇත්ත සදීනට ආදරෙයි..ඒත් එක හංගන් ඉන්න තරමට දවාත් ට සැනසීමක් වුනා..

" හරි හරි .. ඒක නෙමෙ උඹ ආවේ..කිව්වේ නැනේ ඒක..

දවාත් කතාව වෙනස් කරගත්තේ සදීනා ගැන තවත් කතා කරන්න ඕනි නැති හින්ද..

" උඹ දන්නවද.. කම්පැනි එකේ තත්වේ දැන්.. උඩ දන් ගෙදරට වෙලා පිස්සු නටලා..

sinhalaebooks.com

අන්න සිල්වෙස්ටර් අංකල් කම්පැනියේ ෂෙයාස් ටික ආපහු ගන්න හදනවා බත් වෙන එකකට දෙන්න..

දවාන්ට පුටුවෙන් නැගිට්ටුනේ ඉබේටම.. දවාන්ගේ කම්පැනියේ ප්‍රධානම තැනක් සිල්වෙස්ටටර් තිබ්බේ.. ඒ අත අතැරුනොත් සැහෙන්න එරෙනවා..කොල්ලට දඩිය දැම්මා ආදී කියද්දි ..

" අඩෙ මචන්.. මන් ඉවරයිඑහෙම වුනොත් ආ..
ගොඩ ද ගන්න ඕනේ පොරව කොහොම හරි..

දවාන් ඔලුවේ අත ගහන් කලපනා කලේ කරන්න දෙයක්...

" නෑ මෑ කලබල නොවී හිටාන්කෝ පොර ඕක තාම ප්‍රසිද්ද කරලා නෑ.. හිතන් ඉන්නවා කියල විතරයි කියලා තියෙන්නේ.. දැන් උඹ වැඩ පටන් ගත්ත නිසා ශේප් කරගන්න පුලුවන්..

දවාන් දවසම කලේ කල්පනා කරපු එක.. අනිත් ඔක්කොම බිස්නස් හැන්ඩ්ල් කලේ මේකෙන්.. ලොකුම කම්පැනිය වැටුනොත් ඉවරටම ඉවරයි කොල්ලා දහ අතේ හිතුවා..

දවාන් ගෙදර ගියේ රෑ වෙලා.. ඔෆිස් එකට වෙලා පරන ෆයිල් ඇදන් කොල්ලා පහුගිය මාස වක කම්පැනියේ අලාභ චෙක් කලා.. ඒ ඔක්කොම තිබ්බේ අඩු වෙලා කොල්ලට එකපාර ඔලුවත් එක්ක අවුල් වුනා..

ගෙදර ආව ගමන් සදීනා හොයන් කාමරේට ගියේ කෙල්ලගේ මූන බලලා චුට්ටක් හරි සැනසෙන්න..
සදීනා පොතක් බල බල ඉදලා කොල්ලා ඇතුලට එද්දිම හොරට නිදගන්නවා දැක්කා

" බකමූනි... හොර කෙල්ල..
තවුසේට කෝමද දැන් මිම්ම්ම්..
කෝ බේත් බිව්වද.. කකුල අඩුයිද........

දවාන් ඒක ඇහුවේ ආදරෙන්.. සදීනා නෙවෙයි ඇස් ඇරියේ.. කෙල්ල නැහුන ගානට හිටියා..

" මන් දන්නවා තමුසේ හොරට ඉන්නේ කියලා..
ආයෙ ආයේ මට එකම කියන්න බෑ සදීනා..

සොරි සොරි සොරි සොරි.................

මේ අවසාන වතාව... කතා නොකෙරුවොත් ආයාන්ව දෙන් නෑ අදන්.. කොල්ලා ඉන්නේ මන් ළග ඔන්නම්.. මන් එක්ක යාලුවෙලා ගන්නවා..

sinhalaebooks.com

කෙල්ලගේ උගුරේ කෙලත් හිදුනා ඒ ටික කියද්දි.. දවාන් එහෙමම නැගිටලා කාමරෙන් එළියට ගියේ සදීනා බැලුවෙවත් නැති එකට දුකෙන්..

" මන් කතා කරන්නෙම නෑ..මාව විහිලුවක් එයාලට
අයාන්ව මගෙන් උදුර ගන්නවා කියලා මන් දන්නවා දවාන් මහත්තයා මන් දන්නවා.. ඒක ඔයා මට කියන්න ඕනි නෑ..
ඔය ටික කියලා යන්න ආවට වඩා හොදයි ඔහොමම මගේ බෙල්ල මිරිකලා මරලා ගියානම්..

සදීනා අඬ අඬ හිටියා මිසක් රෑට කෑවෙත් නෑ.. නීලා කෑම එක අරන් ආවත් කෙල්ල කොට්ටයක් බදාගෙන හිටියා මිසක් කතා කලේ නෑ.. ආයාන්ව ළගට දෙන් නැති එකට කෙල්ලට තිබ්බෙ දුකක්..

සමදරා දවල්ට නීල ලග අයාන්ව තිබ්බේ කෙල්ලට අමාරු නිසා.. ඒත් සදීනා ඉන්නේ බයෙන් හින්ද කෙල්ල හිතන්නේ දැන් දවාන් කෙල්ලගෙන් ආයාන්ව ගනී කියලා..

ආයාන් ළග නැතුව ගෙවන තුන්වෙනි රෑ නින්ද ආවෙම නෑ කෙල්ල හොයාගෙන .. ඇඳේ එන කොල්ලගේ කිරි සුවදට සදීන ඉව අල්ල අල්ල හිටියා.. දරාගෙනෙන්න බැරිම තැන කෙල්ල නැගිට ගත්තේ අමාරුවෙන්

" මට බෑ ඉන්න.. මන් යනවා ආයු ඉල්ලගන්න..
මට තවත් ඉන්න බෑ මෙහෙම..

දවාන්ටත් නින්දක් තිබ්බෙ නෑ ඔෆිස් එකේ ප්‍රශ්නේ කොල්ලගේ ඔලුව විකාර කරා ඒ මදිවට ගෙදර ආවම සදීනා කොල්ලට මූන දෙන් නෑ.. මේ ඔක්කොම දවාන්ට නින්ද නැතිකලා..

දවාන්ට තුරුල් වෙලා කොල්ලා සැපට නිදි..
කොල්ලා ඇහැරලා ඉදන් ආයාන්ගේ පස්සට තට්ටුවක් දඅන ගමන් කල්පනා ක්ලේ ඉස්සරහට කරන්න දෙයක්.

ආයාන් නින්දෙන් කොල්ලගේ පපුව අතගානවා හෝ ගාලා..
දවස් දෙකේම දවාන් ඒක දැක්කා.. කොල්ල නින්දෙන් කට හද හද පපුව අස්සේ ඔලුව ගහ ගන්නවා..
ආයාන් හොයන්නේ සදීනගේ පපුව ඒ උණුහුම..කොල්ලා සදීනා ලග ඉද්දි කරන හොර වැඩක් ඒ. දවාන්ට අහුවුනා.. ආයාන් කෙල්ලගේ පපුව අස්සෙ ඉදන් කෙල්ලව අම්මා කරන් කියලා දවාන්ට හිතුනා..

" සදීනා ඔයා එතකොට.. දෙයියනේ මන් හිතන දේ හරි ද...

sinhalaebooks.com

දවාත් ඇඳෙන් බිමට පැන්නේ ඉබේටම වගේ...සඳීනා එච්චර දෙයක් කරයි කියලා දවාත් හීනෙකින්වත් හිතුවේ නෑ.. කෙල්ල ගැන සතුටු වෙන්නද දුක් වෙන්නද කියලා දවාත්ට හිතාගන්න බෑ..

" දවාත් මහත්තයා..

කියනකොටත් කෙල්ල දොර ලඟ.. දවාත් දොර ඇරියේ කලබලෙන්.. සඳීනා දැක්කා දවාත් ඉන්නේ බය වෙලා කියලා..ඒත් කෙල්ල ආවේ අයාන්ව ඉල්ලගන්න.. නින්ද යන් නැති හින්ද..

"සඳීනා.. ඔයා මේ රෑ..

දවාත් බැලුවේ කෙල්ලගේ ඔලුවෙ ඉඳන්ම .. රෑ ගවුමපිටින්ම ඇවිත්.. කොණ්ඩේ ඔහේ ඇවිස්සිලා ගිහින් මූන මැලවිලා..කෙල්ල අඬලා කියලා දැක්ක ගමන් කියන්න පුලුවන්..

" අනේ දවාත් මහත්තයා.. ආයුව දෙන්න මට..
නින්ද යන්නෑ එයා නැතුව..
මට සමාවෙන්න.. මට් ඉන්න බෑ කාමරේ..
අනේ.. චුට්ටක් දෙන්න..අදට විතරක්වත්..
මට දැන් සනීපයි..මේ කකුල හොඳ වෙලා..
අනේ දෙනවද....

දවාත්ගේ ඇස් වලින් කඳුලු ආවේ නොනැවතීම.. සඳීනගේ තොල් උඩින් අත තිබ්බේ ඔය ඇති කියන්න.. එහෙමම කෙල්ලව උස්සලා අරන් දොර වහන් ඇවිත් කෙල්ලව තිබ්බෙ නිදගෙන ඉන්න අයාන් ගාවින්..

කෙල්ල අසිහියෙන් වගේ අයාන්ව තුරුල් කරන් සිපගෙන ගියේ දවාත්ට ඒ ආදරේ ඉස්සරහා කරන්න කිසිම දෙයක් නැතුව නිරුත්තර කරලා

" බය වුනා ද.. හැමදාටම අයාන්ව මන් ගනී කියලා..
ම්ම්..

කෙල්ල කතා කලේ නෑ.. අයාන්ව තුරුල් කරන් ඇඬුවා හොඳටම..

" වදින්නම් මන් ආයුව මගෙන් ඈත් කරන්න එපා මහත්තයා..මාව මැරිලා යයි. දවසකටවත් එපා..

කෙල්ල වැන්දේ දවාත්ට අත් දෙක එකතු කරලා..

" සඳීනා මාව ඔච්චරටම අවිස්වාසාද.. එහෙනම් ඇයි අයුව මට ලන් කරන්න හැදුවේ..ම්ම්ම්..

sinhalaebooks.com

ඔයාට හිතෙනවනම් මන් ළමයව ඔයාගෙන් ඈත් කරයි කියලා. මන් අයාන්ව අත අරින්නම්.. ඔයාට දෙනවා මන් ලොබ නැතුව..ප්ලීස් මන් ගැන ඔහොම හිතන්න එපා..

සදීනා කලේ අඬපු එක.. දවාන් ඇඳ ලග ඉදන් හිටියෙ කෙල්ලයි අයානුයි දිහා බලන්.. මේ ආදරයක් නෙමෙයි..සංසාර බැදීම්ක් දවාන්ට ඕනේ මේක කඩන්න නෙවෙයි..ඒ බැඳීම අස්සේ මහා පවර්තයක් වෙලා රැකගන්න.. ඒත් සදීනා හිතන විදිය ගැන කොල්ලට දුකයි

" දවාන් මහත්තයා .. ආයු මගේ නේද හැමදාටම..

දවාන්ට හිනාවක් ගියා සදීනා එක අහපු විදියට..
කොල්ලා ඇඳේ උඩ පැත්තෙන් ඇවිත් කෙල්ලගේ ගවුමට වැහිලා තිබ්බ එක පියයුරු තුඩක් අරන් ආයාන්ගේ කටින් තිබ්බෙ කෙල්ල ඇස් ලොකු කරන් බලන් ඉද්දි..
සදීනට ලැජ්ජා හිතුනා. බයත් හිතුනා..ඒත් ඒ වෙලාවේ දවාන්ගේ ඇස් වක තිබ්බෙ ගෞරවයක් .. ඒ ඇස් වල කෙල්ලගේ ඇගක් ගැන අල්ප මාත්‍රයකවත් රාගයක් තිබ්බෙ නෑ..

සදීනා දැක්කා ඒක.. මේ හොර රහසේ අයාන් ලගට ආපු දවසේ ඉදන් කරපු දෙයක්.. කිරි නැතත් ආයු වෙනුවෙන් ඒ උණුහුම දුන්නා..

අයාන්ගේ අම්මා ඔයයි සදීනා.. ඒ ඔයා..විතරමයි
මේක අයාන්ගේ තාත්තා විදියට මන් ඔයාට දෙන අයිතිය...
මීට වඩා මට ඔයාට දෙන්න විස්වාසයක් නෑ..

දවාන් එහෙම කියලා කාමරෙන් එලියට ගියේ
ඇස්වල එන කඳුලු සදීනට නොපෙනෙන්න
දවසින් දවස ජීවිත පොතේ ලියවෙන්නේ අලුත්ම පිටු ඒ හැම පිටුවකම අලුත්ම කතාවක් ලියවෙනවා කියලා සදීනට හිතෙන්නෙ..

මම පහන් අයියට කරන්නේ ද්‍රෝහි කමක්ද..
මන් ඒ ආදරේ අමතක කරලා දලාද දැන්..

නෑ නෑ සදීනා ඔයාට බෑ එහෙම කරන්න.. ආයාන් කියන්නේ ඔයාගේ මුලු ජීවිතේම වෙන්න පුලුවන් ඒත් පහන් කියන්නේ ඔයාගේ ආදරේ..
ඒ ඇස් කවදහරි ඔයා එනකම් බලන් ඉන්නවා..
ඔයාට මේ හැම දේම මෙහෙ තියකා දවසක යන්න වෙනවා ...

කෙල්ලගේ හිත කෑ ගහනවා .. අයාන්ගේ අම්මා කියන වගකීම එක්ක කෙල්ලට ජීවිතේ හුගක් දේවල් අත ඇරෙන්න යනවා කියලා හිතුනා..

ලොකු නෝනා මට පොරොන්දුවක් දුන්නා..
කවදහරි මාව ගෙදර යවනවා කියලා ඒත්
එහෙම දවසක් ආවොත් මන් මොකද කරන්නේ..

sinhalaebooks.com

මත් කොහොමද යන්නේ..
මට මේ හැම දේම දාලා යන්න පුලුවන් වුනත් ආයු දාල යන්න බෑ..
දෙයියනේ මාව ආදරෙයි සෙනෙහසයි මේ දෙක මැද්දේ අතරමං කලේ ඇයි..
අයාන් නැත්වුනොත් මන් පිස්සියක් වෙයි..පහන් අයියව නැති වුනොත් මන් අනාථ වෙයි..
වෙන පිරිමියෙක් ළගට යන්න බැරි තරමටට මන් පහන් අයියගේ වෙලා ඉවරයි..

සදීනට නින්දක් ආවේ නෑ කෙල්ල අයාන් තුරුල් කරන් ඇඩුවා .. අයාන් කෙල්ලගේ පපුවේ එල්ලිලා නිදි..
ඉස්සරහටබෙන හැම දවසක්ම කෙල්ලට අමාරු දවස් වෙයි කියල හිත කිව්වේ.. දැන් දවාන් අයාන්ව පිළිඅරන් ඉවරයි.. අයාන්ගේ ජීවිතේ ලැබෙම්ම ඕන අයිතිය දවාන්ගෙන් දැන් ඕනාවටත් වඩා හම්බෙයි..
ඒත් සදීනට කොහේ කොතන කොයි විදියට නවතින්න වෙයිද කියලා හිතාගන්න බෑ..

සදීනා වගේම දවානුත් ඇවිලුනා.. කොල්ලා පහළට වෙලා සිගරට් එකක් දල්වගෙන ඉඳගත්තේ මේ වෙන හැමදේම එකිනෙක ජීවිතේ වෙනස් කරනවා කියලා හිත හිත..ම සදීනට කියන්න ඔක්නේකම තියනවා අයාන් වගේම තමන්වත් කෙල්ල ළගට ගන්න කියලා..
ඒත් දවාන්ට බෑ එහෙම දෙයක් එකපාර සදීනට කියන්න..

මන් දන්නෑ සදීනා උඹ කොහොම කෙල්ලෙක්ද කියලා
මෙච්චර ආදරයක්..
තාත්තා වුන මන් ළගවත් නොතිබුන ඒ ආදරේ උඹ අරන් ආවේ කොහොමද..
මට තේරුම් ගන්න බෑ සදීනා ඔයාව.
ඒත් දැන් මට ජීවත් වෙන්න ආස හිතෙනවා..
ඔයාලා දිහා බලන් හැමදම ඉන්න ආස හිතෙනවා..

දවාන්ගේ හිතත් හේතු හෙව්වා මේ වෙන හැම දේටම..
කොල්ලා පැයක් විතර ඉඳලා කාමරේට ගියේ කෙල්ලයි අයානුයි නිදිද බලන්න..
දවාන්ට දුකයි අඩිය තියාගන්නත් බැරුව කෙල්ල කොහොමහරි උඩට ඇවිත් ඉල්ලුවම්වේ අයාන්ව..
හවස අයාන්ව දෙන් නෑ කියඹෘ නිසා කෙල්ලට බය හිතෙන්න ඇති කියල හිතුනේ..

දවාන් කාමරේට ඇතුල්වෙලා බැලුවේ සද්ද නොකරම.
කෙල්ලයි අයානුයි නිදි.. දවාන් ඇඳේ තිබ්බ කොට්ටයක් අරන් පහළට යන්න ගියේ සෝෆාවේ නිදාගන්න

" දවාන් මහත්තයා..ඉන්න...

දවාන් බැලුවේ කෙල්ල දිහා.. සදීනා පරිස්ස්මට ඇඳෙන් වාඩි වුනේ ආයු ඇහැරෙයි කියලා පරිස්සමට..

" ස දී නා .......

sinhalaebooks.com

නිදි නැද්ද තාමත්

" මට සමාවෙන්න මහත්තයා..
මෙහෙම ආවට.. මට ඉන්න බැරි නිසාමයි ආයු හොයාගෙන ආවේ..
මහත්තයා ආයු එක්ක නිදගන්න මන් යන්නම්..
අනික් ලොකු නෝනා දැනගත්තොත් හරි නැතේ මන් දවාන් මහත්තයාගේ කාමරේ නිදගත්තා කියල..
ඒ නිසා මහත්තය ඉන්න මන් යන්නම්..

කෙල්ල කිව්වේ බිම් බලන් දවාන්ගේ මූණ බලන්න ලැජ්ජයි කෙල්ලට.. ඉස්සරලා දවාන් කෙල්ලගේ පපුව දැක්කා ඒක ඒ වෙලාවේ අයුට තිබ්බ ආදරේ හින්ද නොදැනුනත් දැන් කෙල්ලට ලැජ්ජයි..

" පිස්සු නැතුව නිදගන්නවා
අම්මා ඇහුවිත් මන් කියන්නම් අයාන් අඩපු නිසා ආවේ කියලා..
දැන් නිදගන්න.. විකාර හිතන් නැතුව..

දවාන් කාමරේ දොර වහන් එළියට ගියේ හිනාවෙලා
කොල්ලට ඉන්න බැරිවුනත් ඒ කාමරේ සදීනගෙයි අයානුයි ඉන්නවා ඒක කොල්ලට සතුටක්..

............................................................

" නීලා කෝ සදීනා ළමයා... කාමරේ නැතේ

සමදරා කුස්සියට දුවන් ගියේ උදේම කෙල්ලනැති හින්ද කාමරේ..

" නැද්ද නෝනා...දෙයියනේ කොහෙ ගියාද කකුලත් තියන්..මන් බාතෲම් එකේ බල්ලා එන්නම් නොනා

නීලා බය වුනා කෙල්ල කොහෙට වුනාද කියලා..

" එයාලා මගේ රූම් එකේ නිදි අම්මා..

දවාන් සමදරාට කිව්වේ වතුර එකක් අරන් කෑම මේසෙන් ඉඳගන්න ගමන්..

සමදරා බැලුවේ පුදුමෙන් වගේ.. දවාන් සදීනව කාමරේට අරගත්තේ එක සමදරාට හිතාගන්න බැරිවුනා.. දහක් ඒවා සමදරාට හිතුනා..

" ආ ආ ආ ඔහොම බලන්නේ..
කොල්ලා ඇඩුවා හොඳටම.. පස්සේ මන් සදීනා ආවා මන් එයාලට නිදගන්න කියලා සාලේ නිදගත්තා..

sinhalaebooks.com

තිකත් සදීනව බලෙන් උස්සන් ගියා වගේ අම්මා බලන්නේ මත් දිහා..
පිස්සුනේ.. මට ගෑනු ගෙන්නගන්න..

දවාත් ශේප් වෙලා ගියේ සමදරා තිහඬව බලාගෙන ඉද්දි..

ඔයා එහෙම හිතනවනම් හොදයි පුතේ..
සදීනට ලන් වෙන්නනම් හිතන්න වත් එපා එයා අපි ලග සදහටම ඉන්න ආව කෙනෙක් නෙවෙයි..
එයාගේ පොරොන්දුව ඉෂ්ට කරලා එයා යන්න යාවී..
ඔයා සදීනට ලන් වුනොත් ඒක ආපහු ඔයාට දුකක් වෙනවා.පුතේ..

සමදරා හිතුවේ දවාත් යන දිහා බලාගෙන.ඇත්ත සදීනා සමදරාගෙන් ඉල්ලුවේ කවදහරි අයාත් ලොකු වුනාම කෙල්ලට යන්න දෙන්න කියලා..
ඒක ඒ විදියටම කරන්න ඕනේ කියලා සමදරා දන්නවා
ඒ හින්ද හිතට බයයිදවාත් මේ විදියට හොඳ වෙලා සදීනට ලන් වෙයිද කියලා..

දවාත් ඔෆිස් යන්න ලෑස්ති වෙන්න නාගෙන කාමරේට එද්දි තවත් සදීනයි කොල්ලයි නිදි හොදටගුලි වෙලා..

" මුත් දෙන්නා යකෝ... පස්සට ඉර පායනකම්ම නිදිනේ..
කවදහරි මට වෙන්නේ මේකි ගත්තොත් බඩගින්නේ ඉන් න තමා..
දෙන්න හිතෙනවා පයින් එකක් පස්සට ඇඳෙන් බිමට වැටෙන්න..බකමූනී..
.

දවාත් එහෙම කියලා කොණ්ඩේන් බේරුන වතුර බින්දු කෙල්ලගේ මූනට වැටෙන්න පාත් වෙලා ඔලුව ගැසුවේ සදීනා ගැස්සිලා ඇහැරෙද්දි..

කෙල්ල ඇස් ඇරියේ මූනට වැටුන වතුර බින්දු වල සීතලට..

" ද් ද..වා ත් ... මහත්තයා..

" ඔව් ඔව්..දවාත් තමා..තමුසෙලා දෙන්නා කාමරේ බදු අරන්ද... දවල් වෙනකම් නිදි හොදට. මට ඇඳුම් ඇඳගන්නත් නෑ.. අපි ලැජ්ජා බයට හැඳුන කොල්ලෝ අනික... මේ කෙල්ලෙක් පැනලා කොල්ලො දෙන්නෙක්ගේ කාමරේට මල කරදරයක් වුනා දැන්...

දවාත් බොරු තරහක් අරන් කිව්වේ කෙල්ලට..සදීනා ඇඳේ න් බැස්සේ ක්ෂනිකව.. ඇත්තටම තරහා ගිහින් කියලා..

" අනේ.. මට නින්ද ගියා.. පාන්දර කොල්ලා නැගිට්ට නිසා ඇරුනා මටත්.. ඒ නිසා නින්ද ගියේ..

sinhalaebooks.com

මන් යන්නම් .... ආයු නැගිට්ටොත් මට කියන්න..

" සුදු මහත්තයා බයියගන්න ඕම .. මන් කුක්කු හදන් එන්නම්...

අයාන්ව ඉඹලා කෙල්ල යන්න හැරුනේ..

" මට නැද්ද කුක්කු..

දවාත් ඒක කිව්වේ ඇහෙන නැහෙන හඬින්.. කෙල්ලට ඇහුනා එක..
කෙල්ල හොරාට බැලුවේ දවාත් දිහා.. ටවල් එකක් ඇඳන් කොල්ලා ජෙල් ගාලා කොණ්ඩේ හදනවා කණ්නාඩියෙන් බලන්..දවාත්ට පේනවා කෙල්ල බලන් ඉන්නේ කියල..

" මොනවද බලන්නේ..අදත් ටවල් එක ගලවලා දුවන්නද.. ඒවටනම් එන්න එපා බකමූනී හරිද.. කෑ ගහනවා මන් කරදර කරනවා කියලා.. අම්මට ඇහෙන්න..

සදීනට හිනා ගියා..කෙල්ල අහක බලාන් හිනාවුනේ දවාත්ට..
හිතලා කරේ නෑ කෙල්ල ඒක දවාත්ගෙන් බේරිලා යන්න ඕනි හින්ද කරේ එදත්.. ඒත් දවාත් හිතන් ඉන්නේ සදීනා එක කරේ හිතලම කියලා..

" මන් යන්නම් මහත්තයා පහළට..
ආයුව බලන්න ටිකක්..

" මේහ්.. මට තේ එකක් හදනවා හොදේ.. මන් ලෑස්තිවෙලා එන්නම් පහළට..

දවාත් ඒක කිව්වේ කෙල්ල දිහා බලලා ලස්සනට හිනා වෙලා.. සදීනා ඔලුව වැනුවා..
දවාත්ගේ ඒ හිනාව කෙල්ල දැක්කේ අදමයි.. ආවට පස්සේ එහෙම සැහැල්ලුවෙන් කොල්ලා ඉන්නවා දැකලා තිබ්බේ මෑ මීට කලින්..

සදීනා පහළට ගියේ කකුක කොර ගහ ගහ කෙල්ලට අමාරුයි තවත්.. ඒත් අයාන්ගේ වැඩ වලදි කෙල්ලට ඇගට අමාරුවක් දැනුන් නෑ..

දවාත් ගෙදරින් ඔඉට වෙනක්ම්ම හිටියේ කෙල්ක වටේ කැරකි කැරකි.. සදීනගෙන්නේ ඉල්ලගෙන බීලා කොල්ලා කෑම කැවෙන් සදීනාව මේසේ ලග තියන් මොකක් හරි බොරුවක් දලා කෙල්ලව ඇස් ලග තියාගත්තා..

කොල්ලා පිටත් වෙද්දි අයානුත් ඇහැරලා හිටිය නිසා කෙල්ල එලියට ඇවිත් අයාන් ලවා දවාත්ට බායි කියෙව්වා .. දවාත් වාහනේට නැගලා එක පාරක් ආයි බැලුවේ මේ පේනන හැමදේම හීනයක් ද කියලා හිතෙනතරම් අවිස්වාස හින්ද..

....................................................................

sinhalaebooks.com

රණබාහු ගෙදර ආවේ දවස් කීපෙකට පස්සේ හින්ද හවස් වරුවම සමදරාට වැඩ වැඩි වුනා..

" සමදරා ...... ළමා නිවාසෙට ගිහින් වුනා කියන්නේ මොකක්ද අර ළමයට..

රණබාහු තේ එකක් අරන් ඇවිත් වාඩිවුනේ සදීනට සිද්ද වුනේ මොකක්ද කියලා වටින් ගොඩින් ආරංචි වුනත් හරියටම විස්තරේ දැනගන්න..

" අනේ මහත්තයා.. ඒකනම් මතක් කරන්න එපා..
බයවුන තරමක් මන්... මෙ අපේ පිස්සෝ දෙන්නගේ විහිලුවක් හින්ද ඔක්කොම වුනෙ...

කෙල්ල ගඟට කියලා ගිහින් තියෙන්නේ මහ පතල් පැත්තට.. ඒවගේ උන් කෙල්ලව අල්ලගෙන බැඳලාලු හිටියේ ගහක ලමයි යද්දි.. උන් එක්ක ඔට්ටුවෙලා තමා කෙල්ල බේරගෙන තියෙන්නේ ......
ක්කට කියන්නද දෙයක් වුනානම්..

සමදරා පපුවාත්ක් තියාගෙන විස්තරේ කිව්වේ මතක් කරන්නවත් අකමැත්තෙන් එද සිද්දිය්..

" නෑ නෑ හයිකාරයෝ වැඩී කියලා ආරංචී මටත්..
මත් බලාගන්නම්කෝ.. ඔහොම තියෙද්දි ළමා නිවාසේ ලමයින්ගේ ආරක්ෂාවටත් තජර්තයක්නේ..ඔය වගේ උන්ට හොද පාඩමක් උගන්නත ඕනේ..

" මහත්තයා බලාගන්න ඒවා.. මත් දන්නෑ ඔය චන්ඩි වැඩ ගැන..

" කෝ දැන් සදීනා ළමයා..අසනීපයි කිව්වේ අඩුද.. බෙහෙත් ගෙනත් දුන්නද කෙල්ලට සමදරා..

රණබාහු කෙල්ලට හ්්ආදරෙයි..දසුනි ගියපු ද ඉදන් දසුනිට වගේම කෙල්ලටත් සැලකුවා.. දසුනි සදීනයි දෙන්නම දැන් හෙදර ළම යි ගානයි රණබාහුට..

" දවල් ඉදන් කකුල කකියනවා කිය කිය හිටියේ..
ආදී ආවා හවස මත් කොල්ලා එක්ක ඇරියා බෙහෙත් මාරු කරන් එන්න කියලා.. කකුල පෙන්නලා..
තැල්මට ඔය කැක්කුම ගහන්නේ.

සදීනා ඊයේ රෑ පඩිපෙල නැගලා ගිය නිසා කෙල්කගේ ක්කුලේ තැල්ම වැඩිවුනා.. උදෙ ඉදන් රිදුන හින්ද කෙල්ල දවල් සමදරාට කිව්වේ..
ආදි දවාන්ව හම්බෙන්න ආව ගමන් කෙල්ලව බෙහෙත් දන්න ඇරියේ සමදරා..

sinhalaebooks.com

දවාත් ඔෆිස් එකේ ඉඳන් ගෙදර ආවේ සදීනායි ආදී එන්න කලින්.. කොල්ලා ආවේ ඉස්පාසුවක් නැතුව.. ඊයේ රෑ ඉඳන් සදීනව දවාත්ගෙ හිත අස්සට රිංගලා හිටියේ වෙනදටත් වැඩියෙන්..

" පුතා දැන්ද ආවේ...
ඉන්න නීලට කියන්නම් තේ එකක් හදන්න..

ස්මදරා රණබාහු එක්ක කතා කර කර ඉද්දි දවාත් ආවේ.. කොල්ලට තේ එකක් හදන්න කියන්න ගියේ කුස්සියට..දවාත් රණබාහු ලගින් වාඩි වුනේ බෙල්කට හිර වෙලා තිබ්බ ටයි ගැටේ ලිහන ගමන්..
කොල්ලගේ ඇස් තිබ්බේ සදීනගේ කාමරේ ලග..

" කොහොමද පුතා.. ඔෆිස් එකේ තත්වේ..

රණබාහු කාලෙකින් දවාත් එක්ක බිස්නස් ගැන කතාවක් පටන් ගත්තේ .. මෙච්චර කාලයක්ම කලේ දවාත්ගේ ප්‍රශ්න වලටයි තපුරු කමටයි කොල්ලා එක්ක රණබාහු ඇවිලෙන එකනේ.. ඒත් දැන් දවාත් වෙමස් වෙනවා කියලා රණබාහු දන්නවා..

" අවුල් තමා තාත්තා...
අර සිල්වෙස්ටර් කාරයා ෂෙයාස් ටික විකුණන්න හදන්නේ ...
එහෙම වුනොත් මම විනාසයි.. මේ දවස්වල ඔලුව ගිනි අරන් ඉන්නේ තාත්තා..

දවාත් කොන්ඩෙ අවුස්සගෙන අතක් ඔලුවෙ තියන් හිටියේ ප්‍රශ්න එකපිට එක ගොඩගැහෙද්දි ආව පීඩනේ දරාගන්න බැරුව..

" පුතා සිල්වෙස්ටර් ව නම් තරහා කරගන්න හිතන්නවත් එපා..
ඒක ලොකු පාඩුවක් ..අපි ඔක්කොම අනථයි එහෙම වුනොත්..
මැන් තමා අපේ හුගක් ශෙයාස් අරන් ඉන්නේ..

දවාත් හිතුවේ කරන්න දෙයක් මේ ප්‍රශ්න විසදගන්න..

" ආ පුතේ තේ එක..

" මේ මේ කෝ අම්මා පුතා..

දවාත් කෙල්ල ගැන අහන්න බැරි කමට අයාන්ව ඇහුවේ කොහොමත් ආයන් කෙල්ල එක්ක ඉන්නේ කියල දන්න නිසා..

" නීලා එක්ක ඉන්නවා අන්න.. සදීනත් බෙහෙත් දන්න ගියානේ..

දවාත් බැලුවේ සමදරා දිහා...

sinhalaebooks.com

" තනියම...

" නෑ නෑ ආදී එක්ක ගියේ..

කොල්ලගේ තේ එක හිරවුනා කැස්සක් ආවේ ආදී සදීනයි තනියම ගියා කියද්දි..

" මොකද පුතා.. ප්‍රශ්න ඔලුවේ තියන්න කන්න බොන්න එපා..ඔෆිස් එකේ ප්‍රශ්න එහෙ තියලා එන්න පුතා.. ඒක හොද බිස්නස්මන් කෙනෙක්ගේ ගතියක්.. හරිද..

රණබාහු කොල්ලගේ පිටට තට්ටුවක් දන් ඇතුලට ගියා..

සදීනා උඹ අද කරේ හොද දෙයක් නෙමේ..
මන් සින්හලෙන් කිව්වා එද.. උඹට..... එපා කියලා..
අද එනවකෝ ගෙදර...
උඹව මරන්ව මන් අද.අම්මාපා..
මන් එනකන් හිටියනම් මැරෙන් නෑනේ..
උඹට එච්චර ට ඇම්ම ආවා අදී එක්ක යන්න.
වරෙන්කෝ..මන් කකළු ඉතුරේ හන්දි ටිකත් ගලවලා දන්න..

දවාන් දත් මිටි කෑවා.. කේන්තිය දරාගන්න බෑ.. ඔක්කොම ප්‍රශ්න අමතක කරලා කෙල්ල බලන්න ආවේ..ඒත් කෙල්ලගෙනුත් දවාන්ගේ හිතට නිදහසක් නෑ කියලා හිතුනා.. එහෙමම උඩට ගියේ සදීනාව මරන්න තමර් කේන්තියෙන්...

කෙල්ල ආදිඑක්ක ගෙදර ආවේ කකුලට බෙහෙත් දාගෙන.. ඒත් දවාන් ආදි එක්කවත් කතා කරන්න පහලට ආවේ නෑ.. ආදී ගියාම ඔලුව රිදෙනවා කියලා නිදාගත්තා.. සදීනා දවාන්ව හෙව්වා රෑ කෑම මේසෙදී
උදේ විහිලු කරලා ගියත් ගියාමයි දැක්කේ නැති හින්ද..

" නැත්දේ..කෝ දවාන් මහත්තයා..
කෑම කන් නැද්ද...

" එපා කියලා නිදාගත්තේ අද කලින්ම..

සදීනා ඊට එහා මොකුත් අහන්න ගියේ නෑ .. අයාන් එක්ක කෙල්ල ගිහින් නිදාගත්තේ මොකක්දෝ හිතට හරි නැති ගතියක් දැනෙද්දි..

දවාන් දවස් දෙක තුනක්ම සදීනා එක්ක වචනයක්වත් කතා කලේ නෑ.. කොල්ලා පලිගත්තේ ආදීඑක්ක ගියපු එකට
අයාන්ව විතරක් කොල්ලා වඩාගෙන හුරතල් කලා මිසක් කෙල්ලව ගනන් ග්ත්තෙම නෑ..

sinhalaebooks.com

" නීලාඅම්මා කිරි එක දෙන්න පුතාගේ මම පොවන්නම්..

දවාන් කලින් ඔෆිස් එකේ ඉදන් ආව නිසා අයාන්ගේ කිරි එක නීලගෙන් ඉල්ලගෙන කොල්ලව වඩාන් සාලෙට ආවේ කිරි එක පොවන්න..
සදීනා කකුල රිදෙන හින්ද පුටුවක් තියන් කකුල උඩ තියන් හිටියේ අමාරුවෙන්.. කොච්චර එපා කිව්වත් කෙල්ල ඇවිදින එක නතර කරන් නෑ දවසම අයාන් අරන් ඇවිදලා රෑ වෙනකොට කකුල අල්ලන් කෑ ගහනවා..

" අපි කුක්කු බොමු .. කෝ එන්න..

දවාන්ට හරියට ළමයා කකුල් දෙකේ ඉන්දවගන්නත් බැරුව ඔට්ටුවෙලා කොල්ලව තියාගන්නවා සදීනා බලාගෙන.. කෙල්ල සද්ද නොකරම බලන් හිටියේ..දවාන් කරන දිහා..

කිරි බොතලේ ටිකක් හොලවලා දුන් නැත්තන් එන්න පරක්කුයි කිරි.. කෙල්ල ආයුට දෙද්දි හොලවලා දෙන්නේ ටිකක් දවාන් නොදන්න කමට කිරි එක දුන්නට අයාන්ට කිරි එන්නේ නැති හින්ද කොල්ලා අඩනවා.. සදීනට කොල්ලා අඩද්දි දුකේ බෑ.. දවාන්ගේ පණ්ඩිතකමටයි ලොකු කමටයි කෙල්ලටකතා කරන්න හිතෙන්නෙත් නෑ..දවස් ගානක් නිකමටවත් හොදින්දවත් අහන්න බැරි හාම්පුතෙක්ගෙන් කෙල්ලට වැඩක්ම නෑ කියලා හිතුනා.. මනුස්සකමක් නැති දවාන් යකෙක් ගානට දගෙන සදීනා හිටියේ තරහින්..

" ඕක ටිකක් හොලවලා දෙන්න .. ආයුට එන් නෑ ඕකෙන් කිරි..

" ආ ආ.. මන් ඒක දී ගන්නම් තමුසේ ගිහින් ආදී එක්ක රවුම් ගහනවාකෝ තව ටිකක්..

සදීනා පුටුවෙන් නැගිට්ටේ දවාන් දිහා කේන්තියෙන් බලාගෙන..සදීනාට හිතුනදවස් දෙක තුනක් මේ සද්ද නොකර ඉන්නේ මොකක් ම හරි කුනු ගොඩක් හිතේ තියන් කියලා..අද තමා දවාන්ගේ කටින් පැන්නේ..
කෙල්ලට ආදී පාවලා දීලා දවාන් බනින එක ඉවසන්න බෑ.. අනික ගියේ බෙහෙත් දන්න මිසක් වැරදි ගමනක් නෙවෙයි ඒකත සමදරා කියපු නිසා නැත්තන් කෙල්ල කීයටවත් එහෙම ගමනක් යන් නෑ.. ඒත් දවාන් කෙල්ලට බොරුවට අපහාස කරන එකට කේන්ති..

" කරුණාකරලා ඔය ජරා කතා කියන එක නවත්තගන්න දවාන් මහත්තයා.. මම ආදී මහත්තයා එක්ක ක්ලබ් ගානේ නටන්න ගියෙ නෑ.. කාමර ගානේ ලගින්න ගියේත් නෑ. ගියේ කකුලට බෙහෙත් දගන්න ඒකත් ලොකු නෝනා මට බල කරපු නිසා..
මන් ඒ තරම් පහත් ගෑනියෙක් කියලා හිතනවනම් අදම මාව ගිහින් දන්න දවාන් මහත්තයා..
නිකන් පව් පිරෙන කතා නොකියා..

කෙල්ල වේදනාවටම කියාගෙන ගියේ හුස්ම ගන්නෙවත් නැතුව..

sinhalaebooks.com

" කට වහනවා සදීනා..තමුසේට මන් එපා කිව්වනේ කලින් ඌ එක්ක යන්න කොහෙවත්..
තමුසේ කරන්නේ මන් එපා කියන ඒවමනේ..

" ඕන්නෑ බෙහෙතුත්.. කකුලට වෙන මගුලක් වෙද්දෙන්..
මේවා එපා..

කෙල්ලහෝ ගාලා කකුල බැඳලා තිබ්බ ගෝස් පටි ලිහලා දලා බෙහෙත් ගාලා තිබ්බ ඒවා පිහලා නැඟිලා කාමරේට ගියේ තරහෙන්ම පුපුරගෙන..

" පුතේ.. අම්මෝහ්..
කොහොමද බන් මෙ යක්ෂනී එක්ක මෙච්චර කල් හිටියේ..

දවාත් අයාන්ගෙන් ඇහුවේ ඔලුව බදගෙන.. සදීනගේ කේන්තිය කෙල්ල හොදට ඉද්දි තියෙන අහිංසක කම වගේ දෙතුන් ගුණයක් කියලා දවාන්ට හිතුනා..දවාන්ගේ වචන වලට සදීනගේ හිත රිදුනා හුගක් එත් ඒක පිටට නොපෙන්වා සාමාන්‍ය වෙන්න උත්සාහා කලා කෙල්ල.

" ආයු... ඔයාගේ තාත්තා හිතත් ඉන්නේ මන් එයාගේ හිරකාරෙයෙක් කියලද දන්නෑ..
මට කිසිම දෙයක් කරන්න දෙන්නෑ හැම එකම
එපා එපා එපා..
මට කව්රුත් එක්ක කතා කරන්න දෙන් නෑ
මට කොහෙවත් යන්න දෙන් නෑ..
පුදුම වැඩක් මේක...

ආයු නොදරුවෙක් මොනා තේරෙනවටද කෙල්ල කට හද හද බනින දිහා බලන් කොල්ලා හිනාවුනා..

" ඔයාට හිනා..
මට දෙන්න හිතෙනෝ ඉතිම් මේ සූටි මූන පිම්බෙන්න උම්මා කෝටියක්..
මගේ හොරගෙඩියා..
ඔයාවත් නැත්තන් මේ ගෙදර මන් පිස්සෙක් වෙනවා..

දවාත් කාමරේට වෙලා රෑ වෙනකම්ම ඔෆිස් එකේ ගොඩ ගැහුන වැඩ ටික කරේ හවස කෙල්ල එක්ක වලිය ද ගත්ත හින්ද ආයේ කෙල්ලට පේන්න නැව්දින් ටික වෙලාවකට..

" සදීනා මිසී.. මේ තේ එක ලොකු බේබිට දීලා එන්නකෝ..මන් ලොකු නෝනලට කෑම අරිනකම්..

" මට බෑ.. ඔයාට ඕන්නම් ගිහින් දීගන්න..තේම දෙන්න වටින්න නල්ලමලේ බේබි මහත්තයා.

නීලට හිනාගියේ කෙල්ල ගස්සලා ගිය තාලෙට..හවස සිද්දිය නීලත් දැක්කා කෙලලගේ තරහා දැන් ඉස්සර දවාන් වගේ වෙලා..

sinhalaebooks.com

" දෙන්නම එකයි.. හොස්ස ලගින් මැස්සා යන්න බෑ..

නීලා සදීනට නෑහෙන්න ඒක කිව්වේ..

රෑ කෑම නොකාම කොල්ලා වැඩ කලේ හිත අවුලෙන්.. කොහෙත් කොහොම ලෙහාගන්නද කියලවත් තේරෙත් නැති තරමට් මුලු බිස්නස් එකම පැටලිලා..ඔක්කොම හොද වේගන එද්දි සිල්වෙස්ටර් දපු ලෙඩේ දවාන්ගේ ඔලුවම පිස්සු වැට්ටුවා..

" මේ මිනිහා මාව කැවා.. ශිට්..
දැන් මට හිතෙන්නෙම මූට ඕන මඟුලක් කරගන්න කියලා ෂෙයාස් ටික දීලා දන්ඩ..

දවාන් ඔලුව අල්ලන් කල්පනා කලේ ලැප් එකේ තිරේ දිහා බලන්..

" ඔක්කොමත් අස්සේ සැනසීමකට හිටිය අර බකමූනී කොල්ලයි විතරයි.. ඒ හොල්මන සිල්වෙස්ටගෙර් දුවද කියලත් හිතෙනවා..වෙලාවකට ඇයි යකෝ මුන් දෙන්නටම මාව පේන්ඩ බෑනේ..

දවාන්ගේ හිත කිව්වෙම ගිහින් කෙල්ලව බලන්න කියලා. බඩගින්නකුත් තිබ්බ නිසාම කොල්ලා පහලට ගියෙ නිකමටවත් සදීනා පේන්න ඉදී කියලා හිතන්..
කොල්ලා යද්දි නීලා වැඩ ඉවර කරලා නිදගන්න යන්න ලෑස්තිවෙලා හිටියේ..සදීනගේ කාමරෙත් දොර වහලා කියලා කොල්ලා දැක්කා..

" ලොකු බේබී.. ඇයි මොනාහරි ඕනෙද..

නීලා කාමරේට යන්න ගිහින් කොල්ලව දැකලා ඇහුවේ දවාන්ට තේ එකක්වත් ඕනෙ වෙලාද කියලා හිතලා..

" න් නෑ නෑ.. නීලාම්මා නිදගන්න යන්නද හැදුවේ..

" ඔව් බේබි..පාන්දර නැඟිට්ටින්නත් ඕනෙනෙ..

" හ් හා හා.. නීලම්මා නිදගන්න මන් මේ නිකමට ආවේ මාත් නිදගන්න යනවා..

දවාන් නීලට පිටුපාලා පඩිපෙල නගින්න වගෙ ගිහින් නීලා කාමරේට යන්න ඇරලා හොරාට පැන්නේ සදීනාගේ කාමරේට..

සදීනා කොල්ලව නිදිකරවලා තියලා රෑ ගවුමට මාරුවෙලා කොණ්ඩේ පීරන ගමන් හිටියේ.එකපාරම දොර ඇරන් දවාන් කාමරේට පනිද්දි කෙල්ල බය වුන පාරට කෑ ගහන්න කට ඇරියත්
දවාන් ඊට කලින් කෙල්ලගේ කට අතින් වහගත්තේ තුලට ඔක්කොම බේරගෙන..

sinhalaebooks.com

" ෂ් ෂ් ෂ්............මම දවාත්..කෑ ගහන්න එපා තමුසෙ හොල්මන් දැක්කා වගේ මගුල..

කට වහලා තිබ්බ දවාන්ගේ අත ඇදලා විසිකරලා පැත්තකට වුනේ කෙල්ල කේන්තියෙන්..

" පිස්සු ද දවාත් මහත්තයා ඔයාට..

"ඇයි..

" මෙහෙම කාමර ගානේ මහ රෑ එන්න.. අනික කතාවත් නොකර.. ලැජ්ජා නැද්ද..

" ම ම මන් ආවේ මගේ ළමයා බලන්න..
අනික මගේ ගෙදර මන් කොහේ කොහොම කොයි වෙලාවේ ගියත් මොකද..ආ..

දවාන්ට එන කේන්තිය ඉවසන් හිටියේ අමාරුවෙන්.. දැක්කේ නැති හින්ද කෙල්ලව්‍ය ිදරුවයි බලන්න ආවේ ඒත් සදීනා දොස් කියන විදියට දවාන්ට කෙල්ල නොවුනනම් හොම්බ කට සමතලා වෙන්න දෙන්න හිතුනා..

" හ හරි . මහත්තයා ළමයා බලන්න හොඳට.. මන් යනවා..එලියට..එතකොට හරිනේ..

සදීනා කාමරෙන් එලියට යන්න ගියේ දවාන්ට අයාන් ලග ඉන්න කියලා කෙල්ලට දැනෙන දේ දවාන්ට නොදැනෙන එකට කෙල්ලට තරහයි.. දවාන් මේ කරන වැඩ වලින් කව්රු හරි දැක්කොත් හොද නැත්තේ දවාන්ට වගේම කෙල්ලට.. අහම්බෙන් වත් සමදරා දැක්කොත් කොල්ලා රෑ සදීනා එක්ක ඉන්නවා
එකෙන් නරකක් වෙන්නේ හැමෝටම..

" ඉන්න.වා... මගුල..
මම ආවේ තමුසේගේ කකුල බලන්න.. බෙහෙත් ද ගන්න කියන්න..
හවස කියවුන ඒවට සොරි...

දවාන් ඒක කිව්වේ සදීනගේ අතකින් අල්ලලා ළගට ඇදලා ගන්න ගමන්.. තත්පරයක්වත් දවාන් ලග ඉන්න සදීනා කැමති නෑ. කෙල්ක දවාන්ගෙන් ඈත් වුනේ ඒ මූන දිහාවත් නොබලා..

" නෑ මගේ ලෙඩ බලන්න ඕන නෑ මහත්තයා..
කකුල හොද කරගන්න ඕන නෑ.. වැඩි වුනාම ආදී මහත්තයා එක්ක රවුම් ගහන්න පුලුවන්නේ මට බෙහෙත් ගන්න යනවා කියලා..

" ආ පලයන්කෝ බලන්න කඩනවා තොගේ කකුල් දෙක මන්.....

sinhalaebooks.com

දවාත් එහෙමම කියලා ඇඳෙන් ඉඳගත්තේ අයාන් දිහා බලාගෙන..සදීනගේ මුරණ්ඩුකම දවාත්ව කේන්ති ගස්සනවා..කොල්ලට ඕනේ ළඟතියන් හිත නිවාගන්න මොකද දැන් සදීනා කියන්නේ දවාත්ගේ ජීවිතේ මෙච්චර කාලයක් ඇවිලුන ගින්නට වැටුන මහ වැස්සක් වගේ.

" කඩනකන් බලන් ඉඳී මන්..

සදීනා ඒ ටික කිව්වේ දවාන්ට ඇහෙන්න නෙවෙයි..

" අඩෝ නැගිටිනවකෝ.. බටු ඇටේ..
තාත්තා මේ කොහෙද යන ගෑනියක්ගෙන් කුනු බැනුම් අහනවා ..මූ මෙතන පස්ස උඩදන් නිදි..

දවාත් කොල්ලගේ ඇඟ උඩට පැනලා නිදගත්තේ චූටි පපුව උඩ ඔලුව තියන්..

" ආ මෙන්න වැඩක්.. ළමයා ඇහැරුනොත්..
තලවගන්න එකයි ඇත්තේ ආ..
ඌරා වගේ අර පොඩි දරුවා උඩට පැන්නා..

සදීනා බනිද්දි දවාත් නින්ද ගිය ගානට කොල්ලව බදගෙන හිටියේ සද්ද නැතුව.. කොල්ලා දන්නවා සදීනා අයාන් එක්ක ඉන්න එකට බනින්නේ බොරුවට කියලා..කෙල්ල අයාන්ව ලං කරන්න හැම්දේම කලේ කියලා දවාත් දන්නවා..

" මට බඩගිනි.. කන්න මොනාහරි හදලා දෙනවකෝ
රෙද්ද .. කැනුගහා..
නැද්ද පුතේ.. පුදුම කංකරච්චලයක්නේ..මේකිගෙන් තියෙන්නේ
මූ කොහොම ඉවසන් ඉන්නවිද දන්නෑ දවල්ට...

දවාත් අවුස්සන්න කිව්වේ කෙල්ලව තව ටිකක් සදීනා අත්දෙකත් බැඳන් හිටගෙන බලාගෙන හිටියේ දවාත්ට බනින්න හිතාගන්න බැරුව..

" දවාත් මහත්තයා මට නිදිමතයි.. විකාර නොකර යන්නකො දැන්.. බඩගිනි නම් නීලම්මට කියලා කෑම කන්න.. මෙතන මට වද නොදී.. මන් ආය නෙමේනේ

දවාත් ඇඳෙන් වාඩිවුනේ අයාන්ව අත ඇරලා සදීනට බේරෙන්න ක්‍රමයක් නැතිම තැන කෙල්ල බලන්හිටියේ දවාත්ගෙ මේ විකාරේ කීයටහරි ඉවරකරනකම්..

" දැන් මෙහෙමයි...අයාන් කියන්නේ කව්ද..
මගේ පුතා...
එතකොට සදීනා කියන්නේ කව්ද මගේ ළමයගේ අම්මා
කියමුකෝ..
එතකොට නිකම්ම තමුසේ මගේ ගෑනී වෙනවා..

sinhalaebooks.com

හා නැද්ද...
එහෙම බැලුවම ආයඅම්මට වඩා ටිකක් උසස් තැනක් හම්බෙනවා..

තමුසේ දන්නවද නිව්ටන්ගේ 5 නියමය මොකක්ද කියලා..
නැතේ තේහ්... ආ අහගන්නවා
ළමයට කෑම හදනවනම් ළමයගේ තාත්තටත් හදලා දෙන්න ඕනේ..
ළමයට කෑම කවනවනම් තාත්තටත් කවන්න ඕනේ..
ළමයව නලවලා නිදිකරවනවනම් තාත්තවත් නලවන්න ඕනේ..
ළමයව හුරතල් කරනවනම් තාත්තවත් හුරතල් කරන්න ඕනේ..
ළමයට උම්මා දෙනවනම් තාත්තට ඒකේ දෙගුණයක් දෙන්න ඕනේ..
ළමයට කුක්කු දෙනවනම් තාත්තට.............

රවන්නේ ඉතින් ඔහොම..ඉන්න කියනකන්..
තාත්තට කුක්කු එපා... අම්මා කැමතිනම් විතරක්
නෑ ඒහෙමත් එපා කියලා තමා තිබ්බේ..

" රවනවා නෙමේ මරනවා දැන් මන් ... හොඳහිතින් දවාත් මහත්තයා යනවද මෙතනින්
මගෙන් මොකුත් අහගන්නැතුව..

දවාත් හිනාවෙනවා.. සදීනගේ කේන්තිය තිබ්බේ ඉස් මුදුනේ.. ඔක්කොම නිදගන්න ඇරලා කාමරේට පැනලා දවාත් නටන නාඩගම අස්සේ කියන සමහර කතා ඇත්තටම සිද්ද නොවෙන දේවල්..ඒ ගැන කතා කරන්නවත් ඕනේ නැති දේවල්.. සදීනාට ඕනේ දවාත්ව පන්නගන්න මොකද දවාත්ගේ සමහර වචන කෙල්ලට දරාගන්න අමාරුයි..

" හ්ම් හ්ම් මන් යනවා.. අරක මතක තියාගන්නෝනේ..
ළමයට දෙන ඔක්කොම තාත්තටත් ඕනේ..
ඒක නියමයක්.. බායි ගුඩ් නයිට්.

දවාත් සදීනගේ මූනට තට්ටුවක් දන ගමන් කියලා ගියේ සදීනටත් හිනාවක් යද්දි.. දවාත් දඟකාරයෙක් වෙලා පොඩි ළමයෙක් වගේ.

" දවාත් මහත්තයා ඉන්න..

දවාත් දොර ලඟට ගිහින් හැරුනේ සදීනගේ මූන දිහා බලාගෙනම.. කෙල්ලට දූක හිතුනා බඩගිනී කියලා කියද්දියිහ් දවාත්ව යවන එක..

" ඇයි...

" යමු කෑම හරිගස්සලා දෙන්නම්.. හිස් බඩෙන් නිදගන්න එපා..

sinhalaebooks.com

කොල්ලට මල් හතයි..සාලෙට පැන්නේ හිනාවෙලා සදීනා අයාන්ට වැටෙන් නැතිවෙන්න කොට්ටා රැකුල් තියලා එනකම් දොරෙන් එබීගෙන දවාත් ඉන්නේ සින්දුවක් දගෙන..සදීනා හදලා දෙන කෑම කොල්ලා කන්න කැමති.. කෙල්ලව ලග තියන් ඕන පරිප්පුවක් කයි රස කරලා..

පිරිමියෙක්ට ඕන තරම් ගෑනු ඇසුරු කරන්න පුලුවන්..
ඒත් පිරිමියෙක්ට නිදහසේ සැහැල්ලුවෙන් හිතට එකගව හැසිරෙන්න පුලුවන් එකම ගෑනියක් ලග විතරයි..
දවාන්ට හිතෙන්නෙත් එහෙම.. මේ ජීවිතේ නවතින්න අවැසිම තැන සදීනගේ උණුහුම ලග. ලබා ගන්න හෝදිනාගන්න යමක් වේනම් ඒ සදීනගේ ප්‍රේමයේ හිමිකාරයා වීමම පමණක් යැයි දවාන්ගේ හිත හැමවෙලේම කිව්වා..

සදීනා කොලඹ ඇවිත් මාස තුනක්ම කිට්ටු වුනා.. කුසුමා හිටියේ කෙල්ල පන්න ගත්ත එකට සතුටින් ඒත් ඒ සතුට එකපාර ඉහ උඩ කඩන් වැටුනේ හදිසියේ සදීනගේ මාමා බෝට්ටුවෙන් වැටිලා ඔත්පල උනාට පස්සේ..
කුසුමා තනියම පවුල් බර කරඝන් ගියේ වීරෙට හැම වේලේම ඇනුම් පද කිය කිය..

" මේ සුමේ මට තනියම කොරන්න බෑ තවත්.. මාලු විකුනන්නයි..ලෙඩ්ඩුන්ට සලකන්නයි ළමයින්ට උගන්නයි යකෝ තනි ගෑනි වුන මට මේ ඔක්කොම කොරහැකිද..

පාර ඉදන් හොදට ඇවිත් ගෙදර කඩුල්ල ලන් වෙද්දි කුසුමා යාතිකාව පටන් අරන් එන දිහා බූරු ඇදටවෙලා වීරේ බලන් හිටියේ හිස් බැල්මෙන්..කුසුමා තමන් ඔත්පලවැටුන ද ඉදන් ඔය ටික ඔහොමම හැමදම ජප කරලා කරලා දැන් ඒක හුරු වෙලා..

" අද පාඩුද කුසුමෝ.. මාලු ගියේ නැද්ද ලාහෙට..

මාලු වට්ටිය පිලෙන් තියලා කුසුමා බිම ඉදගත්තේ ටිකක් නිවිලා කියන්න දන්න නිසාම වීරේ අහන්නේ හෙමීට .. කුසුමා ගැන දුකයි ඇත්තා ගෑනියෙකට මෙහෙම පවුල් බරක් අදින්න බැහැ කියලා වීරේ දන්නවා ඒත් අසරණකමට කරුමයක් පඩිසන් දීලා එකතැන් වෙලා ඉන්න වීරෙට බලාගෙන අහගෙන ඉන්නවා ඇරෙන්නවෙන කරන්න දෙයක් තිබ්බේ නෑ..

" අහවල් ලාහ... කුණු කොල්ලෙට ඔක්කොම ගියේ..
අර ඇඩ්ඩියා එක්ක බුදියන්ඩයන වුන්ට ඒකා හොද මාලු දෙනවා.අපිට තැලිච්ච අහකටම ගිය ඒවා දෙනවා..
හෙන ගහන්න ඕනේ සක්කිලි හැත්ත..
ඒකා හිතන් ඇති මාත් ඒකා එක්ක ලගින්න එයි කියලා
මට හැමදම අරියාදු...

කුසුමාකියන්නේ වැල්ලේ ගෑනියෙක්ට ඉහ ගහන්න බෑ කියලා.. හැන පැත්තෙන්ම ආවේ ජීවිතේගැහැනුකම උකසට තියලා වැඩ කරගන්න වුන එක..ඒත් එහෙම නොකර විදින්න වෙන හිරිහැර ගැන.. වීරේ දන්නවා කුසුමා කියන්නේ කට සැර වුනත් හිත හොද ගෑනියක්

sinhalaebooks.com

කියන්න.. ඔත්පල වෙලා ඇඳක හිටියත් නරකක් කරන් නෑ කියන්න දන්නවා ඒ හින්දම විරෙට දුකයි..

" උඹ ඕවා ගනන් ගන්න එපා..

" මේ ඇහුනද අපි සදීනා කෙල්ලට ලියුම් කඩදහියක් දමුද.. සල්ලි කීයක් හරි ඉල්ලලා.

කුසුමා හදිසියේ මතක් වෙලා කිව්වේ සදීනව ආයෙම වැල්ලට ගෙන්න ගන්න.. ඒකත් වාසියට කෙල්ලව පත්තගන්න උවමනාව තිබ්බෙම කුසුමට ඒත් දැන් තත්වේ එක්ක කෙල්ලව ගෙන්න ගන්න හිතුනා ටික දවසකටහරි..

" නෑ මෑ ඕන නෑ.. ඒකිව විකුණකා ගෙඩි පිටින් ගත්තේ
ආයේ මට බෑ රෙද්දක් ඇදත් සල්ලි ඉල්ලන්න..

" යකෝ෴තින් මත් ගන් ගෙවල් වලට ගෙනිච්චාද.. ඒ සල්ලිත් වියදම් කරේ මේ ගෙදරටනේ..

කුසුමා නැගිට්ටේ ගස්සගෙන.. සදීනගෙන් සල්ලි ඉල්ලගන්න ලියුමක් යන්න හිතාගෙනමයි..

" ඒකිට ලියුම් දැම්මොත් තකහතියක් දූවන් එයි මාව බලන්න එහෙම වුනොත් අර පහනාගේ කුණේඩවාල ප්‍රශ්න වලට අපේ එකීත් අහුවෙයි... ඒ හින්ද එකිට නොකියා ඉන්න එක හොදයි මේ විස්සර..

කුසුමා ගෙට යන්න ඇරලා වීරේ කිව්වේ සද්දෙට ඇහෙන්න..

" ඒ බල්ලා ගෑනු කීයක් අනාථ කරලද .. ආන් සෝමේගේ කෙල්ලට හම්බෙන්න ඉන්න ළමයත් උගෙලු...

කුසුමා කිව්වේ පහන්ගේ වැල්ලේ ජීවිතේ සදීනා නොදැක්ක ඇත්ත.. කෙල්ල පහන්ව තාමත් විස්වාස කරන් ඉන්නේ .. කෙල්ලගේ හැමදේමත් පහනුදුර ගත්තා.. ඒත් කෙහෙන්දෝ ආව වාසනාවක් එක්ක කෙල්ල දවාන් ලඟට යැව්වේ මේ කාලකණ්ණි ජීවිතේන් කෙල්ල විනාශ නොකර..

දවාන්ගේ බිස්නස් අන්තිම බින්දුවට වට්ටලා සිල්වෙස්ටෂෙර්යාළු ආපහුගත්තේ කොල්ලට කරන්න කිසිම දෙයක් නැති කලර්ා..
ඔගිස් එකට වෙලා නොකා නොබී දවාන් කල්පනා කලේ ආපහු කම්පැනිය ගොඩදන්න ක්‍රමයක්..

" උඹ ඔහොම නොකා නොබී කල්පනා කරලා දැන් වැඩක් නෑනේ..ඉස්සරහට කරන්න දෙයක් ප්ලෑන් කරමු

sinhalaebooks.com

ආදී කොල්ලට තේ එකක් අරන් ඇවිත් ඉදගත්තේ මේසේ ඔලුව ගහන් කල්පනා කරන දවාන් ඉස්සරහින්..

" මට වැටෙන්න බෑ බන්.. මන් ජීවිතේ අලුතෙන් පටන් ගන්න හිතුවා විතරයි.. අර මූසලී කාලා විනාස කරලා ගියපු මගේ ජීවිතේ ආයෙම විනාස කරගන්න බෑ..

මට වගකීම් තියනවා..මට දරුවෙක් ඉන්නවා.. ඌට හොඳ අනාගතයක් හදන්න ඕනේ.. මොන දේ කරලාඅ හරි .. මට හැම්දේම නැති කරගන්න බෑ බන්..

දවාන් කියන්නේ ඇස්වල කඳුලු තියන්..ආදිට සතුටුයි එක අතකින් දවාන් ජීවිතේ ගැන දැන් හිතනවා.. හිටපු විදියට කවදවත් දවාන් මේ තත්වෙට එයි කියලා ආදී හිතුවේ නෑ.. ඒත් තාත්තෙක් කියන තැන අද දවාන් ඉන්නේ කොන්ද කෙලින් තියන් නියම පිරිමියෙක් වගේ... ඒ වගකීම් තනියම බාර අරන්.. කොල්ලා ජීවත් වෙන්න පටන් අරන්..ඒත් මේ.ප්‍රශ්න එකපිට එක ගෙනත් දවාන්ව පරීක්ෂා කරන්න හදන්නේ තපුරුම විදියට..
කියකා ආදී හිතුවා..

" උඹ බය නොවී හිටහන්.. අංකල් ගියා අද වැඩකට..
ඒ වැඩේ හරිගියොත් උඹ ගොඩ..

" කව්ද අපේ තාත්තා.. ඒ මොකද ඒ..

" අර මිස්ටර් සපරමාදු බන් .... oit එකේ අයිතිකාරයා.. පොරගෙන් අපි ෂෙයාස් ටිකක් ගත්තොත් ගොඩ..
අංකල්ගේ යාලුවනේ..බෑ කියන එකක් නැතිවෙයි
බලමු හවසට හොඳ විදියට වෙලා තියෙන්න කියලා හිතපන්..

දවාන්ට පුංචි සැනසීමක් ආවා රණබාහු කොල්ලා වෙනුවෙන් වැඩ කියකා කියද්දි.. බයක් නෑ කොල්ලා දන්නවා මොන ගේම ගහලා හරි රණබාහු කොල්ලව ගොඩදනවා දැන් කියලා..
සදීනගේ අතට සමදරා දුන්නේ ලියුමක් කෙල්ල ඒක බලද්දි දැක්කේ තමන්ගේ නමට ආව එකක් කියලා.. තමන් වෙනුවෙන් ලියුම් එවන්න වෙන කෙනෙක් නැත එක්කො පහන් නැත්තම් මාමා විතරයි ඉන්නේ..කෙල්ලගේ හිත කීවෙම ඒ පහන් කියලා..
ලියුම අරන් එලියේ බංකුවට දිව්වේ පුංචි බලාපොරොත්තුවක් එක්ක.. ඒ පහන්නම් කෙල්ල වෙනුවෙන් තාමත් බලන් ඉන්නවා කියලා හිතෙද්දි සතුටු හිතුනා.. ඒත් ලියුම තිබ්බේ කෙල්ලගේ මාගෙන්.. මාමා වුනත් ඒක ලියලා තිබ්බේ කුසුමා..
ඒ බාගෙට ඇදවෙලා ගිය නුහුරට ලියපු අකුරු දිහා සදීනා බලන් හිටියේ වචනයක් ගානේ ඇස්වලින් කඳුලු බේරෙද්දි..

" අනේ ලොකු නොනා... එන්නකෝ
මගේ මාමට කරදරයක් වෙලා......

කෙල්ල ලියුමත් අරන් අඩාගෙන දිව්වේ සමදරා ළඟට

sinhalaebooks.com

කෙල්ලට මේ ගෙදර අම්මා කෙනෙක් වගේ ඉන්නේ සමදරා හැම දුකක්ම කියන්න පුලුවන් සමදරා එක්ක.. ආව ද ඉදන් කිසිම දවසක වචනෙකින්වත් හිත නොරිද්දපු සමදරා ලග කෙල්ලට ඕනෙම දෙයක් කියන්න විස්වාසයක් ගෞරවයක් වගේම ආදරයක් තිබ්බා..

" ඇයි දරුවෝ මොකක්ද වෙලා තියෙන්නේ..

" ලොකු නෝනා අනේ මගේ මාමා බෝට්ටුවෙන් වැටිලා ඔත්පල වෙලාලු.. නැන්දට මොකුත් කරගන්න බැරුව හුගක් දුක් විදිනවලු.. අනේ ලොකු නෝනා.මම මොකකද කරන්නේ දැන්.. මට මාමව බලන්න ඕනේ ලොකු නෝනා..

සදීනව සමදර ළගට අරන් හිස පිරිමැද්දේ කෙල්ලගේ හිතේ තියන වේදනාව් තේරෙන හින්ද..

" හරි පුතේ අපි මහත්තයා ආවම කතා කරලා මොකක් හරි කරමු.. දැන් නාඩා ඉන්නකෝ.. බයවෙන්න එපා අපි මාමට උදව් කරනවා.. ඔයා චුට්ටක්වත් හිතන්න එපා..

සමදරාගේ වචන කෙල්ලට සැනසීමක් වුනා ඒ වෙලාවේ.. ඒ බොරුවට හිත හදන්න කියපු නිකම්ම නිකන් වචන නෙමේ කියන්න කෙල්ල දන්නවා.. සමදරා වගේම රණබාහුත් මේ වගේ වෙලාවක අහක බලන් නෑ කියලා කෙල්ල දන්නවා..

පුංචි කාලේ ඉදන් අම්මෙක් අප්පෙක් නැතුව කෙල්ලව හදගෙන උස් මහත්කරපු පින හැමදම සදීනා වීරෙට දුන්න..කුසුමා නිසා මොන දේ ක්ලත් කෙල්ලට හිත යට මහ හුගක් වීරේ ආදරේ තියාගෙන හිටියා කියලා කෙල්ල දන්නවා.. අද එ මහා පවර්තයක් වාගේ රැකවනය දුන්න මාමා අසරණ වුන වෙලාවේ කෙල්ලට ලග ඉන්න බැරිවුන එකට තිබ්බේ කියාගන්න බැරි වේදනාවක්..

" අනේ මාමේ..
මට ඔයා ලගට එන්න ඕනෙ..
මට ඔයා වෙනුවෙන් මොකුත්ම කරගන්න බැරිවුනා
මන් දන්නවා මාම නැතිවුනා කියන්නේ මුලු පවුලම ඉවරයි.. නංගිටයි මල්ලිටයි හරියට කෑමක් බීමක්වත් තියනවද දන්නෑ..
නැන්දට කොහෙන් සල්ලි හම්බෙන්නද..
මන් හිටියනම් කොහෙන්හරි සල්ලි කීයක්හරි හොයලා දෙනවා. ඒත් මෙහේ ඉදන් මන් මොනා කරන්නද..

ලොකු නෝනා කියන දෙයක් තමා කුන්න වෙන්නේ.
මන් කොහොමහරි මාමට සල්ලිටිකක් ඉල්ලලා යනවා
වෙන මේ වෙකාවේ මට කරන්න කිසිම දෙයක් නෑ..

හවස් වරුවම ගෙවිලා ගියේ කෙල්ල ඔහේ බලා ගන්න අත බලන්න්කල්පනා කර කරම.. අයාන් කෙල්ල ලගට වෙලා හිටියේ සෙල්ලම් කර කර.. අයාන් ගැනවත් කෙල්ලට් අද ගානක්

sinhalaebooks.com

නෑ.. කොල්ලා තනියම සෙල්ලම් බඩු එක්ක නට නට හිටියේ.. වෙනදනම් මේ වෙද්දි කොල්ලව සදීනා දහ දොලොස් වතාවක් ඉඹලා පොඩිකරලා අද ඒ කිසිම දෙයක් ගානක් නෑ..

රෑ කෑම මේසෙදි රණබාහු එක්ක සමදරා කෙල්ල ගැන කිව්වා.. දවානුත් කෑම කන ගමන් හිටියේ.කොල්ලටත් එන්න රෑ වුනා ටිකක් ගෙදර හවස රණබාහු එක්ක බිස්නස් වැඩ වලට කොල්ලත් අහරහේ මෙහේ දිව්ව නිසා..

" ආ මහත්තයා සදීනගේ මාමාට අසනීපයිලු ගොඩක්
බෝට්ටුවකින් වැටිලා කියලා ලියමනක් එවලා තිබ්බා..
කෙල්ලව යවන්න වෙයි නේද බලලා එන්නවත්

සමදරා කියද්දි දවාන් කෑම කකා ඉදලා ඔලුව ඉස්සුවේ සදීනා ගෙදර යවනවා කියපු එකට.. එකෙක් මැරුනත් කෙල්ලව ඇස් මානෙන් ගෙනියන්න දවාන් කැමති නෑ..

" සල්ලි ටිකක් යවන්න සමදරා.. කෙල්ලවත් දවස් කීපෙකට හරි යවන එක හොදයි.. කරදරයක් වෙලාවට ලග ඉන්න එපැයි..

" සදීනා යවලා කොහොමද.. මේ මේ මන් කියන්නේ අයාන්ව බලාගන්නේ කවුද.. ළමයා හුරුත් නෑ අනිත් අය අතට ...

රණබාහුගේ කැමැත්ත හම්බෙද්දිම දවාන් පැන්නේ විරුද්ධව අයාන්ට වඩා කෙල්ල නැති ගෙදර දවාන්ට දන් ඉන්න බෑ.. කොහේ ගියත් ගෙදර මතක් වුනාම සදීනගෙයි අයාන්ගෙයි මූන මතක් වුනාම පැනලා ගෙදර දුවන් එන්න හිතෙනවා.. රණ්ඩු වෙච් හරි දවාන්ට ඕනේ කෙල්ල ළග ඉන්න..ඒක හිත කොනක දළුලන පුංචි බලාපොරොත්තුවක ඉඟියක්..

" එහෙම කියලා බෑනේ පුතා.. ඒ ළමයා හදගත්ත මිනිස්සු ඒ.. දුකක් වෙලාවට නොයා කොහොමද..
කෙල්ල උදේ ඉදන් ඔය කෑමක් බීමක් නැතුව වැලහින්න වගේ අඩ අඩ ඉන්නේ..
ගිහින් බලලා ආවම හිතටත් හොදයිනේ..

සමදර කිව්වේ සදීනා ගැන හිතලා.. දවාන් ආවත් හරි කෙල්ලව දැක්කේ නෑ අද.. දවස් දෙකක් තුනක් තියා කෙල්ල නැතිගෙදර දවාන්ට එක මොහොතක්වත් ඉන්න බෑ කියලා හිතුනේ.. ආව වෙලේ ඉදනුත් කොල්ලා කලේ සදීනාව හොයපු එක..

" දවස් දෙකකට විතර යවන්න. ඩ්‍රයිවටර් කියන්න කෙල්ලව දලා එන්න කියලා.. අපි යමු එක්කන් එන්න පස්සේ.. සල්ලි ටිකක් යවන්න සමදරා..බඩු මුට්ටු ටිකක් එක්ක.. අමාරු ඇති මේ දවස්වල රස්සාවත් නැති එකේ..

රණබාහු කිව්වෙ සමදරාට කෙල්ලට ඕනේ දේවල් ලෑස්ති කරලා දෙන්න..රණබාහු කෑම මේසෙන් නැගිටලා යන්න ඇරලා කොල්ලා සමදරා ට කිව්වේ කෙල්ල යවන්න එපම කියල..

sinhalaebooks.com

" ගිහින් බලලා ආවම මදිද..නවතින්න ඕනදැයි..

" මේ ලොකු ඔයා කියන විදියට මිනිස්සු තියන් ඉන්න බෑ හිරකරලා..මනුස්සකම් නැද්ද පුතා.. ඔයත් නිකන් අර වැඩවසම් යුගයේ ධනපතියෙක් වගේ කතා කරන්නේ..

සමදර කිව්වේ හිනාවෙලා..දවාත් රවාගෙන හිටියේ කතා නොකරම.

" රෙද්ද ධනපතියෙක් නෙමේ අම්ම බයිලා ගහනවා..
මට ඒකි නැතුව ඉන්න බෑනේ එකයි සිත්හලෙන් කියන්නේ.. දවස් දෙකක් අසිහියෙන් තමා ඉන්ඩ වෙන්නේ..

දවාත්කෑම එක දිහා බලන් මුමිනුවේ හොරාට.. අකමැත්තෙන් වුනත් කොල්ලාට සදීනව යවන්න ම වුනේ සමදරාලාගේ කැමැත්තට.

" සදීනා.. පුතේ කොල්ලා නිදිද...ඔයා චුට්ටක් එන්නකෝ

සමදරා කෙල්ලට කතා කලේ කෑම මේසෙට.. කෙල්ලට හෙට යන්න ලෑස්තිවෙන්න කියන්න එම්ම කිව්වේ දවාන් සද්ද නැතිව හිටියේ සදීනා එනවද කියලා හොරාට බල බල.. කෙල්ල දවසම කෑවේ නෑ කියපු හින්ද දවාත්ටත් කෑම එක කන්න හිතක් ආවේ නෑ.. අතගගා හිටියේ කෙල්ල එනකම්..

" නෝනා..

" පුතේ හෙට ගමේ ගිහින් එන්න.. වාහනයක් ලෑස්ති කරන්නම් මන්.. ගිහින් දවසක් දෙකක් ඉදලා සල්ලි ටිකක් දීලා මාමලාව බලලා එන්න..

සදීනට සතුට දරාගන්න බෑ.. කෙල්ල නොකිව්වට මාමව බලන්න ඉස්පාසුවක් නැතුව හිටියේ..ඒත් අයාන්ව දාලා කෙල්ලට යන්න බෑ.. අමාරුවෙන් හරි කොල්ලව තියලා ගියත් හිත මෙහේ තියලා යන්න වෙන්නේ..

" නෝනා ආයූ බබා...

" අපි ඉන්නවනේ..දවසක් දෙකක් එයා බලාගන්න එක අමාරු නෑ.. ඔයා ගිහින් එන්න.. ඇදුම් ලෑස්ති කරගන්නකො.. මන් සල්ලි ටිකක් අරන් ඇවිත් දෙන්නම්..

සමදරා කෑම මේසෙන් නැගිටලා යද්දි කෙල්ල බලන් හිටියේ හිස් බැල්මෙන්.. කොච්චර යන්න ආස හිතුනත් අයාන් මතක් වෙද්දි කෙල්ලගේ පපුවට මොකක්දෝ වුනා..

" තමුසේ යනවා නේද එතකොට...ම්ම්ම්..

sinhalaebooks.com

දවාත් අහද්දි කෙල්ල තාමත් එක තැන හිට ගත්ත ගමන්මයි..

" මට මාමා බලන්න ඕනේ ... ඒත් ආයු දලා යන්න බෑ දවාත් මහත්තයා.. මගේ පපුව රිදෙනවා..
මත් අසරණයි... මත් මොකක්ද කරන්නේ කියන්නකො..
ආයුටත් මත් නැතුව ඉන්න බෑ.. පව් මගේ කොල්ලා..

දවාත් දන්නවා කෙල්ල කියන්නේ ඇත්ත කියන්න.. අයාත් නැතුව එක රැයක්වත් කෙල්ලට නින්ද යන් නෑ.. එද අසනීපෙ වුන දවස් දෙකේ කටපු නාඩගම දවාත්ට මතකයි.. වැලහිත්ත වගේ අඬාගත්ත අයාත් නැති තත්පරේට කෙල්ල..

කොල්ලාට වගේම මටත් උඹ නැතුව ඉන්න බෑ..
කියන්න දවාත්ගේ හිතට ආවත් ඒක හංගගෙන
හිටියේ තාම එහෙම කතාවක් කියන්න තරම් සදීනාකොල්ලට ළං වෙලා නැති හින්ද..

" අයාත් මත් ළග ඉදී... ඔයා ගිහිත් එන්න..
හැබැයි දවස් දෙකයි.. ඊට වැඩිය තත්පරයක්වත් බෑ එහෙ ඉන්න..හෙට මත් ගිහිත් දලා එනවා හරියටම දවස් දෙක්කින් මත් එක්කත් යන්න එනවා..එච්චරයි..

සදීනා බැලුවේ කඳුලු ඇස්වල තියාගෙන දවාත් දිහා.

" දවාත් මහත්තයා එනව ද හෙට මාත් එක්ක යන්න..

" හ්ම්.. ඩ්‍රයිවස්ලා එල්ක තමුසේ යවන්න බෑ මට..
මන්ම එන්නම්..

දැන් කෑම කනවා ඉඳගෙන... දවසම කාලා නෑ නේද .
ම්ම්ම්.. කන්න ඇත් මාත් එක්කම..

දවාත් කිව්වේ කෙල්ල එක්කම කෑම ගන්න.. සමදරා කිව්වනේ දවසම අඬලා හිටියේ කියලා ඒක මූනෙත් පෙනුනා..

"මට කන්න බෑ මහත්තයා
මත් යන්නම් ආයු නැගිටලද දන් නෑ..

දවාත් කෙල්ල දිහා හොර ඇහෙන් බලලා බඩ අල්ලගත්තේ එකපාරම.. සදීනට හිතාගන්න බෑ කෑම කකා ඉදලා බඩ රිදෙනවා කියද්දි.. දවාත්ට කොහොමත් වැඩිය අනම් මනම් කන්න බෑ කියලා කෙල්ල දන්නවා..

" අනේ ඉන්න මහත්තයා මත් බොන්න දෙයක් බලන්නම්.. කෑම එක කන්න එපා වතුර ටිකක් බොන්න..

sinhalaebooks.com

" එපා...ඉන්න.
.මේ තමුසේ මෙතන මන් කන දිහා බලන් ඉඳලා කෙල ගිල්ලනේ..ඒකයි බඩ රිදෙන්නේ..

දවාන් කියන්නේ බොරු සදීනා ඇස් ලොකු කරන් ඉද්දි කොල්ලට ආසයි. තරහා ගිහින් බත් කියලමයි කොල්ලා හිතුවේ.. ඒත් අද සදීනා තිහඩයි..කෙල්ලට දවාන් එක්ක අද ඝර්ඩූ වෙන්න බෑ..හිතට හරිනෑ..කෙල්ලගේ..

" මන් යන්නම්..මහත්තයා කන්න..මට සමවෙන්න..

" ඔහොම ඉන්නවා මෝඩී.. මේක අඩුවෙනවා තමුසේ කෑම කටක් කෑවොත්.. කෝ කට අරිනවා මන් කවන්න..

දවාන් බත් කටක් ලන් කලේ කෙල්ලගේ කට ලගට.. ඇත්තටම දවාන්ට ඕනේ කෙල්ලට තමන්ගේ අතින්ම බත් කටක් කවාගන්න.. අවසර නැතත් කොල්ලා ලන් වෙන්නේ මේ හීනෙකට..සදීනගේ හිත දවාන් ලග නතර කරගන්න ඕනේ..කොල්ලා මේ හැම්දේම කරන්නේ ඒකට ආදරේ පෙන්නනේ සදීනට දැනෙන්න..

" අනේ මට එපා.. මහත්තයා..

" තමුසේ කනවද නැද්ද.. මන් ගහනවා කෑම පිගානම පොළවේ.. දන්නවනේ හැටි මගේ.. කනවාද නැද්ද මගේ යකා අවුස්සගන් නැතුව..

සදීනගේ කට බයටමයි ඇරුනේ..දවාන්ගේ අතින් කෙල්ල බත් කටක් කෑවා.. කොල්ලට සතුටුයි.. මේ විදියට ජීවිත කාලෙම තමන්ළග ආදරෙන් හිනාවෙලා කෙල්ල ඉන්නවනම් හැම්දේම නැතුව ජීවත් වෙන්න පුලුවන් කියලා හිතුනා.. අයාන්ගේ අම්මා සදීනා විතරමයි.. ඒ වගේම දවාන්ගේ හිතේ හැමදම දැන් ඉන්න එකම ගැහැනිය සදීනා විතරයි.. මැරෙනකම්ම ආයේ කාටවත් ඒ හිත අස්සට රිංගන්න බැරි තරම් කෙල්ලට ආදරෙයි දවාන්.. හැම පුංචි දේකම දවාන්
දුන්නේ සදීනට ආදරේ. කෙල්ලට ඒ ආදරේ නොතේරුන එකට දවාන්ට දුකයි.

" සමදරා කෝ ලොකු ඔෆිස් ගියාද අද...

රණබාහු උදේ තේ මේසෙට එන ගමන් ඇහුවේ දවාන් ගැන... රණබාහු සපරමාදු එක්ක ලොකු ඩීල් එකක් ගහලා තිබ්බෙ මේ වෙද්දිත්..ඒක රණබාහු විතරයි තාමත් දන්නේ දවාන්ට නොදන්වා කරන්න යන වැඩේ සමදරාට කියන්න රණබාහු වෙලාවක් හොය හොය හිටියේ..

" නෑ මහත්තයා අර සදීනා ළමයා ඇරලලා එන්න ගියා.. ඩ්‍රයිවර් අතේ යවන එක හරිනෑ කියලා ඔය පුතාම ගියේ..

sinhalaebooks.com

පව් කෙල්ල වැලහින්න වගේ අඩ අඩ ගියේ... අයාන්ව දාලා කෙල්ලට යන්න බෑ.. කොල්ලාගේ ගිය ආත්මෙක අම්මෙක් වෙලාවත් ඉන්න ඇති ඒ ළමයා..පුදුම ආදරයක් තියෙන්නේ දෙන්නගේ.. ඔය ගමනත් ගියේ නොගිහින් බැරිකමට කෙල්ල...

සමදරා කිව්වේ උදේ සදීනා අයාන්ව දාලා යද්දී අඬපු විදිය දැකලා..කෙල්ල ඇත්තටම ගියේ හිතකින් නෙමේ.. දන්නවා මේ දවස දෙක අමාරුවෙන් ගෙවන්න වෙම්තේ කියලා

" ඒ ළමයට උනත් හැමදම මේක කරන්න බෑනේ..
දවාන්ට ස්ථිර පිළියමක් ඕනේ දරුවට.. සදීනා ළමයත් ආවේ හැමදටම නෙමෙනේ තරුණ ළමයෙක්ගේ ජීවිතේ මේ ගේ අස්සට දියකරලා දානවට මමනම් කැමති නෑ..

රණබාහු කිව්වේ ඒක හිතේ අදහසක් තියාගෙන කියල සමදරාට තේරුනා..

" ඒ කියන්නේ මහත්තය..සදීනා යවන්න කියලද ආපහු
එහෙම කරලා ළමයා බලාගන්නේ කව්ද.. තාම පොඩීනේ අයාන්..

සමදරාට පෙහෙලිකාවක් රණබාහු එකපාරම එහෙම දෙයක් කියපු එකට..

" නෑ සමදරලා.. සපරමාදු යෝජනාවක් කලා කම්පැනියට ෂෙයාස් දෙන්න අපේ කොල්ලට එයාගේ දූවව බන්දමු කියලා...

සමදරා උඩ බිම බැලුවේ දවාන් එහෙම දේකට කැමති වෙන් නෑ කියලා දන්න නිසා..
දවාන්ට ගෑනු පේන්න බැරි තරම් වෛර කරනවා අකීෂගේ සිද්දියෙන් පස්සේ කියලා සමදරා දන්නවා..අ

" දෙයියනේ මහත්තයා.. අපේ එකා කැමති වෙයිද..
එයාගෙන් නාහා මේ ගත්ත තීරණේටනම් මන් විරුද්ධ යි.. දන්නව්නේ හැටි අපේ යකාගේ..

" සමදරා එයාට එහෙම කරන්න බෑ.. අනික අපේ සපරෙට ඉන්නේ එක දුවයි..කෙල්ලට තමා ඔක්කොම..කෙල්ලව දවාන් බැන්දම ෂෙයාස් නෙමේ ඔක්කොම අපේ එකා අතේ..
කම්පැනිය ගොඩ දගන්න පුලුවන් එකම විදිය මේක..
මන් කැමති වුනා වෙන විකල්පයක් නැති හින්ද..
අනික මාත් කැමති ඒ වගේ ළමයෙක් අපේ පවුලට එකතු වෙනවට

රණබාහු හිතන්නේ බිස්නස් ගැන දවාන්ගේ හැම ප්‍රශ්නෙකදිම රණබාහු කොල්ලව තේරුම් ගත්තේ නෑ කියන්න සමදරා දන්නවා.. මේ වෙන දේවල් වලින් පරන දවාන්ම ආයේ වෙයි කියලා සමදරාට බයයි..යන්තමට කොල්ලා හිනාවෙලා ඉන්න පටන් ගත්තා විතරයි..

" අපේ කොල්ලට දරුවෙක් ඉන්නවා කියලා දන්නවද..
ඒ ළමයා කැමති වෙයිද බැඳපු මිනිහෙක්ව බඳින්න..ඒ ළමයි රට රටවල හැදුන අයනේ.. මට විස්වාස කරන්න බෑ කැමති වෙයිද කියලා..

sinhalaebooks.com

" ඒ ළමයත් සපරේට් වෙලා ඉන්නේ..බොරුකාරයෙක්ට අහුවෙලා.. අපේ කොල්ලට එක පයින් කැමති වෙකා කෙල්ල..හෙට අනිද්දා එයි මෙහේ ඇවිත් යන්න.. කොල්ලව ගෙදරතියාගන්න සමදරා..

සමදරාගේ හිතට කොහොමත්ම හරිනෑ.. සදීනා ගෙනාවෙත් දවාන්ට බන්දලා දෙන්න කියල ඒත් කෙල්ල අකමැති වුන නිසා මඟඇරුනා.. දවාන්ට එහෙම බඳින්න අදහසක් තියනවනම් සදීනා ගැන හිතක් ඇතිවෙන්න කල්..ඒත් කොල්ලා එහෙම කිසිම දෙයක් පෙන්නත් නෑ.. ළඟ ඉන්න කෙල්ල ගැනවත් හිතක් පහල නොවෙන එකේ සරමාදුගේ දුවට හිත යයි කියලා සමදරාට හිතෙන්නෙම නෑ..මේකෙත් වෙන්නේ අන්තිමට දවාන්ව නැතිවෙලා යන එක කියලා හිතුනේ..

" අනේ මන්ද මහත්තයා මේ දේවල් කොහෙත් ඉවරයක් වෙයිද කියලා...

..................................................

දවාත් කෙල්ලව දන්න ගාල්ලට එද්දි ටිකක් දවල් වුනා වාහනේ එනගමනුත් කෙල්ල කරේ අඬපු එක..දවාත් අවුස්සලා අවුස්සලා කෙල්ලව අඬවලා එක්කත් ආවේ කෙල්ලගේ මාමලාගේ ගේ ළඟට..

" දවාත් මහත්තයා ගෙට ගොඩවෙන්න එනවද..
මහත්තයලට ගැලපෙන් නෑ මේ ගෙවල්..

කෙල්ල කිව්වේ උන බට දෙකක් හරහට දපු කඩුල්ලෙන් එහා පෙන සුදු වැලි මිදුල එක්ක තිබ්බ පොල් අතු ගේ පෙන්නලා..

" මඟුල..ඇයි මෙහේ ඉන්නේ අඟහරු ලෝකේ වුන්ද..
බැහැලා එනවා මෙන්න මෙහේ.. මන් යනවා

දවාත් වාහනෙන් බැහැලා ගියේ කෙල්ලට කලින් සදීනා බලන් හිටියේ දවාත් උණ බට දෙක අයින් කරලා ගෙදරට යන දිහා..

" මේ සදීනගේ මාමා වෙන්න ඕනේ..

දවාත් කෙලින්ම ගියේ ලුණු ඇඳේ දිගාවෙලා හිටිය වීරේ ළඟට. වීරේ කලබලේට නැඟිටගන්න දඟලද්දි දවාත් අත දීලා වීරෙව හේත්තු කලා..

" ඔව් මහත්තයා ..ඒ මගේ කෙල්ල.. ඇයි කෙල්ලට කරදරයක්ද මහත්තයා ...මේ මහත්තයා කව්ද එනකොට..

වීරේ කලබලෙන් ඇහුවේ කුසුමා ලිදූම් යවපු බවක් නොදන්න හින්ද..

sinhalaebooks.com

" නෑ නෑ.. මත් සදීනව එක්කත් ආවා..මාමට අසනීප නිසා..සදීනා ඉන්නේ අපේ ගෙදර..

කොල්ලා කියද්දි සදීනා රෙදි මල්ල උස්සන් කඩුල්ලෙන් පැනලා දුවන් ආවේ වීරේ ළගට..

" අනේ මාමේ..මොකක්ද මේ කරගත්තේ..

සදීනා වීරෙගේ කකුල අල්ලගෙන ඇඩුවා.. දවාන් බලන් හිටියේ හිටගෙනම කෙල්ල දිහා.. මෙච්චර අමාරු ජීවිතයක්ද කෙල්ල පොඩි කාලේ ඉදන් ගෙවලා තියෙන්නේ කියලා හිටිජෙද්දි කොල්ලට දුකයි..

" හරි හරි.. දැන් ඒවා වකතා කරලා වැඩක් නෑ..කරුමෙට වුනා ඉතින්..
අප්පේ උඹ දැක්ක එක මට පුදුම සතුටක් බන්..

කෝ ඉදින් නැම්දට කතා කරන්න.. අර මහත්තයා ට ඉදගන්න පුටුවක්වත් නෑ..

කුසුමෝ...මේ ඔය ප්ලාස්ටික් පුටුවක් ඇන්න වරෙන්කෝ..මේ කවුද ආවේ බලන්න..

සදීනා බැලුවේ දවාන් දිහා.. කොල්ලා හිටගෙන අත් දෙකත් බැඳන් බලන් ඉන්නවා.. හරියට ඉදගන්නවත් තැනක් නැති ගෙදරක් කියලා කොල්ලා හිතින් බනිනවා ඇති කියලා කෙල්ල හිතුවේ..

" අපේ අප්පෝ මේ සදීනානේ අපේ.. ලස්සන බලපන්කෝ.මේකිගේ.. බෝල ගෙඩිය වගේ..

කුසුමා කෙල්ලව වැලඳගත්තේ ගෙයි ඉදන් පුටුවක් අරන් ඇවිත් එලියෙන් තියලා දවාන් ට ඉදගන්න දීලා..

" නැන්දේ.. කෝ නංගී මල්ලී..

" උන් වැල්ලේ ඇති.. ඒක නෙමෙ මේ උඹ කසාද බැඳපු මහත්තයද..

සදීනා උඩ ගියා එකපාර කුසුමා අහද්දි..දවන් කුසුමා දිහයි සදීනා දිහයි මාරුවෙන් මාරුවට බැලුවේ එකපාර කිව්ව කතාවට..

" ආ.ආ.. මේ නෑ නැන්දේ මේ මහත්තයා ගේ බබාව තමා මත් බලා ගන්නේ..

" ආ..එහෙමද.. ඉන්න මන් තේ ටිකක් හදන් එන්නම්..මහත්තයටත් එක්ක..

කුසුමා ඇතුකට ගියේ සදීනා වගේම දවානුත් කලබල වුනා කියලා තේරුන හින්ද.. කුසුමා වැරදි දෙයක් ඇහුවාද කියලා හිතිලා..

sinhalaebooks.com

සදීනා හොරාට බැලුවේ දවාන්ගේ මූන දිහා.. දවාන් ඉන්නේ අවුලෙන් කියලා තේරුනා ඔච් කොල්ලාට හිතාගන්න බෑ. සදීනගේ නැන්ද එකපාර එහෙම අහන්න තිබ්බ හේතුව..

" සදීනා මුහුදට හුගක් ඈතද මෙහෙ ඉඳන්..

දවාන් ඇහුවේ කෙල්ල එක්ක කතා කරන්න ඕනේ හින්ද කෙල්ලව තනිකරගන්න හිතල..

" අපෝ නෑ මහත්තය..ඔය ගෙවල් පහ හයකට එහායින් තියෙන්නේ.. අඩි පාරෙන් හුවක දුර..

සදීනා එක්කන් පලයන්කෝ මේ මහත්තයව ටිකක් මුහුද පැත්තට..ගම බලන්නත් එක්ක.. නැන්ද තේ ටික ලෑස්ති කරනකන්..

සදීනට දැන් ඕනේ දවාන්ව මගාරින්න ඒත් වීරේ කියද්දි කෙල්ලට බෑ කියන්නත් බෑ.. දවාන් කුසුමා අහපු එක හිතේ තියන් ඉඳලා කෙල්ලගෙන් අහයි කියලා බයයි..

" හ්ම්.. යමු දවාන් මහත්තයා..

සදීනා ඉස්සර වුනේ ගෙට මෙහායින් තිබ්බ අඩි පාර දිගේ.. හැම ගෙදරකම ඉස්සරහා පොල් අතු ගහලා තිබ්බ වැටක් තිබ්බා වැල්ලේ .. කොල්ලයි සදීනයි දිහා වැටවල් වලින් කඩුලු වකින් ජනෙල් වලින් එක එක්කෙනා බලන් හිටියේ අමුත් මිනිස්සු දැකලා වගේ කොල්ලට නුහුරුයි..සදීනා සද්ද නැතුවම ඉස්සරහින් ගියේ බලන් ඉන්න අයට හිනා වෙලා කතා කරන.. ගමන්..

" මොකද දවාන් මහත්තය ඔය කරන්නේ..

දවාන් නැවතිලා ෂටර් එක යි කලිසමයි දිහා හොදට බලනවා දැකලා සදීනා ඇහුවේ..

" මන් බැලුවේ කලිසමේ ෂිප් එකවත් ඇරන්ද කියලා.. නැත්තන් කොහෙ හරි පැච් එකක්වත්ද කියලා..

" ඇයි..ඒ..

" නෑ මේ මිනිස්සු මන් දිහා බලන්නේ මන් හෙලුවෙන් යනවා වගේ ඕයි.. ලැජ්ජයි මට..

සදීනට හිනා යන්න ආවත් කෙල්ල හිනාව තද කරන් ගියේ.. දවාන්ට හුරු නැති වැල්ල ගැන හිත හිත...
පොල් රුප්පාවෙන් පේන ඈත මුහුද හැමදම වගේ සද්දෙට වෙරළට එද්දි ඒ හුළඟ සදීනව අතීතෙට අරන් යනවා ..කෙල්ලට හිතෙන්නෙම දුවගෙන ගිහින් මුහුදට පනින්න.. ජීවිතේන් කොටසක් වගේ හරියට මුහුද ..දැන් ආගන්තුකයෙක් බලන්න ආවා වගේ..දැනෙන්නේ කෙල්ල දවාන්ට ඉස්සර වෙලා යන්නේ ඈත මුහුද දිහා බලන්.. 

sinhalaebooks.com

ඒත් මේ වෙලාවේ දවාත්ගේ හිත කැළඹිලා හරියට කුණාටුවකට අහුවුන නැවක් වගේ. කුසුමගේ කතාව කොල්ලට තාමත් පෙහෙලිකාවක්...

" සදීනා... මොකක්ද අර නැන්ද කියපු කතාවේ තේරුම..

දවාත් ඇහුවේ යන ගමන නැවතිලා ඉඳන්.. සදීනා දවාත් දිහා බැලුවේ හැරිලා කෙල්ල ඉන්නේ ටිකක් ඉස්සරහින්.. සදීනට ඇහුනා දවාත් කියපු දේ ඒත් කෙල්ල වෙනසක් නෝපෙන්වා කතා කලා..

" මොන කතාවද මහත්තයා..

" අර මම තමුසේ බැඳලා ඉන්න කෙනාද කියලා අහපු එක..

සදීනා කටට ආව කෙල පිඩක් ගිලගත්තේ අමාරුවෙන්.. ඒක කොයි වෙලේ හරි දවාත් අහයි කියලා කෙල්ල දැනන් හිටියා.

" ඒක නැන්ද නිකන් කියන්න ඇත්තේ..

" නිකන් බැඳලද අහන්න නැන්දට මොලේ අමාරුවක් නෑනේ සදීනා.. මට ඇත්ත කියනවා.. මොකක්ද ඒ කතාවේ තේරුම..

සදීනා නවතින් නැතුව පාරේ ඇවිදන් ඉස්සරහට ගියේ බිම බලන්..දවාත් නැවතිලා හිටියේ සදීනගෙන් උත්තරයක් එනකන්..

" ඒවා වැඩක් නෑ මහත්තයා දැන්...

"නෑ මට දැනගන්න ඕනේ.. තමුසේ ඒ ගැන කියනකම් මන් යන් නෑ මෙතනින් අඩියක්වත්..

දවාත් පාරේ හිටගෙන ඉන්නේ රවාගෙන.. සදීනා දන්නවා දවන්ගෙන් ප්‍රශ්නයක් ඉස්සරහා ලිස්සලා යන එක හරි අමාරු දෙයක් කියලා.. කෙල්ල ආපහු ආවේ දවාත් ළගට..

" ඒ කතාව ඇත්තක් මහත්තයා..ලොකු නෝනයි ලොකු මහත්තයයි මාමට සල්ලි දීලා මාව අරන් ගියේ මහත්තයට කසාද බන්දලා දෙන්න.. ඒත් මන් කැමති තිබ්බේ නෑ.. නන්නාදුනන මනුස්සයෙක් බඳින්න කවිද මහත්තයා කැමති වෙන්නේ.. මාව බලෙන්ම එක්කන් ගියා ඒ වුනත්..

එදා මන් ආව ඉස්සල්ලම දවසේ මහත්තයා යකෙක් වගේ මාව අල්ලගෙන මට ගැහුවා බෙල්ල මිරිකුවා..එදා මන් හොදටම බය වුනා මහත්තයා..
ඒ වගේ දරුණු කෙනෙක් බඳිනවට වඩා හොදයි මට ජීවිතේ නැති කරගන්න එක කියලා හිතුනා..

sinhalaebooks.com

සත්තයි මත් එහෙන් හොරෙන් පැනලා කොහේ හරි යනවා කියලා හිතන් හිටියේ..

ඒත් ලොකු නෝනා අයාන් එක්කන් ඇවිත් මට බාර දුන්න වෙලාවේ මොකක්දෝ එකකට මත් අයාන්ට ආදරේ වුනා මහත්තයා.. ඊට පස්සේ ලොකු නෝනාට මත් කිව්වා ආයු ලොකු වෙනකම් මත් ඉන්නම් එයාව බලාගෙන කියලා..මහත්තයව බඳින්න බෑ කිව්වා.. ලොකු නෝනා මට පොරොන්දු වුනා ආයු ලොකු වුනාම මාව ගමේ එවනවා කියලා..

අයුට එයාගේ තාත්තගේ ආදරේ අරන් දෙනවා කියලා මත් එයාට පොරොන්දු වුනා.. ඒක මත් කලේ මහත්තයා
මෙච්චර දවස්.. මට සතුටුයි මහත්තයා ආයුට ළන් වෙලා නිසා..

කෙල්ල කියන් යන වචන දවාන්ගේ පපුවට පිහිතුඩකින් අනිනවා වගේ.. කෙල්ලගෙන් මේ වගේ කතාවක් බලාපොරොත්තු වුනේ නෑ.. පිස්සෙක් වගේ තිබ්බ ජීවිතේ පාට කලේ කෙල්ල ඒ ජීවිතේ අයිති සදීනට..දවාන්ට දැන් සදීනා නැති ජීවිතයක් හිතන්න බෑ. ඒත් කෙල්ල අමු අමුවේ යකෙක් කියලා කියන්නේ කොල්ලගේ ආදරේ නොදැන.. ඒ පපුව පැලිලා යන තරම් වේදනයි..

" ඇති සදීනා ඔය ඇති.. ප්ලීස්.. තවත් එපා..
මත් යනවා..පරිස්සමින් ඉන්න..

දවාන් ආපහු හැරුන වේගෙන්ම වාහනේ ලගට ආවේ පස්සෙන් දුවන් එන කෙල්ල දිහා හැරිලවත් නොබලා

" දවාන් මහත්තයා ඔහොම ඉන්නකෝ.. අනෙ නැන්ද තෙ හදනවා ඉන්න ...මහත්තයා.. අනේ......

දවාන් වාහනේට නැග්ග වේගෙන්ම ගියේ සදීනා ග්ලාස් එක අල්ලන් හිටියත් දවාන් වාහනේ ගිය වේගෙට සදීනා විසිවෙලා ගියා..

" අනේ මහත්තයා අයාන්ව බලාගන්න හොදට..

සදීනා කඩුල්ලෙන් ඇතුළට ආවේ කඳුලු ඇස්වල තියන්.. දවාන් හිත තරක් කරගත්තද කියලා..ඒත් ඇත්ත ඒක..කවදහරි කෙල්ල දන්නවා ආපහු එන්න වෙනවා කියලා.. ආයු ලොකු වුන දවසක කෙල්ල වැල්ලට එනවා කියලා හිතාගත්තේ ඒ ජීවිතේට වඩා කෙල්ලට හුරු වැල්ලේ ජීවිතේ හින්ද..

දවාන් බඳින්න කෙල්ලට හිත හදගන්න එදා වගේම අදටත් බෑ.. පහත් නිසා කෙල්ල ගෑහැතියක් කියන එක දන්නේ කෙල්ල විතරයි..ආයි වෙන මනුස්සයෙක් ලගට යන්න කෙල්ලට බෑ.. ඒ තියා දවාන් වගේ කෙනෙක් කවදවත් කෙල්ලට කැමති වෙන්නෙත් නෑ. අපිරිසිදු කෙල්ලෙක් වැල්ලේ ඉඳලා නටලා නටලා ආවා කියලා කෙල්ලට දොස් කියයි කියලා බයයි..

sinhalaebooks.com

" ආයුව දලා මන් එනවා කියපු එකට මහත්තයට දුක හිතෙන්න ඇති..ඒත් කවදහරි හොඳ නෝනා කෙනෙක් ලැබෙයි මහත්තයට වගේම ආයුටත් හොඳ අම්මෙක් වෙන කෙනෙක්..

මේ වැල්ලේ අවජාතක මාව එදට නිකම්ම අමතක වෙයි. මම එදට සතුටින් එනවා වැල්ලටම..මගේ ජීවිතේ අයිති මේ වැල්ලට.

........................................................................................

දවාත් කෙලින්ම ගියේ ආදී හොයාන..කොල්ලට දුකක් දැනෙන ඕනමවෙලාවක ආදී ලග පුංචි සැනසීමක් තිබ්බා.. හැමදේම ආදී ඉස්සරහා කියමන්න නිදහස තිබ්බා.. දවාත් ආදීලගේ දිහාට එද්දි රෑ වුනා. කොල්ලා ගෙදර ගියේ නෑ සදීනා නැති ගෙදරක දවාත්ට දැන් මොහොතක්වත් ඉන්න බැරිතරම්..

" මේන් ලොකු බොස්ට අපිව මතක් වෙලා.. සුදු බෝලේ මේ එන්නෝ ඔයාගෙ දවාත් පුතා ඇවිත්.. පාවඩ එලලා පිළිගන්න එන්නෝ..

ආදී කෑ ගහන්නේ ආදිගේ ආච්චිට.. ආදී දවානුයි දෙන්නටම එක වගේ ආදරේ කලා ආදීගේ ආච්චි.. ආදිගේ අම්මයි තාත්තයි රට ඉන්න නිසා කොල්ලට ලංකාවේ හිටිය එකම කෙනා ආච්චි විතරයි..මොන රටේ හිටියත් ආදී ලංකාවට දුවන් එන්නේ ආච්චි බලන්න..

" දවාත් පුතා.. අපිව මතක් වුන වෙලාව තමා නේද..

" අනේ සුදු බෝලේ මන් දුකෙන් අද.. මගේ ඔලුව රිදෙනවා පැලෙන්න වගේ.

දවාත් ආදී ආච්චී ලගින් ඇතුලට ඇවිත් සෝෆාවට වැටුනේ ඔලුව අල්ලගෙන..

" ඒ දවාත්.. ඇයි මචන්.. උඹේ මූනත් එක්ක වෙනස් වෙලා උඹ ඇඩුවද...

ආදී ඉඳගත්තේ කොල්ලා ළගින්.. ආච්චි ඇවිත් දවාත්ගේ ඔලුව අරන් කකුල උඩින් තියාගෙන අතගෑවේ කොල්ලා පොඩි කාලෙත් ඇවිත් තුරුල් වෙලා අඩන්නේ ආදිගේ ආච්චි ලග ඒ කාලෙත් ඔඩොක්කුවේ තියන් ඔලුව අතගෑවම දවාත්ට නින්දයනවා.දසුනි එක්ක වලි දාගත්තම එහෙම කොල්ලා එන්නේ ආදීගේ ආච්චීව හොයාන..

" පුතේ ප්‍රශ්නයක් එද්දි ඒවට උත්තරත් අපට දෙනවා..කලබල නොවී අපි ඒ උත්තර හොයාගන්න ඕනේ..

ආච්චි දවාත්ට කිව්වේ කොල්ලා ඇස් පියාන අහන් ඉද්දි..

" අනේ සුදු බෝලේ මට බයයි.. එයා මාවයි මගේ කොල්ලයි දාලා යයි කියලා..

sinhalaebooks.com

" ආ ආ.. දැන්නේ මීටර් වුනේ. මේ ප්‍රේම ගීත්තක් සුදු බෝලෙ.. මන් කිව්වේ මූ අර කියුවිට ලව්.. ඒකයි සුදූ ඔය ප්‍රශ්නේ..

ආදී ආච්චිට කියලා තිබ්බේ දවාන් සදීනට ආදරේ කරනවා කියලා..ආදී කොල්ලා අවුස්සන්න සදීනට ලන් වෙන්න හැදුවෙත්.. ඒකයි ආදී කෙල්ල දැක්ක දවසෙම හිතුවා දවන් නවතින්නේ සදීන ළග කියලා..

" දවාන් පුතා.. ආදී මට කිව්වා..
ඔයා අදරෙයිනම් ඒ දරුවට ඒක කියන්න එපැයි..
මෙහෙම හිතේ තියන් දුක් විඳලා වැඩක් නෑ නේද..

" සදීනා.. මට කැමති නෑ සුදු බෝලේ..
එයා ආයු ලොකු වුනාම යනවලු..මට ජීවත් වෙන්න හේතුවක් නැති වෙයි එහෙම වුනොත්..

" අනෙ මගුලෝ.. ඒ ආයු ලොකු වුනාමනේ ඉතින්..
අනික ඒකට තව කොච්චර කල් තියනවද..
ඒ වෙනකම් උඹ පොල් ගාන්නැනේ..කෙල්ලට ලන් වෙයන් ටිකක්..

යමන් ගෙදර. මන් කියන්න කියුවිට.. මේකා මෙතන මැරෙන්න තානවා කියලා..

ආදී නැගිට්ටේ දවාන්ව ඇඳන් ගෙදර යන්න හිතාන්..

" සදීනා ගෙදර ගියා..

" මොකක්.. ආයේ එන්නැද්ද කියුවි..

ආදී එහෙමම ආයේ පුටුවට වැටුනේ දවාන් ඇස් පියන් ඉද්දි..

" එයි.. මාමට අසනීපයි කියලා ගියේ ...

" ආ ඒක මිසක්..මන් බයවුනා උඹ අරන් ගාල්ලේ දුවන්න වෙයි කියලා මට..

ආදී හිතාවුනේ ආච්චිගෙන් ගුටියක් කාලා..කෙල්ලා රෑ වෙනකම් ආදීලගේ ගෙදර හිටියේ සදීනා නැතුව ගෙදර ගිහින් ඉන්න බැරි හින්ද..

..................................

සදීනා රෑ කාලා පැදුර එලාගෙන බිත්තියට හේත්තු වෙලා කල්පනා කලේ පහන් ගැන.. කෙල්ල හවස නැන්දගෙන් යන්න ඇහුව වෙලාවේ නැන්ද බෑන්නේ යන්න එපා කියලා ඒත් උදේම කෙල්ල පහන් බලන්න යන්න හිතා ගත්තා..

sinhalaebooks.com

" මන් එනවා පහන් අයියේ..ඔයාව හොයාන..
ආයිම ආවා ඔයාගේ සදීනා..

කෙල්ල නීලට කියලා පහන්ට ෂටර් එකක් ගෙන්න ගෙන තිබ්බා දවසක් කොළඹින්.. කෙල්ල කවදහරි ගමේ යන දවසට අරන් එනවා කියලා.. ෂටර් එක අරන් පපුවට තියන් කෙල්ල පැඳුරේ ඇලවුනේ..

" අනේ මගේ ආයු නිදිද දන්නෑ.. අඬවද දන්නෑ..
මගේ පපුව රිදෙනවා.. කොල්ලට බඩගිනි වෙලා ඇති..

කොල්ලට බඩගිනි වෙද්දි සදීනට පපුවට දැනෙනවා ඒක කෙල්ල දන්නවා. අදත් එහෙමයි නින්ද ගියේ නෑ චුට්ටක්වත් ඇස් පියාගත්දී මැව්නේ ආයුව.. පපුවට තුරුල් වෙලා ඉන්නවා වගේ දැනෙන්නේ..
වෙලාවකට කෙල්ල පැඳුරේ අනිත් පැත්ත බැලුවේ කොල්ලා ළග ඉන්නවා වගේ දැනුන හින්ද..

පැයක් දෙකක් කෙල්ල අඩ අඩ හිටියේ ගෙදර අය නිදි හින්ද කළුවරේම බිත්තිය මුල්ලට වෙලා..ඔලුව ගහන් හිටියා.. කෙල්ල එක පාරක් වෙලාව බලද්දි රෑ මැදියමත් පහුවෙලා.. ඇස් පියවෙන්න හිතන්නෙවත් නෑ.

එකපාරම ආව සද්දෙන්කෙල්ල ගැස්සුනා..ඒක හරියට රණබාහුලගේ ගෙදර දුරකතනය නාද වෙන සද්දේ වගේ සදීනා වට පිට බැලුවේ එන්න එන්න වැඩිවෙන සද්දේ එන්නේ කොහෙන්ද කියලා..

" අඩේ මොකක්ද කෙල්ලේ ඒ සද්දේ.. පොලිස් ජීප් එකක වගේ. බලපන් දොර ඇරලා පොලිසියෙන් පැනලද කියලා කිරාගේ වාඩියටවත්.. ඕකා කුඩු හංගලා ඇති මෙලහට..

කුසුමා ලාම්පුවක් අරන් දොර ළගට ගියේ එලිය බලන්න..සදීනා නැගිටලා හැමතැනම බැලුවා..

" අම්මේ මේ..අක්කාගේ බෑග් එකේ ෆෝන් එකක්..ඒකෙන් එන්නේ සද්දේ..

කුසුමගේ පුතා කෙල්ලගේ බෑග් එකෙන් ගත්තේ පොඩි ෆෝන් එකක්.. සදීනා දුවන් ආවෙ එහෙම එකක් ගෙනාවේ නැතුව කොහොමද බෑග් එකට ආවේ කියලා..

කෙල්ල ෆෝන් එක අරන් බලද්දි ඒකේ තිරේ වැටිලා තිබ්බ නම දවාන්ගේ..කෙල්ලට පුදුමයි මේ දවාන්ගේ වැඩක් කියලා කෙල්ලට තේරුනා..මේ වෙලාවේ හැටියට දවාන්ගේ කෝල් එක කෙල්ලට මහ මෙරක් වගේ..

" මහත්තයා..කෝ ආයු..

කෙල්ල ෆෝන් එක කනට ගත්ත ගමන් ඇහුවේ ආයාන් ගැන..

sinhalaebooks.com

දවාත්ගේ ඇස් වලින් කඳුලු ආවේ හෝගාලා.. කොල්ලා ආදිලගේ ගෙදර ඉඳන් ඇවිත් ආයුව අරන් ඇඳට ආවට නින්ද ගියේ නෑ.. ආයුගේ නින්ද කෙටි වුනා අහැරලා සදීනව හොයනවා දවාත්ව අත ගගා.. කෙල්ලගේ උණුහුම හොයන කොල්ලා දැක්කම දවාත්ගේ පපුව පිච්චිලා ගියා..

ෆෝන් එක හොරෙන් දම්මේ කෙල්ල එක්ක කතා කරන්න ඒත් දැන් එහෙම කතා ක්රන්න
හොයලා බලන්න කෙල්ල දවාත්ට අයිතියක් දෙන් නෑ කියල දන්නවා ඒත්
ආයාත් නිසා කොල්ලා කෝල් එකක් ගත්තේ කෙල්ලට.
සදීනගේ කට හඬ ඇහෙද්දි කොල්ලා නිදගනී කියලා හිතලා..

" ආයු ඉන්නවා. එයාට නින්ද යනකම් කතා කරන්න සදීනා.. මන් ෆෝන් එක ළගින් තියන්නම්..

දවාත් කොල්ල ළගින් ෆෝන් එක තියලා ඇඳේ පැත්තකට වුනේ නිහඬවම..නිකමටවත් පරිස්සමට ගෙදර ගියාදවත් දවාත්ගෙන් කෙල්ල ඇහුවේ නෑ.. දවාත්ට දුකයි .. සදීනා කොල්ලා ගැන එහෙමවත් හිතන් නෑ කියලා හිතෙද්දි..

." ආයු මගේ පුතේ.
අම්මි ඉන්නවා පුතා දොයියගන්න ඕනේ..
මගේ මැණික.. බයි කැවද අද..
ආච්චි පුතුට කුක්කු දුන්නද...
ම්ම්ම්.. කෝ මගේ හොර ගෙඩියා...

තාත්තිට කියන්න පුතුගේ පස්සට තට්ටුවක් දන්න කියලා එතෝට බයිගන්නම් කියන්න..

කෝ තාත්තී ඉන්නවද...

කෙල්ල කතා කලේ දවාත්ට. දවාත් කෙල්ල කියන හැම්දේම අහන්හිටියේ ඒත් ඇස්වල කඳුලු.. ආයාත් නිදන් හිටියේ ෆෝන් එක අල්ලන්..කොල්ලා සදීනා කතා කරනවා අහන් හිටියේ ආසාවෙන් .. ඒ හඬටපවා කොල්ලා නැලවෙනවා දවාත්ට හිතාගන්න බෑ සදීනා නැතිදවසක අයාත් කොහොම හැසිරෙයිද කියලා..

" සදීනා.. දැන් තියන්න..
කොල්ලා නිදි...

දවාත් ෆෝන් එක තියන්න ගියේ..කෙල්ල එක්ක කතා නොකර..දවාත්ට කෙල්ල එක්ක කතා කරන්න හිත හයිය නෑ..

" ඉන්න දවාත් මහත්තයා.. රෑ වෙන්න කලින් ගියා නේද..
ලොකු නෝනලා හොඳින්ද..

sinhalaebooks.com

මන් අනිද්දට එන්නම් කියන්න..

" හ්ම්..

දවාත් කෙල්ල එක්ක කතා කලේ නෑ..එහෙමම ෆෝන් එක තිබ්බා...

" දවාත් මහත්තයා මන් එක්ක තරහා වෙලාද කොහෙද..ගියාම යාලු කරගන්නවා..යක්ෂ මහත්තයා පුදුම ලොකුකමක්..

සදීනා එලියේ ඉදන් ගේ ඇතුලට ආවේ ෆෝන් එක පපුවට තුරුල් කරන්..කෙල්ලගේ හිතටත් හොදයි ආයුට කතා කරන්න පුලුවන් වුන එකට..

" කවුද කෙල්ලේ කතා කරේ..

සදීනගේ මාමා ඇඳේ ඉදන් ඇහුවේ කෙල්ල ගෙට එද්දිම..

" දවාත් මහත්තයා මාමේ. බබාට නින්ද යන්නැලු මම නැතුව.. ටිකක් මන් කතා කලා නින්ද යනකම්..

" අනේ පොඩි දරුවා උඹට එකතු ඇති..

" අනේ ඔව් මාමේ.. ආයු අම්මා කියන්නේ මට..
මටත් මේ ආවට දුකයි. ඉක්මනටයන්න ඕනේ මන් මාමේ..

කෙල්ල කිව්වේ වීරේ ළග ඉදන් ඇතුලට එන ගමන්..

..........................................................................

ණර්බාහු වෙනදට වඩා උදෙන්ම ලෑස්ති වෙලා පහලට ආවේ වැඩ වැඩි දවක් හින්ද.. මොකද දවාත් එක්ක අද හවස සපරමාදුලගේ ගෙදර යන්න ප්ලෑන් කරගෙන හිටියේ.. පරම්පරා ගානක් ගොඩ නගපු බිස්නස් කඩාවැටෙන්න යද්දි මිනිස්සු ඕනෙම දේයක් කරනවා රණබාහුත් බිස්නස් එක වෙනුවෙන් වැඩ කලේ එහෙම.. කොහොම හරි දවාත්ව මේ කසාදෙට කැමති කරගන්න ඕනේ කියන තැන රණබාහු හිටොයේ ඒ හින්ද..

" මහත්තයා අද උදේම යන්න ද..

සමදරා හිටියේ රණබාහුට තේ එක හදන ගමන්..

" අද වැඩ වැඩී සමදරා.. උදේම කොට්ටාවෙ වැඩ ටික ඉවර කරලා හවස පුතා එක්ක සපරේලාගේ යන්න ඕනේ...

sinhalaebooks.com

සමදරා කතා නොකර හිටියේ දවාත් කීයටවත් කසාදෙකට කැමති වෙන් නෑ කියලා දන්න නිසා.. ඒක රණබාහුට කියලා පහදන්න ගියොත් නවතින්නේ වලියකින් කියලා දන්න නිසා නිහඬවම හිටියා..

" තේ එක මහත්තයා..

" කෝ පුතා..උදේම ඔෆිස් ගියාද..

රණබාහු ඇහුවේ පඩිපෙල දිහා බලලා..දවාත් පේන්න නැති හින්ද..

" ලැස්ති වෙනවා මගේ හිතේ.. ආ ඔය කියනකොටම එන්නේ..

දවාත් කහ ෂටර් එකට කලු ට්‍රවුසර් එක ඇඳලා පඩිපෙල බැස්සේ ටයි එක දන ගමන්.. කොල්ලගේ පෙනුම තාම තරුණයි සපරමාදුගේ දුව කොල්ලා දැක්කම එක පයින් කැමති වෙන එක අහන්න දෙයක් නෑ කියලා රණබාහුට හිතුනේ..

" Good morning පුතා අද හවස ෆ්‍රී කරගන්න.. අපට ගමනක් යන්න තියනවා..

සමදරා දන්න නිසා රණබාහුගේ මූන දිහා බැලුවා.. දවාත්ගෙ මූන අද එච්චර හරිනෑ කියන්න සමදරාට තේරුනා.. කොල්ලා ඊයේ සදීනා දලා ආවත් හරි දැනුයි දැක්කේ.. දවාත් එද්දි හුගක් රෑ වෙලා තිබ්බා..

" කොහෙද යන්නේ තාත්තේ..

දවාත් එනගමන් ඇහුවේ රණබාහුගෙන්

" සපරේලාගේ ගෙදර.. රෑට ඩිනර් වලට එන්න කිව්වා.. අපි ගිහින් ටිකක් කතා කරලා එමු..

දවාත් හිස වැනලා නිකන් හිටියේ කොල්ලට ඒ කිසිම දෙයක් දැන් වැදගත් නෑ.. ආයේ පිස්සෙක් වගේ ඉන්න තිබ්බනම් මොකුත් නෑ කියලා හිතිලා ඉන්නේ..

" පුතා ආයු නිදිද..සදීනා නැති හින්ද කොල්ලා ඊයේ දවසම ඇඩුවා. මේ කෙල්ලට ඇබ්බැහි වෙලා දැන් පොඩි එකා

සමදරා කියද්දි දවාත්ගෙ පපුව සීතල වෙලා ගියා.. රෑ නින්දක් නැතුව හිත අස්සේ තියන් විඳවපු ඒ වේදනාව සමදරා අලුත් කරා..

" නිදි අම්මා.. ඇහැරුනාම කිරි එක දෙන්න..

sinhalaebooks.com

රණබාහු යනකම් කොල්ලා තේ මේසෙට වෙලා ඉඳගෙන හිටියේ තේ කෝප්පේ තොලේ ගගා.. එක උගුරක්වත් බොන්න හිතුත් නෑ.. වෙනද ගේ පුරාම සදීනා දුවනවා මේ වෙලාවට.. ආයුට කිරි එක පොවන්න එහෙම නැත්තන් තේ හදලා හැමෝටම දෙන්න.. ළගකදී ඉදන් දවාන්ගේ තේ එක වැඩි හරියක් හදලා දුන්නේ කෙල්ල..අද දවාන්ට ඒ හැමදේම මතක් වෙනවා .. පාලුවක් දැනුනා සදීනා නැති ගෙදර..

" පුතා.. මොකද මේ වරුවක් විතර ඔය තේ එකක් අතේ තියන් දැන්.. යන් නැද්ද ඔෆිස්..

සමදරා කුස්සියේ ඉදන් ඇවිත් අහද්දි දවාන් ගැස්සුනා.

" අම්මා.. මට දෙයක් දැනගන්න ඕනේ...

සමදරා ඇවිත් දවාන් ළගින් වාඩිවුනේ දවාන් මේ අහන්න යන දේ මොකක් වුනත් ඒ ප්‍රශ්නේ කොල්ලගේ මූනේ තිබ්බා කියලා දැකලා.. කලපනාබරව ඉන්න තරම් දවාන්ට වද දෙන ප්‍රශ්නේ සපරමාදුගේ දුවව බන්දන එක නෙමේ කියන්න සමදරා දන්නවා මොකද අද හවස තම ඒක දවාන් දැනගත්තොත් දැනගන්නේ..

" කියන්න පුතා..ඇයි මොකක්ද ප්‍රශ්නේ..

" සදීනව මෙහෙට ගෙනාවෙ මට බන්දලා දෙන්නද..

සමදරාගේ ඇස් දෙක ලොකු වෙනවා දවාන් බලාගෙන ඒ කතාව ඇත්ත කියලා දවාන් දන්නව ඒත්.. සමදරාගේ ක්ටින් ඒක අහගන්න දවාන්ට ඕනේ වුනා..

" ඔව් පුතා..ඒත් තාත්තා කැමති වුන් නෑ. මගේ වදේට අපි ඒ ලමයාව එක්කන් ආවෙ.. සදීනා කැමති වුන් නෑ පුතාව බදින්න කොහොමවත්ම..ඒකයි එයා අයාන්ව බලාගෙන ඉන්න කියල අපි තියාගත්තේ..

" මන් ඒක දන්නව..මම යක්ෂයෙක් කියලා හිතාගෙනනේ එයා මාව බදින්න බෑ කිව්වේ..

සමදර දවාන්දිහා බැලුවේ සදීනාගෙම් හැමදේම දැනගෙන කියලා හිතලා..

" නෑ පුතා ඒකම නෙමෙයි හේතුව..

" එහෙනම්..

" ඒ ලමයා මෙහේ ගේද්දිත් වැල්ලේ කොල්ලෙක් එක්ක සමබන්ධයක් තිබ්බා.. සදීනගේ මාමා කියපු විදියට ඒක නවත්තන්න කෙල්ල කැමති නෑ බලෙන්ම මෙහෙ ආවා මිසක් කෙල්ල එන්න කැමැත්තක් තිබ්බෙම නෑ..

sinhalaebooks.com

දවාන්ගේ ඔලුවට කලු ගල් අතාරිනවා වගේ.. හිතාගන්න බැරිවුනා..සදීනා ඒ ආදරේ හින්ද තමා වැල්ලට යන්න ඔච්චරටම කැමති කියලා කොල්ලා හිතුවා..

දවාන් නැගිටලා එන්න ආවේ තවත් සමදරා ඉස්සරහා සාමාන්‍ය විදියට ඉන්න ශක්තියක් නැති හින්ද..

" ඇයි සදීනා උඹ මායි මගේ කොල්ලයි අතරට ආවේ..
මෙච්චර දුකක් දෙන්නද.. මීට වඩා හොදයි උඹ මාවයි කොල්ලවයි එක පාර මරලා දැම්මනම්..

දවාන් වාහනේට නැගලා ස්ට්‍රීන් වීල් එකේ ඔලුව ගහගෙන ගියේ කඳුලු ගලාගෙන යද්දි..

" ආයේ එන්න එපා සදීනා.. එන්නම එපා.

දවාන් කෙල්ලව අමතක කරලාදන්න හිතුවා.. තවත් සදීනා කියන්නෙ මිරිඟුවක් විතරයි කියලා දවාන් දන්නවා.. මෙච්චර කල්ම කෙල්ල වෙන ආදරයක් එක්ක ඉදලා කියලා දැනෙද්දි දවාන්ට ආවේ කියාගන්න බැරි පසුතැවීමක්..
.........................සදීනා උදේම නැගිට්ටේ බලාපොරොත්තු ගොන්නක් හිතේ තියන් කෙල්ල අද පහන්ව බලන්න යනවා ඒ මාස ගානකට පස්සේ. මේ ගෙවෙන ත්ත්පරෙත් සදීනා පහන්ව විස්වාස කරනවා මහ හුගක්..

දවාන් දුන්න දුරකථනය අතට අරන් කෙල්ල බැලුවේ දවාන්ගෙන් කෝල් එකක්වත් ඇවිත්ද කියලා.. ආයු නැගිට්ටද අහන්න කෙල්ලට කෝල එකක් ගන්න හිතුනත් ආයෙම ඒක යටපත් කරන් හිටියේ ආයුට කතා කරොත් මේ දැන්ම කොළඹ යන්න හිතෙන තරමට වේදනාවක් එන හින්ද..

" සදීනා උදේම නැවද බත්..මන් ඒත් බැලුවා පැදුරේ නැති හින්ද..

කෙල්ල ලිඳෙන් නාගෙන පිලිකන්නේ තිබ්බ රෙදි වැලට හෝදපු රෙදි ටික වනන්න එද්දි කුසුමා ඇහුවේ කුස්සියේ උයන ගමන්.. කෙල්ල උදේම නා ගත්තේ පහන් බලන්න යන්න.. පහන් ඉස්සරහට කොහොමත් කෙල්ල ඉස්සරත් ගියේ හරි ලස්සනට.. සදීනට තිබ්බා වැල්ලේ හිටිය හැම කෙල්ලෙක්ම පරදන රූපශ්‍රීයක්..ඒක කෙල්ලට වාසනාවට ලැබුන දෙයක්.. පහන් හැමවෙලේම කෙල්ලගේ ඇස් දිහා බලන් ඉන්න ආස.. ඒ ඇස් ඒ තරම්ම ලස්සනට තිබ්බා..

" ඔව් නැන්දෙ ඊයේ නාගන්නත් බැරි වුනානේ..
නැන්ද වැල්ලට යන්නේ නැද්ද අද....

කෙල්ල කුස්සියේ පුටුවක ඉදගන්න ගමන් ඇහුවේ කුසුමගෙන්..කෙල්ලටත් ඕනේ වැල්ලට යන්න..

sinhalaebooks.com

" මාමව පිහදලා කන්න දීලා තමා යන්නේ බත්.. ඒ මනුස්සයාගේ වැඩ ටික ඉවරවෙද්දි දවල් වෙනවා.. මන් ඒකනේ කියන්නේ තනියම මේ සුමේ බෑ කියලා.. උදේම මුන්ට ස්කෝලේ යන්න උයන්ඩ ඕනේ ඊටපස්සේ අර මනුස්සයා සුද්ද කරන්න ඕනෙ ඒ ඔක්කොමත් කොරලා වැල්ලට යන්න ඕනේ... මට ලෙඩක් කැටියොත් මුන් ඔක්කොම ඉවරයි..

කුසුමා කියන්නේ ඇත්ත කියලා සදීනා දන්නවා.. ලේසි නෑ ගෙදරක වැඩ තනි මනුස්සයෙක් දරාගන්න එක.. කෙල්ලට උදව්වක් කරන්න ඉන්න තිබ්බනම් හොදයි ඒත් අයාන් දලා කෙල්ලට එන්න බෑ...

" නැන්දේ මට හැමදම ඉන්න බැරිවෙයි.. මන් මාසෙට සල්ලි ටිකක් දන්නම් කොහොමහරි.. නංගිගෙයි මල්ලිගෙයි වැඩ වලටවත් ගන්න...මාමට හොද වෙන එකක් නෑ කියලද කියන්නේ ඩොක්ටලා..

" හොද වෙයි කිව්වා.. කොන්ද හරියන්න කල් යයි කිව්වේ ටිකක්..

ඒක නෙමේ උඹ දැන් ඔය ජැන්ඩියට ඇඳන් ඉන්නේ අර පහනා බලන්න යන්නද..

කුසුමා එකපාර කෙල්ලගෙන් අහද්දි සදීනා බිම් බලාගත්තේ නෑ කියලා බොරුවක් කියන්න බැරි හින්ද..

" මන් ගිහින් එන්නද නැන්දේ.. රෝසීවත් බලලා සයුරිත් හම්බෙලා එන්නම්.. කෙල්ලො ටික බලන්න ආසයි මට..

සදීනා හිටියේ වැල්ලේ රෝසිලා එක්ක කෙල්ලගේ යාලුවෝ ඔක්කොම වැල්ලේ කෙල්ලෝ ඒ ඔක්කොම ආපහු දකින්න කෙල්ලට තිබ්බේ ආසාවක්..

" උන්නම් ඔය හිටියේ.. ඒත් උඹ යද්දි හිටිය පහන්නම් නෑ දැන්.. ඌ දැන් තාත්තෙක්...

සදීනට පුටුවෙන් නැගිට්ටුනේ ඉබේටම.. කුසුමගේ කතාව කෙල්ලගේ කන්වල දෝංකාර දුන්නා..නෑ ඒක විස්වාස කරන් නෑ කෙල්ලගේ හිත.. පහන් කවදහරි කෙල්ල එනකම් ඉන්නවා කියලා සදීනා විස්වාස කලා.. මේක කුසුමගේ බොරුවක් කියලමයි සදීනගේ හිත කියන්නේ..

" නැන්ද බොරු කියනවා . ...

කුසුමා හැන්ද අරන් ආවේ සදීනා ලගට තරහෙන්.. සදීනට දෙකක් අනින්න තරම් තරහා.. පහන් කියන්නේ සල්ලාලයෙක් කියලා සදීනා එදා පිලිගත්තෙත් නෑ අදත් නෑ.. ඇස් පනා පිට කුසුමලා දකින ඇත්ත කෙල්ල ඇස් දෙකෙන් දකිනකම් විස්වාස කරන් නෑ කියලා කුසුමා දන්නවා.. සදීනව පහන් ලගට යවලාම ඇත්ත තේරුම් ගන්න අරිනවා ඇරෙන්න කියලා පහ්දන්න බෑ කියලා කුසුමා හිතුවේ..

sinhalaebooks.com

" එලදෙන.. උඹට බොරු ඇදබාලා මත් අහවල් එකක් ගන්නද බන්..
උඹම ගිහින් බලපන් සයිමලාගේ ගෙදර..
මේ දැන්ම පලයන් උඹේ පහනා වැල්ලෙම පහන් ටික පත්තු කරලා අවසානේ සයිමගේ දුව කරගහන් ඉන්නේ.. දැන්..
ඒ යක්ෂනී ඒකව මරන් කනවා.. දන්නවනේ ඒකිගේ කටේ සැර..
උඹට ඔච්චර සැකනම් ගිහින් බලලා වරෙන්..

කුසුමා කිව්වේ ඇත්ත ඒත් කෙල්ල ඒ ඇත්ත පිලිගත්තෙම නෑ.. හිත කිව්වෙම වැල්ලට ගිහින් පහන් හම්බෙලා ඇත්ත දැනගන්න කියලා..

" මන් යනවා පහන් අයියා හම්බෙලා එන්න..

සදීනා නැඟිට්ටේ කුසුමට කියාගෙන.. කෙල්ල පහන්ට ගෙනාව ෂටර් එකත් උරේකට දාගෙන ගෙයින් බැස්සේ හිත නොසන්සුන් කමෙන්..

" කෙල්ලේ උඹ උදේම කොහෙද යන්නේ.. තව අව්ව මෝරලාවත් නැතුව..

වීරේ ඇහුවේ කෙල්ල මිදුලට බහිනවා දැකලා..

" ඒකී ඔය පහනා බලන්නලු යන්නේ..

" පිස්සුද යෝධියේ..උඹ කිව්වේ නැද්ද ඌ දැන් පවුල් කාරයෙක් කියලා.. මේකි ඔතෙන්ට ගිහින් මොන ගිනිවිජ්ජුම්බරයක් කොරගනීද දන්නෑ..

වීරේ කුසුමට දොස් කියද්දිත් කෙල්ල කඩුල්ල පැනලා බාගයක්ම ගිහින්..

" ඒකීම ඇස් දෙකෙන් දැකලා ආපුදෙන්.. අපිව විස්වාස නැනේ..
කුසුම කුස්සියටගියේ සදීනා නොපෙනී යන්න ඇරලා..

කෙල්ල වැල්ල දිගේම ගියේ පහන්ලගේ ගෙදර.. සයිමා කිව්වේ රෝසිගේ තාත්තා
කුසුමා කියන විදියට රෝසිව පහන් බඳී කියලා කෙල්ලට හිතාගන්න බෑ.. ඉස්සර ඉඳන්
රෝසි දැනන් හිටියා කෙල්ල පහන්ට ආදරේ කලා කියලා.. රෝසී තමන්ට එච්චර දුෂ්ටකමක්
කරයි කියලා සදීනා විස්වාස කලේ නෑ..

පහන්ලගේ ගෙදරට යන්න හම්බුනේනෑ කෙල්ලට අඩි පාර ඉවර වෙද්දිම තියන වැටකෙයියා පඳුර ළග පහන්ලා දැල් වියනවා කෙල්ල දැක්කා. ඒත් පහන් ළගම හිටිය රෝසි කොන්දට අත තියන් බඩ අත ගගා හිටියේ මාස පහක විතර කුසක් එක්ක.. කෙල්ලට කකුල් දෙකත් පන නැතිවුනා..

දෙයියනේ..පහන් අයියේ..
එතකොට නැන්ද කිව්වේ ඇත්තකද...

sinhalaebooks.com

රෝසි පහත්ගේ කරෙත් අත තියත් හිටියේ හිටගෙන ඉත්ත අමාරුවට .. මේ සදීනා කාලයක් දැකපු හීනයක්..රෝසි සැබෑ කරගෙන ඉත්තේ.කෙල්ලට හිතා ගත්ත බෑ..

" ඒ අර බලපත් සදීනා... ඒකිගේ ලස්සන යකෝ සුදු හංසි වගේ..

රෝසිගේ මල්ලි කෙල්ලව දැකලා පෙත්තද්දි පහත් දැල බිමට දාලා නැගිට්ටේ බයවෙලා.. කෙල්ලට පහත්ගේ මූනක්වත් බලත්ත බෑ අද.. ඇස්වලිත් කඳුලු ඔහේ ගලාගෙන ගියා තාමත් වැල්ලේ හිටත් ඉත්ත කෙල්ල ලගට රෝසි එනකම්ම කෙල්ල හිටියේ ගල් වෙලා..

" වල් බැල්ලී.. තෝ කොළඹ මහත්තුරු එක්ක නටලා නටලා ආවද...අපේ පවුලුත් කාලා යත්ත..

උඹේ කව්රුත් මෙහෙ නෑ.. පහත් දැත් මගේ මිනිහා.. මේ බඩේ ඉත්ත එකාගේ තාත්තා.. පිත් සිද්දවෙයි අපේ පවුල විනාස තොකර උඹ ආපු දිහාකට පලයත්...

රෝසි කියත වචන කෙල්ලට ඇහෙත් නෑ.. පහත් ළගට කෙල්ල දුවත් ගියේ පහත්ට ගෙනාව ෂටර් එක බිම දාලා එක පෑගිලා වැල්ලට යටවෙලා ගියා.. කෙල්ල අත් දෙක පපුවට තියත් පහත් ලග දණගහ ගත්තේ අඩාගෙන..

" ඇයි පහත් අයියේ මට මෙහෙම කරේ..
මත් ඔයාගේ ආදරේට අබ මල් රේණුවක වරදක් කලේ නෑ.. පන වගේ රැක්කා ඒ ආදරේ..
මත් හිතුවා මත් කවදහරි එනකම් මගේ මගේ පහත් අයියා බලාගෙන ඉදී කියලා..ඒත්..
ඔයා මට ආදරේ කලේ බොරුවටද අයියේ..
ඒ ආදරේ බොරුවක් ද...

සදීනගේ කඳුලු ඉස්සරහා උණුවෙන හිතක් පගත්ට තිබ්බේ නෑ.. මොකද පහත් කෙල්ලට කවදුවට්ජ් ඇත්තට ආදරේ කලේ නෑ.. වීරෙගේ බෝට්ටුවට පැනගත්ත කෙල්ලව ආශ්‍රේ කලේ.. ඒකත් පහත්ගේ වාසියට..දැත් ඒ නිසා පහත්ට සදීනගෙත් වැඩක් නෑ..

" පලයත් සදීනා යත්ත්.. උඹ එක්ක මගේ කිසිම සම්බන්ධයක් තිබ්බේ නෑ..
මත් උඹට ආදරේ කරෙත් නෑ.. උඹ මගේ පස්සෙත් ආවා මිසක්..

පහත්ගේ වචන කෙල්ලට පිහියකිත් අතිතවා වගෙ.. අඩාගෙන වැල්ලේ ඉඳගත්තේ දුක කියත්ත අහත්ත කව්රුත්ම ලග නැතිවෙද්දි.. හැමෝටම වඩා විස්වාස කරපු තමත්ගේ ආදරේ අද කෙල්ලටම ද්‍රෝහි වෙලා.. කලකිරුනා හැමෝම ගැන කෙල්ලට..

" අඩේ මෙහේ වරෙල්ලා.. මේකි කොළඹ ගණිකා තිවාසෙක ඉඳත් ඇවිත් මගේ මිනිහා ගත්ත හදනවා.. මේකිට ගහලා පත්තපල්ලා..

sinhalaebooks.com

රෝසි බෙරිහන් දුන්නේ විලාප නගලා කෙල්ල බය වුනා..හීනෙකින්වත් නොහිතපු අපහාස ගොඩක් එක්ක හම්බුනේ ගුටි බැට පූජාවක්..

" අනේ මට ගහන්න එපා
අනේ රෝසි එපා.. මට පහන් අයියව එපා.. මන් ආවේ එයාව ගන්න නෙමෙ.. අනේ මාව අතාරින්නකෝ

අනේ නැන්දේ.............

සදීනා කෑ ගැහුවේ රෝසිගෙ පාරවල් කෙල්ලගේ කන්බුල් හරකා යද්දි තොල් පැලිලා ලේ ගලද්දි.. පහන් බලන් හිටියේ ගානක්වත් නැතුව.. රෝසි ඉස්සරහා පහන් කියන්නේ බය ගුල්ලෙක්..

" අත ඇරපන් තිරිසන් හැත්ත මගේ කෙල්ලව.
තොපිට කාලා ඉවරකරන්න නෙමෙයි මේකි ආවේ..
මොන වැරැද්දක් කරාටද තොපි කෙල්ලට ගහන්නේ..
මන් නරක ගෑනි කරගන්න එපා උඹලා..

මෙහාට වරෙන් සදීනා.. උඹට මේ නැන්ද විස්වාස නැතේ.. හොදවැඩේ උඩ දන් ආවට..උඹ දන්නැ මේ වැල්ලේ උන්ගේ හැටි මුත් මහ සක්කිලි හැත්තක්..

රෝසි උඹේ මලෙන් උපන් මිනිහා හයියෙන් අල්ලලා තියාගනින්.. සෝමේලාගේ ගෙට රිංගයි රැට රැට..

කුසුමා කෑ ගැහුවේ සදීනව අල්ලගෙන්.. කෙල්ලට හොදටම තුවාල වෙලා.. කෙල්ලට බනින ඒවා තියා කෙලින් හිටගන්න පන නෑ..

" උඹත් පලයන් ඕකි එක්ක කොළඹට ...
අහවල් එක විකුණන්න..

රෝසිගේ අම්මා තෝන්ඩියට් කියලා මහ හයියෙන් හිනා වෙද්දි කුසුමා කෙල්ල අරන් එන්න ආවෙ. තවත් රණ්ඩුවට ගියොත් එකෙක් දෙන්නෙක් කපාගෙන ඉස්පිරිතාලේ නවතින්න වෙන හින්ද...

.....................................................................

ඊයේ සදීනගේ කතාවයි උදේ සමදරාගේ කතාවයි ඒ දෙකම දවාන්ගේ හිත කඩල බිඳලා දැම්මෙ හරියටබිපිපිගෙන ආව මල් පොහොට්ටුවක් සැර කුනාටුවකට අහුවුන ගානට..සදීනා එක්ක ජීවිතෙ විඳින්න කොල්ලා හීන දැක්ක හැමදේම නැතිවෙලා ගියා කියලා කොල්ලා හිතන් ඉන්නේ..

sinhalaebooks.com

දවසම ඔෆිස් එකේ ගෙවලා දැම්මේ දවාත් හරියට වැඩක් නොකර.. දවසම කෑමක් බීමක්වත් නොගෙන හිටියේ හවස් වෙනකම් කාලේ ගෙවා ගන්න..
ආදී කොළඹින් පිට ගිහින් තිබ්බා බිස්නස් වැඩ වලට කොල්ලට දුක කියන්නවත් අද කව්රුත් නෑ..
ඒ හැමදේම දරාගෙන හවස සපරමාදුලගේ ගෙදරට යන්න රණබාහු එක්ක කොල්ලට සිද්ද වුනා..

" පුතා.. මේක් අපට තියෙන අන්තිම තුරුම්පුව.. බිස්නස් එක රැකගන්න නම් සපරෙගේ උදව් ඕනේමයි..මේ වෙලාවේ අපට වෙන පිළියමක් නෑ..

ණර්බාහු යන ගමන් දවාන්ට කතින් කොනින් දන්න ගියේ යෝජනාව.. දවාන්ට මේ කිසිම දෙයක් නොතේරුනා කොල්ලා අද ඉන්නේ හොඳ කල්පනාවක නෙමෙයි.. සාමාන්‍ය විදියට හිටියට හිත ඇතුලේ ගිනි ගන්නවා ..තත්පරයක් තත්පරයක් ගානෙ කොල්ලට සදීනව මැවෙනවා..

" ඉතින් තාත්තේ දැන් සපරමාදු අංකල් කැමති වුනානේ අපි එක්ක ෂෙයාස් බෙදගන්න..

" ඒත් පුතා ඒ ෂ්‍යාස් ඔක්කොම සපරෙගේ දුවට අයිති ඒවා.. ඉතින් එයාලා කියනවා පුතාට දුවව මැරි කරන්න කියලා..

දවාත්ගේ හුස්ම හිර වුනා.. ඔක්කොම අස්සෙන් මේ පාත් වුනේ මොන ගෙනයක්ද කියලා..
නෑ මේක වෙන්න දෙන්න බෑ.. දවාත් ළඟ වෙන ගෑනියක්ට දැන් ඉඩක් නෑ... සදීනා ඇරෙන්න වෙන කිසිම කෙනෙක්ට ඒ හිතටඑන්න තියා හිතන්නවත් බෑ.

" මොකක්... තා ත්..තට පිස්සුද.. මට කසාදයක්..
බෑ එක වෙන් නෑ..
අනික මන් කොල්ලෙක් නෙවෙයි මට දරුවෙක් ඉන්නවා.. අනික මන් බඳිනවනම් බඳින්න ඕනේ මගේ ළමට අම්මෙක් මිසක් බිස්නස් ඩීල් එකක් නෙමෙයි..
බෑ තාත්තේ බෑ.. මේක කරන්න බෑ..

දවාත් කෑ ගැහුවේ රණබාහුට.

" ඒ හැමදේම සපරේ දන්නවා. ඒ ළමයත් කසාදේ කඩන් ඇවිත් ඉන්නේ.. මේකට අකමැති වෙන්න බෑ පුතා ඔයාට.. මන් සපරෙට කැමැත්ත දීලා තමයිෂෙයාස් ඉල්ලගත්තේ..දැන් ඒක වෙනස් කරොත් මගේ නම්බුව විනාශ වෙන්නේ.. ඒටත් අපේ පරම්පරාවේ බිස්නස් එක.. මේ ඔක්කොම නැති වෙලා යයි උඹ මේකට අකමැති වුනොත්..

දවාත් ....පුතේ තීරණය කරපන් උඹ මේ ඔක්කොම නැති කරලා මේ තාත්තවත් මරාගන්නවද..
මේ.මඟුලට කැමති වෙලා රණබාහු පරම්පරාවේ නම්බුව බේරගන්නවද කියලා..

sinhalaebooks.com

හොඳම තැන හොඳම විදියට දවාන්ව රණබාහු හිර කලේ කොල්ලට ආයේ නෑ බෑ නොකියන්න..
සපරමාදු ලගේ ගෙදර ගිහින් දවාන් ගල් පිළිමයක් ගානට ඔහේ වැනුනා .. හිතාවෙලා කතා කලේ අහපු දේකට උත්තර විතරයි.. කොල්ලට මේ ඔක්කොම දලා කොහේ හරි යන්න හිතෙනවා.. පිස්සෙක් වගේ පාරක් පාරක් ගානේ ඇවිදින්න හිතෙනවා..

සපරමාදුගේ දුවව කොල්ලට අඳුන්නලා දීලා රණබාහුයි සපරමාදු යි සුහද කතා ගොඩක හිනාවෙනවා.. දවාන් කිව්ව පලියට එලියට ආවේ සපරමාදු ගේ දුව එක්ක කතා කරන්න තියා මූනක්වත් බලන්න හිතක් නැතුව..

" හායි දවාන්.. අ යෑම් වෂ්රා..
මිම්ම් අපි කොහෙදිහරි දැකලා තියනවා වගේ මතකයි..

දවාන් නැහුන ගානටඉන්න නිසා වෂ්රා කොල්ලගේ උරහිසෙන් අල්ලලා හොලවපු පාරට කොල්ලා ගැස්සිලා පියවි සිහියට ආවේ..

" අ ආ.. මොකක්ද කිව්වේ....

" අනේ අනේ මෝඩයෝ කොයි ලෝකෙද ඉන්නේ..
මත් කිව්වේ මීට කලින් මත් ඔයාව දැකලා තියනවා වගේ මතකයි කියලා..

" අහ් . .. ක්ලබ් එකෙන් වෙන්න ඇති..මත් වැඩිපුර ඉන්නේ ක්ලබ් එකේ..

දවාත් ඒක කිව්වේ ඕනැවට එපාවට.. දවාන් ගැන හොඳ ප්‍රතිරූපයක් වෂ්රගේ හිතේ මවන්න කොල්ලට ඕනේ නෑ.. ඒ හින්දමයි ක්ලබ් එකේ ඉන්නවා කිව්වේ.. වෂ්රටඑත්තු ගත්තන්න ඕනේ වුනේ කොල්ලා බේබද්දෙක් කියලා..

" මාත් හවසට යනවා ගොඩක් වෙලාවට.. මෙහෙ කම්මැලි නිසා එන්ජෝයි කරන්න.. මීට පස්සේ එහෙනම් තනියම යන්න ඕනේ නෑ.. මට ඔයත් එක්ක යන්න පුලුවන්..

එකකින් බේරෙන්න එකක් කිව්වා තව මරාලයක් වැටුනා කියලා කොල්ලට හිතුනේ..

" හ්ම් ඔව් නේද.. යමුකෝ.

කොල්ලා කෙටි උත්තර දීලා ආ ගිය තොරතුරු වලින් වෂ්රව ශේප් කරලා ආවේ රණබාහු ඉස්මුදුනෙන්ම සතුටු වෙද්දි.. දවාන්ගේ හිතේ කිසිම සතුටක් තිබ්බේ නෑ. කරන්න දෙයක් නැතිකමට වෂ්රා එක්ක කොල්ලට ටික කාලයක් හරි රඟපාන්න වෙනවා කියලා දන්නවා.. බෙල්ල මුලටම රණබාහු කොල්ලව හිර කලේ ගැලවෙන්න කිසිම තැනක් නැති කරලා..

" මොකද පුතා වුනේ ගිය ගමන... කෝ තාත්තා..

sinhalaebooks.com

දවාත් ගෙට ගොඩ වෙද්දිම සමදරා ඇහුවේ කුස්සියේ ඉදන් දුවගෙන ඇවිත්.. කොල්ලා සන්සුන්ව ඉන්නවා දැකලා සමදරාට පුදුමයි.. රණබාහුගේ බිස්නස් ගැට කොල්ලව මෙල්ල කරන්න අරන් කියලා සමදරාට හිතුනා.. රණබාහු දෙයක් තීරණය කරොත් ඒක කරලමයි පස්ස බලන්නේ කියලා සමදරා දන්නවා..

" මොකක්ද අම්මා තාත්තා මෙ නටන්න හදන නාඩගම..

දවාත් ටයි ගැටය ලිහිල් කරන ගමන් සෙටියට වැටුනේ සමදරාගෙන් අහගෙන..

" ඇයි පුතා..

" ඇයි ඇයි ගාන්න එපා අම්මේ හැම එකටම නොදන්නවා වගේ .. ඔය දෙන්නා හැමදේම දැනගෙනනේ මේවා කරන්නේ.. තාත්තා සපරමාදු අංකල්ගේ දුවව බඳින්න කියන්නේ මට අම්මා නොදැන නෙමේනේ..

දවාත් ඉන්නේ කේන්තියෙන් වුනත් සමදරාටතේරෙනවා කොල්ලව මොකක්දෝ එකක් හින්ද පාලනය වෙනවා කියලා..

" ඒකේ වරදක් නැනේ පුතා.. වෂරී ළමයා මට කතා කලා.. එයා දන්නවා ඔයා ගැම ඔක්කොම.. ඒ දැනත් තමා එයා ඔයාට කැමති වෙලා තියෙන්නෙ.. අයාන්ට හොද අම්මා කෙනෙක් වෙයි වෂරී.. තාත්තා නිසාවත් මේකට කැමති වෙන්න පුතා.. මට විස්වාසයි ඔයාලට ලස්සනට ජීවත් වෙන්න පුලුවන් කියලා..

දවාත් නැගිට්ටේ ආයේ ඒ ගැන සම්දරා එක්ක කතා කරලා වැඩක් නෑ කියලා හිතලා.. රණබාහු ගන්න ඕනම තීරණයක් සමදරා හිස නමලා පිලිගන්නවා කියලා දවාත් දන්නවා මේකටත් ඒ ටිකම වෙනවා කියලා කොල්ලා හිතාගත්තා..

" කෝ අම්මා කොල්ලා..

දවාත් සදීනගේ කාමරේ ළඟින් නැවතිලා වහලා තිබ්බ දොර දිහා බලලා ඇහුවේ සමදරාගෙන්..

" අනේ පුතා.. කොල්ලට හවස උණ ගත්තනේ..

දවාත් පඩිපෙල බැස්සේ කලබලෙන්..

" මොකක්.. කෝ දැන් පුතා.. ඇයි අම්මා මට කෝල් කලේ නැත්තේ..

" මන් කෝල් කීයක් ගත්තද ළමයෝ..ආන්සර් කලේ නෑ මිසක්.. ඔයාගේ කාමරේ නිදි කොල්ලා
දැන් අඩුයි.මන් බෙහෙත් අරන් ආවා ගිහින්..

sinhalaebooks.com

කොල්ලට සාංකාව කිව්වා පුතේ සදීනා නැතුව..

ඒක සම්දරා කිව්වේ දවාත් පඩිපෙල දිගේ උඩ යද්දි.. දවාත්ගේ පපුවට මොකක්දෝ වුනා.. එක දවසට කොල්ලාට මෙහෙම වෙනවනම් කවදහරි සදීනා දලා ගිය දවසක කොල්ලාට මොනා වෙයිද කියලා හිතුනා..

" සදීනා.. උඹට දැනෙන්නෙවත් නැද්ද
.මගේ කොල්ලා උඹ නැතුව ජිවත් වෙන එකත් අතඅරින තරමට උඹට ආදරේ වෙලා..

දවාත් අයාත් ළඟින් ඇලවුනේ ඒ ඇඳුම් පිටින්ම කොල්ලගේ ඇඟ ගිනි රස්නෙට තිබ්බේ.. උණ බහින්නේ නැතුවම.. කෙඳිරි ගාගා නිදගෙන ඉන්න අයාත් දැක්කම කොල්ලට සදීනව එක්කත් එන්න හිතුනා..
ඒ තරම් වේදනාවක් අයාත් විදිනවා කෙල්ලගේ උණුහුම නැතුව..

දවාත් ආයුගේ පුංචි ඔලුව හෙමීට අතගෑවේ ඇස්වල කඳුලු පුරවත්.. තාත්තෙක්ට පුලුවන් දරුවෝ බලාගන්න ආදරේ කරන්න ඒත් අම්මෙක්ගේ උණුහුම දෙන්න බෑ.. දවාත් අසරණයි ආයු ළඟ අද.. ඒ අසරණකමෙන් අද ඔක්කොම ප්‍රයෝජන ගන්නවා කියලා කොල්ලට හිතුනා..
සදීනා කොල්ලගෙනුයි දවාත්ගෙනුයි ඈතට දුවන්න හදනකොට කොහෙවත් නැති කෙනෙක් අයාත්ගේ අම්මා වෙන්න එන්න හදනවා.. මේ ඔක්කොම අස්සේ දවාත් විදින වේදනාව කියන්න බැරිතරම්..බීලා බීලා සිහි නැතිවෙනකම්ම වැටිලා නිදගන්න හිතුනා දවාත්ට..

දවාත් ෆෝන් එක කලිසම් සාක්කුවෙන් අරන් ඇඳේ පැත්තකින් තියන්න හදද්දි දැක්කේ කෝල් එකසිය ගානක් ඇවිත්..දවල් කොල්ල ෆෝන් එක සයිලන්ට් කරේ කෝල්ස් එන එකත් වදයක් වුන හින්ද..

" සදීනා ......... මෙච්චර කෝල් ගොඩක් අරන් මොකද..

කොල්ලා හිතා ගත්තේ ආයේ සදීනට ගන් නෑ කියලා.. එක්කත් එන්නෙත් නෑ කියලා ඒත්.. හිත කිව්වෙම කෙල්ලට කරදරයක් දෝ කියලා..

එහෙමම රී ඩයල් කරලා කෙල්ලගේ අංකෙට ගත්තේ හිත හදාගන්න බැරිම තැන..

කෙල්ල දවල් ඉඳන්ම දවාත්ට ගත්තේ කෙල්ලව එක්කන්න්‍යන්න එම්ම කියන්න.. ඒ එක කෝල් එකක්වත් දවාත් ගත්තේ නැති හින්ද කෙල්ල අඩ අඩම දවස ගෙව්වේ දවාත් කොළඹ වෙලේ හරි ගනී කියලා..

" ද් ද වාත් ම හත්තයා.. අනේ මාව එක්කන් යන්න එන්නකෝ... මට මෙහෙ ඉන්න බෑ.. අයු ළඟට එන්න ඕනේ.. අනේ.. මන් බලන් හිටියා මහත්තයා ගනී කියලා..

sinhalaebooks.com

කෙල්ලගේ කට හඬ වෙව්ලනවා.. දවාත්ට හිතාගන්න බෑ එකපාර සදීනා මෙහෙම කියන්න හේතුවක්..

" තමුසේ අඬනවද ඔය... මොකක්ද වුනේ කියනවකෝ මට..

" මට එන්න ඕනේ...අනේ මාව අරන් යන්නකෝ මෙහෙන්...

දවාත්ට ඒ වචන ඇහෙන්නේ හිත අස්සේ විදුලි කොටනවා වගේ..කියනවනම් උඹව අරන් මේ ලෝකේ කෙලවරටමහරි යන්නම් මැතිකේ.. උඹ මට එක අවස්ථාවක් දියන් මේ ආදරේ පෙන්නන්න.. එදට මේ හැමදේම දලා මන් උඹ ළග නවතින්න එනවා.. මේ හිත පිලිගන්න දකට..සත්තයි මේ දවාත් දැන් උඹගේ විතරමයි..

" දවාත් මහත්තයා.. කො ඉන්නව ද..
අනේ කතා කරන්නකෝ එනවා නේද..

කෙල්ල එහා පැත්තේ ඉඳන් කියවනවා දවාත් ෆෝන් එක කනේ තියාගෙන ඇස් පියන් හිටියේ සඳීනගේ කට හඬ අහගෙන..

" මේ දැන්..වුනත් මන් ආවොත්.. මන් ළගට එනවද සදීනා.

" මන් එනවා මහත්තයා.. මාව එක්කන් යන්නකෝ..

කෙල්ලට දවාත් අහපුදේ තේරුන් නෑ කෙල්ල ඉන්නේ අසිහියෙන් වගෙ.. පහන් කෙල්ලට දීපු දුක සදකාලික කැලලක් වෙලා සදීනට ඉතුරු කලේ අපිරිසිදු ගෑහැනියක් කියන ලේබලේ වැදුන තවත් එක කෙල්ලෙක් විදියට සමාජෙට මුහුන දෙන්න

" දැන් හුගක් රෑ වෙලා.. අනික අයුට උණ හොදටම..

සදීනා කලබල වුනේ කොල්ලට උන කියද්දි.. ඔක්කොම අමතක වුනා කෙල්ලට..

" අනේ ආවාන් මහත්තය ඇයි මට කිව්වේ නැත්තේ මන් එනවනේ කිව්වනම් කෝහොමහරි අදම.. අනේ මගේ කොල්ලා..

සදීනගේ පපුව රිදෙනවා.. කෙල්ලට දුවන් යන්න පුලුවන් දුරකනම් මෙ වෙද්දි දුවලා.. ඉගිලෙන්න තරම් හිතුනා අයාන් දලා ආවට කෙල්ල සාප කරගත්තා..

" තමුසේ බොරුවට අඬන්න එපා.. මගේ කොල්ලව රවට්ටලා ආදරේ පෙන්නලා අන්තිමට තමුසෙගේ මාලු පෙම්වතා හොයන් ගියා නේද..

මන් එන් නෑ එක්කන් යන්න ... ඉන්නවා ඔහෙටම වෙලා.. මාලු කාරයා එක්කම..

sinhalaebooks.com

දවාත් කිව්වේ තරහට.. සදීනට ඇඬුනා.. කවදාවත් අයාන්ට බොරු ආදරයක් දීලා නෑ..
දවාත් එහෙම කියද්දි කෙල්ලට දුකයි..

" මන් එනවා දැන් එහෙනම්..

" තනියම ..

" ඔව්... මන් එනවා..

" බස් නෑ මේ මහ රෑ... අනික තමුසේ දන් නැතේ තනියම එන්න..

" ආයු වෙනුවෙන් මන් අපායටහරි හොයන් යනවා මහත්තයා..

" හෙට උදේ එන්නම්. මන්...
මේ සෙල්ලම් කරන්නනම් එපා මෝඩී.. මන් එනවා කිව්වොත් එනවා..තමුසේ රෑ යන්නෙ එහෙම නෑ කොහෙවත්.. හෙට එළිවෙද්දි මන් ගේට් එක ලඟ ඉන්නවා.. හරිද...

කෙල්ල මහ රස්ම එයි කියලා දවාන්ට බය හිතුනා..ඇත්ත්ටම අයාන් වෙනුවෙන් කෙල්ල ඕනේ දෙයක් කරනවා කියන්න දවාත් දන්නව.. තරහට කෙල්ලට රිද්දන්න දවාත් කියන්නේ සමහර වචන.

කෙල්ලට තපුරු වෙන්න දවාන්ට බෑ.. ගෙදර සදීනා ඉන්නවනම් දවාන්ට සැනසීම තියනවා.. කොල්ලට ඕනේ නෑ වැල්ලේ තියන්න කෙල්ලව.. කොච්චර අමතක කරනවා කියලා සදීනගෙන් ඈත් වෙන්න හිතුවත් කෙල්ලගේ එක වචනයක් ඇති දවාන්ට වෙනස් වෙන්න.. දවාත්ගේ වචනේ අංශුමාත්‍රයකවත් වෙනසක් තිබ්බේ නෑ කෝල්ලා එළිවෙනකොටම හිටියේ සදීනගේ ගෙදර කඩුල්ල ළග..

" දෙයියනේ මහත්තයා ඇවිත් මහ වෙලාවක්ද..
කුසුමෝ සදීනට එන්න කියපන් මෙන්න මේ මහත්තයා ඇවිත්...

වීරේ ඇදේ ඉඳන් කෑ ගැහුවේ දවාත් කඩුල්ලෙන් පැනලා ගෙදරට එද්දි..

" අංකල් කොහොමද දැන්..

දවාත් මිදුලේ ඉඳන්ම ඇහුවේ වීරෙගේ වෙලුම් පටි දාලා තිබුන කකුල දිහා බලලා..

" අනේ බුදු මහත්තයෝ.. මන් මෙහෙම මැරිල ගියත් කමක් නෑ... මේ කෙල්ල එවන්න එපා වැල්ලට.
මේකේ වුන් ඒකිව මරගන්න හදන්නේ.. අම්මත් නැති මගේ අහිසකී..

sinhalaebooks.com

දවාන්ට හිතාගන්න බෑ වීරේ කියන්නේ මොකක්ද කියල.. ඒත් සදීනා හිටිය දවස් දෙකට කෙල්ලට මොනාහරි දෙයක් සිද්දවෙලා කියලා දවාන්ට තේරුනා.. සදීනා කෝල් අරන් තිබ්බෙත් ඒක කියම්ම වෙන්න ඇති කියලා කොල්ලා හිතුවා..ඒත් කෙල්ල අඬ අඬ එක්කන් යන්න කිව්වේ මේ හින්ද වෙන්න ඇති කියලා කොල්ලා හිතුවේ..

" ඇයි අංකල්..මොකක්ද වුනේ..

" අනේ මහත්තයෝ..කෙල්ලට ඊයේ වැල්ලේ ගෑනු ටික ගැහුවා හොදටෝම..

මේකි මෙහෙ ඉද්දි පහන් කියලා බෝට්ටු කාරයෙක් එක්ක පැටලිලා හිටියනේ.. ඒකා මහ සල්ලාලයෙක් හැමතැනම ගෑනු.. මේකි ගියාට පස්සේ වැල්ලෙම කෙල්ලක් බැන්ද.. අපේ එකී ඌව බලන්න වැල්ලට ගියා ඊයේ අපි එපා කියද්දි.. ඒකගේ ගෑනි අපේ කෙල්ලට හොදටෝම ගහලා මහත්තයෝ..

දවාන්ට කෙල්ල ගැන දුක හිතුනා. ඊට වඩා වීරේ උස්සන් නටන්න තරම් සතුටු හිතුනා..දැන් සදීනා අයිති කොල්ලට විතරයි කියලා හිතෙද්දි හිතට පුදුම සැනසීමක් ආවේ..

" දවාන් මහත්තයා... අපි යන්කෝ..

සදීනා බෑග් එකත් අරන් ඇතුලේ ඉඳන් දුවන් ආවේ
කෙල්ල වීරේටයි කුසුමටයි වැඳලා දවාන්ට ඉස්සර වුනේ..කෙල්ලට ඕනේ පහන්ගේ හුළගක්වත් නැති ඈතට යන්න..දැන්..

" කෙල්ල බලාගන්න මහත්තයෝ..

කුසුමගේ ඇස්වලත් අඳ කඳුලු තිබ්බා කෙල්ල වෙනුවෙන් කොච්චිහර වෙනස්කම් කරත් ළඟ ඉන්න කාලේ සෑහෙන කාලෙකට පස්සේ ආව සදීනාට ගෙදර දවස් කීපයක්වත් ඉන්න නොලැබුන එකට කුසුමටත් දුකයි.. තමන් කොච්චර බැන්නත් පිටවුන් ඉස්සරලා කෙල්ලට අවනම්බු වෙද්දි ඒ වේදනාව කුසුමටත් දැනුනා.. කෙල්ල ආයේ වැල්ලට එන්න ඕනේ නෑ කියලාමයි කුසුමා හිතුවේ..

" අපි ගිහින් එන්නම්..

දවාන් ඇවිත් වාහනේ ට නගිද්දි කෙල්ල බෑග් එක තුරුල්න්කරන් හිටියේ අඬ අඬ..

" ගහලා මදි... හම ගහන්ඩ තිබ්බේ අල්ලන්..
මගේ කොල්ලා දලා ආවට..

දවාන්වාහනේ ස්ටාට් කරන ගමන් කිව්වේ කෙල්ලට ඇහෙන්න.. සදීනා වචනයක්වත් කිව්වේ නෑ.. ඉකිගහන සද්දේ විතරයි ඇහෙන්නේ..

sinhalaebooks.com

දවාත් වාහනේ හරවන් නැතුව කෙලිනම ඉස්සරහට යද්දි සදීනා ඔකුව උස්සලා බැලුවේ පාර වැරදි හින්ද..

" පාර වැරදීනෙ.. මේකෙන් යන්නේ මුහුදට..
දවාත් මහත්තයා ආපහු හරවන්න..

" පාර හරි.. මට පෙන්නනවකෝ තමුසෙගේ පහනද ලාම්පුවද මොකාගෙද ගෙදර..

සදීනා ගැස්සුනා.. දවාත් පහන්ලගේ ගෙදර යන්න හදද්දි..ඒක නැති ප්‍රශ්න දගන්න වැඩක්..

" අනේ එහේ මොකටද යන්නේ.. අපි කොළඹ යමු අනේ දවාත් මහත්තයා.. ආපහු යන්කෝ..

" තමුසේ කියනවද මන් හොයාගන්නද..
ආ අර ඉන්නේ.ඇන්ටි කෙනෙක්..
මන් අහගන්නම්..

සදීනා එපා කිව්වට කොල්ලා කොහොමහරි පහන්ලගේ ගෙදර ගිහින්මයි නවතින්නේ කියලා දන්න හින්ද සදීනා දවාත්ට පාර පෙන්නුවේ අකමැත්තෙන් වුනත් වෙන කරන්න දෙයක් නැති හින්ද..

දවාත් කාර් එක නතර කලේ පහන්ලගේ ගේ ලගින්.. රෝසි එක්කම පහනුත් වැල්ලටබ්‍යන්න එළියට බහිද්දිම දවාත් කාර් එකෙන් බහිනවා දැකලා පහන් නැවතුලා බලන් ඉන්නවා සදීනා දැක්කේ කාර් එකේ ග්ලාස් එකෙන්.. කෙල්ලට දුකයි පහන් වෙම්ස වෙලා ඉන්න විදිය දැක්කම.. ඒ ඉන්නේ ඉස්සර හිටිය පහන් නෙවෙයි කියලා කෙල්ල දන්න්වා.. රෝසි පහන්ව වෙනස් කරලා කියලා කෙල්ල හිතුවා..

" සදීනා... තමුසෙ ඕක ඇතුලේ භාවනා කරනවද..
ඇවිත් පෙන්නවා තමුසෙට ගහපු වුන්ව මට..

සදීනා දවාත් කියන ඒවා ඇහුන් නෑ වගේ ෂීට් එක අස්සෙ රිංගන් හිටියේ පහනුයි දවානුයි ගහ ගත්තොත් කියලා බයට..

" අපි යන්කෝ... අනේ..

ග්ලාස් එක අස්සෙන් ඔලුව දාලා දවාත්ට කෙල්ල කිව්වේ අඩ අඩම..

" නෑ නෑ යන්න නෙමේ.. ඉන්නවකො මන් ගිහින් අහන්න..

දවාත් පහනුයි රෝසි ලගටයනවා කෙල්ල බලන් හිටියේ අත් දෙකෙන් මූන වහන්.. කෙල්ලට බයයි දවාත් මොනා කරයිද කියලා..

sinhalaebooks.com

" අනේ දවාත් මහත්තයා එන්නකො.. රණ්ඩු වෙන්න එපා දෙයියනේ..

" සදීනා.. කෝ එන්වා.. කව්ද මෙයාද තමුසෙගේ මහ ලොකු පහන්..
ආ.. ඇවිත් පෙන්නවා.. කව්ද ගැහුවෙ මූ ද..

දවාත් කෑ ගහන්නේ යටිගිරියෙන් සදීනා බැරිම තැන බැහලා ආවේ දවාත්ව ඇදගෙන හරි වාහනේට එනවා කියලා හිතන්..

" ආ සදීනා උඹ චන්ඩි එක්කන් ආවද අපට ගහන්න ආ..

රෝසි බඩත් උස්සන් ඉස්සරහට ආවේ සදීනගෙන් අහගෙන පහන් රෝසිව අල්ලගෙන පස්සට කරේ සදීනා දිහා බලාගෙනම..

" ෂ්.ෂ්...මේ නෝනා කලබල වෙන්න එපා.. මන් සිප්පි කෑලිවලට ගහන්නෙත් නෑ.. චන්ඩි පාට් දන්නෙත් නෑ..

සදීනා තමුසේට ඇහෙන් නැද්ද මන් කියන එක.. මන් අහන්නේ කව්ද ගැහුවේ..

කෙල්ල අත දික් කරේ රෝසි පැත්තට..

" තමුසේ යනවා වාහනේට මන් එන්නම්..

සදීනා හෙමීට වාහනේ ළගට ගියේ පස්ස හැරී හැරී කෙල්ල මගක් ගිහින් නැවතිලා බලන් හිටියේ පහන්ට ගහයි කියලා දවාත්..

" තමුන් අද බේරෙන්නේ ඔය තත්වෙන් ගෑනියෙක්ට වචනයක්වත් කියන එක මගේ පිරිමි කමට හොද නැති හින්ද.. නැත්තන් සදීනට රිද්දපු වාරයක් පාසා මන් උඹලගේන් පලිගන්නවා..

එතකොට උඹ.. මෙන්න වැන්ද.. පින් මගේ කෙල්ලව අත ඇරපු එකට.. උඹට වචනයක් කියන් නෑ මන්.. අද උඹ සදීනව ගත්ත්ජනම් තමා මන් උඹව මරලා යන්නේ.. ඒත් මට මගේ හුස්ම උඹ ආපහු දූන්න එකට පින්..

මීට පස්සේ සදීනටවත් පවුලේ කාටහරිවත් උඹලගේන් හුළගක්වත් වදින්න බෑ.. අන්න ඒක හොදට මතක තියාගනින්..

දවාත් එ ටික කියලා එන්න ආවේ..පහනුයි රෝසි බලන් ඉද්දී.. කොල්ලා මගක් එද්දි පහන්ගේ කට ඇරුනේ..

" ඕකිගෙ ගන්න දෙයක් නෑ මහත්තයා..

sinhalaebooks.com

නිකන් රැවටෙන්න එපා.. හැම බෙලි කටුවක් අස්සෙම මුතු ඇට නෑ.. නිකන් පව වෙන් නැතුව ගියානම් හොඳයි..මහත්තයා..අපරාදේ පැටුල් පුච්චන්නේ..

දවාන් නැවතුනේ.පහන් ට දෙකක් අනින්න තරම් කේන්තියෙන් හැබැයි දත් ගහලා විසදගන්නවත් ලබාගන්නවත් දෙයක් දවාන්ට ඔඅහන් ලග නෑ මොකද කොල්ලට සදීනව දත් ලැබිලා ඉවරයි.. කොල්ලගේ ආදරේ ඉස්සරහා ආයේ සදීනට හෙලවෙම්නවත් බෑ කියලා දනවා..

" ආ ආ.. ඇති නැති ඒවා මන් බලාගන්නම්කෝ
කලබල වෙන්න එපා ඒ ගැන..

" යන්කෝ දවාන් මහත්තයා දැන්වත්..

සදීනා කියද්දි කෙල්ලගේ අතින් අල්ලගෙම ඇවිත් වාහනේට දත් දවාන් ඉගිලුනේ කුරුල්ලෙක් වගේ.. ආයි සඳීනට මේ ජීවිතෙන් පැනලා යන්න හේතු තියන් නෑ.. මොන දේ කොහොම කරලා හරි කොල්ලා සදීනව තමන් ලග තියාගන්නවා කියලා හිතුවා..

අයාන් වාසනාවන්තයි කියලා කොල්ලට හිතුනා.. සඳීනට දවාන්ගෙන් ඈතටයන්න බැරි එකම හේතුව අයාන්ම වෙනවා.. කොල්ලා කොහොමහරි සදීනගේ ආදරේ ලග තියාගන්නවා.. ඒ ආදරේ නිසාම දවාන්ට විස්වාසයි සඳීනා ලග තමන්ටත් සැනසීමක් තියනවා කියලා..

වෂර්‍රා දවාන් පස්සෙන් එන්න අරම්බය අරන් ඉවරයි.. කෙල්ල ඉස්සල්ලම නම්මගත්තේ රණබාහු ඊලගට සමදරාව.. කෙල්ල සමදරාව බලන්න ආවේ දවාන් ඉන්නවද බලන්නත් එක්කම හිතන්..

" ආන්ටී.. කොහොමද..

වෂර්‍රා දවාන්ලගේ ගෙදර එද්දි සමදරා දසුනි එක්කන් එන්න ගිහින් ආවා විතරයි..දසුනි දන්නෑ වෂර්ව කෙල්ල බලන් හිටියේ සමදරා කතා කරනකම්..

" හලෝ දුව.. එන්න එන්න..
චූටි මේ.. තත්තිගේ යාලුවා සපරමාදු අංකල් එයාගේ දුව මේ වෂර්‍රා..

" හෙලෝ අක්කී..

දසුනි වෂර්ට අත දීලා සැටියෙන් වාඩි වුනේ සමදරාගේ මූනෙන් කෙල්ලට ඉගියක් තේරෙද්දි.. දසුනිට කේන්ති ආවා එම එන හැම නිවාඩුවටම දවාන්ට කෙල්ලෙක් අරන් එනවා සම්දරාලා..ඒකෙන් දවාන්ව අවුස්සනවා කියලා දසුනි හිතුවේ..

" කෝ දවාන් ආන්ටී..

sinhalaebooks.com

වෂ්රා සමදරාගෙන් ඇහුවේ වටේම ඇස් යවලා.. වෂ්රා ආවේ කොල්ලා එක්ක හවස ටිකක් ඇවිදින්න යන්න හිතන්..

" පුතා යාලුවෙක්ගේ ගෙදර ගිහින්නේ දුව.. එන වෙලාවක් කියන්න බෑ ඉතින්.. එයාගේ ගමන් හිතාගන්න බෑ ..

සමදරා කිව්වේ දවාන් උදේ ගියේ ආයුවන් අරන් ආදිලගේ දිහා යනවා කියලා නිසා එන වෙලාවක් කියන්න බැරි හින්ද..
දවාන් උදේ ආයාන්ව ආදී ගේ ආච්චි ලග දලා කෙල්ල එක්කන් එන්න ගියේ කෙල්ල අරන් කෙලින්ම එහෙට යන්න හිතාගෙන..

ආදීගේ ආච්චිට සදීනව පෙන්නන කොල්ලට ඕනේ වුනා.. ඒ හින්දම කෙල්ල එහෙ එක්කන් යන්න හිතුවේ..

වෂ්රගේ බලාපොරොත්තු බිඳවැටෙද්දි කෙල්ල ආව වෙනුවට දසුනි එක්ක කතා කර කර ඉඳලා එන්න ආවේ හිස්වුන හිතෙන්..

" අම්මා වෂ්රා කියන්නේ අයියට ප්‍රපෝස් කරපු කෙනාද..

දසුනි ස්මදරාගෙන් ඇහුවේ වෂ්රා යන්න ඇරලා.. කෙල්ල දන්නව දවාන් කැමති වෙන් නෑ කියලා.. කසාදෙකට එහෙම තියෙද්දි සමදරාලා කරන්න් යන දෙයින් ආයෙම දවාන් නපුරු වෙයි කියලා දසුනිට බයයි..

" ඔව්.. ඒ ළමයගේ බිස්නස් එක තමා අයියට දුන්නේ
තාත්තලා තමා ඕවා තීරණය කටලා තියෙන්නේ චූටි
අනේ මන්දන්නෑ.. මොනවා වෙයිද..

කෙල්ල කැම්පස් එකේ ඉද්දි ආදීගෙන් හැම්දෙම දැනගත්තා.. සදීනට දවාන් ආදරේ කරනවා කියලා දසුනි දන්නවා.. ඒත් නොදන්න ගානට ඉන්නවා කියලා කෙල්ල ආදිට පොරොන්දු වුනා.. දැන් වෂ්රා නිසා දවාන්ට සදීනා නැතිවුනොත් ආයෙම ඔඅරන දවාන් එයි කියලා දසුනිට බය හිතුනා..

සදීනා කියන්නේ දැන් පවුලෙ කෙනෙක් වගේ..දසුනි කෙල්ලට ආදරෙයි..දවාන් එක්ක කෙල්ල එකතු වෙලා හදන පුංචි පවුලකට දසුනි ඉහටන් උඩින් කැමති.. සදීනා ඇරෙන්න දවාන්ව හසුරවන්න වෙන කෙනෙක්ට බෑ කියලා කෙල්ල දන්නවා..

" අයියා පිස්සෙක් කරලා තමා ඔයාලගේ බිස්නස් වැඩ නවතින්නේ අම්මා..
ආයේනම් අඩාගෙන දොඩාගෙන එන්න එපා..

දසුනි කාමරේට ගියේ කේන්තියෙන්.. එදා වගේම අදත සමදරා දෙපැත්තටම ඇදුනා..
රණබාහු වගේම දවාන්ගේ පැත්තත් ගන්න ඕනේ ඒත් එක අතකින්වත් සහනයක් නෑ..

sinhalaebooks.com

.......................................................................

සදීනායි අයානුයි එක්ක දවාන් හවස් වරුවම ගෙව්වේ ආදීලගෙ දිහා.. කෙල්ල සුදු බෝලේ එක්ක එකතු වුනේ තත්පරේට..ඔක්කොටමවඩා සදීනව දැක්කම අයාන්ට තිබ්බ සතුට කොල්ලාගේ උන කොහෙත් ගිහින්ද නෑ.. කෙල්ල එක්ක හොඳටම හුරතල් වෙමවා දවාන් බලන් හිටියේ ආත්මය පුරාවට මේ දැනෙන සැහැල්ලුව සදීනා ළඟ විතරමයි තියෙම්මේ කියලා හිතන ගමන්..

" උඹ මොකක්ද දැන් කරන්න යන්නේ දවාන්..

ආදී ඇහුවේ කෙල්ල මගඇරලා දවාන් තනි වුන වෙලාවේ..
ඇත්තටම දවාන් සදීනා එක්ක සතුටු වුනාට කොල්ලා ඉස්සරහා විසඳන්න බැරි ප්‍රශ්නයක් තියනවා කියලා ආදී දන්නවා ඒකමයි දවාන්ගෙන් ඇහුවේ.. ඉස්සරහට කරන්න හිතන දෙයක්..

" මට සදීනව නැති කරගන්න බෑ බන්.. පුංචි සැනසීමකට තියෙන්නේ දැන් කෙල්ල නිදහස් කියලා හිතෙන එක විතරයි..
වෂ්රා එක්ක ටික කාලයක් හරි ඉන්න වෙනවා බන්
මේ ප්‍රශ්න වලට උත්තර හොයාගන්නකම්..
මට ගෙදරට විරුද්ධ වෙන්න බෑ මේ වෙලාවේ..
මගේ අතේ බිස්නස් බේරගන්න කිසිම තුරුම්පුවක් නෑ..
ඒ හින්ද වෂ්රව බොරුවටහරි ආශ්‍රය කරන්න වෙනවා..
මේවා ඉවර කරගෙන මත් කෙල්ලගෙන් අහනවා..
එදාට සදීනට මට විරුද්ධ වෙන්න කිසිම හේතුවක් නැති වෙනවා..

දවාන් කියන්නෙ ඇත්ත.. කොල්ලට බෑ මේ වෙලාවේ සදිනා ගැන කියන්නවත් වෂ්රව ප්‍රතික්ෂේප කරන්නවත්.. සදීනා දැන් දවාන් එහෙම දෙයක් ඇහුවත් එක පයින්ම ප්‍රතික්ෂේප කරනවා.. කෙල්ල තාමත් ඉන්නේ පහන්ගේ ආදරේ හින්ද කලකිරීමෙන්.වගේම දවාන් ගැන කෙල්ලට තිබ්බේ අයුගේ තාත්තා කියන හැඟීම විතරයි කියලා කොල්ලා දන්නවා..

" උඹ හොඳට හිතලා වැඩ කරපන්.. ඕනම වෙලාවක මත් ඉන්නවා උඹ එක්ක..

දවාන්ට තිබුනු එකම හයිය ඒ යාලුකම නෑ ඊටත් එහා ගිය සහෝදරකමක්.. වැටෙන හැමතැනකම ආදීගේ අත දවාන් වෙනුවෙන් තිබ්බේ ඒ බැඳීමේ ශක්තිය පෙන්වමින්..

සදීනා එක්ක දවාන් ආපහු ගෙදර එන්න ආවේ අඳුර වැටීගෙන එද්දි.. කෙල්ල කතාවක් නැතුව වාහනෙන් එළිය බලන් හිටියේ අයාන් පපුවට තුරුල් වෙලා හොඳට නිදගෙන ඉන්දැද්දි..

දවාත් වාහනේ නතර කලේ පොඩි කඩයක් ලගින් කෙල්ල ෂීට් එකට හිස තියන් හිටියේ දවාත් ඕනෙ දෙයක් අරන් ආපහු එනකම්..

" ම්ම්ම්.. රටකජු..

" මට එපා..

ගත් කටට සදීනා එපා කිව්වේ ..වතුර උගුරක්වත් බොන්න බැරි තරම් හිත බිඳිලා තියෙන වෙලාවක රට කජු වලට වඩා වහ ටිකක් තිබ්බනම් හොදයි කියන තැන කෙල්ල හිටියේ..

" තමුසෙට කන්න නෙමේ දුන්නේ ඕක පොතු ඇරලා මගේ කටට දානවා.. මන් ඩ්‍රයිව් කරනවනේ..

සදීනට ආව කේන්තියට අල්ලලා විසිකරන්න හිතුනේ ග්ලාස් එකෙන් එලියට. ඉවසීමෙන් දවාන්ට එකග වුනේ කෑ ගහලා රණ්ඩු වෙන්න තරම් මානසික තත්වෙක නැති හින්ද..

" මේ ඒක නෙමේ.. කවුද අර ප්‍රෙග්නට් කෙල්ල.. අර තමුසෙට බිම දන් ගැහුවා කිව්ව..

දවාත් කට කොනට හිනාවක් අරන් ඇහුවේ සදීනා අවුස්සලා හිනා වෙන්න..

" රෝසි.. මගේ හොදම යාලුවා..ඒ..

දවාත් ස්ටීන් වීල් එකට ඔලුව ගහන් මහ හයියෙන් හිනාවෙද්දි සදීනා බලන් හිටියේ කේන්තියෙන්..

" හම්මෝ වකුගඩු දෙකත් ඇඹරුනා ඕයි.. එතකොට තමුසෙගේ සදදර පහන්ව උස්සලා තියෙන්නෙ හොදම යාලුව ද..

හම්මෝ.. ඒ මදිවට යාලුකමේ නාමෙන් ගුටිත් කෑවා..

" දවාත් මහත්තයා ඕක නවත්තනවද ...ඔය හිනාවෙන්නේ මගේ අසරණකම එක්ක.. ඒක මහත්තයට සතුටක් උනාට මට මැරෙන්න තරම් දුකක්..

සදීනගේ ඇස්වලින් කඳුලු ගලාගෙනගියේ කම්මුල් දිගේම..

" හරි හරි සොරි.. . මේහ් රෝසිට මන් ආදරෙයි මොනා වුනත්.. රෝසි එල කෙල්ලෙක්..

" ඇයි මට ගහපු හින්දද..මන් දන්නව මහත්තයා මහ හුගක් ඒකට සතුටු වෙනවා කියලා..

" රෝසි දෙකක් දීලා මන් ළගට එව්වනේ මේ හිතුවක්කාර කොච්චි කරල... රෝසිට කිස් එකක් දෙනවා අම්මපා අය ගිය වෙලාවක..

sinhalaebooks.com

දවාත් එක කිව්වේ සදීනගෙන් මූන අනිත් පැත්තට හරවලා කෙල්ලට ඇහෙන් නැතිවෙන්න..

" ආයු ඔයා විතරයි මට ඉන්නේ දුක කියන්නවත් හැමෝම ඉන්නේ මට රිද්දන්න බලන්..
මන් ආවේ ඔයා හින්ද.. නැත්තන් මන් කීයටවත් එන් නෑ මේ අහංකාර නගරෙට..

සදීනා ඒ ටික කියද්දි කොල්ලට දුක හිතුනා.. ඒත් කෙල්ලව අවුස්සලා තරහ ගස්සන එක දවාත්ගේ ආදරේ රාජකාරියක් වගේ දැන්..

" ආයු පුතේ ඔයාගේ ආම්ට ගැහුව රෝසි ආන්ට්ට අපි ගිහින් දෙමු ඩිෂුම් ඩිෂුම් ගාලා පස්ස හිරිවැටෙන්න..අපේ ආම්ට සිද්දුවේ ඇයි කියලා..
ආම්ට අඩන්න එපා කියන්න.
තාත්තා සුපර් මෑන් කියන්න.. ආම්ට කාටවත් ආයේ අත තියන්න දෙන්නෑ කියන්න..

දවාත් කියන්නේ ආයුට.. කෙල්ල එලිය බලන් හිටියේ දවාත් කියන දේවල් නෑහුන ගානට..

" ඒයි පුම්බන්න එපා.ඔච්චර ..හිනාවෙනවකො රෙද්ද....

ඔන්න ඔය ගජමෑන් තමුසෙගේ බ්ලවුස් එක උස්ස උස්ස ගැජමැටික්ස් එක හොයනවා..
දෙනවා ඕක අරන්.. දවස් දෙකක් පොරට ඕක නැතුව තමා සාංකාව..

සදීනට දවාත් ඒ කිව්ව කතාවටනම් හිනා යන්න ආවා..ඇත්තටම අයාන් පපුව අස්සේ ඔලුව ගහන් හොයන්නේ කිරි බොන්න.. කොල්ලා කිරි නැතත් සදීනගේ පපුව අස්සේ උණුහුමට ඉන්න ආසයි..

සදීනට ලැජ්ජයි දවාත් ඉස්සරහා කොල්ලට පියයුරක් දෙන්න.. ආයුව රවට්ටලා කෙල්ල ග්ලාස් එකෙන් එලිය පෙන්නුවේ කොල්ලට ඒක අමතක වෙන්න..

" ගෙදර ගිහිම්..දොයියද්දි දෙන්නම් ආයු.. ආම්ට සැජ්ජයි අලේ.. මේ අලි කොල්ලො දෙන්නෙක් ඉස්සලා ඕවා දෙන්න.. හාද..

සදීනා කොල්ලගේ කනට රහසින් කියනවා දවාත්ට ඇහුනා..දවාත්ට දැනෙන සතුට ඒක සදීනා ගැන තියෙන ආදරේ දශමෙන් දශමේ වැඩි කරනවා

" මුගේ තියෙන කපටිකම.. කිරි නෑ කියලා දැන දැන මූ ආතල් එකක් ගන්නේ ඔය..
සැහ් මටත් එක්ක ලැජ්ජයි.. තාත්තා විදියට මන් කෙස් පිටින් මහන වෙනවා..

දවාත් කොල්ලට බැන්නේ බොරු තරහක් අරන්.. සදීනා තොල් තද කරන් හිටියේ කෙල්කට ඒවට උත්තර නෑ.. දවාත් ඉස්සරහා ඒ ගැන කතා කරන්න ලැජ්ජා හිතුනා කෙල්ලට..

" තාත්තා කට පියන් යනවද දැන්.. ඔය ඇති ඕක..

sinhalaebooks.com

දවාත් සදීනත් එක්ක ගෙදර එද්දි රෑ වුනා.. දසුනි ආ වගක් සදීනා වගේම දවානුත් දන්නේ ආවටත් පස්සේ..සදීනට දසුනි දැක්කම සතුටුයි.. රණබාහු ගෙදර සදීනට හිටිය හොඳම යාලුවා වගේම ළඟම කෙනා දසුනි..

" සදීනා.. කොහොමද..
කෝ අපේ චූටියා.. අනේ කෝ එන්න.. මගේ පන නැන්දී අතට..

" චූටි නෝනා කවද්ද ආවේ..

" මන් අද ආවේ සදීනා.. කොහෙද මේ මකර දවාත් එක්ක ගියේ ඔයා.. දැන් ගිනි පිඹින් නැද්ද සදීනා..

දවාත්ත්ගෙට ගොඩ වෙද්දි දසුනි කිව්වේ දවාත්ට නොත්ඩියට.. කොල්ලා ඉස්සර හිටියේ සදීනා දැක්කත් ඇති බෙල්ලට පැන පැන හින්ද..

" දැන් ඉන්නේ නයෙක්.. දුටු තැන දෂ්ට කරනවා

ෂ් ෂ්..ෂූස්.. ඔන්න දෂ්ට කරා..

දවාත් දසුනිගේ කකුල අල්ලලා උඩට දිව්වේ කෙල්ල ආයු වඩාන් දවාත් පස්සේ දුවත් යද්දි..

" ඔහොම ඉන්නවා ලොකු ටිකක්..

සදීනා බලන්හිටියේ මොන දේවල් වෙලා හරිදැන් මේ පවුල එකතු වෙලා ඉන්නවා දැකලා සතුටින්..
සදීනා ණිර්බාහු නිවසේ සුපුරුදු විදියටම අයාත් එක්ක දවස ගෙව්වේ සතුටින්.. පහන්ගේ මතකය ඒ වේදනාව හැමදෙයක්ම අයාත්ගේ හිනාවයි ආදරයයි ඉස්සරහා දියවෙලා ගියේ ඒ හිත සැනසීම විදගත්දි..

දවස් කීපයක් ගෙවිල යන්නේ කිසිම කලබලයක් නොවී..දවාත් නිදහසේ ඔෆිස් යනවා එනවා.. කොල්ලා සදීනාගේ රුව ගැටන මානේ නිතරම ගැවසුනේ.. අයාත්ට වගේම දවාත්ටත් හිත තිවෙන එකම තැන සදීනා විතරක්ම වු නිසාවෙන්..

උදෑසනක දවාත් ඔෆිස් ඇදුමෙන් කෑම මේසෙට එද්දි සදීනා ලස්සනට පීරිසියකට කිරිබත් අහුරන ගමන් ඉන්නවා දැක්කා . එ රූපේ ළඟට දකින්නේ හුග දවසකින් කොල්ලා එද්දි සදීනා වගේම අයුත් ගොඩක් වෙලාවට නිදි.. හොරෙන් දෙන්නා දිහාම බලන් ඉඳලා ගිහින් නිදගන්න එක දවාත්ට පුරුද්දක් දැන්.. උදේම පිපුන මලක් ගානට සුවද දෙන පුංචි කෙල්ලව අල්ලන් පොඩි කරගන්න හිතෙනවා කොල්ලට..

" අද ස්පෙෂල් කිරි බත්.. ද..ම්ම්ම්

sinhalaebooks.com

දවාත් සදීනගෙන් අහන ගමන් වාඩිවුනේ කෙල්ල ළගම තිබ්බ පුටුවෙන්

" ඔව් මහත්තයා.. චුටි නෝනා ආස නිසා හැදුවේ..

සදීනා කිරිබත් කෑලි දෙකක් දවාත්ගේ ප්ලේට්නෙකෙන් තියන ගමන් කිව්වෙ..කෙල්ල ළග හරි සුවදයි කොල්ලගෙ අත උඩින් මේසෙට නැමිලා ඉන්න සදීනා ලගින් එන්නේ ආයුගේ සුවඳ.. දවාත් ඉව අල්ලන්නේ සදීනගේ සුවඳ එක්ක හිතින් තුරුල් වෙන ගමන්..

" ඒයි.. කොහෙද දුවන්නේ..
මේක කවනවා මට...

සදීනා කුස්සියට යන්න හැරුනත් දවාත් ඇදලා ගත්ත පාරට කෙල්ල නැවතුනේ දවාත්ගේ ඇගේ වැදිලා..

" කිරි බත්..මත් කවන්න මහත්තයාට පිස්සුද..
ලොකු නෝනලා දැක්කොත් ... බබෙක්වැයි.. ඕක කාලා ඔෆිස් යන්න සෙල්ලම් නොකර..
ආයු ඇහැරලාද බලන්න යන්න ඕනි ආතාරින්නකෝ

" බැහ්.. කවනකන් යන්න දෙන්නෑ... මතකනේ නිව්ටන්ගේ නියමය....

සදීනා දවාත්ගෙන් මිදෙන්න දගලුවත් තවත් ඒ අත් දෙකට හිරවුනේ හෙලවෙමින වත් බැරි වෙන්න..

" අනේ මහත්තයා ....... අතාරින්නකෝ
පිස්සු නැතුව.. කව්රුහරි දැක්කොත් හරිනෑනේ..

" රෙද්ද එහෙනන් කවනවා මේක.. මගුල අයාන්ට කවන්න පොවන්න පුලුවන්.. මටනමා බැරි..
මන් උගේ තාත්තනේ..

සදීනාට හිනා ගියේ දවාත් අයාන්ව හිතන් ඉන්නේ ලොකු කෙනෙක් ගානට නිසා.. පොඩි ලමයි වගේ රණ්ඩුවෙන්න හදන්නේ ආයු එක්ක...
දවාත්ගෙන් බේරෙන්න බැරිම තැන කෙල්ල කිරිබත් කෑල්ලක් ලුණු මිරිස් එකේ තවරලා දවාත්ගේ කටින් තිබ්බේ අහක බලන්..

" මගේ අත් දෙකේ ගැව්නම සවුත්තු වෙනවා.. ලස්සනට යන්න එපැයි කොල්ලා..

දවාත් කියන්නේ සදීනා කවපු කට කනගමන්..

" කොහෙද කොල්ලා.. කොලු තාත්තා..

sinhalaebooks.com

" මොකක්..මන් එච්චර වයසද ඕයි. තමුසේ ඔය කියන්නේ ඊරිසියාව ට මන් ලස්සනට ඉන්නවනේ..

සදීනා තොල් හපාගෙන හිනාව ගිල්ලේ දවාන් කොණ්ඩේ හදපු විදිය දැකලා.. ඇත්තටම දවාන්ගේ පෙනුමේ වෙනසක් නෑ තාමත් ඒ කොලුකම එහෙමමයි සදීනා දකිනවා ඒ දගකාරකම ඊටත් ඒ අස්සේ තියෙන නපුරුකමත් හොදටම අඳුරනවා..

" අන්න හරි සදීනා මාත් ඉන්නවා.. මේ යකා නාකි පිළිගන්න කැමති නෑ.. දැන් 40 පැනලා..

දසුනි පඩිපෙල බහින ගමන් කිව්වේ සදීනාගේ කතාවට එකතු වෙලා..

" ආ ඇත්තද නටුරාණී... දන්න තරම තමා ක්ලබ් එකේ කෙල්ලෝ පොරකනවා මන් එක්ක ඩාන්ස් කරන්න.. කෙල්ලොන්ගේ ක්‍රශ් එක මන් යකෝ.. නාකි නාකි ගාන්න එන්නේ..

" අපි දැක්කා නේද සදීනා ක්ලබ් එකේ ක්‍රශ් එක පොලිසියේ කණුවක් බදගෙන හිටපු විදිය.. කොහොමද එද ක්‍රශ් එක කියපුවා.. මට මතකත් නෑ මොනාද සදීනා මෙයා එද දෙඩෙව්වේ..

දසුනි කෙල්ලගෙන් ඇහුවේ දවාන්ට නෝන්ඩියට..කොල්ලා පොලිසියෙන් ගෙනියඹෟ වෙලාවේ සදීනයි දසුනි එක්කන් එන්න ගියා කියලා දවාන් දන්නවා.

" සැප ඕනේ.. ඩාලින් ඕ මයි ස්වීටි..
අපි රූම් එකකට යමු...
කෙල්ලොනම් සැපම තමා... කියද්දිම පොලිසියේ කාණුවට වැටුනා.. උස්සලා අරන් ආවේ අපි කාණු පල්ලේ ඉදලා..........

සදීනා දවාන් වගේ කට හදලා කිව්වේ දවාන්ට හිනා යද්දි.. කොල්ලා බොරු තරහක් ගත්තේ කෙල්ලෝ ඉස්සරා නෝන්ඩි වෙන්න බැරි හින්ද..

" උඹට මන්.. සදීනා දුවන්න එපා අල්ලගත්තොත් තමුසෙ ගුටි කනවා මගෙන්..නැවතියම් ඔහොම..

සදීනා ඉන්නවා ....... ඔහොම...

දවාන් පන්නනේ කෙල්ල පස්සෙන්.. දසුනි මහ හයියෙන් හිනාවෙද්දි.. කෙල්ල එළියට දුවන් යද්දිම මිදුලේ ඉදන් ආව වෂරා සදීනගේ ඇගේ හැප්පිලා විසිවුනේ කෙල්ල බය වෙලා බලන් ඉද්දි..

" ඕ ගෝඩ්.. පිස්සුද අනේ..
මගේ ෆෝන් එකත් වැටුනා.. ශිට්..

sinhalaebooks.com

වෂ්රා සදීනගේ ඇගේ වැදිලා විසිවුන ෆෝන් එක අහුලන ගමන් කෙල්ලට බැන්නා..

" ඕහ්.. ව ර් ෂා .. සොරි
මොකද වුනේ.. එන්න ඇතුලට..

" කවුද දවාන් ඒ..

වෂ්රා ඇතුලට එනගමන් ඇහුවේ සදීනා දිහා නපුරු මූනක් දගෙන

" ඒ අපේ ගෙදර ඉන්න ළමයෙක්.. එන්න වෂ්රා තේ එකක් බොමු.. මන් යන ගමන් ඔයාව ගන්න හිටියේ..

දවාන් සදීනගෙන් වෂ්ර්ව වෙන අතකට ගත්තේ සදීනා ගැන වෂ්ර්ට විස්තර කියන එක නවත්තගන්න..

සදීනා කුස්සියට රිංග ගත්තේ වෂ්ර්ට බයවුන පාර..

" කව්ද නැන්දේ අර ආව නෝනා..

සදීනා නිලගෙන් ඇහුවේ වෂ්ර්ව මීට කලින් දැකලා තිබ්බේ නැති නිසා..

" ආ ඔය එන්න ඇත්තේ වෂ්රා නෝනා වෙන්න ඇති..
අපේ ලොකු බේබි බඳින්න ඉන්න නෝනානේ ඒ..

සදීනා අතින් ආයුගේ කිරි බෝතලේ වැටෙන්න ගිහින් නූලෙන් අතේ රැඳුනේ නීලා කියපු කතාවට..
දවාන් බඳින්න යන කතාවක් කෙල්ලට ආරංචි වුනේම නෑ..

හිතට මහ අමුත්තක් දැනෙනවා.. දවාන් බඳිනවා කියන්නේ අයාන්ට අම්මා කෙනෙක් ගේනවා කියන එක..තමන්ට තිබ්බ එකම සැනසීම වුන අයුවත් තමන්ගෙන් ඈත් වෙන්න හදනවද කියලා කෙල්ලට බය හිතුනා..අත පය ගැහෙන්න ගත්තේ අයු නැති තැනක ජීවත් වෙන්න තියා හුස්මක් ගන්නවත් හිතාගන්න බැරුව..

" සදීනා තේ අරන් එන්න අපට..

සමදරා ආලින්දේ ඉඳන් කතා කලේ කෙල්ල කුස්සියට වෙලා කලපනා කර කර ඉන්දැද්දි..

නීලා හදපු තේ එකත් අරන් කෙල්ල යද්දි වෂ්රා දවාන් ළඟ ඉඳගෙන කෑම ගන්නවා දසුනි සමදරායිත්වාඩිවෙලා හිටියා කෙල්ල බිම බලන් ගිහින් තේ එක තොයලා එන්න ආවේ දවාන් කෙල්ල දිහා හොරාඅට ඇස් කොනකින් බලන් ඉද්දි..

sinhalaebooks.com

" කවුද ආන්ටි ඒ..

" ආ වෂ්රා අක්කි ඒ අපේ අයුගේ අම්මතේ..

දසුනි පැනලා කිව්වේ සදීනා අයාන්ගේ අම්මා කියලා.

" අනේ නෑ දුව ..මේ ළමයා තමා අපේ අයුව බලාගන්න කෙනා ඒකයි ආයු අම්මා කියන්නේ..

සමදරා වැරැද්දක් හදන මුවානෙ කෙල්ල ආසම අයුගේ අයිතිය උදුරලා ගත්තේ පපුව ගැලවිලා යන තරම් වේදනාවක් දැනෙන්දිදි

" සදීනා මේ තමා දවාත් මහත්තයා බද්න්න ඉන්න නෝනා.. ආයුව හුරු කරලා දෙන්න ඕනේ ටිකක් වෂ්රා ළගට හොදද..

සමදරා කෙල්ලට කිව්වේ උස් හඩින්.. දවාත් මේසෙට ඇස් තියන් හිටියේ සදීනා වෙනුවෙන් කතා කරන්න අද කොල්ලට කිසිම අවස්ථාවක් නැති එක ගැන දුක් වෙන ගමන්.. දැන් සදීනා කොහෙම ආයුව වෂ්රා එක්ක බෙදගනීද කියලා දවාත්ට හිතාගන්න බෑ.. කෙල්ල මොනදේ දුන්නත් ආයුව වෂ්ර්ට දෙයි කියලා දවාත්ට විස්වාස නෑ..

සදීනා හිස වනලා කාමරේට යනවා දවාත් දැක්කේ ඇස් කොනකින්.. කෙල්ල ගේ මූන බලන්න ශක්තියක් නෑ අද..ඔක්කොම දමලා ගහලා සදීනායි කොල්ලවයි අරන් ඈතකට යන්න තිබ්බනම්.කියලා හිතුනා.. මේ හැමෝගෙන්ම ඈත් වෙලා..කෙල්ලට දුකක් දෙන්න දවාත්ගේ හිතේ තිබ්බේ නෑ ඒත් මේ හැමදේම දරාගන්න ඕනේ සදීනා.. කවදහරිම දවාත් අයාන්ගේ අයිතිය කෙල්ලට දෙනවා කියලා හිතලාඉවරයි ඒත් මේ එන හැම අභියොක්ගයක්ම දිනන්න කොල්ලට ශක්තිය තියනවා ඒ සදීනා ළග ඉන්නවනම් විතරක්..

" ඉවසන්න මගේ පන.. පුතාව දෙන් නෑ මන් කාටවත්.. මට ටික දවසක් දෙන්න.. සදිනා.. හැමදේම ඉවසන් ටික දවසක් දෙන්න.. මන් කොල්ලා එක්ක ඔයා ළගට එනවා..සදහටම.. ඔව් සදහටම නවතින්න..

ඒ දවාත්ගේ හිත සදීනටදුන්න අවසාන පොරොන්දුව..

.........................................................

"ආයු.. ඔයාට අලුතෙන් අම්මා කෙනෙක් ගේනවලු ආච්චිලා.. මට යන්න වෙයිද පුතේ ඔයාව දාලා..
හැමෝම මගෙන් ඈත් වෙලා යනවා.. ඔයත් අලුත් අම්මා ළගට යනවද.. මේ කාලකණ්ණි මාව අත ඇරලා..
ඔයත් යනවද පුතේ..

sinhalaebooks.com

බංකුව උඩට වෙලා සදීනා කොල්ලව ලග තියන් ඇඩුවා.. හොඳටම ඇඬුවා.. හිත හදගන්න බෑ .. පහන් ගෙන් නැතිවුන ජීවිතේට තිබ්බ එකම බලාපොරොත්තු ව ආයු දූන් ඒ සැනසීම උදුරන් යන්න කොහෙන්දෝ කෙනෙක් ඇවිත් කෙල්කට බලාගෙන ඉන්නවා ඇරෙන්න කරන්න කිසිම දෙයක් නෑ..

" සදීනා...

" ලොකු නෝනා..

කෙල්ල දැක්කේ නෑ සමදරා ඇවිත් ළගින් ඉඳගන්නකම්ම..

" පුතේ.. ඔයා එක්ක කතා කරන්න ඕනේ ටිකක්..

සමදරා හුස්මක් අරන් කියද්දි සදීනා සමදරා දිහාම බලන් හිටියේ කියන්න හදන දේ මොකක් වුනත් ඒ උදේආව වෂ්රා ගැන වෙන්න ඕනේ කියලා හිතුනා..

" නෝනා..

" අපේ ලොකු බඳින්න යන්නේ සදීනා.. උදේ ආවේ ඒ ළමයා . බිස්නස් වැඩ හින්ද තමා හදිසියේ මේ තීරණේ ගන්න වුනේ..

සමදරා නොකියා කියන්න හදන දේ සදීනට නොතේරෙනවා නෙවෙයි.. ඒත් ආයුගෙන් ඈත් වෙලා යන්න කියලා සමදරාගේ කටින් අහනන්න කෙල්ලය බෑ.. ඒකටහිත හදගන්න බැහැ..

" දවාන් මහත්තයා කැමති වුනාද නෝනා..

" එයාට කැමති නොවී බෑනේ.. බිස්නස් එක එයාගේ
ඒක ගොඩගන්න මේ හැමදෙයක්ම කරන්නේ.. අනික වෂ්රා නරක ළමයෙක් නෙවෙයි.. අපේ අයාන්ට හොඳ අම්මා කෙනෙක් වෙයි..

සදීනා පුතේ වෂ්ර්ට කොල්ලව කොහොමහරි හුරු කරගන්න ඕනේ.. දැම්ම තියා කොල්ලව වෂ්ර්ට එකතු වුනොත් පස්සට ඒක හොඳයි..
ඔයා වෂ්ර්ට උදව් කරන්න සදීනා..

සදීනා හිස වැනුවේ හා කියන්න ඒත් අයාන්ව වෂ්ර්ට දෙන්න සදීනට හිත හයිය මදි..

...............................................

හවස ගෙදර හැමෝම ලෑස්ති වුනේ වෂ්ර්ලාගේ පවුලේ අයත් එක්ක රෑ කෑමකට එළියට යන්න. දවාන් එක්ක වෂ්ර්ත් ඇවිත් හිටියේ දවාන් එක්ක යන්න හැමෝම කලබලෙන් ලෑස්ති

sinhalaebooks.com

වෙන්නසදීනා අයාන්ව ඇඳුමක් දලා ආලින්දෙට ගෙනාවේ කොල්ලව සමදරාලා එක්ක යවන්න ඕන නිසා..

" අනේ මගේ පුතු පැටියා කෝ එන්න බලන්න..

වෂරා කොල්ලව සදීනා අතින් ගත්දි කෙල්ලට දැනුනේ පපුව පලල හදවත එලියට ඇදලා ගන්නවා වගේ..

" සදීනා ලැස්ති වෙන්නේ නැද්ද යන්න..

දවාන් පහලට ආවේ කෙල්ලත් යන්න ලැස්ති ඇති කියලා හිතලා.. ඒත් සදීනාගේ කිසිම ලැස්තියක් පේන්න නැති හින්දු දවාන් කිව්වේ කෙල්ලටත් ඇඳුමක් දන් එන්න කියලා..

" නෑ පුතා සදීනා ඉදී ගෙදර.. අයූ වෂරා එක්ක යයි...අනික දැන් හුරු වෙන්නත් එපැයි නේ ද වෂරා දූව..
සදීනට හැමදම ඉන්න බෑනේ ආයූ එක්ක..

දවාන් බැලුවේ සදීනාගේ ඇස් කෙල්ලගේ කඳුලු දවාන්ට හංගන්න බෑ. මේ මැරි මැරි ජීවත් වෙන්න වෙන කාලයක ආරම්බයක් කියලා සදීනට හිතුනේ..

" අයියා සදීනා පව් ඕයි.. අම්මා මේ කියන ඒවට කෙල්ලට දුක හිතෙයි හුගක්..පව් මොනාහරි කරනවකෝ..

දසුනි දවාන්ගේ කනට කරලා කිව්වේ වෂරා අයූ අරන් වාහනේට යන්න ඇරලා.. සදීනා කාමරේට වුනේ දවාන්ලා යනකම් එලියට නැවිත් ඉන්නවා කියලා හිතලා කෙල්ලට බෑ වෂරා එක්ක අයාන් යනව බලන් ඉන්න..

" සදීනාට ඉවසන්න වෙනවා චූටී.. මීට වඩා දේවල් ඉවසන්න වෙනවා.. එයා අයූගේ අම්මනම් ඒ හැමදේම ඉවසයි... ඒකට එයාට ශක්තිය ඇති කියලා මන් හිතනවා..

දවාන් සදීනව විස්වාස කරනවා..කෙල්ල ඉවසන් ඉදී කියලා හිතනවා.. මේ හැමදේම හරිගස්සන දවසක් එනකම් කොල්ලා ඉවසනවා වගේ සදීනත් ඉදී කියලා හිතනව

වෂර්ලාගේ පවුලේ අය එක්ක සමදරා රණබාහු ලා හුගක් සතුටු වුනා දවාන් හිටියේ පැත්තකට වෙලා ...
සදීනටරිද්දලා අවා ගමන කොල්ලට කිසිම සතුටක් තිබ්බේ නෑ..ඒත් ඒක මූනෙන් පෙනෙයි කියලා බයට දවාන් කලේ හැමෝමව මගඇරපු එක..

" අයියා..

sinhalaebooks.com

දසුනි කට්ටිය අහාට මෙහාට වෙන්න ඇරලා දවාන් හොයාන ආවේ කෑමට ආව හොටෙල් එකේ තිබ්බ පූල් එක පැත්තට..

" චූටි.. ඇයි මෙහෙ..

" අයියා.. තමුසේ සදීනට ආදරේ කරනවා..නෙද..

දසුනි එකපාර අහපු දේ දවාන්ව නිශ්ශබ්ද කලා..දසුනි ඒක ඇහුවෙ දැනගෙනමයි..

" අයියා මන් දන්නවා ඔයා නිහඬ වුනාට ඔය ඇස්වල සදීනට තියෙන ආදරේ පේනවා මට..

ඇයි අයියේ සදීනට ඒක කියන් නැත්තේ.. මේ වෂර්ව බඳින්න බුනොත් ඔයා මොකද කරන්නේ අන්තිම තත්පරේ වෙනකම්ම ඔහොම බලන් ඉඳලා
ප්ලීස් අයියේ ප්ලීස්.. සදීනට කියන්න ඔයා ආදරෙයි කියලා..එයාට ආයුගෙන් ඈතට යන්න දෙන්න එපා....

" මන් වෂර්ව බඳින් නෑ.. ඒත් බිස්නස් එකට පිලියමක් හොයාගන්නකම්.. මේක ශේප් කරන් ඉන්න වෙනවා.

දවාන් කිව්වේ ඈත බලාගෙන.. වෂර්ව අත අරින්න රණබාහුගේ ප්‍රශ්න වලට උත්තර හොයන් ඉන්න ඕනේ කියලා දවාන් හිතුවේ.. එතකන්වෂර්ගේ නාඩගම කොල්ලට ඇදගෙන යන්න වෙනවා අකමැත්තෙන් වුනත්..

සංසාර මාවතේ දුටුවේ නිදහස් ජීවිතේ .
දෛවයේ තීරතේ වෙනසක් වුනේ ජීවිතේ .
මවක් නොවී කිරි කැටි සිනහ ලග
හද සෝ සුසුම් ඉපදී
නුබ වෙනුවෙන් සටනක ජීවිතේ .
නපුරු දෙනුවන් දන්වනුයේ
ආදර හැගුමන් මුව පුරා
කෝල නුබේ දගකාර කම් මන් මත් කරා.
කටු මතින් ගෙවන් ජීවිතේ
සරසන්නට මල් වලින්
වෙහෙසෙම් දිවි තුරා.

ආයු එන්න පුතේ මේ අම්මා ළගට.... ඇස් රිදෙනවා බලන් ඉදලා.. මේ පපුවේ හුස්ම හිරවෙනවා උඹ නැති හැම තත්පරයක්ම මට කලායක් වගේ...
ආයු වෂර්ලා එක්ක ගෙවින රෑ සදීන ගෙවපු දිගම රය වුනා.. තත්පරයක්ම පාසා මග බැලුවේ දවාන්ගේ වාහනේ එනවද කියලා..වෙලාව ගෙවිලා ගියේ කෙල්ලගේ ඇස් තෙහෙට්ටුවටම පියවිලා යද්දි

sinhalaebooks.com

දවාත් රෑ ආයුව කෙල්ල ළඟින් තියන්න ගියත් නිදගෙන ඉන්න සදීනව ඇහැරවන්න කොල්ලට ලෝබයි..ආයුව අරන් එහෙමම කාමරේට ගියේ කෙල්ල දවසෙම අයු එක්ක ඔට්ටුවෙලා නිදහසේ නිදන් ඉන්න නිසා ..

" නැත්දේ.. කෝ ආයු... ආවේ නැද්ද දවාත් මහත්තයලා ඊයේ..

සදීනා උදේ පාන්ද කුස්සියට දිව්වේ වෙනදට ඇස් ඇරෙද්දිම තුරුල් වෙලා ඉන්න අයාන් නැති හින්ද.. කෙල්ල හිතුවේ දවාත් රෑ ගෙනත් දෙයි කියලා කොල්ලව..

" ලොකු බේබි එක්ක කාමරේ අන්න.. උදේම නැගිටලා සෙල්ලම..

සදීනට දුකයි.. මේ එක පිට එක එන වේදනාවල් වල අවසානය ගැන සදීනට බයයි.. මේ හැමෝම ටික ටික කරන්නේ අයුව තමන්ගෙන් ඈතට අරන් යන එකද කියලා කෙල්ලට බයයි..
දවාත්ගේ කාමරේට දුවන් ගියේ ඊයේ හවස ඉඳන් නොදැක්ක ඒ මූන බලගන්න ඉවසිල්ලක් නැතුව..

" ආයු............. මගේ මැනික..
ආම් නැතුව පාලු හිතුන් නැද්ද රත්තරනේ..
මන් ඔයා එනකම් බලාගෙන හිටියා... ඇයි ආම් ගාවට ආවේ නැත්තේ.. ඔයා ටත් ආම්ව එපාද පුතේ...

දවාත් බාත්‍රූම් එකේ ඉඳන් එද්දි කෙල්ල ඇඳේ ඉන්න කොල්ලව බදාගෙන කියවනවා..

" චුටි පුතා.. ඔයාගේ ආම්ට කියන්න පොඩ්ඩක් නිදගන්දි දිග ඇඳුමක් ඇඳගෙන නිදගන්න කියලා..
අපි ඊයේ සෑහෙන්න බය වුනා........නේද..

දවාත් සදීනව අවුස්සන්න කිව්වෙ.. ඒත් දවාත්ගේ විහිලු ඇත්ත වහන්න හදනවා කියලා සදීනට හිතුනේ.. කෙල්ල හිතුවෙම වෂර්‍ා නිසා ආයුව තමන්ගෙන් ඈත් කරනවා කියලා..
දවාත් මේ කරන්නේ ආයුව උදුරගන්න එක කියලා.....

" ඇයි දවාත් මහත්තයා මට මෙහෙම කරන්නේ ..
ආයුව මගෙන් ඔච්චර ඉක්මනට උදුර ගන්න එපා.. මන් දෙන්නම් ආයුව. ඒත් මෙහෙම රිද්දන්න එපා මගේ පපුව පැලිලා මැරිලා යයි..
මේ මගේ ජීවිතේ.. මගේ සැනසීම..

දවාත් කණ්නාඩිය ඉස්සරහා ඉඳන් සදීනා දිහා බැලුවේ කෙල්ල අඬනවා.. ඒ කඳුලු දවාත් හීනෙකින්වත් හිතපු චෝදනාවකට නෙවෙයි. සදීනගෙන් ආයාන්ව උදුරගන්න දවාත්ගේ තුන්

sinhalaebooks.com

හිතකවත් තිබ්බේ නෑ.. ඒත් මේ හැමදේම දැන් සදීනා හිතන්නේ වැරදියට කියලා දවාන්ට විස්වාසයි..

" මොකක්ද තමුසේ කියන්නේ..
කව් ද දැන් ළමයා ගත්තෙ තමුසෙගෙන්...
සදීනා ප්ලීස්... අඬන්න ලෑස්ති වෙන්න එපා කොල්ලා හිත්ද...

ඔය හිතන කිසිම දෙයක් මෙතන වෙන් නෑ මන් ඉන්නකම්..

" බොරු... ඇයි එහෙනම් ඊයේ රෑ අයු මට නොදුන්නේ.. ආයුගේ අලුත් අම්මට එයාව දෙන්න ඕනේ නිසා මගෙන් ටික ටික ඈත් කරනවා.. මට තේරෙනෙවා.ඒක දැන්..

අනේ දවාන් මහත්තයා ආයුව ඒ තෝනට දෙන්න කලින් මාව මෙහෙන් යනවන්න.. මට බලන්න බෑ ආයු වෙන කෙනෙක්ට අම්මා කියනවා...

දවාන් අල්ලගත්තේ කෙල්ලගේ උරහිස් .. ඒ ග්‍රහනය දැඩි වෙත්ම දවාන් කේන්තියෙන් කියලා ඒ ඇස් රතු වෙද්දි සදීනට තේරුනා..

" මේ ගෙදරින් අඩියක්වත් එලියට තියන්නනම් හිත්නවත් එපා සදීනා.. මාව යකෙක් වෙයි එදට...

ඊයේ කොල්ලා නොදුන්නේ උඩ දාගෙන නිදන් ඉන්නවා දැක්කම ලෝබ හිතුනා මට ඇහැරවන්න ඒකයි...
වෙන මගුලක් නෙමේ..
තමුසේ හිතාගන්න එකක් හිතාගන්නවා මන් කිව්වේ ඇත්ත..

සදීනා දවාන්ගෙන් ඈත් වෙලා අයු අරන් එලියට ආවේ තරහින් .. දවාන්ගේ වචන කෙල්ල විස්වාස කලේ නෑ..
දවාන් ඔෆිස් යන්න ලෑස්ති වෙලා පහට ආවත් සදීනා පේන්න හිටියේ නෑ.. වෙනදට හැම්දම කෙල්ලගේ අතෙන් දෙන තේ එක දවාන්ගේ දවසෙම හිතාව වුනා.. ඒත් අද තරහා වෙලා කියලා දන්නවා කෙල්ල..
සමදරා තේ හදද්දිම දවාන් එලියට බැහැලා ආවේ කෙල්ල ඉස්සරහට ආවේ නැති එකට හිත අවුලෙන්..

" මේකිගේ මූන නොදැක එලියට බැස්සා කියන්නේ මගේ දවසම සකබ්ලාස්ටිනේ.. නිකමට රවලා යන්නවත් ආවනම්..

දවාන් මිදුලේ තිබ්බ ගල් වලට පයින්ගහන ගමන් ඇවිත් බැල්කනිය බැලුවේ කෙල්ල පේන්න ඉන්නව්ද කියලා ගොඩක් දවස් වකට දවාන්ට ආයු එක්ක කෙල්ල උඩ ඉඳන් අත වනනවා බායි කියනවා ඒ කෝලම් දවසන මතක් කරලා හිත නිවාගන්නවා කොල්ලා..

sinhalaebooks.com

බංකුව ළඟ කෙල්ල ආයුට කිරි එක පොවනවා දැක්කේ දවාත් වාහනේට නගින්න යන ගමන්..අද සදීනගේ මූනේ හිනාව අතුරුදහන් කෙල්ල දුකෙන් කියලා දවාත් දන්නවා ඒත් ඇත්ත දැනගත්ත දවසක සදීනා දවාත්ට මහ හුගක් ආදරේ වෙයි කියලා කොල්ලා හිතුවා..

" ආයු... තාත්තට අද කුක්කුත් නෑ..
උදේට කෑමත් නෑ..
තාත්ති බඩගින්නේ ඔෆිස් යන්නේ..

දවාත් කෙල්ලයි ආයුයි ළඟට ගිහින් කොල්ලව සදීනහෙත් අරන් කතා කලේ කෙල්ල අහක බලාගෙන ඉද්දි..

" ආයු .. වෙනදට මට හිටියා ලස්සන මල් කුමාරියක්
උදේට හැම්දම තේ හදලා දෙන...
අද එයා ආවේ නෑ......තාත්ති එක්ක තරහා වෙලා.ලු එ මල් කුමාරි..

දවාත් කොල්ලා අරන් ඉඳගන්න ගමන් කිව්වේ සදීනා ලගින්ම..කෙල්ල දවාත්ගේ නොගෑවෙන්න ඈත් වුනේ අහක බලාගෙනම..

" ආයු තාත්තට මල් කුමාරියෝ ඕන් නෑනේ.. ලස්සන සුරංගනාවියක් හම්බෙලා ඉන්නේ..
එයාට කියලා තේ හදගන්න කියන්න..

සදීනා ඒක කිව්වේ නෝක්කාඩුවටට..ආයු දෙන්නගෙම මූන දිහා බලන් හිනාවෙන්නේ කොල්ලට නොතේරුනත් මේ තමා තමන්ට ඕනේ උණුහුම කියලා තේරිලා.. කොල්ලා පතාගෙන ආව අම්මයි තාත්තයි දෙන්නම මේ ගිනි අවිලගත්තේ.. ඒත් මේ ආදරේමයි.. දවාත්ගේ වචන වල තිබ්බේ හැංගුන ඒ ආදරේ.. සදීනගේ නෝක්කාඩු අස්සේ තිබ්බේ වෂරා ගැන ඊෂ්‍යාර්වක්.. ආයුවත් දවාත්වත් වෂරාගේ වෙනවට සදීනගේ යටි හිත කැමති නෑ.. අහිමීම දරාගන්න අමාරුම තැන දවානුත් ඉන්නවා කියලා කෙල්ල පිලිගන්න කැමති නෑ..

" ආයු..... ඒ වුනාට අපි ආස මල් කුමාරිට නේද.
ඔයාගේ අම් ට කියන්න තරහා වෙන්න එපා කියලා..
එයා තමා අපේ මල් කුමාරි හැමදම..

ආයුව කකුල් දෙක උඩින් තියල දවාත් ගියේ හිනාවෙලා
දවාත්ගේ වචන සදීනගේ හිතට අමුත්තක් ගෙනාවා..

ආදී වෙනද හැමදම දවාත්ලගේ ගෙදර ආව එකන්ට්ක දවසක ඉදන් නැවතිලා කියලා සමදරාට තේරුනා.. දවාත් වෂර්ට ප්‍රපෝස් කරපු ද ඉදන් ආදීත් මගඅරිනවද කියලා සමදරා සැක කලේ..

" ආ චූටි.ආදි ආවේ නෑනේ හුග දවසකින්..

sinhalaebooks.com

" ආදී අයියට කලකිරිලා ඇති අම්මලා ගේ වැඩ වලට..

දසුනිඇඟට නෙදෙනි කියන වචන වල හී පහරවල් සමදරාට නොතේරුනාම නොවුනත් දසුනිගෙන් සැක නැතිව දැනගන්න සමදරා නොදන්න ගානට රඟපෑවා..

" මොකක්ද චූටි ඒ කතාව...

" අයියාට බලෙන් කසාදයක් කරලා දෙන එක... තාත්තා හදන්නේ අයියව බිස්නස් ඩීල් එකක් කරගන්න..
පව් අර අහිංසකයා.. හැම අතින්ම දුක්විදිනවා..

" චූටි මේ පණ්ඩිත කතා නොකියා ඉන්නව.. ඔයා තාම පොඩි.. ඕවා තේරෙන් නෑ..
තාත්තගෙයි අයියගෙයි වැඩ වලට කට නොදා ඉන්නවනම් හොඳයි...

සමදරා දසුනිව නිශ්ශබ්ද කලත් හිතේ දෙගිඩියාවක් තිබ්බා දවාන් ගේ තිහඩ බබ අස්සේ ලොකු කුනාටුවක් අත ළග කියලා..

" චූටි මෙන්න ඔයාට් කම්මැලි කමට යාලුවෙක් එක්කන් ආවා.. දෙන්නට් දවසම කයිය ගහ ගහ ඉන්න පුලුවන්..

රණබාහු එක්ක එන වෂරා අතේ තිබ්බ ටැවලින් බෑග් එක දිහා දසුනි බැලුවේ.. වෂරා නවතින්නම ආවා කියලා ස්ථිරවම දැනගෙන..

" හානේ දුව..එන්න එන්න.. අංකල් ලේලිව අදම එක්කන් ආවද එතකොට..

" අනේ නෑ ආන්ටි.. තාත්ති අම්මි ඉන්ග්ලන්ඩ් ගියා හදිසි බිස්නස් වැඩකට.. රණේ අංකල් කියලා මාව බලාගන්නම් කියලා.. මන් දන්නෙත් නෑ අංකල් අම්මිලා යන්න හදිදිම ගියා මාව එක්කන් එන්න..

දසුනි හිනාවෙලා බලන් හිටියේ හිත යටින් දුක් වෙවී..දවාන්ට ලේසි වෙන් නෑ මේ ප්‍රශ්නෙන් බේරෙන්න කියලමයි දසුනිට හිතුනේ...

" අර සදීනා ළමයට කියලා අපි ආයුගෙ රූම් එක ගමු වෂර්ට... දුව ආස ඇති බබා එක්ක ඉන්නත්..

" අනෙ ඔව් අංකල්.. මන් පුතා එක්ක ඉන්නම්..

සදීනා බැල්කනියේ ඉදන් පහලට ආවේ ආයු එක්ක කෙල්ලට ඇහුනා රණබාහුගේ වචන..
ඒත් විස්වාස කලේ නෑ.. දසුනිගේ මූනේ තිබ්බ ප්‍රශ්නාථර් ය.. වේදනාව සදීනා දැක්කා..

sinhalaebooks.com

" අහ් සදීනා.. ඔයාට පුලුවන්නෙ නීලා එක්ක කාමරේ ඉන්න.. මේ මිස් අද ඉඳන් ආයු එක්ක ඉදිවී.. කාමරේ අස් කරලා දෙන්න දරුවෝ...

සදීනගේ කෙල ගිලෙන්න නොදී මුවතුල වේලිලා ගියා.. හිසේ ඉඳන් ඇවිලුන ගින්නක් පාදය තෙක් එන්නා සේ දැනෙන්නේ.. දවාත් කොච්චර නෑ කිව්වත් මේ සිද්ද වෙන්නේ අයුව තමන්ගෙන් ඈත් කරන එක නේද.

" කෝ අනා එන්න මගේ චූටි කොල්ලා..

වෂර් පැනපු ගමන් කෙල්ලගෙන් දරුවව උඳුරල වගේ වඩාගත්තේ සදීනා ට නොරිස්සුම් බැල්මක් එක්ක.. මේ රිද්දන්නේ තනාගේ ආත්මය වෙලාගත් ඒ හුස්මටයි. පහන්ගෙන් නැතුවුන ඒ ආදරේ ඒ ජීවිතේ අද රැජගන්න තිබ්බ එකම ශක්තිය හැමෝම එකතුවෙලා උදුනානවා වගේ දැනෙන්නේ..

වෂර්ගේ පැමිණීමෙන් හෝරා කීපෙකින්ම කෙල්ලට ආයුයි කෙල්ලයි මෙච්චර කල් කෝලම් කරපු ඒ පුංචි කාමරෙන් කුස්සියේ ලග තිබ්බ නීලාගේ කාමරේට යන්න වුනේ.. ටිකෙන් ටික ආයුව රණබාහු පරම්පරාවට උරුම වෙද්දි සුපුරුදු ධනපති මාන්නය එක්ක සදීනගේ දුප්පත්කමත් ණර්බාහුගේ තණ්හාවත් එකතු වෙද්දි..

" සදීනා ඔයා කාමරේ අස් කරන්නකෝ ගිහින්..
නීලගේ කාමරෙන් තියාගන්න ඔයාගේ බඩු ටික..

දසුනිගේ ඇස්වල කඳුලු සදීනා වෙනුවෙන්.. සමදරාට වගේම රණබාහුට වෂර්ට වඩා කිසිම දෙයක් වැදගත් නොවුන නිසාම සදීනව පෙනුනේ නෑ ඒ හිතට දුක හිතුනා කියලා පෙනුන් නෑ..

" අනේ දෙවියනේ.. මන් මොන පවක් කලාටද මෙච්චිහර දඬුවම් දෙන්නේ..
පහන් අයියව මගෙන් උඳුරගත්තා..
දැන් ආයුව මගෙන් උඳුරගන්න හදනවා..
මට දරාගන්න බෑ මේ හැමදේම.. මැරෙන්න හිතෙනවා..
මන් කොහොමද ඉන්නේ ආයු නැතුව..
බෑ මගේ පඹුව රිදෙනවා..

දවාත් ඔෆිස් ඇරිලා එද්දි සිද්ද වෙන්න ඕන හොඳම දේවල් ඒ විදියටම වෙලා.. දසුනි හැම්දේම කිව්වේ දවත්ට හරිගස්සන්න කිසිම දෙයක් ඉතිරි නොවෙන්න හැම්දේම සිද්ද වෙලා නිසා..

" අයියා.. අනේ සදීනා.. පව්..
අනේ සදීනව එක්කත් කොහෙහරි යන්නකෝ..
අයියා..ප්ලීස්.. එයාට ආයු නැතුව ඉන්න බෑ..

sinhalaebooks.com

මට දුකයි සදීනා ගැන.. කෙල්ල අද දවසටවත් කාමරෙන් ආවේ නෑ.. ආයු බලන්නවත් ආවේ නෑ..
මට බයයි අයියේ..

දසුනි අඬන්නේ දවාන්ගේ අතේ එල්ලිලා.. කොල්ලා කාමරේට වුනේ රෑ කෑමටවත් නොගිහින්..පහල රඈබාහු සමදරා එක්ක වෂර්ගේ හිනාව ඇහෙද්දි දවාන්ට කේන්ති.. සදීනව නීලා ලගට යවපු එකට ඊටත් වඩා කේන්ති.. කෑ ගහලා යකා නටන්න හිතට ආවත් බිස්නස් එකයි ණර්බාහු පවුලේ නම්බුවයි දවාන්ව යදම් දාලා බැඳලා තිබ්බා.

" චූටි නිදගන්න දැන්.. ඔහොම ඉන්නවා දැක්කොත් තාත්තා බනී..
මන් මොනාහරි කරන්නම්..

දවාන් දසුනිව කාමරෙන් යැව්වේ ප්‍රශ්නයක් නෙවෙන්න..
සිගරට් එකක් දල්වගෙන ඇඳට හේත්තු වුනේ බොනවනම් අසිහියෙන් මැරියා යනතම බොන්න පුලුවන්..ඒත් සදීනා හින්ද දැන් ඒහෙම කරන්න බෑ.. දැන් ආරක්ෂා කරගන්න හිතන්න තමන්ට ආදරයක් තියනව..

දවාන්ට නින්දක් ඇස් මානෙකටවත් ආවේ නෑ හිත කිව්වෙම සදීනව බලලා එන්න කියලා..
ගෙදර හැමෝම නිදගන්න ඇරලා දවාන් ගියේ නීලගේ කාමරේට..

" ලොකු බේබි..

" ෂ් ෂ්ෂ්...... නීලම්මා සදීනා නිදිද..

දවාන් ඇහුවේ රහසින්..

" හොදටෝම උන අරන් මහත්තයා පව් මේ අහිංසකී..

දවාන් බැලුවෙ නිදගෙන ඉන්න කෙල්ල දිහා..මේ දුක් විදින්නේ තමගෙම ලේ වෙනුවෙන්.. අයාන්ගේ ආදරේ වෙනුවෙන්.. දවාන්ට දරාගන්නම අමාරු වරදක් නොකර කෙල්ලට මෙහෙම විඳවන්න වුන එකට..

" ඔය මොකද කරන්නේ මහත්තයා ..
එපා..ඕක කරන්න එපා.. ලොකු නෝනලා දැක්කොත් ප්‍රශ්නයක් වෙයි..අනික අර අලුත් නෝනත් ඉන්නවා.

" නීලම්මා කියන්නේ මේ කෙල්ල මෙහෙම වෙව්ලද්දි ආපහු යන්න කියලද.. නීලම්මා පාඩුවේ ඉන්න මන් සදීනට බෙහෙත් අරන් එන්නම්..

කෙල්ලව උස්සන් වාහනේට දගන්නේ සදීනා කෙඳිරිගාද්දි..කෙල්ලට කෙලින් ඉන්නවත් පනක් නෑ.

sinhalaebooks.com

එහෙමම එල්ලව අරන් ගියේ බෙහෙත් ගන්න.. ගෙදර කව්රුත්ම නොදන..

කෙල්ලව ප්‍රයිවට් හොස්පිටල් එකකට දලා දවාත් බෙහෙත් ගත්තා සදීනට උණ බහින්න දුන්න බෙහෙත් නිසා කෙල්ලට ටිකක් ඇස් ඇරගන්න පුලුවන් වුනේ දවාත්ගේ හිතට සැනසීමක් දැනෙද්දි.. කෙල්ල පන නැතුව ඉද්දි දවාත්ව පිච්චෙන තරම් වේදනාවක් දැනුනා..

සඳීනාව උස්සගෙන වාහනේ ළග එනකම් දවාත් ආවා.. කෙල්ලව ඇවිද්දවලා එක චුට්ටක්වත් මහන්සි කරේ නෑ දවාත්.. දහක් බලන් ඉද්දි හොස්පිටල් එක පුරාම ගියේ කෙල්ලව හරහට අරන්.. සදීනා සිහියෙන් හිටියනම් මේ ආදරේ දරාගන්න බැරිතරම්..ඒක ආදරයකට එහා ගිය ආත්ම ගනුදෙනුවක්..

" දවාත් මහත්තයා.. මට මැරෙන්න ඔනේ..
අනේ මට මැරෙන්න දෙන්න.. ආයු නැතුව ඉන්න බෑ.. හැමෝම මගේ දරුවව මගෙන් උදුරගන්න හදනවා..
මට ජීවත් වෙන්න බෑ.. මට මැරෙන්න දෙන්න..

" සඳීනා සදීනා සදීනා.. තමුසේ උණ විකාරෙන් කියවන්නේ ඔය.. මැරෙන කතා කියන්න එපා.. මැරෙනවනම් උඹයි මායි කොල්ලයි අපි තුන්දෙනාම මැරෙමු..

වාහනේත් ගෙනත් තිබ්බ සදීනට හොස්පිටල් එකෙන් එවලෙට දීපු බෙහෙත් නිසා කටට පන ඇවිත්..දවල් ඉදන් දොඩවපු වචන කෙල්ල තාමත් ඔහේ කියෙව්වා..

" මන් ඉන්නේ කොහොමද... මන් අම්මා.. මන් ආයුගේ අම්මා..

සදීනගේ ඇස්වලින් කඳුලු කඩාගෙන වැටෙද්දි දවාත් හිටියේ ඩ්‍රයිවින් ශීට් එකේ ඔලුව ගහන්.. සදීනා විදවන විදිය කොල්ලට බලන් ඉන්න බෑ..

" මගේ මැනික.. ඔය ඇති රත්තරන්..

දවාත්ගේ ආදරේ තවත් සදීනා ඉස්සරහා රහසක් වුනේ නෑ.. කෙල්ලව ඇඳලා අරන් පපුවට තද කරගත්තේ සදීනාත් ඒ උණුහුමට ගුලි වෙද්දි.. මේ සංසාරේ හොයාගෙන ආව ආදරයක හමුවීමක්.. දවාත්ගේ අතැගිලි සදීනගේ කෙස් අතරින් යන්නේ ඒ හිස මෘදුව පිරිමදිමින්..

" මගේ පපුව රිදෙනවා.. මන් කොහොමද ඉන්නේ ..
මට මැරෙන්න දෙන්න මහත්තයා..

සදීනගේ වචන දවාත්ගේ ආත්මෙට පිහි පාහරවල් වගේ ඇනෙද්දි.. ඒ මූන දෝතට ගත්තේ ඒ ඇස් දිහා බලාගෙනම.. මේ හැමදෙම ලස්සනට විසඳලා තමන් ලගට ගන්න හිටියේ ඒත් දැන් හැම්දේම එකම නූල් බෝලයක් වටේ පැටලිලා..

" සදීනා.. මේ අහන්න..

sinhalaebooks.com

මත් ආදරෙයි මැතික.. මහ හුගක් උඹට..
මැරෙන්න තියා හිතන්නවත් එපා.
ඔය හුස්ම වැටෙන් නැති තැනක මායි කොල්ලයි දවසක්වත් ඉන්නෑ..
සදීනා... දැනුත් නැද්ද මේ ආදරේ..
දවාත් අයිති උඹට විතරයි.........
වෂර්ලා දහක් ආවත් මේ හිතේ ඉන්නේ එකම එක කෙනා සදීනා..
මගේ පන දීලා හරි මත් ආයුව ගේනවා උඹ ලඟට
ඉවසන්න මැතික චුට්ටක් තව.......

කඳුලු ගලාගෙන යන්නේ හැඩුම් නැතිවම.. සදීනා බලන් ඉන්නේ දවාත්ගේ ඇස් දිහා.. ඉලග තත්පරේ දවාත්ගේ දෙතොල් නැවතුනේ සදීනාගේ වෙව්ලන සීතල දෙතොල් මත..
මේ ආත්මය නිවාලූ එකත සැනසීම.. සදීනා දවාත්ගේ ස්පශර්යත් එකින් එක විඳගත්තේ සීරුවට..
වැරදි නිවැරදිකම් ඒ මොහොත ආක්‍රමණය නොකලේ ඒ විඳගැනීම ඒ අනුරාගය මුසු හැම තත්පරයක්ම සදීනගේ වේදනාව යටපත් කරද්දි ගිනි අරන් ඇවිලෙන හිත දවාත්ගේ ප්‍රේමයෙන් නිව්ලා ගියා..දින සති මාස පුරා හිත අස්සේ තියන් විඳවපු ඒ ආදරේ අද සදීනා ගේ ඇස් ඉස්සරහම ප්‍රකාශ වී අවසත්.. මේ ගෙවෙන්න තත්පරයක් ගානේ ආත්මය සුවපත් කරනු විනා කිසිවක් හරි හෝ වැරදී කියා සිතෙන් නැහැ..

සදීනා තාමත් දවාත්ගේ ප්‍රේමය ඉදිරියේ මුනිවත රකින්නේ නිහඬවම..හිත ආත්මාථර්කාමී කියලා කෙල්ලට හිතෙන්නෙම.. පහත් මත්තෙම නැහුන ඒ කුලුදුල් ප්‍රේමය වෙනුවෙන් තනිකම ප්‍රාථර්නා කරපු හිත අද දවාත්ගේ ප්‍රේමණීය ස්පශර්ය ඉදිරියේ කීකරු වෙලා.. දවාත්ගේ උණුහුම විඳින්න හිත ලෝබ වෙලා..
ඒත් මේ දකින්නේ හීනයක්.. කිසිම දවසක හැබෑ නොවෙන..සමදරාගේ වචන තාමත් සවන් අතර දෝංකාර දුන්නේ මේ ආදරේ සදීනට අයිත් නෑ කියලා හිත කියද්දි..

දවාත් සදීන එක්ක ගෙදරට ඇවිත් වාහනෙන් බහිද්දි දැක්කේ ආයු වඩාගෙන මිදුලේ ඇවිදින සමදරා.. ආයුගේ ඇඬිල්ල නොනැවතී ඇහෙද්දි සදීනා වාහනෙන් බහිනවා වෙනුව පැන්නේ අසනීප ගානක්වත් නැතිව.. කෙල්ලට කෙලින් ඉන්න පන නෑ ඇස් ඇරන් හිටියේ පවා හිතේ ශක්තියටඒත් ආයුගේ හැඩුමක් ඉස්සරහා සදීනට ගතේ සවි අවශ්‍යම නැත..

" ලොකු නෝනා..

දවාත් වාහනෙන් බැහැලා එද්දින්කෙල්ල දුවකා සමදරා ළඟට..

" කොහෙද සදීනා ගියේ.. මේ දරුවා අඬන එක්ක නවත්තත් නැනේ.. වෂර්ා දුවට බේරන්න බෑ කොල්ලව..

සදීනා අයුව ගත්තේ පපුවට තද කරන් ඒ ආදරේ මව් සෙනෙහස එක්ක පුංචි කන් පෙති අස්සෙන් සදීනගේ පපුව ගැහෙන සද්දේ අඳුරගත්තා කොල්ලා..හැඩුම් නවතින්නේ ඉබේම

sinhalaebooks.com

වගේ.. දවාත් සැනසුම් හුස්මක් බරට පිට කරේ නිහඬවම සම්දරාගේ ඇස් ලොකු වෙනවා අඩ අඳුරෙම දැක්කා..

" පුතා මේ රෑ සදීනව එක්කත් කොහෙද ගියේ..

දවාත් ආලින්දෙට ගොඩ වෙද්දිම සමදරා ඇහුවේ සැරෙන්.. වෂර්‍රා සැටියේ වාඩිවෙලා හිටියේ ආයු එක්ක ඔට්ටුවෙලා මහන්සියෙන් දවාත් දැකලා වෂර්‍රා නැගිට්ටේ සදීනව එක්කත් ගියපු එකට නොරිස්සුම් බැලමක් එක්ක .

" ඇයි ඒකේ වැරුද්ද මොකක්ද අම්මා..

" සදීනට අසනීපනම් අපට කියන්න තිබ්බා.. ඔයා මොකද ඒ ලමයා තනියම එක්කත් ගියේ..

සමදරා මේ රඟපාන්නේ වෂර්‍ගේ හිත සතුටු කරන්න. සදීනා මෙතෙක් කල කිසිවක අගයක් දැන් හිත් මානයක නැති කලගුන නොදත් සේ රඟපාන සමදරා ගැන දසුනිට තිබ්බේ කලකිරීමක්. සදීනා ආයු එක්ක කාමරේට ගිය නිසාවෙන් නැසෙන මේ වදන් ගැන දසුනි සතුටු වුනා..

" අම්මා.. අයියා වරදක් කරලා නෑනේ.. ඔහොම ප්‍රශ්න කනර්ත..

" නෑ චූටි නෑ. මේ රණබාහු ගෙදර වුන් ලෙඩ වෙන් නෑ උන් අමරණීයයි.. යකෝ මනුස්සයෙක් වේදනාවෙන් ඉද්දි අහක බලන් ඉන්න මන් සතෙක් නෙමේ..

ගුණමකු සක්කිලි හැත්තක්........මේ ගෙදර ඉන්නේ..

" දවාත්........ කාටද ඔය කතා කරන්නේ...

සමදරා කෑ ගහද්දි දවාත් පඩිපෙලේ බාගයක් දුර ගිහින් තිබ්බේ වෂර්‍රා වගේම දසුනිත් බලාගෙන ඉද්දි..

" ආන්ටි ඇයි දවාත් එහෙම.. එයා නපුරු වෙලා..

වෂර්‍රා අඬාගෙන කාමරේට දුවන් ගියේ සමදරා බලන් ඉද්දි..

" ඇද්ද අම්මලාට.. ලොකුව ආයේම යකෙක් කරලා. තමා ඔයයි තාත්තයි නවතින්නේ.. මේන් වැන්දු මම නෑ ඔය පච්කාර වැඩවලට...

දසුනි සමදරාට කිව්වේ අනතුරු අඟවලා.. සමදරා දෙපැත්තකට හිරවෙලා තීරණ වල හරිවැරදි ඉස්සරහා සමදරාට ගන්න වුනේ ණර්බාහුගේ පැත්ත.. කිසිම දවසකට රණබාහුගේ වචනෙට ඉහලින් නොගිය සමදරා අදටත් යටහත් පහත් බිරිඳක් වුනා ණර්බාහුට..

sinhalaebooks.com

ආයු........
මගේ පණ....අම්මට උණ හැදුනා ඔයා නැතුව.
මේ පපුව රිදුනා මහ හුගක්..
මගේ මැණික ඇඩුවද අම්මි නෑ කියලා..
අලුත් අම්මි ළග ඉන්න බෑ කියලා..

ආයු තාමත් ඉකි ගහනවා කොල්ලව සනසන්න සදීන ළග තිබ්බ එකම බෙහෙත කොල්ලගේ කටෙත් තිබ්බේ
චූටි තොල් වලින් සදීනගේ පියයුරු තුඩු අල්ලගත්දි දැනුන ආදරණීය වේදනාව යටපත් කරන් මව් සෙනෙහස හදවතේ නහරයක් නහරයක් පාසා කිඳ බැසගත්දී .

" ආයු.. පුතේ ඔයා කුක්කු බොනවද..
දෙයියනේ.. මට කිරි තියනවා මගේ ආයු වෙනුවෙන් මත් ළග කිරි තියනවා..
මට විස්වාස කරන්න බෑ.. දෙවියෝ මට මොකකද මේ කරන්න යන්නේ..
මගේ පුතාව උදුරගන්න හදද්දි ඇයි මට මෙච්චර වේදනාවක් දුන්නේ.. මත් කොහොමද ආයු නැති දවසක ජීවත් වෙන්නේ...

කෙල්ලගේ ඇස්වල කඳුලු ආයාන් වෙනුවෙන් පපුව බර වෙලා කිරි පියයුරු තුඩු අස්සෙන් විදගෙන විහිදුනේ අයාන්ගේ ආදරේ තිම්හිම් නැති අසීමාන්තික මව් සෙනෙහසක් එක්ක එකට වෙලෙද්දි.. මේ බැඳීම රණබාහු ගේදර හොර රහසෙම දලු දලා මහ වෘක්ෂයක් වි හමාරයි..

" මේ දවාත් මහත්තයගේ ආදරේ නිසාද.. ඒ ආදරේ මත් වෙනුවෙන් දුන්න නිසාද එයාගේ ලේ වෙනුවෙන් මගේ ලේ කිරි වුනේ..
අනේ දවාත් මහත්තයා මමත් ඔයාට ආදරේ කරවද..
මත් දන්නෑ.. මගේ හිතේ ඒ ආදරේ නිසාද මෙහෙම වුනේ
ඒත් මේක හීනයක්......
කවදවත් හැබෑ වෙන් නැති.. මට යන්න වෙනවා මහත්තයා මේ හැමදේම දලා දවසක..
එදට මත් කොහොමද දරාගන්නේ....
ඇයි දෙවියනේ මට මෙච්චර විදවන්න දුකක් දුන්නේ..

සදීනගේ ඇස් වලින් ගලාගෙන යන කඳුලු වල වේදනාව තනියම විදගත්තා.. අයාන් තුරුල් කරන් හිටියේ සීරුවට කිරි උරන ඒතොල් දිහා සදීනා බලන් හිටියේ ඒ ආදරේ හදවත පසාරු කරන යද්දි..

..............................................................

වෂර්ගේ හිත සැක කලා මේ හැමදේම පිටිපස්සේ සදීනගේ බලපෑම එක්ක දවාන්ගේ සමබින්ධයක් ඇති කියලා..සදීනට බෙහෙත් අරන් දෙන්න දවාන් ගිය එකට වෂර්ගේ හිත රිදුනා..

sinhalaebooks.com

" ආන්ටී Good Morning

රෑ සිද්දියත් එක්ක වෂ්රා දවල් වෙනකම් නිදාගත්තේ අයාන් එක්ක ඔට්ටු වෙලා තෙහෙට්ටුවටට.. කොල්ලව බැරිම තැන සදීන ලගින් තියලා හැමෝම සැනසීමේ නිදාගත්තත් වෂ්රා රෑ කල්පනා කලේ ආයුව සදීනගෙන් තමන් ලග්ට ගන්න ක්‍රමයක්..

" ආනේ දූ.. නැගිට්ටද මන් ඇහැරවන්න ගියේ නැහැ ඊයේ නිදාගත්දි ලේඩ් වුන නිසා..

සමදරා වෂ්රව හුරතල් කලේ කිසිම දෙයක් නොවුන ගානට හිත් වල අසාරණකම් වල සත්‍ය බුරබුරා නැග්ගත් පරම්පරාවක හිස උදුම්මගත් නම්බුකාරකම් සමදරාගේ වගේම රණබාහුගෙත් හිත් වල ඉහලින්ම තිබුනා..

" ආයු කෝ ඇන්ටි අර කෙල්ල ලගද..

" ආහ් නැ නෑ.. දසුනි එක්ක එලියේ මල් බලනවා මන් හිතන්නේ ...

සමදරා කවුලුවෙන් පේන ගඩින් එක දිහා බලලා කිව්වේ වෂ්රගේ හිතට සහනයක් දැනෙද්දි..

" ආන්ටී.. මන් හිතන්නේ ආයාන්ව මට හුරු කරගන්න අමාරු ඒ ගලර්' නිසා කියලා..
ඒයා පේන්න ඉන්න නිසයි ආයු එයා ලගට යන්න අඩන්නේ..
ආන්ටී මන් මේ ඒ ළමයට වරදක් කියනවා නෙමේ..
මීඅ වඩා ආයාන්ව මන් ලන් කරගන්න ඕනේ..
එයාට මට හැඩගැහෙන්න..

" ඒක ඇත්ත දූව.. සදීනා දූවට උදව් කරයි
ඒ ළමායා ආවේ දවාත් මැරිකරනකම් ඉන්න විතරයි කොහොමත්.. මන් ටිකක් සදීනා එක්ක කතා කරන්නම්.. එයා ඔයාට අයාන්ව හුරු කරලා දෙයි..

වෂ්රගේනුවමනාව කෙලින්ම නොපවසා වටෙන් සමදරා ලගට ගියේ කෙල්ලව ගෙදරින් යවන්න නොකියා..

" ආන්ටී මට දෙයක් කියන්න තියනවා.. මන් ආයු එක්ක දවස් කීයපයක් හිටියනි..ඒත් මේක කියන එක හරිද දන්නෑ.. මට තේරුනේ එදා ඩිනර් එකට ගිය වෙලාවේ.. අයාන්ට කව්රුහරි කිරි දෙන්වද..

සමදරාට වෂ්රගේ වචන ඒ තරම් නොවැටහුනත් අවාදනෙන් හිටියේ අයු මව් කිරි බොනවද අහන්න මොකක්ම හරි හේතුවක් ඇති කියලා හිතලා..

" ඇයි දූව එහෙම අහන්නේ..

sinhalaebooks.com

" ආන්ටී ආයු හැමවෙලේම මගේ ටී එක උස්සලා අඩනවා.. එයා කිරි හොයනවා කියලා මට හිතෙන්නේ.. ඒක එයාට පුරුද්දක් නෙවෙයිනම් එහෙම අඩන් නැතේ..නේද..

මන් කියන්නේ එයාට අර ළමයා...

" නෑ නෑ දුව ඒක කොහෙත්ම වෙන්න බෑ.. සදීනා කියන්නේ අන් මැරීඩ් ගලර් කෙනෙක් එහෙම කෙනෙක් ඒ වගේ දෙයක් කරන් නෑ.. දුව ඒක ගැන ඕනාවට වඩා හිතලා ඒකයි.. පොඩි දරිවෝ එහෙම තමා ඒක එයාලගේ හැටි..

සමදරා වෂර්ගේ සැකය බින්දත් ඒ කුතුහලය වෂර්ගෙන් එලියට නොගියේ සදීනා ලග ආයු නිහඩ වෙන්න මොකක්ම හරි රහසක් ඇති කියන සැකය තියාගෙන.. වෂර්ා සදීන ගැන අවදනෙන් හිටියේ කෙල්ල ආයු ලග හැසිරෙන විදිය බලාගන්න..

" පිස්සෙක් ද ඕයි.......
මහ පාන්දර ඔෆිස් එකට ඇවිත් නිදගන්න..
ඇයි උඹට ගෙදර නින්ද යන් නැද්ද..
ආ ආ ආ..
වෙන්න බෑ දැන් උඹේ අලුත් බිරිදත් ආවා නේහ්..
එකට දෙකයි දැන්.. සැප තමා නේහ්..

පාන්දරම දවාන් ගෙදරින් ආවේ අරමුණක් නැතුව.. නින්දක් ඇස් පලාතක නැවදින් සදීනව හිත අස්සේ තියාගෙන රෑ එලිවෙනම් කඳුලු එක්ක සටින් කලා.. ආදරෙයි කියලත් සදීනා ඒ ආදරේ නොදැනුන ගානට ගහක් ගලක් වගේ නිහඬව උන්න වේදනාව දවාන්ව තත්පරෙන් තත්පරේ දැවිලා අලු වුනා..

" මන් සදීනට ආදරෙයි කිව්වා ආදී
ඒත්......

දවාන් ඔලුව ඉස්සුවේ ඇස් වල කඳුලු පුරවන්.. ආදී කොල්ලා ළග තිබ්බ පුටුවට බර වෙලා දවාන් දිහාට හැරුනේ සිද්ද වුන දේ මොකක් වුනත් දවාන් අවුලෙන් කියලා තේරුන නිසා..

" අඩෝ.. කියපන් මොකද වුනේ
කියුටි මොකෝ කිව්වේ..........

" එයා නැහුන ගානට හිටියා.. මන් ලං වුනා කියලා එයා ළග කිසිම හැගීමක් තිබ්බේ නෑ බන්..
මට බයයි සදීනා මාව දලා යයි කියලා..
මටහිතෙනවා මන් එහෙම කියඹා එක වැරදිද කියලා..
ආයුට එයා පන වුනත් දෙයි.. ඒත් මන් තාමත් එයාගේ යක්ෂයා බන්..
කවදවට්ජ් ඒ ඇස් වල මන් ගැන ආදරයක් ඇතිවෙන් නැති වෙයිද බන්..
අර මලහෝන්තුව බැඳලා මට බෑ ආපහු විඳවන්න..

sinhalaebooks.com

දවාත්ගේ අවසානම ආදරේ සදීනා කියලා ආදී ස්තීරවම දන්නවා. මේ හැමදේකින්ම අවසානය දවාත් ආයෙම පිස්සෙක් වෙලා නවතින එක කියලා විස්වාසයි..
සදීනා කොල්ලට පිටුපෑවොත් සිද්ද වෙන විනාශය ආදි දන්න නිසාම කෙල්ලඑක්ක කතා කරනවා කියලා හිතාගත්තා

" හරි බන් හරි.. ඉස්සල්ල අර වෂර්ාගේ සීන් එක විසදගනින්කෝ..
අන්න උඹලගේ තාත්තා ග්‍රෑන්ඩ් වෙඩිමක් සෙට් කරනවා රට වටේම දුව දුව..
මටහිතාගන්න බෑ බන්.. උඹලගේ ගෙදර වුත් මෙච්චර ඉක්මනට මේ හැමදේම අමතක කරපු එක..
මෙච්චර තණ්හාවක්.. ඕන්නම් මන් දෙන්නම් බන් මගේ බිස්නස් ඔක්කොම වුනත් උඹට..
ඕවා අත ඇරලා සදීනායි කොල්ලයි අරන් පලයන් මේ රටෙන්..
ඔය මිනිස්සුන්ට ඕන බම්බුවක් ගහගන්න කියලා..
මගුල...........

දවාත්ට මේ වෙලාවේ රණබාහු වගේම සදීනා දෙන්නම ඕනේ.. හරියට ඇස් දෙකෙන් එක ඇහැක් තෝරගන්න කියලා වගේ.. කොයි අතට හිතුවත් හැමවෙලේම තාත්තයි සදීනයි අතටම බැලන්ස් වෙන්නේ සමානව..
ණර්බාහු අත ඇරලා සදීනා තෝරගන්න කොල්ලට හේතුවක් නෑ.. සදීනව අත ඇරලා වෂර්ව බදින්න එකම හෙතුව රණබාහුගේ කැමත්ත එක්ක බිස්නස් ගොඩගන්න තිබ්බ අන්තිම තුරුම්පුව වීම්..

දවාත් කග ආදී ශක්තියක් වුන නිසාම කොල්ල දවස ගෙවලා දැම්මත් සදීනා තට්ට තනියම විදෙව්වේ ආයුගේ කැමක් බීමක්වත් කෙල්ලට අල්ලන්නවත් නොදුන් නිසා..

ආයුට බඩගිනි දැනෙන හැම මොහොතකම ඒක සදීනට දැනෙනවා කෙල්ල කොල්ලව හොයන් දුවනේ පපුව පැලෙන්න තමර් වෙදනාවෙන්.. ඒත් වෂර්ා ළමයා තියන් හිටියේ සදීනට අල්ලන්නවත් අවසර නොදී..

" මෙහ් තමුන් මට කියන්න ඕන් නෑ දරුවගේ කෑම බීම ගැන අපි ඒවා දෙන්නම්..
තමුන් දැන් කුස්සියේ වැඩක් බලන් ඉන්නවා..
මමයි ළමයාගේ අම්මා දැන්..
එනවා මෙතන ළමයි හදන හැටි උගන්න මට..

" මගේ දරුවට.. ඔහොම වද දෙන්න එපා
පව්.මගේ කොල්ලා......
මන් මැරිලා යයි...

සදීනා අත දික් කලේ වෂර් අතේ අඩ අඩ යන ආයු දිහාවට.. කොල්ලගේ ඇස් මලානික වෙලා.. ආයු ඉන්නේ අමාරුවෙන් කියලා සදීනට දැනනවා.. ආයු කියන්නේ පුංචි දේටත් හිත ගැස්සෙන දරුවෙක්.. අම්මා අහිමි හැම දරුවෙක්ම පුංචි දේටත් ශක්තිය හීන කරගන්නවා ..

sinhalaebooks.com

ආයුට බෑ මේ දේවල් වකටඹඅරොත්තු දෙන්න.. සදීනා දන්නව මෙහෙම ආයුට වද දුන්නොත් අවසානෙ දරුවා ලෙඩ වෙලා නවතින්නේ කියල..

අඩුම තරමේ කොල්ලා කිරි එකවත් බිව්වේ නෑ අද සදීනා ඒක දැන ගත්තේ නීලාගෙන්.. නොකා නොබී අඬන ළමයව බලෙන් නලවන්න දඟලන සමදරයි වෂර්යි දිහා දැසුනි බලන් හිටියා මිසක් වචනයක්වත් නොකිව්වේ කියල පහදන්න තරම් ඒ කිසිම හදවතක් විවර නොවූ නිසාවෙන්..

...........................................................................

දවස් කීපයක් ගෙවිලා යන්නේ දවාන් ගෙදර කිසිම කෙනෙක් එක්ක කතා නොකරම..දවාන් එන යන වෙලාවක් වෂර්වත් සමදරාවත් කිසිම කෙනෙක් නොදැක්කත් සදීනා ගැන කොලලා හොරෙන් හෙව්වා.. නීලට හැමදේම කියලා දවාන් තිබ්බේ.. කෙල්ලව බලාගන්න වගේම හදිසියක් වුනොත් දවාන්ට කෝල් කරන්න කියලා..

අයාන් දිහා හොරෙන් බලාගෙන සදීනා කලේ දවසම කඳුලු බීපු එක.. කිසිම දෙයක් දුවලා පැනලා කරගන්න කෙල්ලට ශක්තිය නෑ.. හරි හැටි කෑමක් බීමක් නැති හින්ද සදීනා හිටියේ කෙලින් හිටගන්නත් බැරිබ්තරම් අමාරුවෙන්..

" අනේ රත්තරනේ ඔහොම තමන්ට වද දී ගන්න එපා.
මටොඹුව මගෙම දරුවෙක් වගේ..
මෙහෙම ඉන්නවා බලන්න බෑ.. ලොකු.මිනිස්සු ඔහොම තමා අපි දැනගන්න ඕනේ ගානට ජීවත් වෙන්න

උඹ කොච්චර වැලඹානත් ආයු බේබි මේ පවුලට අයිති මිසක් උඹට දෙන් නෑ..
හිත හදාගනින් රත්තරනේ.. මේ හැමදේම දාලා අපට හෙට යන්න කිව්වොත් එලියට බහින්න වෙනවා..
ඒ හින්ද මේ දේවල් අත ඇරලා ශක්තියෙන් වැඩ කරපන් මයේ අම්මා..

නීලා කෙල්ලගේ හිස අතගෑවේ සුප් එකක් හදන් ඇවිත් බොන්න දීලා ඒකෙන් එක හැන්දකට වඩා කෙල්ල කටෙන් තිබ්බේ නෑ. කටට ගන්න වතුර උගුරක්වත් ගිලෙන්න දුන් නෑ මොහොතක් පාසා අයාන් අඬන සද්දේ කෙල්ලගේ කන් වල දෝංකඅර දෙනවා..

කෙල්ල දන්නව ආයුව අඬවලා දැන් හොඳටම තෙහෙට්ටු කරලා ඉන්නේ කියල . වෂර්ා ආදරය මවා පාන ගමන් අයාන්ට දෙන වද සදීනා හොරෙන් බලන් ඉඳකා දහන් වාරයක් පපුව පිච්චුනා..

ආයු අඬන වාරයක් පාසා පියයුරු පිරී එන කිරි දවසම කඩා හැලෙද්දි සදීනා ඇඩුවා.. හැම මොහොතකම සමදරා කෙල්කට කිව්වේ වෂර්ට උදව් කරන්න අණක්..

sinhalaebooks.com

හුග දවසකට පස්සේ දවාත් රෑ කෑම මේසෙට හිටියේ වෂ්රා වගේම රණබාහු යි කට්ටියම එක්ක..

" පුතා.. කොහොමද බිස්නස් එක දැන් ශේප් එකේ යනවා නේද.. අර මඩගල්ල එකෙන් අපට ඔඩස් වගයක් එවලා ඊයේ.. දැන් අල්ලත් යන්න පුලුවන්..

රණබාහු කියනව් ගියත් දවාත් කෑම එක අතගෑවා මිසක් ඒ කිසිම දේකට හූම්ටි නොදුන්නා.. කොල්ලට මැවෙන්නේ සදීනා මේසේ වටේ දුවලා වෙමද කෑම බෙදන විදිය.. ඒ අතර දවාත්ගේ විහිලුවක් නිසා සදීනගේ රතුවෙලා කේන්ති යන මූන කොල්ලට මැවිලා පේනව..

" දවාත්.......දවාත්..
පුතා..........හොදින්ද අසනීපයක්ද..

" අ අහ්..න් නැ ..ඔව් ඔව්..මේහ්.

දවාත් පටලන වචන අස්සේ වෂ්රා ගේ හිත දහක් ප්‍රශ්න මවද්දි සමදරා කලේ මුනිවත රැකගෙන හිටිය එක..

" මොකද ළමයෝ.. මොනාද කල්පනා කරන්නේ..

" අංකල් එයාට කල්පනා කරන්න දේවල්ද නැත්තේ. වැඩකාරියොන්ගේ අසනීප ගැන හිතන්න ඕනේ.. එයාලට බෙහෙත් ගේන්න යන්න ඕනේ.. එයාට තමා ලෝකේ වැඩිම ප්‍රශ්න ඇත්තේ..

වෂ්රා කියද්දි රණබාහු විමසිලි ඇස් දවාත්ට හෙලුව..වෂ්රා මහ හයියෙන් හිනාවුනේ දවාත්ගෙන් ඇද්ද කියමින වගේ..

"මොකද පුතා මේ දුව කියන්නේ..

" ආ මහත්තයා ඔය අර සදීනට අසනීප වෙලා ඊයේ දවාත් බෙහ්විත් ගෙනත්.. ඒකටඔය දුව හිත්ටි ගහන්නේ.. මෙයත් මේ ළමයවයි පොඩි එකාවයි නිකමටවත් එලියට ඇවිදින්න එක්කත් යන් නැනෙ.. මේ ළමයා ඇවිත් දැන් දවස් කීයක්ද.. මේයාට වැඩ වැඩ වැඩ..උදේ පාන්දර දුවනවා රෑට රෑ වෙලා එනවා..දකින්නවත් නෑ..

දවාත්ගේ කේන්තිය ඇස් වලින් පිටවෙන දිහා දසුනි බලාගෙන..

" ඉතින් තාත්තා හොද හාම්පුතෙක් ඒ දේවල් කරන්න ඕනේ.. වැඩවසම් යුගයෙන් අපී ඉස්සරහට ආවේ ඒ නිසා.. අද සාමාජයේ හැම මනුස්සයෙක්ටම වටිනාකමක් තියනවා.. ධනපති පන්ති මානසිකත්වයෙන් ඔලුදුම්මගත්ත මන්දමානසික මිනිස්සු දැන අඩුයි තාත්තා ... ඉන්නවා අතලොස්සක් එයාලා තමා නිධර්න පන්තියටත් පහලින් ඉන්නේ..

sinhalaebooks.com

දසුනිගේ වචන වෂර්ට ගල් පහරවල් වගේ වදිද්දි..වෂරා බිම් බලන් කෑම එක ගත්තේ දසුනි ගැන කේන්තියෙන්..

" අනේ චූටි තමුසෙගේ කැම්පස් තියරි අපට හරියන් නෑ..
ගැලපෙන්නෙත් නෑ..ඔයා ඒවා ඔයාගේ පන්තියට කිඅන්න..නැද්ද වෂරා දූව..

" චූටි ගල් පිළිම වලට බණ කියන්න එපා
වචන අපරාදේ.........
එක්ස්කියුස් මී...

දවාත් නැගිට්ටේ රණබාහු රවාගෙන ඉද්දි.. වෂරා එක්ක රණබාහුයි සමදරයි විතරක් ඉද්දි දසුනි දවානුයි වෂර්ව කපලා දැම්මේ තරහටත් එක්කම්..
වෂරා මාන බැලමින් සිටියේ සඳීනව තනිකරගන්න මොහොතක් සොයමින්. සඳීනා නිසා රෑ කෑම මේසෙන් දසුනිගෙන් අහගන්න වුන වචන වගේම දවාත්ගේ කතාවත් වෂර්ට සඳීනා ගැන ඇති කලේ වෛරයක්

" තමුසේ අල්ලගන්න තමා මන් හිටියේ..

කෙල්ල කුස්සියේ එලවලු කපන ගමන් හිටියේ .. වෂරා වතුර එකක් බොන්න ආ විලස සඳීන ළග නැවතුනේ මේ හොදක් කියන්න නෙමේ කියලා කෙල්ල දන්නවා ඉවසන් ඉන්නවා ඇරෙන්න වෙන කල හැකි කිසිවක් නැත.. සඳීනා හිස පහත් කනර් හිටියේ වෂරා ඕනේ දෙයක් කියපුදෙන් කියලා.. මොකද දැන් සියලු බලතල වෂරාට හිමි වී හමාරයි..

" උඹට මන් කතා කලා ඇහුන් නැද්ද .. ගොඩේ කෙල්ල..

" මේ විහිලු කරන වෙලාවක් නෙවෙයි මැණික... මාත් එක්ක ඔච්චරටම තරහද... හැම්දේම විසඳගෙන ආවේ අද... ඒත් කෝ මන් එද්දි ඔයා අපිව දාලා යන්න හදලානේ..

සදීනා තොල් හපාගත්තේ කඳුලු වලට ඔහේ යන්න දීලා

" මගේ පාඩුවේ ඉන්න දෙන්න මහත්තයා.. ඔයාගේ අවාසනාවටයි ඔයාගේ දුෂ්ටකම් නිසයි අක්ෂා මැඩම් ගියේ යන්න.. මටත් කියන්නේ ඔයා වගේ යකෙක් එක්ක ඉන්න කියලද මට බෑ. මහත්තයා..මට බෑ..
ආයුට දැන් අම්මා කෙනෙක් ඉන්නවා.. වෂ්රා මිස් ආයුව බලාගනී හොඳට..පින් සිද්දවෙයි මාව අත අරින්න මහත්තයා..

මන් ආවෙම යන්න පොරොන්දු වෙලා.ඒ විදියටම මට අද ලොකු නෝනා යන්න අවසර දුන්න..ඒත් චූටි නොනාලා මහත්තයාලා එකතු වෙලා ආයෙම මාව හිරකරන්නද හදන්නේ..

වඳින්නම් දවාන් මහත්තයා මට යන්න දෙන්න... වෂ්රා මිස්ව බැඳලා සතුටින් ඉන්න..ආයුට හොඳම කෙනා ඒ

සදීනා ගොනහන් ගලපන වචන දවාන්ගේ ඇස් ගිනියම් කලේ සදීනගේ ඒ වගේ කතාවක් බලාපොරොත්තුවෙම් නොවුන නිසාවෙන්...

" මොකක්ද සදීනා කියන්නේ තමුසේ.. ඔ ඔය ඇත්තටමද කියන්නේ....ආ ඇත්තටද කියන්නේ

sinhalaebooks.com

කතාකරනවා... තමුසේ ඔය ටික කියන්නද මාවයි කොල්ලයි ලන් කරලා උඹ අපේ හිත් අස්සට රිංගුවේ..

සදීනා... කට ඇරලා කතාකරපන්.. මගේ යකා අවුස්සගන් නැතුව......

" අයියා....... මොකද මේ..

දසුනි ආදී දුවන් ආවේ දවාන්ගේ සද්දෙට

" ඔව් ඔව් ඔව්...මේ ඇත්ත.. මට ඔය දෙන්නවම එපා..
දකින්නවත් එපා... මට මගේ පාඩුවේ ඉන්න දීලා යන්න දවාන් මහත්තයා යන්න..

" සදීනා.... පිස්සු හැදිලද මොනව ඔය කියන්නේ..

" චූටි නෝනා දවාන් මහත්තයා එක්කත් යන්න.. මට පාඩුවේ ඉන්න දීලා.. මන් කැමති නෑ එන්න දවාන් මහත්තයා ළගට... ආයුට අම්මා කෙනෙක් ලැබුන එකට මට සතුටුයි...
එතනින් එහා මට ආයේ ආයු එක්ක බැඳීමක් නැහැ..

සදීනා කියන්නේ හැගීමක් නැති වචන ඇගේ ඒවා නොවන බව දසුනි හොදටම දන්නව.. මේ සමදරාලා වෙනුවෙන් ඇය ගන්නා ප්‍රයත්නයකි.. දවාන්ව අත් හරින්න් ඒ සියල්ල මත තීරණය කිරීම සාදරණ නෑ කියකා දසුනිගේ හිත කිව්වේ.. දැන් සදීනා හැමදේම තීණර්ය කල හමාරය දවාන්ට අමාරුවෙන් හරි සදීනගෙන් ඈතට යන්න අවස්ථාව පැමිණ ඇත්තේය.

" ඉතෆ්... ඔක්කොම ඇති දැන්.. තමුසෙට ඕනේ මන් අර වෂර්‍ා බැඳලා සතුටින් ඉන්නව බලන්නනේ.. හරි බලාගන්නවකෝ ඒක..

එක පාරක් සදීනා තව එක පාරක් කියනවා මාව එපා කියල..........මට තාමත් විස්වාස නෑ..

අත ඇරපු අතින්ම සදීනගෙන් අල්ලන් ලන් කරගත්තේ ඒ ඇස් දිහා බලන් ඒ වචන විස්වාස කරගන්න බැරි නිසාම..

" එ එපා..

" හරි.....එහෙනම් ආයේ මේ දවාන් උඹේ ඇස් ඉස්සරහටවත් එන්නෑ සදීනා... එන්නෙම නෑ...

දවාන් අඩියෙන් අඩිය පස්සට ගන්දි සදීනා එහෙමම බිම වාඩි වුනේ හදවත ඇද එලියට ගන්නා තරම් වේදනාවක් දැනෙද්දි...

sinhalaebooks.com

" මට සමාවෙන්න දවාන් මහත්තයා මේ හැමදේම කලේ ඔයාලා වෙනුවෙන්.. මේ ලෝකේ මන් දැන් වැඩියෙන්ම ආදරේ කරන්නේ ඔය දෙන්නට..ඒ ආදරේ හින්දමයි මන් ඇත් වෙන්නේ...
මන් නැතත් ආයුට වගේම ඔයාටත් ඔයාගේ අයව ඕනේ ඒ ඔයාගේ පවුල දවාන් මහත්තයා..
මන් නිසා මේ කිසිම දෙයක් අත අරිනවට මම කැමති නෑ .. මට වෛර කරන්න කමක් නෑ ඒත් ඔයයි පුතයි හැමදම හිනාවෙලා ඉන්න..
මන් මෙහෙමම මැරිලා යන්නම්.. මට ඔය දෙන්නා නැතිව ජීවත් වෙන්න අමාරුයි දැන්..
ඒත්....අමාරුවෙන් හරි මේ තීරණේ මට ගන්න වුනාට සමාවෙන්න දහස් වාරයක්......

හිත කෑ ගහකා ඉල්ලන්නේ ඒ ආදරේ.. ආයුගේ උණුහුම මේ කිසිම දෙයක් නැතුව ජීවත් වෙන්න බෑ කියකා සදීනා දැන දැනම මේ කරන්නේ විඳවලා මැරෙන්න මාගර්ය සොයා ගැනීම විනා අන් කිසිවක් නොවෙයි.. අයාන්ගේ අනාගතේ රණබාහු පවුලේ ශක්තිය වගේම උරුමයයි.. ඒ අයිතිය උදුරන් ඒ සියල්ක ආයුට අහිමි කරන්න සදීන ට බෑ.. ඒ නිසාම කෙල්ල ගත්ත තීරණය ගැන හදවතින් නැතත් අනාගතේ ගැන හිතලා සැන්න්සුනා..

" අයියා.. ඔහොම ඉන්න..
ආදී අයියා නවත්තන්නකෝ මෙයාව.. අනේ ඉන්නවකො සදීනාට පිස්සු.. ඒයා කියන ඒවා හිතන්න එපා.. අයියා..

" නෑ චුටි නෑ.. එයාට අපිව එපාලු..මන් අවාසනාවන්තයෙක්ලු.නේ . මන් වගේ කාලකණ්ණි මිනිහෙක් සදීනට එප කියලා කියන්නේ..
මන් යනවා......

" එයි දවාන් මචන් මේ අහපන්...

ආදී ගේ අත ගිලිහෙද්දි දවාන් වාහනේට නැගලා ඉගිලුනේ විදුලි වේගයෙන්..

" දැන් හරිනේ.. ඔක්කොම ඉවරයි... ඇයි ආදී අයියා මෙහෙම වෙන්නේ.. මගේ ඔලුවත් එක්ක රිදෙනවා..
හැමදේම විසඳුවා කියලා හිත හදගන්න හැදුවා විතරයි..

මේ සදීනා මොන පිස්සුවක් නටන්න හදනවද මට තේරෙන් නෑ....

" දසු ... රිලැක්ස් වෙන්න..මන් ඔයාව ගිහින් දන්නම් ගෙදර බය වෙලා ඇති ඇන්ටිලා..
අපි නිදහසේ හිතලා බලමු කරන්න දෙයක්..දැන් දවාන් යකා වෙලා ඉන්නේ ඕකට තේරුම් කරන්නත් බෑ මොකුත්.. ඔය ගියේ ක්ලබ් එකට ශුවර්..

ආදී දසුනිව අල්ලගත්තේ දෑතින්ම හිස බදන් ඉන්න දසුනිව දැකලා දුක හිතිලා.. සදීනා මා ි දවානුයි නිසා හැමදම දුක් විදින්න වුනේ දසුනිට හැම්දේම කරේ දසුනි ඒ ආදරේ වෙනුවෙන් එත් අන්තිම තත්පරේ හැමදේම විනාසවෙලා යද්දි දසුනිට දැනෙන පරාජිත හැඟීම ගැන ආදි දුක්වුනා..

sinhalaebooks.com

ක්ලබ් එකට වෙලා දවාත් බෝතල් කීපයක්ම හිස් කලේ වේදනාව හූරගෙන එන කඳුලු හංග ගන්න බැරිව..

" අක්ෂා උඹ මාව බාගෙට මරලා දලා ගියා..ඒ දවාන්ට පණ දීපු අතිකි සදීනා.. ඒකී මාව පණ පිටින් පුච්චලාම දැම්මා..

මොන වරදක් කලාටද යකෝ මටම මෙහෙම වෙන්නේ.. සදීනා උඹට මන් ආදරේ කරපු එකද වැරදී ආ.. ආදරේ කරපු එකද

සදීනා බිත්තියක් අල්ලන් අඩා වැටෙද්දි දවාත් බෝතල් ගනන් හිස් කරා අසිහියෙන් ඉන්න.. දෙපැත්තක වේදනාව විදගත්තේ දරාගන්න අමාරුම තැන නැවතිලා..

" දවාත්... නැගිටපන් මිනිහෝ.. ඔහොම බීලා ප්‍රශ්න විසදන්න බෑ..
දැන් වරෙන් යන්න ගෙදර....

ආදී දසුනිව දලා කෙලින්ම ආවේ දවාත් පුරුදු වෙලා හිටිය ක්ලබ් එකට.. දුක සතුට දෙකේම දවාත් නවතින තැන එතන කියලා ආදි දන්න නිසාම..

" ම් මට මැරෙනකම් බොන්න ඕනේ... මගේ කොල්ලව ගෙනත් දියන්..ඌයි මායි වෙන්නම අවාසනාවන්තයොලු.. ඔව් ඒක ඇත්තක්.. මන් අවාසනාවන්තයෙක් ඒත් මගේ කොල්ලා ඇයි සදීනා එහෙම කිව්වේ.. ඒ වචන වලට වඩා හොදයි මාව පිහියක් අරන් කපලා කපලා මරලා දැම්මනම්..

ආදී මන් මන් හැමදේම විසඳගත්තා නේද.. ආ.. අර ගෙදර ඉන්න වෂර්‍ා ගෙන් මන් ඒකීව බේරගන්න හැමදේම කරේ..

පුලුවන් තරම් කොල්ලව ඒකිට ලන් කරා.. හැම දේම දුන්නා.. ඒත් අද මගේ මූනටම මාවයි කොල්ලවයි එපා කියලා කිව්වා.. කොහොමද ආදී සදීනා මට මෙහෙම කරන්නේ...

දවාත් කියවන දේවල් වේදනාවෙම් පිටවෙන හුස්ම දිහා ආදී බලන් හිටියා මිසක් වචනයක්වත් නොකිව්වේ දවාත් එක්ක කතා කරන්න තරම් හොඳ වෙලාවක් නොවුන නිසා..

................................................

" චූටි ඔයා කොහොමද ගෙදරින් ගියේ.. කොහෙ ඉදලද ආදි එක්ක ආවේ...ආ චූටි කතා කරනවා.

සම්දරා දසුනිගෙන් තරවටු ස්වරයෙන් ඇහුවේ කෙල්ල ගෙදරින් ගිය වගක් සමදරා නොදන සිටි නිසාඅවෙන්..

sinhalaebooks.com

" ම් මේ මත්.. මත්.. සදීතාට බතින වෙලේ එලියට ගියා මොකද මේ ගෙදර හිත සැනසීමෙත් ඉන්න නැතේ.. මොකක්ම හරි රණ්ඩුවක් තේ හැමවෙලේම..

මට දැන් මෙහෙ ඉන්න එකත් ඇති වෙලා.. තිවාඩු ඉවර වුනාම මන් යනවා ආයේ එන් නෑ මේ ගෙදර.ට..

" ඔව් ඔව් උඹලා ඔක්කොමටම වරදි මන් තමා.. තාත්තලා පුතාලා දුවලා ඔක්කොටම ඉන්න ඇරලා මගේ ඇස් දෙක පියවුනාතම් ඉවරයක්.. මේ හැටි වේදනා විදින්න බෑනේ දෙයියනේ..

සාම්දරා සාරි පොටෙන් කඳුලු පිහදන ගමන් පහලට ආවේ දැසුනි ගිය වේගයට කාමරේ දොර සද්දෙට වහගත්දිම..

" සමදරා....... කවුද ආවේ බලන්න..

රණබාහු ගෙට ඇතුල් වුනේ සපරමාදූයි අමාලී එක්ක.ම

" හලෝ සමදරා.. ඔන්න අපි හොරෙන්ම ආවා ඉතින්..
කෝ අපේ කෙල්ල..

සම්දරාට සතුටු වෙන්නද දුක්වෙන්නද කියලවත් හිතන්න වෙලාවක් නැහැ..රණබාහු හවස පිට වුනේ සපරමාදූලව එක්කන් එන්න යන්න කියලා නොකීව එක සමදරාට ප්‍රශ්ණයක්..ගහෙන් ගෙඩි එන්නා සේ ප්‍රශ්න ගොඩක් ගෙදර ඇවිලිලා තියෙද්දෙ සපරමාදූලා ආව එක හිතට හරි නෑ....

" බලන්න සමදරා.. මන් ඇමති තුමා ලග ඉද්දි ආවේ කෝල් එක ලංකවට ආවා කියලා මේ දෙන්නා.. එහෙමම ගන්න ගියා එයාපෝට්.. වෂර්ා දුවව ස්ප්‍රයිස් කරන්න කියලා ඔය හොරෙන්ම ඇවිත් තියෙන්නේ..

" අහ් එහෙමද.. ආව එක කොච්චර දෙයක්ද..කෙල්ල පුදුම වෙයි.. යමු අමාලී කෙල්ල කාමරේ නිදි ඇති.. පොඩි එකා එක්ක ...

සමදරා වෙනසක් නොපෙන්වා වෂර්ගේ අම්මව එක්කන් ඇතුලට

" දූව ... දොර අරින්න පොඩ්ඩක්... මෙන්න ඔයා බලන්නන ඇවිත් තියෙන්නේ කවුද බලන්න..

" අම්මී අනේ ඔයාලා ආවද...කිව්වෙවත් නෑ..

sinhalaebooks.com

වෂ්රා දොර ඇරන් අමාලී ලගට පනිද්දි සමදරා හිත අස්සෙන් දෙවියන්ට කිව්වේ වෂ්රා අතින් මේ කිසිම දෙයක් නොකියවේවා කියලා.. සපරමාදූලා ආව ගමන් මේ සිද්දි ආරංචි වුනොත් සිද්දවෙන්නේ හිත් නරක් කරගන්න එක විතරයි...

" එහෙනම් අමාලී කාමරේට ගිහින් රෙස්ට් කරන්නකෝ
මන් බොන්න මොනාහරි හදන් එන්නම්..

සමදරා එතනින් ඉවත් වුනේ හිතාවෙලා රවට්ටගන්න හිත රගපෑමක් කියලා දන්න නිසාවෙන් කොයි මොහොතක හෝ තමන්ගෙ මූනේ වෙනස දකී කියලා බයෙන්..

" දූව..නිදිද කොල්ලා..

අමාලී ඇඳේ හිටිය අයු දිහා බලල ඇඳින් වාඩි වුනේ ලොකු කතාවකට හුස්මක් අල්ලගෙන..

" හ්ම්..දවාන් වගේම යකෙක් මූන්.. මට එපා වෙනවා අම්මී...... දවාන් මේ කුස්සියේ වැඩ කරන කෙල්ලෙක් එක්ක පැටලිලා ඉඳලා තියෙන්නේ.. ඒ ඔක්කොම එලිවුනේ මන් ආවම.. මට තරහා මේ මනුස්සයා ගැන..ඒවත් තියන් තමා අපේ ගෙදර ගිහින් මටත් හා කියලා ආවේ..

" දවාන් එහෙම ළමයෙක් වෙන්න බෑ.. මන් හිතන් නෑ දූව ඔයාව එපා කියයි කියලා දවාන්.අනික දැන් බිස්නස් වලිනුත් එයාඅපට නයයි ඒ නිආ කොහොමත් මන් හිත්න් නෑ වැරැද්දක් කරයි කියලා...

අමාලී කිව්වි වෂ්ර්ට දවාන් ගම දන්න් නිසාම .. කොල්ලාපොඩි කාලේ ඉදන් තද ගතිගුන ඇති බව අමාලි දන්නවා ඒත් වෂ්ර්ට මේ ලැබුන අවස්ථාව ජීවිතේ ආයෙ තියෙන නිසා අමාලිට ඕනේ වුනේ වෂ්ර්ව දවන්ට දෙන්න...

" අම්මී මන් කොහොමත් දවාන්ව අත් හරින් නෑ... මට ඕනි දේ මන් ගන්නවමයි... දවාන්ගේ වැඩකාර කෙල්ල දැන් මෙහෙ නෑ ඒකිව පැන්නුව්... දැන් මට තවත් ලේසී දවාන්ට ලන් වෙන්න.. අම්මී බලන්නකො මන් මේ හැමදේම අයිති කරන් නවතින්නේ...

වෂ්රා හිතාවුනේ රණබාහු පවුලේ ලේලි විදියට අනාගතේ ඉන්න හීන මවාගෙනම . දසුනිගෙන් එන ඇමතුම එක්ක ආදී දැනගන්නවා සපරමාදූ ලා ඇවිත් කියලා.. දවාන් මේ තත්වෙන් ගෙදර යැවීමෙන් සිද්දවෙන්නේ තවත් ප්‍රශ්න රාෂියකට අතවැනීමක් වැන්නකි එනිසාම දවාන්ව අරන් ආදී නිවසට ගියේ දසුනිට කියලා...

" කියුට් උදව් වෙනවකෝ මූව ඇඳට දන්න..

ආදී වාහනේ ඉදන් දවාන්ව වත්තන් කරගෙන එද්දි සඳීනා ඉස්සරහට දුවන් ආවේ ආපහුම මේ විදියට දවාන්ව දකින්න හීනෙකින්වත් නොසිතුව නිසා

sinhalaebooks.com

"දෙයියනේ දවාත් මහත්තයා..

අදි එක්කම කෙල්ල දවාත්ව රැගෙන ගියේ කාමරෙට.. දවාත්ට ඇස් ඇරගන්නවත් සිහියක් නැහැ.. සදීනට දුකයි දවාත් දිහා බලන්න බැරි තරම්.. මේ මාස ගානකට කලින් රණබාහු බංගලාවට එද්දි හිටිය දවාත් වී ඇත ආයෙම.. ආයු එක්කම දවාත් වෙනස් වූයේ සදීනගේ ප්‍රේමණීය ඇස් ළගය ඒ ඇස් අද ප්‍රතික්ෂේප වූ නිසාම දැන් ඔහු පිස්සෙකි.. ප්‍රනය නිරුත්තරයෙකි..හිතක් නැත්තෙකි.. දවාත් සතු ඒ හැමදේම සදීනා හොරාගෙන අවසානය...

" කියුටි වෂර්ලාගේ අම්මයි තාත්තයි ඇවිත් එහෙට මූ එහේ ගියොත් මේ විදියට අනාතයි... ඒ හින්ද මූව උදේ යවනවා.. ඔහොම නිදගත්තුදෙන්..

" ආදී මහත්තයා.. මාවත් ගෙනිහින් දනවද මාමා ළගට උදේ... මට තවත් දවාත් මහත්තයා මෙහෙම විදවනවා බල බල මෙහෙ ඉන්න බැහැ...

සදීනා ඒ ටික කියාගත්තේ හැඩුම් මැද්දෙන්.. දවාත් මෙහෙම කරන්නේ තමන් නිසා කියලා කෙල්ල හොදටම දන්නවා.. මේ හැම්දේම මෙහෙම විසදිලා යන්න තමන් ඒ ඇස් මගහරින්න ඕනමයි කියලා කෙල්ලගේ හිත කිව්වෙම..

" මන් දන්නෑ කියුටි ඔයා ඇයි මෙහෙම තීරණයක් ගත්තේ කියලා..හැබැයි දවාත් අද ආවේ ඔයා නිසා මේ හැමදේම වෙනස් කරගෙන.. අද ඔයාව ඌ ගාවටම ගන්න ඔයාට ප්‍රෝපෝස් කරන්න ඌ ආවේ.. වෂර්ව වගේම ඌ පවුලත් අත අරින්න හැම්දේම කරගෙන ආවේ ඒත් ඔයා ඒ හැම හීනයක්ම විනාස කරලා දැම්මා සදීනා.. හැම හීනයක්ම... දැන් ඌ පිස්සෙක් වෙන එක ඔයාට නෙමේ කාටවත් නවත්තන්න බැරිවෙයි..
අන්තිමේ හැම්දේම අංකල්ට ඕනේ විදියට සිද්ද වෙලා දවාත් පිස්සෙක් වුනා එච්චරයි..

ඔයාගේ කැමැත්ත මූව දලා යන එකනම් ඒක ඔයාට සැනසීමක්නම්..මූ මෙහෙම විදවලා මැරිලා යනවා දකින එක.. ඔයා යන්න සදීනා.. එක ප්‍රශ්ණයක් නෑ..

ආදී අවසන් වචන පිටකලේ බර හුස්මක් එක්ක.. එහෙමම කාමරෙන් පිටවෙලා ගියේ සදීනා දවාත් දිහා බලන් හුල්ලදී..

" මොකක්ද මහත්තයෝ මේ කියන්නේ... ඔයා මාව තෝරගත්තද හැම්දේම අත ඇරලා.. මන් කොහොමද ඔයාව අනාථයෙක් කරලා මන් ළගට ගන්නේ.. ඒ ඔයාගේ පවුලනේ..

විවර වුනු කමිස බොත්තම් කාස අතරින් අතක් ගෙන ගියේ ඒ අසීමිත ප්‍රේමය ලියවුණු ආඩම්බරකාර පපුව මතුපිට.. ඒ උණුහුම විදින්න හිත ලෝබයි.. ඒ පඹාවට ගුලිවෙලා දවස් දින සති මාස නෑ මරණය තාක් රැදෙන්න හිත පෙරුම් පුරනවා..

" මට මෙච්චර ආදරේ ඇයි දවාත් මහත්තයා.. ආයු වගේම ඔයත් මාවම හොයන්නේ මේ ආත්මෙට මට ඔයාලගෙන් ඈතට යන්න බැරිකරලද..මැරෙන්නද මට කියන්නේ ආ.. මන් මැරෙන්නද ඕනේ.. ආ..ඇයි මෙහෙම රිද්දන්නේ..

sinhalaebooks.com

දවන්ගේ පපුවේ සීතල දෙතොල් තියන් එහෙම වැතිරුනේ ඒ උණුහුම අවසන් වතාවට විදගන්න හිත ලෝබකම් කරද්දි..

......................................................................

ණර්බාහු නිවස තුල උදේම තිබ්බ කලබලේත් එක්ක හැමෝම හිටියේ.. නිලා අතින් කෑම මේස සූදනම් වෙද්දි සමදරා අමාලී එක්ක රණබාහු එකතු වෙලා දවාන් ගැනයි වෂර්‍රා ගැනයි කතා කලේ විවාහයට සූදනම් වෙන්න..

" සමදරා කෝ දවාන්.. දැක්කේ නැනේ අපි ආවට පස්සේ කොල්ලව..

සමදරාට හදිසියේ හිසමත හෙතයක් පාත් වූ සේ ගිනි ඇවිලී ගියේ දවාන් නිවසේ නොසිටි බව අමාලී වගේම සපරමාදු අවදනෙන් සිට තිබූ බව දැනුන නිසා... වෂර්‍රා පවසා ඇත්තේ මොනවදැයි සමදරාගේ හිතට දැනුනේ බයක්..

" මිම් ආ මේ..පුතා ඊයේ කොළඹින් පිට ගියා අමාලී බිස්නස් මීටින්ග් වගේකට අද තමා එන්නේ.. කෝල් කරලා ඇහුවා ඒත් කොල්ලා.. අද එයි ඔන්න පැනගෙන..

සමදරා බොරු හිනාවක් මවාගෙන ඉන්නවා රණබාහුට සැකයක් නැත.. දවාන් ඊයෙ පිස්සුවක් නටන්න ඉඩ ඇති බව ඔහු දනී..

" ඔව් සපරේ මන් කොල්ලව යැව්වේ වැඩ වගේකට..මේ අද එයි.. එයා දැන් උනන්දුවෙන් වැඩ බිස්නස් එක එක්කම.. කොල්ලට ෆුල් හැපී සපරෙගේ උදව් ලැබුන එකට..

රණබාහු අතින් දමා බොරු මවන්නේ සපරමාදුලගේහිත් ගැනීමට බව සමදර දන්නවා.. තමන් ගේ කතාවට රණබාහු එකතුවීම ඇයට සැනසීමක් වුනා..

" ඔව් ඔව් දැන් ඉතින් අපේ බිස්නස් ඔක්කොම බලාගන්න ඕනේ දවාන් තමා..මගෙත් ඉතින් ඉන්නේ කෙල්ල විතරනේ.. එයාටතමා රණේ මේ ඔක්කොම කරන්නේ.. ඉතින් දවාන් ඒවත් බාරගනනවනම් මම කැමති.....

සපරමාදුගේ වචන ස්ථිරය.. වෂර්‍රා වෙනුවෙන් ඇති සෑම දේපලක්ම ඔහු දවාන්ට බර දීමට ඉහටත් උඩින් කැමැත්තෙන් ය.. රණබාහුට මෙය ඉල්ලමක් පැදුන සේය.. රණබාහු වත්කම් ලංකාවේ ඉහළම තලයක තබන්න රණබාහු හීන මැව්වෙය ජීවිතකාලයටම් දැන් ඒ හීනය යථාර්ථයක් වන්න අවස්ථාව ලැබී ඇත රණබාහු එය අත් හරින්න කොහොමවත් ඉඩ නොදුන්නාය..

" අනේ අම්මී.. අම්මී මේ අයාන් අනේ මොකද වෙලා ..
අනේ එන්නකෝ අම්මී...

sinhalaebooks.com

සාලේ තිබ්බ හිනා හඬවල් තත්පරේට නැවතුනේ වෂර්ගේ කෑගැහිල්ලට.. කාමරෙන් වෂරා බෙරිහන් දුන්නේ අයු ගැන කියල සමදරාගේ දෙපා පන නැති වේගෙන එද්දි අඩියට දෙකට කාමරේට දිව්වේ කොල්ලා බලන්න..

" මගේ පුතේ.. ආයු මගේ වස්තුව කෝ ඇස් අරින්න දෙයියෝ.. මයේ අම්මා ආච්චිව බය නොකර ඇස් අරින්න..

සම්මිදරා කොල්ලව හරහට අරන් මූන අතගාලා ඉම්බේ ඇස්වලින් කඳුලු කඩාගෙන වැටෙද්දි.. අයාන්ගේ අතක් කඩාගෙන වැටුනේ ඒ ඇස් නොඇරිම.. ඇඟම සීතලා වෙලා අමාරුවෙන් හුස්ම ගන්නවා කොල්ලා ..

" අනේ මහත්තයා මගේ කොල්ලා............

"ආයු මගේ පුතේ.....නැන්දි දිහා බලන්නකෝ ආයු....

දසුනි කාමරේට පැන්න ගමන් කොල්ලව වඩාගෙන දිව්වේ එලියට.. හුළඟ වදින්න කලන්තේ ගතියක්ද බලන්න..ඒයේ අපූරුවට නට නට හිටිය කොල්ලට හදිසියෙව් උන දේ දසුනිට හිතාගන්න බෑ..

" රණේ වාහනේ ගන්නම් මන් හොස්පිටල් යමු ඉක්මනට......

සපරමාදුයි රණබාහුයි අයාන්ව අරන් හොස්පිටල් එකට දිව්වේ සමදත් එක්කම..

" චූටි ඔයා අයියට කතා කරන්න.. පණිව්ඩේ කියන්න පුතේ

දසුනිට සමදරා වාහනේ ඉදන් කෑ ගහල කිව්වේ දවාන් ට පණිවිඩයක් දෙන්න..

ගෙදර ඉතුටු වුනවෂරා එක්ක අමාලී
වෂරා බයෙන් වෙව්ලලා ගියේ තමන් අතින් අත් වැරුද්දක් වුනානම් දවාන්ගෙන් බේරුමක් නැතිවෙන වග දන්න නිසාම..

" අම්මී..මට බයයි.. අරක නිසාවත් ද......

" කට කට ළමයෝ..දසුනිට ඇහෙයි.. ගෑනී උඩට යනකම් ඉන්නවා..

දසුනි අමාලිලා ගැන නොබලා කාමරේට දිව්වේ ආදිට කියන්න..

" අනේ අම්මී ඔයා කිව්ව නිසානේ මන් අයාන් ඒ විටමින් එක දුන්නේ... මට බයයි ඒක නිසාද මෙහෙම වුනේ කියලා.. මොනාහරි සිද්ද වුනොත් අම්මිලා වගකියන්න මට බෑ හිරේ යන්න.. හිරේ යන්න කලින් දවාන් මාව මරලා දයි.. අනේ මටපිස්සු වගේ..

sinhalaebooks.com

වෂර්ා පොළවේ අඩිගහප්පමින් අමාලිට සැර දැම්මේ අමාලිගේ රහස් උපාය වැඩ වැරදී ඇද්දයි වෂර්ගේ හිතට ආව බයට..

" පිස්සු නැතුව ඉන්න ළමයෝ... අපි මොකද වහ දුන්නවැයි.. ඒක හොඳ විටමින් එකක් පොඩ්ඩක් වැඩියෙන් දුන්නා විතරනේ නිදිමත එන්න.. එහෙම මොකුත් වෙන් නෑ ඔයා බොරුවට නටන් නැතුව ඉන්න..

අහුවුනොත් අහුවෙන්නේ ඔයාගේ ඔය මූන දැකලා ටිකක් මනුස්සයෙක් වගේ ඉන්නවා වෂර්ා නිකන් හොල්මන් දැකලා වගේ ඉන් නැතුව.. අනික ඔයාගේ අම්මී මේ වගේ වැඩ කරන්නේ පුරුදු වෙන්න නෙවෙයි ඒක හොඳට මතක තියාගන්න..

අමාලී කිව්වේ වෂර්ගේ බය නැතිකරන්න පම්ප්පෝරිය.. ඒ කොයිදේ කිව්වත් වෂර්ගේ හිතෙ තිබ්බ බය පහවෙලා නොගියේ අයාන් ඒ විටමින් එක බිව්වම හැමදම වෙනසක් දැනුනා.. වෂර්ා බයටම වෙව්ලලා ගියේ දවාන්ගේ මූන මතක් වෙලා..

" අනේ අම්මී... ඒ වුනාට... දවාන් මාව මරයි මොනාහරි වුනොත්.. අනේ

" මේ විකාර නැතුව යන්න ලෑස්ති වෙනවා හොස්පිටල්.. තමුසේ ගිහින් එතන අඬාගෙන කෑ ගහනවා ටිකක් මව් සෙනෙහස පෙන්නලා.. එතකොට කව්රුත් සැක කරන් නෑ.. ගෑනු වුනාම ටිකක් මොලේ කල්පනා කරලා වැඩ කරන්න ඕනේ වෂර්ා.. ඔහොම බය වෙලා බෑ... ටිකක් ශක්තිමත්ව මූන දෙන්න පුරුදු වෙනවා ....

...............................................

උදේම ආදීගේ ෆෝන් එක රින්ග් වුනේ ඇදේ ඉද්දිමයි.. දවාන් එක්ක පිස්සු නටලා ආදිට මහන්සියටම නින්ද ගියා එළිවෙනකම්ම.. කොල්ලා හීනෙන් වගේ අතගාලා ෆෝන් එක කන් ළඟට තියාගත්තේ අඩ ඇස් වලින් තිරේ වැටිලා තිබ්බ නම දසුනි කියලා දැක්කපු නිසාමයි

" දසු...ගුඩ්මෝනින්...

" අදී අයියේ අපේ ආයු............අනේ..

එහාපැත්තෙන් දසුනිගෙන් ආවේ ඒ වචන ටික විතරයි හැඩුම් ස්වර පමණක් ඇහෙද්දි ආදී ඇදෙන් බිමට පැන්නේ ආයු ගැන කියනවා කොල්ලට හීනෙම් වගෙ ඇහුන නිසා..

" දසූ ආයු ආයුට මොකද දසූ.. අඬන් නැතුව කියන්න ළමයෝ..

ආදීගේ වචන ගැස්සුනේ ආයාන් ගැන හිත බය වෙද්දි.. දසුනිගෙ හඬ ඒ තරම් බියමුසු කෙදිනකවත් අසා නැත..

sinhalaebooks.com

" ආයූ හොස්පිටල් අරන් ගියා ... අපේ අයියට කියන්නකෝ.. එයාට කියන්න එයාගේ ආයූ බේරගන්න කියලා අනේ ආදී අයියා..මගේ චූටි කොල්ලා ඇස්වත් ඇරියේ නෑ අද...

දසුනිට සමුදීලා ආදී දවාත් හොයන් දිව්වේ මේ වෙලාවේ දවාත් දරුවා ළඟ ඉන්නම ඕන නිසා..

" දවාත් මචන්.. දවාත් යකෝ නැගිටපන්..

කාමරේ ඇඳ හිස්ව තියෙනවා දැක්කම ආදීට කේන්ති ආවේ දවාත් හොරාට පාන්දරම පැනලා ගිහින්ද කියල.. දවාත් කරන වැඩ ආදී දන්න නිසාම සැක කලේ යන්න ඇති කියල..

" ඕ ශිට්.. මූ වගේ මූසලයෙක්..ඕනෙම වෙලාවේ මේකා නෑ පැනලා ගිහින්..

කියුට් කියුට්................කියු......

ආදී සාලෙට ආවේ සදීනව හොයන වාසනාවකට දවාත් සැටියේ ඉදන් ඔලුව අල්ලන් හිටියේ කල්පනා කර කරම

" දවාත් ලෑස්තිවෙයන්.. හොස්පිටල් යන්නනෝනේ දැන්.. ඉක්මනට..

" ඇයි බන්.. මොකද වුනේ කව්ද්ද හොස්පිටල්.. මට බෑ මට අමාරුයි උඹ යමන්..

දවාත් ගනනක ට නොගෙන කිව්වේ මේ වෙලාවේ ආදී විහිලු කරනවා කියලා හිතලා..

" යකෝ .........ආයූ හොස්පිටල් ගෙනිහින්.. නැගිටලා වරෙන් යන්න...

දවාත්ට සැටියෙන් නැගිට්ටුනේ ඉබේටම.. ඒ වචන දෝංකඅර දුන්නේ කන් අස්සේම.. ආයාත් කියන්නේ හුස්ම ටික.. දැන්..දවාත්ගේ එකම පන ටික.. ඊයේ දවසටවත් කොල්ලා ඇහැට දැක්කේ නැතුව එක පාර හොස්පිටල් කියලා ආදි කියද්දි දවත්ගේ පපුව හිරවෙලා ගියා..

" මගේ කොල්ලා.. දෙයියනේ.. මන් මන් මාව එක්කන් පලයන්.ඉක්මනට මට හොස්පිටල් යන්න ඕනෙ.. මගේ කොල්ලට මොකුත් වෙන්නෑ..

දවාත් එහෙමමවාහනේ යතුර අරන් දුවද්දි ආදී ටීෂට් එක දන ගමන් දවාත්.පස්සේ යද්දි සදීනා හම්බුනේ එලියේ ආදිගේ ආච්චි එක්ක ඇවිදින්න ගිහින් එන වා..

" ..කියුට්.. ආයූ හොස්පිටල් ගෙනිහින් තොරතුරක් දන්නෑ අපි යනව..

ආදී කෑ ගහලා කියද්දිම දවාත් සදීනා නොදැක්ක ගානට වාහනේ කරකවලා අරන් ඊයක වේගෙන් ඉගිලිලා යද්දි සදීනට උගුර හිරවුනා පපුව හිරවෙලා මොකක්දෝ ගින්දරක් දෙපතුලේ ඉදන් පිච්චීගෙන යනවා දැනුනා..

sinhalaebooks.com

" ආ...ආයු ආ....... ම ගේ පුතා..
ත් නෑ නෑ මගේ පුතා හොස්පිටල් ගෙනියන් නෑ..
එයාට මොකුත් වෙන් නෑ ..

ඒ ආදී මහත්තයා කිව්වේ.. නෑ මට ඇහුනේ වැරදියට ද..

ආච්චී ආදී මහත්තයා කිව්වේ මගේ ආයු හොස්පිටල් ගෙනිහින් කියලද... ආච්චී ආ එහෙමද කිව්වේ...

සදීනා ආදිගේ ආච්චිගෙන් ඇහුවේ සැකන්හිතුනත් හිත පිලිනොගත්ත නිසාම..

" ඒකනේ මේ කොල්ලෝ දෙන්නා වහතේ ඉදන් කෑ ගැහුවට අපට ඇහුනදැයි හරියට..
යමුකෝ අපි කෝල් එකක් දලා බලමු ගේ ඇතුලට ගිහින්..

ස්දීනට හිතට අමුත්තක් දැනුනා..ආයු ගැන කෙල්ලට බයක් හිතුනා.. කොල්ලා හොදින් කියලා ඇහෙනකම් සදීනගේ හිතට සැනසීමක් නෑ..

............................................

අයාන්ව ඇතුළට අරන් පරීක්ෂා කරන ගමන් වෛදවරු කොල්ලා ගැන තොරතුරක් එනකම් සදමරා දොර අසලටම වෙලා හිටියේ දෙවියන් යදිනගමන්.. රණබාහු වගේම සපරමාදුත් අඳුරන වෛදයවරු සොයමින් ඇවිද්දේඑ අයාන්ව පුලුවන් ඉක්මනට බලවන්න..

" අම්මා.. කෝ ආයු..
මගේ කොල්ලට මොකද වුනේ.....

දවාන් පිස්සෙක් වගේ වෝඩ් එක දිග දුවන් ආවේ ඒයේ ඇඳගත්තු ඇදුමෙන්මයි.. අසිහියෙන් වගේ දොර ඇරන් යන්න දවාන් හදද්දි සමදරා දවාන්ගෙන් අල්ලගත්තේ අඩ අඩම..

" ආයුව බලනවා ඩොක්ටස්ලා ඇතුකට යන්න බෑ පුතා..
මගේ කොල්ලා පින්වන්තයි.. කිසිම දෙයක් වෙන් නෑ..
බයවෙන්න එපා පුතේ..ආයුට හොදවෙනවා..
වාඩි වෙන්න එන්නකො.. මෙහාට..

දවාන්ගේ කලබලේ ගැම දන්න හින්දම සම්දරා කොල්ලව පුටු සෙටිය ලගට අරන් ආවේ හෙමීට ..

" ආන්ටි මොකක්ද වුනේ ආයුට..

sinhalaebooks.com

" අනේ මන්ද පුතේ.. හොදට හිටියා ඊයේත්.. අද උදේ එකපාටම සිහි නැතිවුනා අතපය සීතල වෙලා.. කොල්ලා ඇස්වත් අරින් නැතුව.. ඒ ගමන් අපි අරන් ආවේ..

" දැන් මොකද කියන්නේ ඩොක්ටස්ලා ..

" තාම කිසිම දෙයක් කියන්නෑ ආදී පුතා.. එයාලා තව බලනවලු කොල්ලව..

සම්දරා සාරි පොටෙන් කඳුලු පිහදගත්තේ වේදනාවෙම්..

" උඹලා මොකද මැරිලද හිටියේ මගේ කොල්ලාට සිහි නැතිවෙනකම්.. ගෙදර වුන් මැරිලද.. හිටියේ ඔච්චර අමාරු වෙනකම්..ආ..

වෂර්ා එක්ක අමාලි හිටියේ ටිකක් ඈතින් දවාන්ගේ පෙනුම දැක්කම වෂර්ට බය හිතුනා.. ඒ ඇස් රතුවෙලා දත් මිටි කාගෙන සමදරාට බනිනවා කෙල්ල ඈත තියාම දැක්කා..

" අර අම්මී.. යක්ෂයා වැහිලා වගේ..
මගේ කකුල් දෙකත් පන නෑ.. අනේ මාව අල්ලගනීද .. අපි ගෙදර යමුකෝ..

වෂර්ා මුමුනත්තේ අමාලිගේ කනට..

" පිස්සුද ළමයෝ.. දැන් ඔයා ගිහින් අඩනවා එතන ටිකක්.. යනවා.. ගෙදර දුවන්න නෙවෙයි....

අමාලි වෂර්ව තල්ලු කලේ දවාන් ළගට යන්න කියලා.. ඕනම පිරිමියෙක් මේ වගේ වෙකාවක ගැහැනියක්ගේ කර්වරුණය ප්‍රාථර්නා කරනවා විශේෂයෙන් මෙහෙම අසරණ වුන වෙලාවක.. වෂර්ව ඒ තුරුම්පුව එල්ක දවාන් ළගට යවන්න අමාලී ප්ලෑන් කලේ..
කාලය ගෙවෙන්නේ හැම හිතකම බිය තත්පරෙන් තත්පරේ වැඩි කරමින්..
තියටර් වෝඩ් එකේ දොර ඇරෙන වෙලාවක් බල බල දවාන් පිස්සෙක් වගේ එහෙ මෙහෙ දිව්වේ අයාන්ගේ මූන බලාගන්න ඉවසිල්ලක් නැතිව.

" බබාගේ අම්මා හරි තාත්තහරි එන්න.

තියටර් එකේ දොර ඇරගෙන ආව වෛද්‍යවරයා ළගට දවාන් පැන්නේ අසිහියෙන් වගේ.. ඒ මුනේ හැගීම් අලබලයි කියලා දවාන්ට පේනවා හිතට දැනෙන අසීමිත බය එක්ක පිය සෙනෙහස ලේ මස් නහර ඇට මිදුලු කිඳබහිමින් දෙන වේදනාව පන පිටින් පිච්චිලා ගියා..

" ඩි ඩොක්ටර් මම තාත්තා.. මගේ පුතාට දැන් කොහොමද එයාට සිහිය ආවද ඩොක්ටර් ......ඕනම දෙයක් කියන්න මම ඕනම දෙයක් දෙනවා එයාව බේරගන්න.. ඩොක්ටර් මගෙ පුතාව සනීප කරල දෙන්න..

sinhalaebooks.com

දරදඬු දවාත් ආඩම්බරකාර යක්ෂයා අද වෛද්‍යවරයා ඉස්සරා අන්ත අසරණ දරු සෙනෙහස ඉදිරියේ දෑත් පාත්තේ ඒ දසුන දුටු නෙත් සියල්ලක් බොඳවෙලා යද්දී..

" මිස්ටර් දවාත්........ දරුවට විටමින් එකක් විස වෙලා අපි දැන් ඒව අයින් කරම ගමන් ඉන්නේ... ප්‍රශ්න වෙන එකක් නෑ.. අපි පුලුව ත් හැමදේම කරනවා..

බබාගේ අම්මා කෝ.........දරුවට අධිමාත්‍රාවෙන් විටමින් දීලා තියනවා දවස් කීපයක් ඒ වයසේ කෙනෙක්ට දරාගන්න බැහැ කියලා ඔයාලට ඔලුවක් නැද්ද..
සම්පූර්ණ වගකියන්න ඕනේ ඔයාලා..

දවාත් වෂ්රා දිහා බැලුවේ දවාලූ බැල්මක්..දරුවගේ අම්මා ගැන අහද්දි වෂ්රා අඩියක් ඉස්සරහට ආවේ වෛද්‍ය වරයාට අහවන්න මෙන්.. ඒත් දවාත්ගේ දෑස් ඉදිරියේ වෂ්ර්ට දැනුන බිය ඒ ගමන් බැලැක්වූයේ ක්ෂනිකවම..

වෛද්‍යවරයා දවාත්ගෙන් ඈතට ගිය සැනින් දවාත් වෂ්රා ළගට ගියේ දෑත් මිටි කරන් ඒ ඇස් ගිනිගහන පුලුගු මෙන් දැවෙන්නේ මේ සිටල්ල වෂ්රා අතින් සිද්ද වී ඇති යැයි සැක නැතිව.. සදීනාගෙන් දරුවා ඈත් කල බව සක්සුදක් සේ ඇස් පනාපිට දැක හමාරය..මේ සියල්ල ගෙදර අනිත් සියල්ලෝම අතින් සිදුවූ වැරදි ලෙස දවාත් නඩු පවරා හමාරය..

" පට්ට බැල්ලී.. තෝ මගේ මගේ ළමයා මරාගන්නද හැදුවේ.. කතා කරපන්.. උඹ තමා මේක කරේ.. සදීනගෙන් වෙන් කරගන්න උඹ මගේ ළමයාගේ ජීවිතේ එක්ක සෙල්ලම් කරාද ආ......වෂ්රා උඹ මගෙන් මැරුම් නොකා ඇත්ත කියපන්..

" අනේ නෑ දවාත් මත් එහෙම කලේ නෑ...

දවාත්ගේ දෑත්වලට සිරවීයන බෙල්ල වෂ්ර්ට වේදනාවක් ආවා.. උගුර හිරවෙලා යන්නේ දැන් මැරෙන තරම් වේදනාවක් දිදී..

" දවාත් අත අරිනවා මගේ ළමයව.. තමුන් කව්ද වෂ්ර්ට එහෙම චෝදනා කරන්න.. මගේ ළමයා මිනීමරුවෙක් නෙමෙයි..

අමාලි කෑග්මගැහුවේ දවාත්ගෙන් වෂ්ර්ව බේරගන්න..

" පුතා අත අරින්න ඔය ලමයව වෂ්රා එහෙම දෙයක් කරන් නෑ.. අනික එයාගෙම දරුවෙක් වගේ අයාන්ව බලාගත්තේ..

සමදරා පැනලා දවාත්ගෙන් වෂ්ර්ව ඈත් කලේ වෂ්රා අමාලි ළගට දුවන් යද්දී..

" අම්මාහ්..........ඉනෆ් ඉනෆ්.........
අල්ලන්න එපා.. මේ ඔක්කොටම වග කියන්න ඕනේ උඹලා ....... හැමෝම සතුටු වෙන්න අම්මා ඔයත් තාත්තටත් කියන්න..

sinhalaebooks.com

මගේ ළමයට වැරැද්දක් වුනොත් මන් උඹකව තියන් නෑ අන්න ඒක මත තියාගනියව්..

" දවාන් ප්ලීස් මචන්.. මේක හොස්පිටල් එක.. දැන් අපි කොල්ලව බේරගන්න බලමු.. උඹ ඔහොම කලබල කරලා හරියන් නැතේ මේ වෙලාවේ..

" ආදී.. කෝ සදීනා... එයා දන්නැද්ද එයාගේ පුතා දුක් විඳිනව කියලා.. ආදී සදීනාව ඕනේ මට දැන්... එන්න කියන්න..මට බයයි ආදී..මට බයයි..

ආදී දවාන්ව වත්තම් කරගත්තේ එ බය සාදරණය.. මේ වෙලාව නොවුනතම් වෂර්‍රා තම්න අතින්ද හොඳවගෙන් අහගෙන හමාරය.. මේ වගකීමක් නැතිව පුංචි ජීවිතයක් සෙල්ලමට අරගෙන ඇත්තේ නොසැලකිල්ලෙන් ය..

සදීනා දවාන්ව ඇවැසිම මොහොත මෙයය.. ආදි දවාන්ව පුටුවක තබා ඉවත් වුනෙ දසුනිට සදීනව අරන් එන්න කියන්න.. කෙල්ලට පණිවිඩේ හරියට කියාගන්නවත් වෙලාවක් නොවු නිසාම..

සපරමාදු එක්ක රණබාහු කලබලෙන් ආවේ අමාලි ඒ වෙද්දි දවාන් වෂර්‍රාට කරපු හැමදේම කනේ තිබ්බ නිසාවෙන්.. ඇමතුමක් අරන් සපරමාදුව අවුස්සලා තිබ්බේ දවාන්ගේ හැසීරීමෙන් අමාලී කුපිත වී සිටි නිසාවෙන්..

" අනේ සපරේ මේ මිනිස්සු මගේ දරුවව මීනීමරුවෙක් කරන්න හදන්නේ..මගේ දරුවා වහ දීලලු අයාන්ට..

අමාලී අඬාගෙන ගියේ සපරමාදු ළගට..

" මොකක්ද අමාලී කියන්නේ..

" අනේ මහත්තයා මේ දවාන් කලබල වෙලා අර දරුවට කෑ ගැහුවා..පුතා හිතලා නෙවෙයි කෑගහන්නේ .. එයාගේ මානසික තත්වේ මේ වෙලාවේ තේරුම් ගන්න ටිකක්..

සමදරා ණර්බාහුර කිව්වේ ඊකගට රණබාහු දවාන්ට කඩාගෙන පැන්නොත් සිද්දවෙන්න නපුර වලක්වාගන්න..

" නෑ නෑ රණේ දවාන්ට මගේ ළමයට එහෙම චෝදනා කරන්න අයිතියක් නෑ.. අනික එයා බලෙන් ඔයාලගේ ගෙදර නැවතුන් නැතේ.. රණේ කියපු නිසා මන් කෙල්ලව නැවැත්තුවේ විස්වාස කරලා..ඒත් මෙච්චර ලොකු චෝදනාවක් දයි කියලා මම හීනෙකින්වත් හිතුවේ නෑ...

රණබාහු කෙලින්ම ගියේ දවාන් ළගට.. පුටුවට ඔලුව තියන් දවාන් ඇස් පියාගෙන හිටියේ හිත නොසන්සුන් නිසාම දැනෙන ඔලුව කැක්කුම දරාගන්න බැරිව..

sinhalaebooks.com

" දවාත්...... මොකක්ද මිනිහෝ අර කියලා තියෙන පාහර කතාව...

රණබාහු දවාත්ගේ කත හරහා ගහපු අතුල් පහරට දවාත් පුටුවෙත් විසිවෙලා ගියේ සමදරා වගේ ම වෂර්ත් ගැස්සිලා යද්දි..

" මට ගහන්නද ඕනේ තාත්තේ ගහන්න ගහන්න.. මීට වඩා මට නැතිවෙන්න දේවල් නෑ.. මරලම දම්මනම් ඉවරයි ඔට අත්දෙකෙන්ම මාව..

බිස්නස් හින්ද තාත්තා මට මගේ දරුවත් නැති කරා..
මගේ ජීවිතේම කාලා දම්මා තවත් මට ඉතුරු වෙන්න දෙයක් නෑ.. මරලා දලා ඔයාල බිස්නස් එක්ක සැනසීමෙන් ඉන්න..

" ඔව් ඔව් උඹේ හැමදේම නැති කරේ මන්.. අර කොහෙද යන නටන්නියක් කරේ එල්කගත්තා ඒකට හා කියලා හිටියම ඒකි උඹව දලා ගියා ඒකට මොකුත් නොකියා උඹව බේරගත්තා.. අන්තිමේ ඒ ගෑනි වදලා දලා ගිය ළමයවයි උඹවයි දෙන්නම මන් බාරගෙන උඹලව හොද තැනකට ගේන්න හදපු එකද වරද දවාත්..

උඹ දනගතින් මීට පස්සේ මේ තාත්තා මැරුනා කියලා
උඹ මගේ දරුවෙක් නෙමෙයි..

" මහත්තයා..අනේ කෑ ගහන්න එපා ඔහොම.. මේ වෙකාවේ ඔය ප්‍රශ්ණ ඇදගන්න හොද වෙලාවක් නෙමෙයිනේ.අපි දරුවා බේරගන්න බලමු..

සමදරා රණබාහුගේ අතේ එල්ලිලා කෑ ගහද්දි ආදී ආවේ දසුනිට කතා කරලා.. දවත් බිත්තියට ඔලුව ගහන් හිටියේ දත් මිටි කරන් වෙව්ලන ඇගිලි එකට තෙරපමින්..

හැම්දේම දවාත්ගෙන් උදුරන් යන්න හදවා වගේ හැඟීමක් ආවේ..

" දවාත්.. කූල් මචන්.. ඉවසපන්.
දැන් සදීනා එනවා.. උඹ බය වෙන්න එපා..
කවුරු නැතත් උඹට මායි දසුනි සදීනයි ඉන්නවා..
උඹව මේ වෙලාවේ සදීනා තනිකරන් නෑ..ඒ හින්ද වැටෙන්න එපා..

ආදී දවාත්ගේ කනට කොඳුරලා කිව්ව ඒ වචනටික දවාත්ගෙ හිදිලා ගිය ලේ නහරවල් දිගේ සියුම් සැනසීමක් ගලාගෙන ගියේ සදීනා ආයු ළගට ආවොත් මේ හැම්දේම හොඳවෙයි කියලා
.

" කව්ද බබාගේ අම්මා..

හදිසියේ ඇරුන තියටර් දොරෙන් එළියට ආව ඩොක්ටර් ගේ හඩට දවාත් කඳුලු පිහදගෙන දිව්වෙ අයාන්ව බලාගන්න ආසාවෙන්..

sinhalaebooks.com

" ඩොක්ටර්.. මම තාත්තා.. මගේ පුතා කෝ

" නැහැ අපට බබාගෙ අම්මව ඕනේ..

වෂ්රා අඩියට දෙකට කඳුලු පිහදන් ආවේ මොනදේ සිද්දවුනත් වරද තමන් අතේ කියන හදර්සාක්ෂියෙන් ගැලවෙන්න වෂ්රට බැරිවුන නිසා

දවාත්ගේ අසරණකමඇස්වල තිබ්බේ.. ඒත් වෂ්රා දිහා නොබලා හිටියේ හැම්දේම සිද්දවුනේ වෂ්රා නිසා බව හිත දන්න නිසාම.. මේ වෙලාවේ ආයු වෙනුවෙන් සදීනා එනවනම් කියලා දවාත්ගේ හිත ආයාචනා කලා..
කවදවත් දෙවියන් විස්වාස නොකල ඒ පිරිමි හිත අද දෙවියන් යදිනවා..

" ඉන්න තැනකින්සදීනව එවන්න දෙවියනේ... ප්ලීස්...
වෙන මුකුත්ම එපා..මගේ දරුවගේ අම්මාව එවන්න..

දවාත් ඇස් පියන් ඇයැදියා..

" මි මම ඩොක්ටර් අම්ම..

වෂ්රා වචන පටලවද්දි දවාත් ඔහේ බලන් හිටියේ මේ වෙලාවේ වෂ්රට කෑ ගහලා බනින්න තරම් වත් සිහියක් නැතුව..

" ඔයා රෙඩි වෙලා ඉන්න බබාට කිරි දෙන්න..

" ඩි ඩොක්ටර්..

වෂ්රා ගැස්සුනා අයාන්ට කිරි දෙන්න තමන් ඔහුගේ මව නොවන නිසා.. අයාන්ට දෙන්න තියා තමන්ගේ දරුවෙක්ටවත් කිරි එරී නැත කිසිම දවසක.. දරුවෙක් කුසකටවත් පැමිණී නැති තමන් ට එය සිදුකල නොහැලි බව වෂ්රා දන්න නිසාම බය වෙලා බැලුවේ දවාත් දිහා..

" ඩි ඩොක්ටර්.. මේ එයාගේ අම්මා නෙවෙයි
එ එ යාගේ අම්මා නැතිවෙලා.......

දවාත් අක්ෂව මරලා දැම්මේ අදක ඊයෙක නෙවෙයි අද වචනයෙන්ම මරා දැම්මේ මේ හැම්දේකම ආරම්බය ඇය නිසාමයි..අයාන් මෙහෙම දුක් විදින්නත් තමන් මේ තරම් අසරණ වෙන්නත් හේතුව අක්ෂාය හිතෙන් මරා දමා අවසන් නමුත් අද ලෝකයා ඉදිරියේ ඇය මරා දැමීම වරදක් නොවේ යන්න දවාත්ගේ හිතට විස්වාසය..

" එත්.. දරුවා කිරි බීලා තියනව.. දවසකට කලින් විතර..බඩේ තියනවා මව් කිරි තාම..

sinhalaebooks.com

දවාන්ගේ ඇස් වගේම වවෂර්ගෙත් දෑස් විසල් වී ගියේ වෛද්‍යවරයා පවසන දේ විස්වාස නැති නිසාමයි..

" මගේ ආයු.................... ආයු...
අම්මා ආවා පුතේ ............මගේ ආයුට එන්න කියන්න..

ඩොක්ටර් කෝ මගේ පුතා .. මම අම්මා..
මට බලන්න දෙන්න මගේ පුතාව...

ආයු....... අම්මා ඔයාට කුක්කු දෙන්න ආවා.. මේ ඔයාගේ කුක්කු අම්මට දරාගන්න බෑ.. නැගිටලා එන්නකෝ
මේ පපුව ඇවිත් තුරුල් වෙලා ඉන්න.. ඔයාගේ කුක්කු දෝරේ යනවා පුතේ අම්මට නොදැනිම..එන්නකෝ ලගට..මාව මැරෙයි........මගේ පන.

ඇදන් ඉන්න බ්ලවිස් එකේ පඹාව මිරිකගෙන සදීනා ඩොක්ටර් එහායින් තිබ්බ දොර අල්ලන් කෑ ගහද්දි දවාන්ගේ ඇස් අදහ ගන්න බෑ සදීනගෙන් වෑහෙන කිරි පපුව තෙමාගෙන යද්දි දවාන්ගේ ඇස් වලින් කඳුලු පිටවෙලා ගියේ සදීනා ගැන තිබ්බ ආදරේ හදවත ගැඹුරෙම තැම්පත් වෙද්දි..

" සදීනා.............

සදීනා වෛදයවරයා ඉදිරියේ අවසන් වචන මුද හැරියේ දවාන්ගේ දෑත් මතට අසිහියෙන් වැටෙද්දි...

සමදරා රණබාහු වගේම ඇස් තිබ්බේ සදීනා ළග..

" සදීනා...... නැගිටින්න මැණික........ සදීනා.. කතා කරන්නකෝ..

දවාන් තට්ටු කලේ ඒ කොපුල් වලට.. සමදරා දුවන් ඇවිත් කෙල්ලගේ මූනෙ වතුර ටිකක් ගැව්වේ අඩ අඩම.. මේ තමන් පත්තා දෑමූ ඇයමයි.. ඒත් අයු ට ඕනෙම වෙලාවෙ කෙල්ල ඇවිත් දැක්කම සමදරාට සැනසීමක් ආවා.. මොකද මේ හැමදේම ලස්සන වුනේ සදීනා අතින් ඒක වසන් කල නොහැකි සත්‍යක් වී හමරය..

" ආ ආයු....................

" ඔයා ශක්තිමත් වෙන්න ඕනේ.. දරුවව බලන්න ඔයාට
විතරක් ඇතුලට එන්න පුලුවන්.. අපින්කතා කලාම එන්න.. එයාට කිරි දෙන්න ලෑස්ති වෙන්න..

sinhalaebooks.com

සදීනගේ දෙවුරෙන් අල්ලලා වෛදය වරලා පවසලා ඇතුලට යද්දි දවාන් සදීනගේ ඇස් දිහාම බලන් හිටියේ මේ දෙවියන් එවු මැව්මිකාරියයි.. ප්‍රේමයේ උත්තරීතරම සංකේතයයි.. ඇය ප්‍රාණසම වී හමාරය දැන් ..

" ද් දවාන් මහත්තයා ....... මම් මට සමාවෙන්න..
මන් නිසා මේ හැමදේම... මගේ ආයුයු මගේ මහත්තයවයි දලා ගියාට සමාවෙන්න.......
මන් යන් නෑ ආයි දල........
මගේ හුස්ම ඔය දෙන්නා.......මන් ආදරෙයි මහ හුගක්
මගේ පුතා අපි ලගට එනවාමයි.. මන් එයාව අරන් ඔයා ළගට එන්නම්.. මන් එනකම් මෙතනම ඉන්නවද..
ඔයාගේ සදීනයි ඔයාගේ පුතයි එනවා..

සදීනා ඒ ටික කිව්වේ දවාන්ගේ කොපුලක් මතින් සීතල දෑතක් තබාගෙන ඒ ඇස්වල සදීනා වෙනුවෙන් තිබ්බ විස්වාසය එහෙමමය ඒ ඇස් හැම්දේම බාරදී අවසානය

" මන් ඉන්නවා රත්තරන් මන් ඉන්නවා..
ඔයා එනකම් මන් මෙතම ඉන්නවා ...........
මගේ ආදරේ විස්වාසයි නේද... මගේ පන අරන් එන්න..

සදීනා තියටර් එක ඇතුලට ගියේ පපුව දෑතින් අල්ලගෙන.. දවාන් සැනසුම් හුස්මක් උඩ බලන් වාතයට මුසු කලේ සදීනා ආයාන්ව අරන් එනවා කියන විස්වාසෙන්..

" මෙකක් ද රණේ මේ වෙන්නේ... දවාන්ගේ දරුවගේ අම්මා අර කෙල්ලද..
වාව්.. මාර රගපෑමක්නේ කරල තියෙන්නේ..රණේ මන් හිතුවේ නෑ උඹ මාව ඔහොම රවට්ටයි කියලා..
අදින් පස්සේ අපේ ගණුදෙනු සේරම ඉවරයි..
මන් මගේ කෙල්ලව අරන් යනවා..

" සපරේ... ප්ලීස් මචන්..මේක එහෙම දෙයක් නෙමේ..
මන් කියන එක තේරුම් ගනින්කෝ..

අමාලි වෂර්ව ඇදන් ගියේ සපරමාදු එක්කම.. මේ කපටික. සියල්ල හෙලිවේ යන බියෙන් අමාලී කල රගපෑමකි.. දරුවා ලෙඩ කලේ තමන් යැයි වෂර්ට එන චෝදනාවෙන් ගැලවීමට කලින්ම ඔවුන් පිටවුනේ දවාන්ගේ සිහිය හොද තත්වෙම් නැති නිසාම

" ආදී අයියා.. වෂර් විටමින් එක දීලා නිසා නේද එහෙම වෙලා තියෙන්නේ...

දසුනි ආදීට ලන්වුනේ කණුවකට බරවෙලා හිටිය ආදී බර හුස්මක් හෙලද්දි..

" දසූ ඔයාගේ තාත්තලා සල්ලි වලට දවාන්ගේ හැමදේම විනාස කරා.. අන්තිමට අර අහිංසක දරුවා වගකියන්න වුනා...

sinhalaebooks.com

" මත් දන්නවා ආදී අයියා... ඒත් මත් මොනා කරන්නද..
එයාලට මේ දේවල් තේරෙන් නෑ.. හැම්දම හිතුවේ පරම්පරාව ගැනයි නම්බුනාව ගැනයි

දසුනි හැඬුම් මැදින් කිව්වේ ණර්බාහු දිහා බලලා.. රණබාහු සමදරාට අඩි හප්ලලා වෝඩ් එක දිගේ සපරමාදු ලා පස්සෙන් දුවන් යන විදිය දසුනි බලන් හිටියේ කනගාටුවෙන්..

" ආයු ශක්තිමත්.. කොල්ලා තමන්ගේ ජීවිතේ පරදුවට තියලා උගේ අම්මයි තාත්තයි එකතු කරගත්තා ඌ ලගට.. ඒ අතින් අයාන් කියන්නේ මට හිතාගන්න බැරි දරුවෙක් දසූ...........

ඒත් ඔයාට ආයු වගේ ගැලව්මිකාරයෙක් නැහැ.දසූ
මට බයයි ඔයාට බලපෑමක් කරයි කියලා කවදහරි..

ආදී හිතේ තිබ්බ බය දසුනි ඉදිරියේ කියලා දැම්මේ..
අන්තිම තත්පරේ දසුනිව තමන්ගෙන් උදුර ගත්තොත්

" ආදී අයියා... මත් අයියා තරම් ඉවසන එකක් නෑ..
මත් එනවා ඔයා ළගට..

ආදීගේ ඇස් බොඳවුනේ මේ වෙලාවෙ දසුනිව තුරුල් කරගන්න තිබ්බනම් ඒ හුස්ම පඹාවටබ්තියන් ඉන්න තිබ්බනම් කියලා ඒත් මේ ඒකට වෙලාව් නෙවෙයි..
දැන් හිතට බයක් නෑ දසුනි ඕනමවෙලාවක තමන් ලගට එන්න සූදනම්.. ඒ සැන්සීම හිතේ තියන් ආදී හිට්ජ නිවා ගත්තා..

හෝරාවකට පමණ පසුව ඇරුන දොරෙන් සදීනා අඩිය තියලා ආවේ දෝතින්ම පපුවට තුරුල් කරගත්තු අයාන් එක්කම.. දවාන්ට හිනාවක් ගියේ කොල්ලා ඇස් ඇරලා සදීනා අස්සේ ගුලි වෙලා ඇනුම් අරිනවා..

" මගේ පන... මගේ හුස්ම ටිඅක සදීනා මේ..
මගේ කොල්ලා ඇස් ඇරලා ඉන්නව.. මට දරාගන්න බෑ පිස්සු හැදෙන්න වගේ...කෑ ගහලා කියන්න හිතෙනවා මේ සතුට..

සදීනා ආයුගේ කොපුලක් මත සිපුමක් තබද්දී හිස් මුදුනට දැනුන සීතල ගතම හිරිවැටිලා ගියා.. ඔව් ඒ දවාන්ගේ වෙවලන දෙතොල් පහස සදීනගේ හිස් මුදුන මත දෑත් පියන් දෙතොල් තද කරන් ආයු වගේම කෙල්ලවත් විසල් පපුතුරට ගුලි කරගත්තේ මේ යදම් වලින් හුස්මක දුරකටවත් ඈතට යන්න යලි කිසිම දවසක ඉඩක් නොදෙන්න ...

" පුතා......

sinhalaebooks.com

සමදරා ඇස්වල උනන කඳුලු පිහදගෙන ආවේ මේ දවාන්ගේ ජීවිතේ අවසන් තීන්දුවය.. රණබාහු තබා දෙලිව පාලනය කරන දෙවියන්ටවත් මේ බැඳීම කඩා වෙන් කල නොහැක.. මෙයට ඉඩ දී පැත්තකට් වනු විනා මේ සමග ගැටී පලක් නැත..

" යන්න අම්මා......... ඔයත් යන්න...
ආයේ මන්වත් මුත් දෙන්නවත් ඔය ගෙදරට අඩියක් තියන් නෑ.. අපි හිගා කාල හරි ජීවත් වෙන්නම්..
මට ආපහු මගේ ජීවිතේ නැතිකරගන්න බෑ..

සමදරා අවසන් වතාවට දවාන්ගේ අත මෘදුවට පිරිමැද ආපහු හැරුනේ කිසිවක් නොපවසාම..

එක මවක් දරු සෙනෙහසින් සැනසෙද්දි තවත් මවක් ඒ දරු සෙනෙහස ඉදිරියේම අසරණවී හමාරය.. ජීවිතේ සෑම සිද්දියක් අවසානයේම ප්‍රේමය කිනම් ආකාරයක හෝ පරාජයක් උසුලනවමය.. දරක ප්‍රේමය ඉදිරියේ මව යනු උත්තරීතරම සෙනෙහසේ හිමිකාරියයි.. පුතුන් දෙදෙනෙක් වෙනුවෙන් මව්වරුදෙන්නෙක්ගේ ඇස් වලින්ගලා ගිය කඳුලු වලින් රෝහල් පොළව තෙත්වී ගියේ.. සමදරා නිහඬව ප්‍රේමය සගවා අභිතික්මන් කරද්දි.. ආදී වගේම දසුනිත් පමණක් අවසානයේ දවාන් ලග ඉතිරි වෙද්දි රණබාහු නිසා සමදරාටත් දවාන්ව දලා යන්න සිද්ද වුනේ සදීනට ඒ දෙන්නම හදවතින් බාරදී අවසානයේ..

" දවාන්.. ගෙදර යමු..

ආදී දවාන්ගේ උරහිසට තට්ටුවක් දමා කියද්දි දවාන් බැලුවේ ආදි දිහා

" නෑ බන් මන් ආයේ ගෙදර යන් නැහැ.. මට ටික දවසක් දීඹඅන් උඹ ලග ඉන්න.. එපාට්මන්ට් එකක් මන් ගන්නකම්..

" පිස්සුද උඹට ටික නෙමෙයිබුඹ හැමදම මන් ලග ඉන්නවනම් මන් කැමතී.. මට මාර හැපී යකෝ පොඩි මැන් හෙට ඉදන් අපේ ගෙදර නෙහ්.. අඩේහ් ශෝක් බන්..

ආදී සදීනා අතේ හිටිය කොල්ලව උඩුරගෙන වාහනේට දිව්වේ එක පිම්මට..

" චූටි........ ඇයි ගියෙ නැද්ද ගෙදර..

ඒ ඇස්වල කඳුලු බොදවෙලා කඩන් වැටෙන්න ඔන්න මෙන්න..මෙච්චර දවස් බලන් ඉදපු ප්‍රාථර්නා කරපු එකම දේ අද දවාන්ගේ ජීවිතේට ලැබිලා.. ඒ සතුට දසුනිට තරම් දැනුන අන් කවරෙක් හෝ නොසිටිය හැකිය.. සදීනව රැකගෙන දවාන් ළගටදෙනකම් වින්ද දුක දසුනිට මතකය.. මේ හැමදේම අවසානයේ ලස්සනට සිද්ද වුන නිසා සතුටක් තිබ්බත්.. දවාන් නැති රණබාහු නිවස පාලුයි කියලා දසුනි දන්නව.. ඒත් අකමැත්තෙන් වුනත් ටික කාලෙකට දවාන්ට වෙන් වෙන්න සිද්ද වෙනවා කියලා දන්න නිසාමයි..

sinhalaebooks.com

" අයියා.. මට සතුටුයි..

දවාත්ගේ බෙල්ලට පැනලා දසුනි අඩත්තගත්තේ සදීනා දසුනිගේ පිටට මූන තියාගෙන සනසද්දි..

" චූටි නෝනා.. ආදරෙයි මත් හුගක්.. හැම්දම මත් ළග හිටියට.. ඔයා තමා මගේ ශක්තිය වුබේ හැම තැනදිම..

" ඔත්ත ඇහෙනවනේ.. චූටි ඔයාගේ නෑනගේ ආදරේ ඔය.. සදීනයි උඹයි මගෙ ඇස් දෙක වගේ දැන්..
පරිස්සමින් ඉන්න ඔනේ මගේ චූටී.. අයියා ලග නැතත් ඕනම වෙලාවක චූටට මේ මත් ඉන්නවා.. හොඳද..

දැන් ගෙදර යන්න ඕනේ.. මාත් යනවා කොල්ලගෙයි මගෙයි ඇඳුම් අරන් එන්න..

දවාත් දසුනිගේ කරවටා අතක් යවන් කෙල්කව උස්සන් ආවේ ආදිගේ වාහනේ ලගට කියව කියව..

" අයියා.. බිමින් තියන්නකෝ.. ලැජ්ජයිනේ.. සදීනා හිනාවෙනවා මට අනේ බස්සනෝකෝ..

" බෑ.. උඹ තමා මගේ පොඩි එකී.. ඔහොම ඉන්නව වාහනෙත් තියන්න මත්..

දවාත් දසුනිව ආදිගේ වාහනේ ඉස්සරහින් තිබ්බේ ඇස් වලින් ආදිට ඉගියක් දීලා.. කොල්ලා ස්ටීන් වීල් එක අයුට පෙන්න පෙන්න හුරතල් කර කර හිටියේ ආසාවෙම්..

" ඔය ළමයා අපිට දීලා උඹ සදීනව ගෙදර එක්ක පලයන්.. මත් දසුනිවත් දලා ගෙදර ට ගිහිත් එන්නම්

" දවාත් මහත්තයා ඩොක්ටර් හම්බෙලා යමු ටිකක්..

සදීනා ඇස් බිමට හරවන් දවාත් කතා කලේ හෙමිට.. දවාත්ට අමතක වෙලාම ගියා කොල්ලා දැක්කට පස්සේ හැමදේම..

" අහ් උඹයි කියුටි ඩොක්ටර් හම්බෙලා වරෙම් අපි ඉන්නම්..

ආදී දසුනි දිහා බලලා කිව්වේ හිනාවක් දල... මේ ප්‍රශ්න දහක් මැද්දේ සැනසෙන්න තත්පරයක් හොයාගන්න..

දවාත් එක්කම සදීනා ඩොක්ටර් ළගට ගියේ ආයු ගැන දැනගන්න..

" අහ් මිස්ටර් දවාත්.. එන්න එන්න.. බබා ඩිස්චාජ් කරා නෙද..

sinhalaebooks.com

දවාත් සදීනගේ අතිත් අල්ලගෙනම වාඩි වුනේ ඩොක්ටර් ඉස්සරහා අසුනෙන්.. දවාත් ගේ හිත තාමත් ගැහෙනවා ඒ බය නිසාමයි කියලා සදීනට ඒ ගැහෙන ඇඟිලිතුඩු පහසින් දැනෙනවා.. සදීනා ඒ අත තද කරලා අල්ලගත්තේ නැවත් කිසිම දවසක ඒ හිත් තනි නොකරන්න තමන්ටම පොරොන්දුවක් දෙන ගමන්.. මේ සා දුක් ගොඩක් දවාත් තනියම විද දරා ගන්න වූයේද තමන් නිසාම යැයි

" ඩොක්ටර් එයාව ගෙදර එක්කන් ගියාට කමක් නෑ නේද.. දැන් ප්‍රශ්නයක් නැහැ නෙද පුතාට..

සදීනාඇහුවේ දවාන්ට කලින්ම ආයු ගැන දැනගන්න ඕනේ නිසා..

" බබාට විටමින් එකක් යූස් කරලා තියනවා.. ඒක බබාගේ වයසට දරාගන්න අමාරු පෝෂනයක්..

අනික මේක දරුවට මෙච්චර බලපානකම් ඔයාලා නොදැනුවත් වුනේ කොහොමද.. දරුවා දවස් කීපෙක ඉදන් වෙනස පෙන්නලා තියනවා.. දවසේ වැඩි හරියක්ම දරුවා ඉදලා තියෙන්නේ නින්දක මත් වෙලා.. ඉතින් ඔයාලා පේරන්ස්ල විදියට මේ තත්වේ අඳුර නොගත්තා කියන එක පුදුමයි..

දවාත්ගේ ඇස් බර වුනේ සදීනා පැත්තට පුන ඔෆනා සදීනා කිව්ව දේ ඒ විදියටම සිද්ද වෙකා ආයුගේ වෙමස ගැන කෙල්ල කිව්වා එද ඒක විස්වාස නොකල එක ගැන දවාන් දුක් වුනා...

" මගේ වරද ඩොක්ටර් මගේ පුතාව මට මගඇරුනා.. ආයේ මගේ අතින් එහෙම දෙයක් වෙන්නෑ.. අනේ ඩොක්ටර් මගේදරුවට ප්‍රශ්නයක් නෑ නේද දැන්..

සදීනා දෑත් එකතුකරගෙන කඳුලු හෙලුවේ ආයුගේ අනාගතේ ගැනබයෙන්.. කොල්ලට පස්සට බලපායි කියලා මේ හැමදේම..

" නෑ එහෙම දෙයක් නෑ.. දරුවා දැන් නිරෝගී.. ලමගේ වාසනාවට මෙ තත්වෙන් ගොඩ ගියේ..

" පින් ඩොක්ටර්..මගේ දරුවව බේරුව එකට..

දවාත් අවසානේ එලියට ආවේ වෛදය වරයාට පින් දීල

.

ආදීගේ නිවසේ දවසින් දවස ගෙවිලා යන්නේ සදීනා දවාත් ආයු පවුලෙ සිනහව එක්ක..

" සදී......... නිදි නැද්ද පුතා තාම..

sinhalaebooks.com

දවාත් මාගෙන කාමරේට ආවේ දව ගාතක තෙහෙට්ටුව කෙමෙන් කෙමෙන් වියැකිලා ගියේ හැමදේම නිදහසේ විසදිලා යද්දි..

දවාත් ආදී එක්ක බිස්නස් පටත් ගත්තේ අලුතෙන්ම හැමදේම මුල ඉදත් පටත් ගන්න.. රණබාහුට අයිති සියල්ල දවාත් අත ඇරලා දැම්මේ සදීනයි දරුවයි විතරක් තමගේ කරත් පැත්තකට වෙත්ත..

" දවාත් මහත්තයා.. මොනාද කල්පනා කරන්නේ..

" ම්ම්ම්ම් මත් මේ කල්පනා කරේ.. මගේ ගැනී ගැන..
මට හෙන අපහසුවක් ඕයි දවාත් මහත්තයා කියද්දි..
තමුසේ මට දවාත් කියනවා එහෙම නැත්තත් කොල්ල වගේම තාත්තී කියනවා..

සදීනගේ කට කොනට ආවේ හිනාවක්..

" තාත්තී කියත්ත මාත්.. අතේ මට බෑ.. ඕත්තම් මහත්තයා කියත්තම්..

ඒ වචන ඇතුලේ දවාත්ට ලෝකයම හම්බුනා වගේ හැඟීමක් දැනුනා..

" එකත් තරකම නෑ.. මේහ් කෝ කොල්ලා නිදිද..
තමුසේව චුට්ටක් තුරුල් කරත් ඉත්න ඕතේ.. මට අද මාර මහත්සී... එනවකෝ ටිකක්..

ආයු ලගින්ම දවාත් හාත්සී වුනේ සදීනාගේ කෙස් රොදක් දෑගිලි වලින් පටලවගෙනම..මේ හීතේ ජීවත් වෙත්ත පෙරුම් පිරුවා.. හැමදේම නැතත් අද සතුට විතරක් ඉතිරු වෙලා සැනසීම ගෙනාව ඒ ඇස් අද තමත්ගෙම වෙලා..

" මැණික.. අපි හෙට ගමනක් යනවා..

" කොහෙද..යත්තේ අපි..

"ම්ම්ම් ඔයාගෙයි මගෙයි අපේ පුතාගෙයි ගෙදරට

දවාත් එඹආට්මන්ට් එකක් ගත්තේ ඉතුරු කරලා තිබ්බ සල්ලි වලින් හෙට ඉදත් ජීවිතේ තනියම නැගිට්ටින්න හිත ශක්තිමත් කරත්.. දැන් ලොකුම හයිය සදීනා තම ලග ය අමුතුවෙන් දිනා ගත්තට දෙයක් නැත.. ජීවිතේ විදිත්ත කාලය එළඹි හමාරය...

.........................................................................

රණබාහු ගේ තරහා තිවෙත්ත දවස් කීපයක්ම ගත වුනා.. සපරමාදු බිස්නස් සිඅල්ල අවලංගු කර සදකාලික හතුරත් වෙද්දි..වෂරා අතින් ආයුට සිද්ද වුන කිසිම දේකට දවාත්

sinhalaebooks.com

පලි ගන්න නොගියේ අවසානයේ රණබාහු පවුල ගැන හිතලාමයි.වෂ්රා අතින් දැන හෝ නොදැන සිදු වූ සියල්ලට වඩා හැමදේම හොඳමවිදියට විසඳුන එක ගැන සතුටක් තිබ්බා..

" මහත්තයා.. හෙට පුතා අලුත් ගෙදරට යනවලු..

" ඉතින්..

රණබාහු කතකට නොගෙන ගනන් නොගත්තේ සුපුරුදු ආඩම්බරකම එක්ක..
හිතේ තිබ්බ කේන්තිය පහව ගිය වගක් නොපෙන්වන්න..

" අපට පුලුවන්නම් එන්න කිව්වා හෙට හවස.. මහත්තයටත් කියන්න කිව්වා.. පුතාගේ හිතේ දැන් තරහක් නෑ මහත්තයා..

" නෑ මැ එයා අපිව අත ඇරියේ එපා නිසානේ..
බිස්නස් ටිකත් මන් ඔක්කොම චූටිට දීලා දනවා.. මන් මේ ඔක්කොගෙන්ම ඇත් වෙලා දැන් නිදහස් වෙන්න හදන්නේ..දැන් ඇති මේකඅ පස්සේ දිව්වා.. දරුවන්ට අගයකුත් නෑ මොනවා කරත් ඔච්චරේ අන්තිමට අපට ඉතුරු..

" ඒක නෙමෙයි මහත්තයා.. චූටි ගැන අපේ ආදිගේ මොකක් හරි තියනවා අදහසක්..මට කතිත් කොතිත් ආරංචි වුනේ.. තාම කෙල්ලතම් මට කොච්චේ නෑ ඒ ගැන..

රණබාහු කලබකයක් නොපෙන්නුවේ ආදි ගැන අකමැත්තක් නොවුන නිසාමයි..දැන් තහංචි දමා සිර කර දරුවන් තබා ගැනීමෙන් පලක් නැති වග රණබාහු පිළිගෙන හමාරය..
දසුනිගේ කැමත්ත අනුව තීරණ ගන්න නිදහස තබා රණබාහු නිහඩ වූයේ එය සිද්ද වෙන්න ඉඩ තබා..

" චූටි ඇවිත් කියපුවම බලමු සමදරා.. . කලබල නොවී ඉන්නකෝ

රණබාහු පුටුවෙන් නැගිටලා ගියේ බර හුසමක් එක්ක..
ආයු නැති ගෙදර තිබ්බ පාලු මූසල ගතිය මේ දවස් කීපෙට රණබාහුට දැනුනා.. වෂ්රව ගෙනත් දරුවට සිද්ද වුන දේට රණබාහු හිත ඇතුලෙන් දුක් වුනා.. පසුතැවුනා.. ඒ නිසාම සපරමාදු සමග පවත්තපු සියලු සම්බන්ධයතා නවතා දමා බිස්නස් එක ඔහුටම විකුණා දැමුවේ.. ඒ සියල්ල දැන් රණබාහුට අවශය නොවූ නිසාමයි..

දවත් නැති රණබාහු බිස්නස් වලින් රණබාහුට වැඩක් නැත.. මොනදේ වුනත් දවාන් තම ලේ වල එකම උරුම කරු යන්න සැගවිය නොහැකි සත්‍යකි.. ලෝකය ඉදිරියේ දරදඬු පියෙක් ලෙස වෙස් ගත්තද ඒ හිත දවාන්ව ඉල්ලලා හඬා වැටුනේ කඳුලු හංගගෙනම..

...........................................................................................

" කෝ කෝ කියුට්... බැලුම් බෝලේ ඩෝං කියන්නම්නේ අපට අයින් වෙන්න අයින් වෙන්න..

sinhalaebooks.com

දවාන්ගේ අලුත් ගෙදර කාමර දෙකක් එක්ක පොඩි කුස්සියක් සහ සාලයක් තිබ්බ එපාට්මන්ට් එකක් ලස්සනට අස්කරලා කට්ටියම හවස එකතු වුනේ පොඩියට වුනත් දවාන්ගේ අලුත් ජීවිතේට සුබ පතන්න..

" ආදි අයියා පොඩි එකෙක් වගේ සදීනා අර බලන්න්කෝ.. ආයුටම ගැලපෙන යාලුවා..

දසුනි පෙන්නුවේ කෑම මේසේ ලෑස්ති කරන ගමන් හිටිය සදීනට..

" චූටි නෝනටයි ආදී මහත්තයටයිත් ඔය වගේම පැටියෙක් ඉන්න කාලෙක ඔහොම නටයි ගේ පුරාම.. නේද..

දසුනිගේ මූන රතු වෙනවා සදීනා බලාගෙන.. කෙල්කට හිනා යන්න ආවේ දසුනිගේ ලැජ්ජාවට..

" අනේහ් සදීනා ඕනැති ඒවා කියන්න එපා අනේ.. හා හා.. ඔය දෙන්නා දැන් ආයුට මල්ලියෙක් හරි නංගියෙක් හරි ගේන්න ඕනේ හරිද..

අතිත් පැත්තට දසුනි සදීනව රතු කරේ..කේක් එකක් කපන ගමන් හිටිය දවාන් දිහා හොරාට බැල්මක් යද්දී..

" චූටි නෝනා ඇති හොද්ද.. ඇහෙයි හැමෝටම..

" ආ ඇහෙන්න තමා කියන්නේ.. අයියා මේ සදීනා කියනවා.. ආයුට නංගි කෙනෙක් හිටියනම් පාලුවක් නෑ කියලා.. අයියගේ උවමනාවක් නෑලු ඒකට..

" අනේ බොරු මහත්තයා.. චූටි නෝනා විකාරද..

" නෑ මෑ මටත් ඇහුනා..සදීනා කියනවා..උඹ ටිකක් හිතපනේ ගැනත් දවාන්..

දවාන් ඔළුහිය අරන් ආවේ කරකව කරකව..

" මාත් මේ අවස්ථාවක් දෙනකම් තමා ඉන්නේ.. එයා කැමතිනම් මත් අද වුනත් ලෑස්ති...

සදීනා කුස්සියට ගියේ කට්ටියම හඩට හිනා වෙද්දී ලැජ්ජාව දරාගන්න බැරිව.. මූනත් රතු කරන්..

" අන්න උඹේ නොනා ලැජ්ජාවට දිව්වේ. ගිහින් ලැජ්ජා බය ඇරකා වරෙන්......

" අද අල්ලගන්නම්කො.. උඹලා කාලා බීලා පලයල්ලකෝ..

sinhalaebooks.com

" ආ ආ ආ.. දසු අපි යන්ද.. මෙයා මේ හොරාට ගල් ඇහිදින්නේ මොකාටද කියක දැනුයි මට තේරුනේ..
හා හා.. ඔහොම යමහිනාවට

ආදී ගේ හිනාවට දසුනි එකතු වුනේ දවාත් ලැජ්ජා කරන්න හිතාගෙන..

"පුතා.................

එකපාර ගෙට ගොඩවුනේ සමදරා එක්ක රණබාහු..
දවාත්ට හිතාගන්න බෑ. සමදරාට කිව්වත් රණබාහු එයි කියටවත් කොල්ලා හීනෙකින්වත් හිතුවේ නෑ..

" අම්මා තාත්තා..

දවාත් සමදරා ලගට පැනලා ගියේ ඇස්වක කඳුලු පුරවත්..

" උඹ දැන් ලොකු මිනිහෙක්නේ.. නතියම ජීවත් වෙන්න නේද..

" අනේ තාත්තා..

රණබාහුගේ පපුවට තුරුල් වුනේ දවාත් ඒ පිය සෙනෙහස හිත් අමනාපකම් සියල්ලක්ම සෙනෙහසින් දියවෙලා යද්දි..

" අහකට යමන් උඹ.. මන් ආවේ මගේ චූටි කොල්ලා බලන්න.. මන් අරන් යනවා මේකව..

සීයා දලා ආව නේද හොර කොල්ලා..

රණබාහු අයාන්ව අරන් හුරතල් කලේ දසුනි වගේම ආදිත් මේ සිද්ද වෙම හැමදේම ගැන හදවතින්ම සතුටු වෙද්දි..

" කො චූටි සදීනා..

සමදරා ඇහුවේ කෙල්ල පේන්න නැති හින්ද..

" අම්මා එයා කුස්සියේ ඇති..කෑම ලෑස්ති කරන ගමන්..

සමදරා සදීනා හොයාගෙන ගියේ මූන දෙන්න තරම් හිත ශක්තිමත් නැතත්.. සදීනගෙන් සමාව ගත යුතුය..
සැනසීමක් දැනෙන්න ඇයටබ්කල වැරදි වකට සමාවක් ලැබිය යුතුය..

" දෙයියනේ ලොකු නෝනා ...

sinhalaebooks.com

කුස්සියේ දොර ළඟින් පෙනුන රූපේ නිසා කෙල්ල පුදුම වුනා.. හිතට දුකක් තිබ්බේ දවාන් පවුලෙන් ඈත් වුන එක ඒත් දැන් සමදරා දැක්කම දවාන් ගැන හිතට දැනුන නිදහස සදීනට ඉහටත් උඩුන්..

" සදීනා........ මට සමාවෙන්න දරුවෝ..
ඔයාට මගේ අතින් වැරදි ගොඩක් සිද්ද වුනා..

" අනේ ලොකු නෝනා.. මොනාද මේ කියන්නේ.. මගේ හිතේ එ දේවල් නෑ දැන්.. ලොකු නෝනලා එක්ක මගේ කිසිම තරහක් නෑ.. වැල්ලේ ඉපදිලා අන්ත අසරණ දුප්පත් මට අද ලෝකයක් ලැබිලා.. ඉතින් මේ හැමදේම මට ලැබුනේ ලොකු නෝනලා නිසා.. මන් පින් දෙනවා නොනා මට් මේ ජීවිතේ දුන්නට. මන් දවාන් මහත්තයා වයි ආයුවයි ඇස් දෙක වගේ පරිස්සම් කරනවා ඒක මන් ලොකු නෝනට පොරොන්දු වෙනවා..

සදීනගේ හිත ගැන සමදරට දැනුනේ අසීමාන්තික ගෞරවයක්..
ඒක මව්සෙනෙහසක්වෙලා සදීනව වටා ගියේ.. දවාන්ගේ බිරිඳ විදියට වඩා සදීනව තමන්ගෙමදුවක් විදියට දැනෙද්දි..

...................................

සුන්ද සවස් යාමයක් එක්ක ගෙවින දවාන්ගේ අලුත් ජීවිතේ අලුත්ම තිවසක පළවෙනි රැය සදීනා එක්ක තිනි වුනේ හැඟීම් නොසිවිසිලිමත් ව හිත ඇතුලේ පොරකද්දි.. ජීවිතේ මිනිස්සු ලබන සැන්න්සීම සතුට අද දවාන් විදිනවා..

" ආක්ෂා ඔයාට පින්.. මට මේ ජීවිතේ දීලා ගියාට.. කොහෙ හිටියත් හැමදම සතුටින් ඉන්න ඔයත්.. මන් වගේ ඔයාගේ ආදරෙන් මට දීපු සංකේතයත් අද හුගක් සතුටින්.. ඒ හැමදේම අද ලස්සනත සුරංගනාවියක් ලග පරිස්සම් වෙනවා.. අක්ෂා ඔයාට පින්........

දවාන් ඒ ටික කිව්වේ බැල්කනියේ ඈත පේන කන්ද දිහා බලාගෙන..

" මහත්තයා... ද්වාන් මහත්තයා ..

සදීනා හිටියේ කොල්ලගේ පිටිපස්සෙන් ඈත බලාගෙන ත්නිවෙලා ඉන්න දවාන්ගේ නිරුවත් උඩු කය දිහා සදීනා බලන් හිටියේ ඒ ඉන වටා දෑත් යවලා පිටට තුරුල් වෙලා..

" මේ හැමදේම මට දුන්නට පින් ඔයාට...

" සදීනා...............ඒයි මැණික..

එහෙමම කෙල්ලව පපුවට ගත්තේ ඒ කඳුලු ආයෙ කිසිදක වලන්න දවන් අකමැති නිසා කෙල්ලට රවාගෙන කඳුලු පිහදන ගමන්..

sinhalaebooks.com

" මට දරාගන්න බෑ මේ හැම්දෙම.. හිතට බර වැඩි වගෙ..

" ෂ් ෂ්.. මොකුත් කියන්න එපා..තව.. අද ඉඳන් මගේ හැම්දේම ඔයා.. දැන් ඉඳන් මේ අද ඉඳන්.. මගේම වෙනවද.. හැම හුස්මකම ඔයා ඉන්න ඕනේ මන් ළඟම..

" මන් ඉන්නවා මහත්තයා.. මැරෙනකම්ම ඔයා ළඟ..
මේ පපුවට් තුරුල් වෙලා මන් ඉන්නවා..

දවාත් එහෙමම කෙල්ලව දෑත් වලට අරන් ගියේ ප්‍රේමයේ සුන්දරම රාත්‍රී ය ගෙවා දමන්නට හැඟීම් හිත
අස්සේ දඩබ්බරකම් කරද්දි..

නිදි වජර්ති රාත්‍රී යක සුසුම් වැල් වාතලය ට මුසු වෙද්දි දවාත්ගේ ප්‍රේමය සදීනගේ ආත්මය වටා පාරා වලල්ලක් සේ එතී ගියේ..ඒ හිත් සදහටම ඔවුන්ගේම වෙමින්..

" මට සමාවෙන්න..

" ඇයි..........

" ඔයාට දෙන්න පිරිසිදු කමක් මන් ළග නෑ දවාත් මහත්තයා.. මට සමාවෙන්න..

" ෂ්...... එහෙම බැලුවොත් මාත් පිරිසිදු මිනිහෙක් නෙවෙයිනේ මැණික..

මේ අපේ ආදරේ....... මේ ආදරේ පිරිසිදුයි.. ඒ ඇති අපිට හිනා වෙලා ජීවත් වෙන්න..

අද ඉඳන් අපි අපේමයි......හැමදටම.....

දවාත්ගේ නිරුවත් පපුවට ගුලිවෙලා සදීනා ඇස් පියාගත්තේ සදහටම ඒ පහසේ රැකවල් පතමින්.. ආයුට මවක් මෙන්ම දවාත්ගේ පතිනිය වී මේ ආත්මය තුල සැනසීම විඳගනිමින්..
සමාප්තයි........